

පාසල
2

# 01

“නිවාඩු කාලයේ මම හුඟාක් විනෝද වුණා.” නැවත වතාවක් පාසලට යාමට සූදානම්ව තම පියාගේ මෝටර් රථයට නඟින අතරතුරේ ඩැරල් කිව්වා. “ඒත් ආයෙත් ඉස්කෝලෙට යන්න කාලය ආව එක ගැන මට සතුටුයි. සති අටක්ම ගත වුණා !”

“හොඳයි, හොඳයි. නරකම නැහැ.” ඇගේ පියා කිව්වා. “අම්මා ලෑස්ති ද, නැත්නම් මම හෝන් එක ගහන්න ද ? හරි වැඩක් තමයි, හැමදාම පළමුවෙන්ම ලෑස්ති වෙන්නේ මම. ඕහ්, අන්න අම්මා එනවා!”

රිවර්ස් මහත්මිය කඩිනමින් පියගැට පෙළ බැස ආවා. “අපොයි, මම ඔයාලව රස්තියාදු කළා ද ?” ඈ ඇසුවා. “අවසාන මොහොතේ ටෙලිෆෝන් එකට කෝල් එකක්. සැලී හෝප්ගේ අම්මා, අහනවා අපි ඇවිදින් සැලීව එක්ක යන්නේ කීයටද කියලා.”

සැලී හෝප් ඩැරල්ගේ හොඳම මිතුරියයි. රිවර්ස් මහත්මයා, ඒ කියන්නෙ ඩැරල්ගේ පියා, ඔවුන් දෙදෙනාව මැලෝරි ටවර්ස් පාසලට කැඳවාගෙන යාමට සූදානම්ව සිටියා. පාසල බොහෝ දුර බැහැර පිහිටා තිබූ හෙයින් ඔවුන් පාන්දරම ගමන ආරම්භ කිරීමට තීරණය කර තිබුණේ අඳුර වැටීමට පෙර සැලීව ද රැගෙන එහි යාමටයි.

“ගෙදර ඇලා යන්න නම් හුඟාක් අමාරුයි. ඒත් ඉස්කෝලේ මතක්වෙන කොට යන්නමයි හිතෙන්නේ.” ඩැරල් කිව්වා. “මේක මැලෝරි ටවර්ස්වල මගේ පස් වෙනි වාරය. අම්මා, දැන් මම දෙවැනි පන්තියේ. මට හරිම උසස් බවක් දැනෙනවා!”

"හොඳයි, දැන් ඔයාට දහතුනක්. ඉතින් මේ වෙන කොට ඔයා ඉහළට යන්න ඕනෑ." රථයේ ආසනයේ හරි හැටි වාඩිවෙමින් මව කිව්වා. "දැන් ඔයා පළමු පන්තියේ ළමයි හුඟාක් පොඩි අය වගේ දකියි, නේ ද ? එයාලා පොඩි බබාලා වගේ !"

"ඒක නම් එහෙම වෙයි." හඬ නඟා සිනාසෙමින් ඩැරල් කිව්වා. "හොඳයි, තුන් වැනි පන්තියේ අය අපි කුඩයි කියලා හිතනවා. ඉතින් අපි ඉන්නේ අපිට නියමිත තැන්වල !"

"අන්න, නංගි ඔයාට අත වනනවා." මෝටර් රථය ඇදෙන්නට වන අතරම ඇගේ පියා කිව්වා. "ඔයා නැතුව එයාට පාළුවක් දැනෙයි, ඩැරල්."

ඩැරල් උද්යෝගයෙන් අත වැනුවා. "ගිහින් එන්නම්, ෆෙලිසිටි!" ඈ කෑ ගැසුවා. "ඔයත් දවසක මැලෝරි ටවර්ස්වලට එයි. එතකොට අපි එකට යමු !"

මෝටර් රථය මහා මාර්ගයට අවතීර්ණ වුණා. ඩැරල් අවසාන වතාවට නිවස දෙස බැල්මක් හෙළුවා. තවත් මාස තුනක් ගත වන තුරු ඈ එය නොදකිනු ඇත. ඇයට යම් දුකක් දැනුණා. එහෙත් බුද්ධිමත් දැරියක ලෙස, සොම්නස් සහගතව ඈ තම සිතුවිලි මැලෝරි ටවර්ස් පාසල වෙත යොමු කළා. පසුගිය වසරේ සිට තම පාසලට ආදරය කිරීමට ඈ නැඹුරුව තිබුණා. එමෙන්ම ඇය එම පාසලේ සිසුවියක වීම ගැන ආඩම්බර වුණා. පොටිස් ගුරුතුමිය සමග, පළමු පන්තියේ වසරක් ගත වූ අතර ඈ දෙවැනි පන්තියේ තවත් වසරක් ගත කිරීමට ආශාවෙන් පෙරුම් පිරුවා.

පැයක කාලයක් ගත වූ අතරේ ඔවුන් සැලී හෝප්ගේ නිවසට පැමිණුනා. ඔවුන් සමග යාමට සූදානම්ව සිටි සැලීගේ ගමන් මලු පඩිය මත තිබුණා. ඇය සමග මව ද සිටි අතර ඇගේ අතේ එල්ලී සිටියේ ඒ වන විට දහ අට මසක් පමණ වයස් වූ වැටි වැටී ඇවිදින කුඩා සොයුරියයි.

"හලෝ සැලී ! හලෝ ඩැෆී !" ඩැරල් කෑ ගැසුවා. "ඔයා ලෑස්ති වෙලා බලා ඉන්න එක හොඳයි !"

ට්‍රන්ක පෙට්ටිය ඩැරල්ගේ එක ද සමග මෝටර් රථයේ පසු පසට දැමුණා. කුඩා ඇඳුම් බෑගය දැරිය සමගම රැඳුණා. සැලීගේ



ලැක්රෝස් පිත්ත අනෙක් බඩු මුට්ටු අතරම ඔබා ඈ රථයට නැඟ ගත්තා.

"මටත් එන්න ඕනෑ." තම ආදරණීය සොයුරිය සැලී පිටත් වෙන්න සැරසෙනු දැක කඳුළු පිරි දෙනෙතින් යුතු කුඩා ඩැෆී හඬ නගා කිව්වා.

"ආයුබෝවන්, අම්මා ! පුළුවන් තරම් ඉක්මනට මම ලියුමක් එවන්නම්." සැලී කිව්වා. "ගිහින් එන්නම්, ඩැෆී බබෝ."

රථය නැවත ඇදෙද්දී ඩැෆී විලාප නගන්නට වුණා. සැලී මඳක් අපහසුවට පත් පෙනුමක් තිබුණා. "මට අම්මාව දාලා යන්න අමාරු වුණා." ඇය කිව්වා. "දැන් ඩැෆීව දාලා යන්නත් අමාරුයි. එයා හරිම අපූරුයි දැන්. එයා දැන් එහේ මෙහේ දුවනවා, හොඳට කතා කරනවා."

"ඔයාට මතකද එයා හුඟාක් පුංචි කාලේ ඔයා එයාට කැමැත්තක් තිබුණේ නැහැ?" ඩැරල් කිව්වා. "ඕනෑම ඔට්ටුවක්, දැන් ඔයාට එයා නැතිව බැහැ. නංගි කෙනෙක් ඉන්න එක අපූරු දෙයක්."

"ඔව්, මම එයාට නපුරු වුණා." අතීතය සිහි කරමින් සැලී කිව්වා. "මැලෝරි ටවර්ස්වල පළමු වාරය මට අපල කාලයක් වුණා. මාව ගෙදරින් පිට කළේ ඩැෆීට හුඟාක් සහනයක් දෙන්න කියලා කල්පනා කර කර මම හරි දුකින් හිටියේ. මට ඔයාවත් එපාවෙලා හිටියේ, ඩැරල්. ඒක මතක් වෙද්දීත් හරිම අමුතුයි නේද ?"

"දැන් අපි හොඳම යාළුවෝ." හඬ නගා සිනාසෙමින් ඩැරල් කිව්වා. මේ, "ඔයා හිතන්නේ දෙවැනි පන්තියේ නායිකාව කවුරු වෙයි කියලාද, සැලී ? දැන් කැතරින් තුනේ පන්තියේ හින්දා එයා නෙමෙයි වෙන කෙනෙක් වෙන්න පුළුවන්."

"සමහර විට ඇලිසියා." සැලී කිව්වා. "එයා තමයි පරණම."

"මම දන්නවා- ඒත් ඔයා හිතනවාද එයා හොඳ නායිකාවක් වෙයි කියලා ?" ඩැරල් සැක මුසුව ඇසුවා. "මම දන්නවා එයා හුඟාක් දක්ෂයි, හැම එකකින්ම වැඩිම ලකුණු ගන්නවා කියලා. ඒත් එයා වැඩියෙන්ම කැමති පිස්සු නටන්න කියලා ඔයාට හිතෙන්නේ නැද්ද?"

"එයා පන්ති නායිකාව වුණොත් ඒවා නවත්වයි." සැලී කිව්වා. "මම හිතන්නේ ඇලිසියාට අවශ්‍ය වගකීම් ටිකක්. එයා කිසි වගකීමක් ගන්නේ නැහැ. ඔයා දන්නවා ගිය වාරයේ එයාට පරිසර චාරිකා මෙහෙයවන්න කිව්වාම එයා මඟ හැරියා. ඒත් හොඳ නායිකාවක් නොවෙන්න එයාට තියෙන තව හේතුවක් මට හිතා ගන්න පුළුවන්."

"මොකක් ද ?" තම පාසල් මිතුරියන් ගැන ඔපාදූප රසවිඳිමින් ඩැරල් ඇසුවා.

"හොඳයි, එයා ටිකක් දැඩියි." සැලී කිව්වා. "කාට හරි කරදරයක් වුණාම එයා උදව් කරන්නේ නැහැ. එයා කාටවත් කරුණාවන්ත වෙන්න උත්සාහ කරන්නේ නැහැ. එයා නායිකාව වුණොත් අනිත් අයට නියෝග දිදී ඒවා පිළිපදිනවාද කියලා බලයි. ඊට වැඩි දෙයක් වෙන්නේ නැහැ. ඒත් පන්ති නායිකාවකගෙන් ඊට වඩා වැඩි යමක් කෙරෙන්න ඕනෑ, නේද?"

"හොඳයි, කවුරු සුදුසුයි කියලා ද ඔයා හිතන්නේ ?" ඩැරල් තදින් ඇසුවා. "ඔයා කොහොම ද? ඔයාට අනිත් අයව හොඳින් මැනගන්න පුළුවන් වගේම කවුරු හරි අසරණ වුණොත් හරි කරදරේ වැටුණොත් හරි, ඔයා හුඟාක් අනුකම්පාවෙන් සලකනවා. ඒ වගේම ඔයා හුඟක් හොඳයි. හුඟාක් සාධුයි. අනික මම වගේ මඟ හැර ගන්නේ හෝ පටලවා ගන්නේ නැහැ. ඔයා නායිකාව වෙනවා නම් මම හුඟාක් ආසයි."

"මට නම් වුවමනාවක් නැහැ." සැලී කිව්වා. "කොහොම වුණත් ඒකට ඉඩක් නැහැ. මට හිතෙනවා නායිකාව වෙන්න ඔයා හුඟාක් හොඳයි කියලා. ඩැරල්, ඇත්තටම ඔයාව පත්වෙයි. හැම කෙනෙක්ම ඔයාට කැමතියි, ඔයාව විශ්වාස කරනවා."



ඇයව තෝරා ගැනීම සිදුවිය හැකිදැයි යන සිතුවිල්ල මොහොතකට ඩැරල්ගේ සිත හරහා ඇදී ගියා ! එක්කෙනෙක් දෙන්නෙක් හැර සියලු දැරියන් ඇයට ඇලුම් කළා මෙන්ම ඇයව විශ්වාස කළ බව ඇය දැන සිටියා.

"ඒත් මගේ ඉක්මන් කෝපය තවම තියෙනවා." ළතැවිල්ලෙන් යුතුව ඈ කිව්වා. "වෙන කෙනෙක් කියලා හිතලා ගිය වාරයේ ටෙනිස් ගහද්දි මේරි ලෝව් මට බනිද්දි මට කොයිතරම් තරහා ගියාද කියලා ඔයා දැක්ක නේද? මම දැනගෙන හිටියේ නැහැ එයාට වැරදීමක් වෙලා කියලා, ඇත්තටම, ඒත් මම එයාට කෑ ගහලා රැකට් එක පොළොවේ ගහලා අඩි හප්පපු හැටි හිතලා බලන්න. මට හිතා ගන්න බැහැ මට මොනවා වුණාද කියලා."

"ඔ, එදා ඔයාට වගේම අපි හුඟ දෙනෙකුට අව්ව දරන්න බැරි දවසක්." සැලී සිත සනසවමින් කිව්වා. "ඒ වගේ මෝඩ දේවල්වලට සාමාන්‍යයෙන් ඔයාට තරහා යන්නේ නැහැ. ප්‍රයෝජනවත් තැනකදී ඒකෙන් වැඩ ගන්න දැන් ඔයා ඉගෙන ගන්නවා ! උදාහරණයක් හැටියට ගත්තොත් අර බූරු ගොන්ඩොලින්ට ගහන්න යනවා වගේ!"

ඩැරල් හඬ නඟා සිනාසුණා. "එයා නම් ඇත්තටම මෝඩියක් නේද? ඔයාට මතකද මිස්ටර් යං වෙනුවට මාස දෙකක් සංගීතය උගන්වන්න ආව මිස් ටෙරීට එයා මොනතරම් මෝඩ වැඩ කළා ද කියලා ? මම හිතුවේ මිස් ටෙරී ඒවා දරා ගත්තේ මෝඩකමට කියලා."

"අපොයි, ගොන්ඩොලින් හැම තිස්සෙම කාට හරි මෝඩ වැඩක් කරයි." සැලී කිව්වා. "එයා එහෙම කෙනෙක්. මම හිතන්නේ මේ වාරයේදීත් වඳින්නයි, පස්සෙන් යන්නයි කෙනෙක්ව තෝරා ගනියි. හොඳයි, දෙවියන්ගේ පිහිටෙන් ඒ මම නම් වෙන එකක් නැහැ !"

"මම හිතනවා අලුත් ළමයිනුත් ඇති කියලා." ඩැරල් කිව්වා. "එයාලා කොහොම අය ද කියලා දැන ගන්න එකත් විනෝදයක්, නේද ?"

"අනිවාර්යයෙන්ම කිප දෙනෙක් ඇති." සැලී කිව්වා. "මෙ... කොහොමද මේරි ලෝව් නායිකාව කියලා කිව්වොත් ?"

දැරියෝ දෙදෙනාම හඬ නගා සිනාසුණා. සැලී හා ඩැරල් දෙදෙනාම වෙනුවෙන් මේරි ලෝව් කැප වී සිටි අතර ඇගේ විරුවරිය ඩැරල් වුව ද දෙදෙනාම කුඩා මේරි ලෝව්ට මහත් සේ ඇලුම් කළා. එහෙත් ඇය වගකීම් ගැන මතක් කරන විටදී පවා ඇකිළෙන බියගුලු ස්වභාවය කොතරම් හාස්‍ය දැයි මතක්ව ඇය පන්තියේ නායිකාව බවට පත් කළ හොත් ඇගේ මුහුණ කුමන විකාර ස්වරූපයක් ගනිදැයි ඔවුන්ට මැවී පෙනුණා.

"බයටම කලන්තේ දාලා ගිනි ගනියි." ඩැරල් කිව්වා. "ඒත් දැන් එයා හුඟාක් හොදයි සැලී. මතකද එයා බය වුණාම දණිස් ගැහෙන හැටි ? දැන් හුඟාක් දුරට ඒක අඩුයි. අපි හුඟාක් එයාට විනීතව සලකලා බය නොකරන නිසා එයාට තමා ගැන විශ්වාසයක් ඇතිවෙලා තියෙනවා. දැන් එයා වෙනස්. එයා ඒතරම් නරක කෙනෙක් වෙන එකක් නැහැ."

පාසල පිහිටි කොන්වෝල් බලා යාම ඉතාම ඉතා දිගු ගමනක් වුණා. පාර පසෙක තණ බිම් හෝ කුඩා පඳුරු සහිත බිම් පෙදෙස්වලදී ගමන වරින් වර නැවතූ ඔවුන් සුළු සුළු ආහාර ගත්තා. තම ස්වාමිපුරුෂයාට විවේකයක් දීමට රිවර්ස් මහත්මිය රිය පැදවීම භාර ගත්තා. පසුපස අසුනේ සිටි දැරියෝ ගමන දික්වන අතරේ කතා බහ කරන්නටත්, නිදි කිරා වැටෙන්නටත් වුණා. "දැන් ඒ තරම් දුරක් නැහැ." රිවර්ස් මහතා නැවත රිය පැදවීම භාර ගනිමින් කිව්වා. "ඉස්කෝලෙට යන තවත් කාර් අපිට හම්බ වෙයි. මඟ කාර් තියෙනවාද කියලා බලන්න."

ඉක්මනින්ම ඔවුන් එකක් දැක්කා. ඒ අයිරින්ගේ පවුලේ උදවියගේ කුඩා රතු මෝටර් රථය. පසුපස අසුනේ සිටි අයිරින් රියදුරු අසුනේ සිටි පියාගේ උපැස් යුවළ ද වැටෙන තරම් වියරුවෙන් මෙන් අත වනන්නට වුණා. මෝටර් රථය වහා පසෙකට කැපුණා.

"ඒ අයිරින්ගේ හැටිම තමයි නේද?" සිනාවක් පාමින් සැලී කිව්වා. "හේයි, අයිරින් නිවාඩුව හොඳ ද?"



රථ දෙකම මොහොතකට සමාන්තරව වැටුණ අතර දැරියෝ අයිරින්ගේ ප්‍රීතිමත් මුහුණ දෙස බැලුවා. ඔවුන් ඇයට ඇලුම් කළා. ඇය දක්ෂ දැරියක්. විශේෂයෙන් සංගීතයට, නමුත් නිතරම තමන්ගේ දේවල් තැන තැන දමා ඒවා අමතක කරන සැබෑ මෝඩියක්. එහෙත් ඇය නිතර කෙළි දෙළෙන් පසුවන අයෙකු නිසා කිසිවෙකුට ඇය සමග අමනාපව සිටිය නොහැකි වුණා.

"අන්න තව කාරෙකක් ! කාගෙද ඒක ?" හරස් පාරකින් තුන් වෙනි රථයක් ද මතුවෙද්දී සැලී කිව්වා. එය වේගයෙන් ඔවුන් පසු කර ගියා.

"ලොකු ළමයෙක්" ඩැරල් කිව්වා. "ජෝර්ජිනා තෝමස් වගේ. මම කල්පනා කරන්නේ ප්‍රධාන ශිෂ්‍ය නායිකාව කවුරු වෙයිද කියලයි. පැමෙලා දැන් අස්වෙලා ගිහින්. ජෝර්ජිනා නම් වෙන්න එපා. එයා හැම දේකටම ලොකුකම් පෙන්නනවා."

මේ වන විට ඔවුන් පාසලට බොහෝ සමීපව සිටි අතර එක් වංගුවකදී එය දර්ශනය වන්නට වුණා. දැරියෝ එදෙස බැලුවේ නිහඬවීමෙන්. ඔවුන් දෙදෙනාම දැඩි ලෙස පාසලට ඇලුම් කළ අතර පාසල ගැන බොහෝ ආඩම්බර වුණා. සිව් දිශාවේම කුලුනු සහිත විශාල අළු පැහැ රවුම් ගොඩනැගිල්ල ඔවුන් දැක ගත්තා. රතු පැහැයට හැරෙමින් තිබූ වැලක් වහලයේ මුදුනටම වැඩී තිබුණා.

"අපේ මන්දිරය !" ඩැරල් ආඩම්බරයෙන් කිව්වා. "මැලෝරි ටවර්ස් ලෝකයේ තියෙන හොඳම ඉස්කෝලේ."

ඉක්මනින්ම මෝටර් රථය විශාල පිවිසුම් දොරටුව අසල වූ පියගැට පෙළ වෙතට ළඟා වුණා. තවත් මෝටර් රථ අවට තිබූ අතර සතුටු සාමීචියේ යෙදුණ දැරියෝ ඒවා අසල සිටගෙන සිටියා. සතුටු කටහඬවල් සෑම තැනම පැතිරුණා.

"හෙලෝ ලුසී ! අන්න, බලන්න ෆ්‍රෙඩා ! එයා ටිකක් කළුවෙලා නේද ? නිවාඩුව කොහොමද, ෆ්‍රෙඩා ? ඔයා හුඟාක් වතුරේම ඉඳලා වගේ පෙනෙනවා. ඔයා ටිකක් කළුවෙලා."

"හලෝ ජෙනි ! මගේ ලියුම ලැබුණ ද ? මට උත්තරයක් එව්වේ නැහැ, ඊට්. හේයි වෙසී, බලාගෙන මගේ බෑග් එක, ඔයාගේ අලි කකුල පැත්තකට ගන්න !"

"ආයුබෝවන්, අම්මා ! ආයුබෝවන්, තාත්තා ! මම ඉක්මනටම මෙතැනට හැඩගැහිලා ලියුමක් එවන්නම්. මගේ චූටි මී පැටියට කෑම දෙන්න අමතක කරන්න එපා, හොඳ ද ?"

"ඔය පාරෙන් අයින් වෙන්න ! අර කාර් එක යට කරගෙන යයි ! ඕ, ඒ බෙට් හිල්. බෙට්, බෙට් ! ඔයා මොනවා හරි විජ්ජා ටිකක් අරගෙන ආව ද ?"

මෝටර් රථයේ කවුළුවෙන් කපටි දෙනෙත් යුවළක් එබී එම මුහුණේ නළල මතට කෙස්රොදක් කඩා වැටුණා. "මා ළඟ මොනවා හරි ඇති." පිටතට පා තබමින් බෙට් කිව්වා. "ඔයාට හිතා ගන්නවත් බැහැ. කවුරුවත් ඇලිසියාව දැක්කා ද ? අපොයි, එයා තවම ඇවිත් නැද්ද ?"

"කෝච්චියේ එන ළමයි තවම ඇවිත් නැහැ ! අපි ගිහින් අපේ නිදන කාමර බලා ගනිමු ද ? එන්න."

"ඩැරල් ! ඩැරල් රිවර්ස් ! හෙලෝ, ඉතින් ! ඔහෝ, සැලී. එහෙනම් ගිහින් නිදන කාමර බලමු !"

මොන ශබ්දයක් ද! මොන ඝෝෂාවක් ද ! ඩැරල්ට දැනුණේ මහත් සතුටක්. මැලෝරි ටවර්ස් වෙතට පැමිණීම මහත් සතුටක්.



## 02

පාසලට පැමිණි පසු ඩැරල් තම දෙමව්පියන්ට සමු දුන් අතර ඔවුන් සතුටින් මෝටර් රථයෙන් පිටව ගියා. සමුගැනීමේදී කල්පනාකාරීව කලබලයකින් තොරව තම දෙමාපියන් පිටව යාම ගැන ඩැරල් හැම විටම සතුටු වුණා. ගොන්ඩොලින්ගේ මව සෑම විටම කඳුළු සලන අයුරින් ඔවුන් සමුගත්තේ නැහැ. ඇය ඔවුන් අසල දැවටෙමින් දුක්වන බවක් පළ කිරීම ඔවුන් අපේක්ෂා කළේ නැහැ. වෙනදා මෙන් සුපුරුදු පරිදි කතාබස් කර සිනාසී නැවත වාර මැද නිවාඩුවේදී එන බවට පොරොන්දු වූ ඔවුන් ඇයව සිප ප්‍රීතිමත්ව අත වනමින් රථයට නැඟී පිටත් වුණා.



ඉක්මනින්ම ඈ හා සැලී තම කුඩා බෑග රැගෙන විශාල ශාලාවට ඇතුළු වුණා. ඔවුන් ලැක්රෝස් පිති ද රැගෙන ගිය අතර ඒවා ඒ මේ අත දුවන දැරියන්ගේ සිරුරේ පැටලෙන්නට වුණා.

ශාලාව මැද පොට්ස් ගුරුතුමිය සිටියා. ඔවුන් පළමු පන්තියේ සිටියදී ඇය පන්තිභාර ගුරුතුමිය වූ අතර ඇය තවමත් උතුරු කුලුන භාර ගුරුතුමිය හෙයින් ඇය තවමත් ඔවුන්ගේ ගුරුතුමිය වුණා. ඒ ඔවුන්ගේ නිදන කාමර තිබුණේ පොට්ස් ගුරුතුමිය යටතේ වූ නිවස්නා ප්‍රදේශයේ නිසයි. සියලුම දැරියන්ගේ නිවස්නා හෝ නිදන කාමර සියල්ලම කුලුනු මත තිබූ අතර ඒ සෑම කුලුනක්ම භාරව නිවාස පාලිකාවක් සිටියා.

සැලී හා ඩැරල් දුටු පොට්ස් ගුරුතුමිය ඔවුන්ට කතා කළා. "සැලී ! ඩැරල් ! මා වෙනුවෙන් මේ අලුත් ළමයාව බලාගන්නවා ද? මෙයා ඔයාලගේ නිදන කාමරයට එන නිසා ඔයාලා එක්ක දෙවැනි පන්තියට එනවා. මෙයාව මේට්‍රන් ළඟට එක්ක යන්න."

පොට්ස් ගුරුතුමිය අසල බියට හා චකිතයට පත් උස් සිහින් දැරියක් සිටියා. මැලෝරි ටවර්ස් වෙත තමා පැමිණි පළමු දිනයේ කොතරම් තනිකමක් දැනුණේදැයි සිහි වූ ඩැරල්ට දැරිය ගැන දුක සිතුණා. සැලී ද සමග ඈ දැරිය වෙතට ගියා.

"හෙලෝ ! එන්න අපිත් එක්ක. අපි ඔයාට උදව් කරන්නම්. ඔයාගේ නම මොකක් ද ?"

"එලන් විල්සන්" දැරිය කිව්වා. ඇයට තිබුණේ සුදුමැලි මුහුණක් හා වෙහෙසට පත් පෙනුමක්. ඇගේ නළල මැද, නිතර නළල රැලි ගන්වාගෙන කල්පනා කිරීම නිසා ඇති වූවාක් බඳු ගැඹුරු රේඛාවක් තිබුණා. ඩැරල් ඇයට එතරම් කැමැත්තක් නොතිබුණ ද ඈ කාරුණික මඳ සිනාවක් පෑවා.

"මම හිතන්නේ මේ කලබල මැද්දේ ඔයාගේ හිත අවුල්වෙලා ඇති නේද ?" ඈ කිව්වා. "ගිය අවුරුද්දේ මම ආපු වෙලාවේ මටත් එහෙම වුණා. මගේ නම ඩැරල් රිවර්ස්. මේ මගේ යාළුවා සැලී හෝප්."



දැරිය විනීතව මඳ සිනාවක් පා නිහඬව ඔවුන් පසු පසින් ආවා. තෙරපෙමින් රැස්කන දැරියන් අතරින් ඔවුන් මඟ සලසා ගත්තා.

"අන්න, මේරි ලෝව් !" ඩැරල් කිව්වා. "හෙලෝ, මේරි ලෝව්. ඔයා දැන් ලොකුයි. !" මේරි ලෝව් සිනාවක් පෑවා. "එහෙම ඇති !" ඇය කිව්වා. "පන්තියේ චූටිම කෙනා වෙලා ඉඳලා මට දැන් ඇති වෙලා. කවුද මේ ?"

"එලන් විල්සන්. දෙවන පන්තියට අලුත් කෙනෙක්. "ඩැරල් කිව්වා.

"අපේ නිදන කාමරයට" සැලී එකතු කළා. "එයාව අපි මේට්‍රන් ළඟට එක්ක යනවා. අන්න අයිරින් ඉන්නවා. අයිරින් අපි දැක්කා ඔයා අපිව දැකලා අත වනද්දි තාත්තාගේ කණ්ණාඩිය ගැලවිලා වැටෙන්න යනවා."

අයිරින් සිනාවක් නැගුවා. "ඔව්, ඒක සිද්ධ වුණ තුන් වෙනි වතාව ඒ. තාත්තාට මාව එපා වෙන්න එන්නේ. ඔයාලා මේට්‍රන් ළඟට ද යන්නේ ? මමත් එන්න ද ?"

"ඔයාගේ සෞඛ්‍ය වාර්තාව තියෙනවා ද ?" සැලී රහසින් ඇසුවා. අයිරින්ගේ මව එය කොතරම් ප්‍රවේසමෙන් ඇගේ ඇඳුම් බෑගයේ ඇසුරුව ද එය ලියුම් කවරයක දමා ඇගේ සාක්කුවකට දැම්ම ද එය නැතුව අයිරින් එන බව දැන සිටි දැරියෝ එය විහිළුවක් කර ගෙන තිබුණා.

"ඔයාට තියෙනවා ද ?" ඩැරල්, එලන් විල්සන්ගෙන් ඇසුවා. "අපට ඉස්සරලාම ඒක භාර දෙන්න සිද්ධ වෙනවා. සරම්ප හරි, පැපොල හරි හැදුණ කෙනෙක් අහලකවත් හිටියේ නැහැ කියලා සහතිකය භාර දුන්නට පස්සේ අසනීපයක් හැදුණොත් එහෙම ඉඳලා ඉවරයි. දෙවියනේ, අයිරින්, ඔයා මේ සැරෙත් ගෙනාවේ නැහැ කියන්නේ ඇත්ත ද ?"

මුහුණේ හාස්‍යජනක පෙනුමක් සහිතව කලකිරුණු ස්වභාවයෙන් අයිරින් සියලු සාක්කු අතපත ගාන්නට වුණා. "කොහෙද කියලා හොයා ගන්න බැහැ." ඇය කිව්වා. "මගේ ඇඳුම්

බෑග් එකේ ඇති. ඒත් නැහැ. අම්මා කිව්වා නිතරම ඒක නැතිවෙන නිසා ඒක බෑග් එකට දාන්නේ නැහැ කියලා. අපොයි!"

"මෙට්‍රන් කිව්වා ඊළඟ සැරේ ඔයා සෞඛ්‍ය වාර්තාව නැතිව ආවොත් තනි කරලා තියනවා කියලා." සැලී කිව්වා. "අම්මා සහතිකයක් එවන තුරු ඔයාට අසනීප කාමරයේ දවස් දෙකක් ඉන්න වෙනවා. ඔයා නම් ඇත්තටම මෝඩියක්, අයිරින්."

කලබලයෙන් සෑම සාක්කුවක්ම සෝදිසි කළ අයිරින්, සැලී, ඩැරල් හා එලන් පසුපසින් ගොස් උතුරු කුලුනට ඇතුළු වුණා. දෙවැනි පන්තියේ නිදන කාමරය තිබුණේ ඩැරල් පසුගිය වාර හතර පුරා නිදා ගත් පළමු පන්තියේ නිදන කාමරවලට වැඩි දුරකින් නොවෙයි. එය තිබුණේ දෙවන මහලේ වූ අතර සුන්දර පරෙවි පියාපත් මෝස්තරවලින් සැදි සුදු ඇඳන් දහයකින් යුතු වූ එය විශාල කාමරයක් වුණා.

තම බෑග නිදන කාමරයේ අත හළ දැරියෝ නේවාසිකාගාර පාලිකාව සොයා ගියා. ඇය අලුත් දැරියක නිදන කාමර වෙත කැටුව යමින් සිටියා. අලුත් දැරිය ඩැරල්ගේ වයසේම සිටි අතර ඩැරල්ගේ මෙන් වූ කළු රැලි කොණ්ඩයක් ඇයට තිබුණ ද පිරිමි දරුවෙකුගේ මෙන් කොටට කපා තිබුණා. ඇය තරමක් අපිරිසිදු හා අපිළිවෙළ බවක් පළ කළ ද ඈට තිබුණේ සිත් ඇදගන්නා පෙනුමක් වූ අතර ඇය දැරියන් දෙස බලන විට ඇගේ දෑස් දිලිසුණා. එලන් මෙන් ඇය අතරමං වූ හෝ හුදෙකලා වූ හෝ පෙනුමකින් යුතු වූයේ නැහැ.

"ඔහ්, සැලී, ඩැරල්, මෙන්න තවත් අලුත් ළමයෙක්," නේවාසිකාගාර පාලිකාව කඩිනමින් කිව්වා. "මෙයාව බලාගන්නවා ද? මෙයාගේ නම බෙලින්ඩා මොරිස්. දැන් ඔයාලගේ ඇඳුම් බෑග් තියෙනවා ද ? කොහොම ද සෞඛ්‍ය වාර්තා තියෙනවා ද ?

"අපේ ඇඳුම් බෑග් අතන" ඔවුන් බෑග් දැමූ තැන දක්වමින් ඩැරල් කිව්වා. "මෙන්න මගේ සෞඛ්‍ය වාර්තාව, මෙට්‍රන්."

"කෝ මගේ ඇඳුම් බෑග් එක ?" හදිසියේම බෙලින්ඩා ඇසුවා.



"දැන් මිනිත්තුවකට ඉස්සර ඔයා ළඟ තිබුණනේ." පාලිකාව වටපිට බලමින් කිව්වා. "හොඳයි, සහතිකය මට දීලා ගිහින් බෑග් එක හොයන්න."

"ඒක බෑග් එකේ." කී බෙලින්ඩා දුර්වලව වටපිට බැලුවා.

"අනික් අය හැප්පිලා වැටෙන්න අනිවාර්යයෙන්ම ඔයා ඒක ශාලාවේ දාලා ඇවිදින්." පාලිකාව කිව්වා. "මේ ළමයි ! මේ ඔයාගේ සහතිකය ද සැලී ?, ඔයාගේ එක මේරි ලෝව්, එතකොට ඔයාගේ එක. එලන්, කෝ ඔයාගේ එක, අයිරින් ?"

"හරි අමුතු දෙයක්, මෙට්‍රන්" සාක්කු අදිමින් අයිරින් පටන් ගත්තා. "මම උදේ එද්දි මා ළඟ තිබුණා. මට මතකයි අම්මා කිව්වා...."

සැබැවින්ම කෝපව පාලිකාව අයිරින් දෙස රවා බැලුවා. "අයිරින්, ඔයා ආයෙත් ගෙනත් නැහැ කියලා නම් කියන්න එන්න එපා. ඔයා දන්නවා පසුගිය වාරයේ මම කියපු දෙය. මෙහේ නීතියක් තියෙනවා සෞඛ්‍ය සහතිකය ගේන්න අමතක කරන ළමයි සහතිකය ඉදිරිපත් කරන තුරු තනිකරලා තියන්න. මට තවම ඒ නීතිය ක්‍රියාත්මක කරන්න ලැබුණේ නැහැ. ඒත්, ඔයා ගැන නම් මට ඇත්තටම හිතෙන්නේ...."

"අනේ, මෙට්‍රන්, මාව තනි කරන්න එපා." තම කුඩා ඇඳුම් බෑගයේ තිබූ ලට්ට ලොට්ට සියල්ල බිමට හළමින් අයිරින් ආයාචනා කළා. "මම හොයාගන්නම්.... හොයා ගන්නවාමයි !"

දැරියෝ සිනාසෙමින් සිටගෙන සිටියා. ඇත්තෙන්ම යමක් නැති වූ විට අයිරින් හරිම හාස්‍යජනකයි. පාලිකාව තරහින් බලා සිටියා. අයිරින් බිමට නැඹුරුව දැඩි සේ සෝදිසි කරමින් සිටියා. හදිසියේම කෑ ගැසූ ඇ පපුවට අත තබා ගත්තා.

"ඌහ්, මොකක්ද ඇනෙනවා ! ඒ මොකක් ද ? මොකක් හරි තදේට ඇනෙනවා."

නැගිට ගත් ඇ පපුව අත ගෑවා. අනතුරුව ඇ තම උඩු කබායේ ඉදිරිය විවෘත කළා. ඒ සමගම දැරියෝ හඬ නගා සිනාසුණා.

"අයිරින් ! මී හරකි ! ඔයාගේ සහතිකය ඉස්සරහට කියලා ඇල්පෙනෙත්තක් ගහලා ! උවමනාවෙන්වත් ඔයාට ඒක නැති කර ගන්න බැහැ."

පහත බැලූ අයිරින් සතුටට පත් වුණා. "ඇත්තෙන්ම !" ඇල්පෙනෙත්ත ගලවමින් ඇ කිව්වා. "දැන් මතකයි. මේක එල්ලා ගත්තේ නැත්නම් නැතිවෙයි කියලා මම දැනගෙන හිටියා. මෙන්න තියෙනවා, මෙට්‍රන්. කොහොම හරි, දැන් ඔයාට මාව තනි කරන්න වෙන්නේ නැහැ."

එය ගෙන අනෙක් ඒවා සමග තබා ගත් පාලිකාව කතා කළා. "නුලෙන් බේරුණේ, අයිරින්" කී ඇගේ පෘෂ්ඨීමත් මුහුණේ සිනාවක් නැඟුණා. "හැම වාරයකම ආරම්භයේ ඔයා මගේ හිසකෙස් පැහෙන වැඩ කරන්නේ. දැන්, ළමයි, ඔයාලගේ බෑග්වල බඩු අස්කර ගන්න. හෙට වෙනතුරු ට්‍රන්ක පෙට්ටිවල බඩු එළියට ගන්නේ නැහැ. ඊට පස්සේ හැම කෙනෙක්ම ගෙනැවිත් තියෙන ඇඳුම් ලැයිස්තුව පරීක්ෂා කරන්න ඕනෑ."

කෑඳ ඇමූ ඒප්‍රනයේ ගොරෝසු හඬක් නඟමින්, ආපසු එන දැරියන්ගේ සහතිකත්, නම් හා සියලු දේවලුත් බැලීමට ඇය පිටව ගියා. උතුරු කුලුනේ ගොඩනැගිල්ලට එන පනහක් හැටක් පමණ දැරියන් පිළිගැනීමට හා ඔවුන්ගේ අඩුපාඩුකම් සෙවීමට ඇයට සිදුව තිබුණා. අනෙකුත් කුලුනු තුනේ ද පාලිකාවෝ එම කාර්යයම සිදු කරමින් සිටියා. දැරියන් දෙසිය පනහක් පමණ හා ඔවුන්ගේ ට්‍රන්ක පෙට්ටි, ඇඳුම් බෑග හා අනෙකුත් දේ සමග ඔවුන්ව පිළිගැනීම සැබැවින්ම භාරදූර කාර්යයක් වුණා. !

බෙලින්ඩා තම ඇඳුම් බෑගය සෙවීමට ඉබාගාතේ ගොස් තිබුණා. අනෙක් අය ඔවුන්ගේ දේවල් බෑග්වලින් එළියට ගනිමින් සිටින අතරේ දුඹුරු පැහැ සූට් කේසයක් ද ගෙන ඇ ගාටමින් ආවා. එය විවෘත කළ ඇ පිජාමාවක් ඇද එළියට ගත්තා. ඇය විමතියෙන් ඒ දෙස බැලුවා.

"දෙවියනේ! මට මතක නැහැ මට මේ වගේ පිජාමා එකක් තිබුණා කියලා." ඇය කිව්වා. "තව ලස්සන සෙරෙප්පු දෙකකුත් අම්මා මට දාලා. මාව පුදුම කරන්න වෙන්න ඇති මම හිතන්නේ."



ඩැරල් උරපතු මතින් මුහුණ හරවා බැලුවා. ඇ සිනාවක් නැගුවා. "තවත් දේවල් එළියට ගත්තොත් ඔයා අමාරුවේ වැටෙනවා." ඇ කිව්වා. "ඕවා අයිති ජෝර්ජිනා තෝමස්ට! එයාගේ බෑග් එක ඔයා ගෙනැවිත් කියලා දැන ගත්තොත් එයාට හොඳටම තරහා යයි. එයා පණ කඩාගෙන හැම තැනම බෑග් එක හොයනවා ඇති. ඔයා අකුරු දන්නේ නැද්ද බෙලින්ඩා ?"

තම නැති වූ බෑගය සොයා ගැනීමේ අදහසින් ඇ නැවතත් පිටත්ව ගියා. අයිරින් දෙස බැලූ ඩැරල් සිනාවක් පෑවා.

"මම දන්නේ නැහැ ඔයා වගේ දෙන්නෙක්ම අපිට ඉන්නවා නම් අපි මොනවා කරන්නද කියලා, අයිරින් !" ඇ කිව්වා. "එක්කෙනෙක් මදිවට - දෙන්නෙක්ම ! ඔයාලා නිසා මම්සලී පුපුරයි. ඒ වගේම අපේ පන්තිභාර මිස් පාකර්, ඔයා දන්නවා එයා කොයි වගේ ද කියලා ! දූර්වලකම්, නොසැලකිල්ල එයාට පේන්න බැහැ. මේ වාරයේදී ඔයයි, බෙලින්ඩයි නිසා පන්තියේදී අපිට ලොකු විනෝදයක් තියෙයි !"

බෙලින්ඩා නැවත ඉක්මනින් ආපසු පැමිණියා, මෙවර වාසනාවකට මෙන්, තමාගේම බෑගය සමග. ඇය සෑම දෙයම එළියට ඇද දමා ඉන්පසු අනෙක් අය මෙන් ඒවා නිසි පරිදි තබන්නට වුණා.

හදිසියේම තරප්පු පෙළින් මහත් සෝෂාකාරී හඬක් නැගෙන්නට වූ අතර දැරියෝ හිස් ඔසවා බැලුවා. "කෝච්චියේ එන ළමයි ! අන්තිමට එයාලත් ආවා. එයාල පරක්කු නැද්ද ?"

තවත් දැරියෝ ඝෝෂාකාරීව නිදන කාමරයට පැමිණුනා. දිලිසෙන ඇසින් යුතුව ඇලිසියා ජෝන්ස් පැමිණුනා. ඊට පසුපසින් ආවේ සාජු, බුද්ධිමත්, ස්කොට්ලන්ත දැරිය, ජීන්. අනතුරුව මැහුම් වැඩවලට මහත් උනන්දුවක් දක්වන හා එම්බ්‍රොයිඩර් වැඩවලට මහත් දක්ෂ වූ නිහඬ දැරිය, එමිලි. "එක, දෙක, තුන, හතර, පහ, හය, හත, අට, අපි අට දෙනෙක්" ගණන් කරමින් ඩැරල් කිව්වා. "තව දෙන්නෙක් එන්න ඉන්නවා. ඒ කවු ද ?"

"එක්කෙනෙක් ගොන්ඩොලින් මේරි, මම හිතන්නේ" මුහුණ ඇඹුල් කර ගනිමින් අයිරින් කිව්වා. "හුරතල් ගොන්ඩොලින් මේරි!

මේ, මම හිතන්නේ එයාගේ අම්මා තවමත් හුරතල් බැටළු පැටියා
නැහැ කියලා අඬනවා ඇති ! කවුද අනිත් කෙනා ?"

"මෙන්න ගොන්ඩොලින් එනවා." ඩැරල් කී අතර දැරියන්ට සුපුරුදු තරමක් අඳෝනාවක් බඳු කටහඬ ඇසුණා. ගොන්ඩොලින් පවුලේ හරක් වූ එකම දරුවා වූ අතර මැලෝරි ටවර්ස් පාසල ඇයට යහපත් යමක් කරනු ඇතැයි සිතුවද නිවාඩුවකට පසු නිතරම ඈ පැමිණියේ තව දුරටත් හරක් වෙලයි.

ඈ ඇතුළට පැමිණියා. ඇය සමඟ දස වෙනි දැරිය ද සිටියා. ගොන්ඩොලින් මේරි ඇයව හඳුන්වා දුන්නා. "ආයුබෝවන් හැමෝටම! මේ ඩැෆනි මිලිසන්ට් වර්නර්. අලුත් ළමයෙක්. එයා ඉන්නේ අපේ පන්තියේ වගේම අපේ නිදන කාමරයේ. එයා ආවේ මා එක්ක එකම කෝච්චි පෙට්ටියේ නිසා මම හිතනවා, වැඩි කල් යන්න ඉස්සර අපේ හොඳම යාළුවෙක් වෙයි කියලා !"



## 03

ඈත්තෙන්ම අලුත් දැරියක් හඳුන්වා දීමට මෙය ඉතාම අනුවණ ක්‍රමයක්. ඒ විශේෂයෙන්ම ගොන්ඩොලින්ගේ ප්‍රියතම කෙනෙකු කිසිදින අන් අයගේ ප්‍රියතම කෙනා නොවන්නට ඉඩ ඇති බව අසා සිටි දැරියන්ට දැනෙන නිසයි ! හිස සිට දෙපතුල දක්වා හොඳින් බලමින් දැරියෝ නවක දැරියට මඳ සිනාවක් පෑවා.

ඇය ඉතා සුන්දරයි. ඇගේ නළල මත වූ රන්වන් හිස කෙස් රැලි ගැසී තිබූ අතර ගොන්ඩොලින්ගේ විශාල මලානික දෑසට වඩා ඇගේ දෑස් තද නිල් පැහැයෙන් යුතු වුවද ගොන්ඩොලින්ගේ දෑසට වඩා සමීපව ඇගේ දෑස් පිහිටීම නිසා ඇගේ මුහුණට කපටි බැල්මක් ලැබී තිබුණා. ඇගේ සුදු දත් දෙපෙළ නිසා ඇයට තිබුණේ සුන්දර සිනාවක්.

ඇය එම සිත් ඇද ගන්නා සිනාව ප්‍රයෝජනයට ගත්තා. "මම මැලෝරි ටවර්ස්වල ඉන්න හුඟාක් ආසයි." ඇය කිව්වා. "මම කවදාවත් ඉස්කෝලෙකට ගිහින් නැහැ මීට ඉස්සර."

"ඒක අපි දෙන්නාටම පොදු එක දෙයක් !" සතුටු ස්වරයකින් ගොන්ඩොලින් කිව්වා. "මමත් මෙහෙ එන්න ඉස්සර ඉස්කෝලයකට ගිහින් තිබුණේ නැහැ."

"ගිහින් තිබුණා නම් තමයි හොඳ." ඇලිසියා කිව්වා. "ඔයාට හැදෙන්න තව හුඟාක් දේවල් ඕනෑ, ගොන්ඩොලින්. මම හිතන්නේ වෙනදා වගේ මේ නිවාඩුවේදිත් ගෙදරදි ඔයාගේ අතට පයට හැමදේම කරලා දීලා තියෙනවා වගේ. ඔයාගේ අම්මයි, ආයයි දෙන්නම කියනවා ඇති ඔයා තමා මේ ලෝකේ ඉන්න අපූරුම ළමයා කියලා."

ගොන්ඩොලින් හිත රිදුණ බවක් පෙන්නුම් කළා. "... දැක්ක ගමන්ම ඔයා මට නපුරු වෙන්න එපා, ඇලිසියා." ... කිව්වා. "එන්න ඩැෆනි. මම පෙන්වන්නම් කරන්න ඕනෑ දේවල් ... ඔයා ඉන්නෙත් අපේ ලස්සන නිදන කාමරයේ. මට පුළුවන් ... ඔයාට වටපිටේ හුඟාක් දේවල් පෙන්වන්න. පළමු දවසේ ... මේවා දකිද්දි හැඟුණ දේවල් මට මතකයි."

ඩැෆනි කෘතවේදී බවක් පළ කළා. ඇයට ඉතා විනීත ... පැවතුම් තිබූ අතර යමෙකු ඇයට කළ යුතු දේ පෙන්නුවොත් ... කිවහොත් ඇ නිතරම කදිම ලෙස ස්තුති කළා. ඇ සැබැවින්ම ... සුන්දර හා සුකුමාල දැරියක් වුණා. ඇගේ මිතුරිය හා උදව්කාරි... වීමට යම් කාරණයක් නිසා ගොන්ඩොලින් හිත හදා ගෙන ඇ... බව පැහැදිලිව පෙනුණා.

"මම කිව්වේ එයා කාට හරි මෝඩ විදිහට රැවටෙයි කියලා" ... රාත්‍රී ආහාරය සඳහා පහළ මාලයට බසින අතරතුරේ සැලී, ඩැරල් ... කිව්වා. "හොඳයි, එයා ඩැෆනිව ඔළුව උඩින් තියාගත්තාවේ. ... නම් එයාගේ මෝස්තර වැඩියි !"

"ගොන්ඩොලින් කියනවා ඩැෆනිගේ තාත්තා කෝටිපතියෙක් ... කියලා." ඩැරල් කිව්වා. "එයාට ආයා කෙනෙක්, නර්ස් කෙනෙක් ... එයාටම සේවිකාවක් හිටියලු මෙහාට එන්න ඉස්සර !"

"ඕ, ඒක තමයි හුරතල් ගොන්ඩොලින් එයා පස්සෙන් ... වැටිලා ඉන්නේ." සැලී කිව්වා. "මම හිතුවා මොකක් හරි ඇති ... කියලා. හේයි, අයිරින්, ඔයා තවමත් තොප්පිය දාගෙන! කෑම ක... අතරේ ඕක දාගෙන ඉන්න ඔයාට විශේෂ හේතුවක් තියෙනවා ද?"

"අපොයි" කියමින් අයිරින් හිසේ අත ගසාගත්තා. "... තවමත් තොප්පිය දාගෙන ද ? බෙලින්ඩා, ඔයා මට කියන්න ... එපායැ !"

බෙලින්ඩා සිනාවක් පෑවා. "එහෙම දෙයක් දැක්කද කියලා ... මට මතක නැහැ." ඇ කිව්වා. "මෙහේ හුඟාක් දේවල් අමුතු ... වගේ පෙනෙන්නේ දැනට. කෑම වෙලාවට තොප්පියක් දාගෙන ... ඉන්න එක අසාමාන්‍ය දෙයක් වගේ පෙනෙන්නේ නැහැ."



"ඔයාල නම් අපූරු ජෝඩුවක්." සැලී කිව්වා. "එන්න, ඩැරල්. එන්න, මේරි ලෝව්. අපි ඉක්මන් නොකළොත් කෑමත් නැහැ."

එදින රාත්‍රියේ සියලු දැරියෝ වෙහෙසට පත්ව සිටි අතර දෙවැනි පන්තියේ දැරියෝ ඇඳන්වලට පැන ගැනීමට සූදානම් වුණා. ගොන්ඩොලින් ඩැෆනිගේ ඇඳ ළඟම ඇඳ තෝරාගෙන තිබුණා. "ඔයාට ගෙදර ගැන දුක හිතෙනවා නම් මට කියන්න." ඇය ඩැෆනිට කිව්වා. නිල් පිජාමාවකින් සැරසී පොකුටු රන්වන් කෙස් කලඹ උර හිස මත විදහා ගෙන සිටි ඩැෆනි සුන්දරව පෙනුණා. ගොන්ඩොලින්ගේ ද හිස කෙස් රන්වන් වුවද රැලි ගැසී තිබුණේ නැහැ. ඇ ඩැෆනිගේ රැලි කොණ්ඩයට ඊර්ෂ්‍යා කළා.

"මට හිතෙනවා මට ටිකක් අමුත්තක් දැනෙයි කියලා." ඇඳට නඟිමින් ඩැෆනි කිව්වා. "බලන්න, හුඟාක් අය මගේ වටේට ඉන්න එක මට හුරු නැහැ. මම් එනවා මට හාද්දක් දීලා යන්න. මම හරිද කියලා බලන්න ආයා එබිලා බලනවා. එතකොට මගේ හිත තැන්පත් වෙනවා. මම...."

"වෙන කතා බැහැ." සැලී හදිසියේ කිව්වා. ගොන්ඩොලින් ඇඳේ වාඩි වුණා. "ඔයා පන්තියේවත් නිදන කාමරයේවත් නායිකාව නොවෙයි සැලී" ඇ කිව්වා. "එහෙම නියෝග දෙන්න එපා !"

"මම නායිකාව නොවෙයි" සැලී කිව්වා. "ඔයා නීතිය දන්නවා, ගොන්ඩොලින්. මම ඒක මතක් කළා විතරයි."

ගොන්ඩොලින් වැතිරුණා. නැවත කෙඳුරුම ආරම්භ වුණා. සැලී කෝප වුණා. "කටවහනවා, ගොන්ඩොලින්. කතා කිරීම නවත්වන වෙලාව පහුවෙලා. දැන් හුඟාක් වෙලා ගියා. අපි හැමෝටම නිදා ගන්න ඕනෑ."

"තමුසේ නායිකාව වෙනකම් ඉන්නවා. ඊට පස්සේ මම කියන දේ අහන්නම්. ඊට ඉස්සර නම් බැහැ." තම අලුත් පොහොසත් මිතුරිය ඉදිරියේ ලොකුකම් පෙන්වීමට මාන බලමින් සිටි ගොන්ඩොලින් කිව්වා. "හෙට අපි හැමෝටම දැන ගන්න පුළුවන් නායිකාව කවුද කියලා."

"හරි. ඒ තමුසේ නම් නොවෙයි." ඇලිසියාගේ තද කටහඬ කාමරයේ කෙළවරින් මතුවුණා.

"ෂ්...ෂ්." අඩි ශබ්දයක් ඇසුණ ඩැරල් හඬ නැඟුවා. ඒ නේවාසිකාගාර පාලිකාව. ඇය නිහඬව පැමිණියා. අවදිව සිටින දැරියන් දැක ඇ කරුණාවන්තව කතා කළා. "තවම නිදි නැද්ද? දැන් කතා නවත්වලා නිදාගන්න. සුබ රාත්‍රියක් !"

ඇ පිටව ගියා. නැවත ඩැෆනි සමග කොඳුරනවාද නැද්ද යන්න ගැන ගොන්ඩොලින් සිතින් තර්ක කළා. එහෙත් ඩැෆනිගේ සිහින් ගෙරවීම ඇය නින්දට වැටී ඇති බව පෙන්නුම් කළා. එහෙයින් සැලීට අවනත නොවීමට ඇයට අවස්ථාවක් ලැබුණේ නැහැ. කොඳුරන්නට ඩැෆනිට නොහැකි වනු ඇත !

ඉක්මනින්ම සියලු දැරියෝ නින්දට වැටුණා. පොට්ස් ගුරුතුමිය නිහඬව කාමරයට එබී බලා දොර වසනු ඔවුන්ට ඇසුණේ නැහැ. සයවැනි පන්තියේ දැරියන් තරප්පුව නැඟ යනු ඔවුන්ට ඇසුණේ නැහැ. ඔවුන් සියලු දෙනාට නින්ද ගොස් තිබුණා

පළමු දිනය විනෝදයෙන් රසවත්ව ගතවුණා. අලුත් දැරියන්ට විශාල ගොඩනැඟිල්ලේ විවිධ ස්ථාන, ගෙවත්ත හා ටෙනිස් පිටි බලා ගැනීමට කැටුව යැවුණා. ගල්තලාවේ පිහිටි පිහිනුම් තටාකය සෑම රළ පහරක් සමගම නැවුම් ජලයෙන් පිරී යනු දුටු දැරියෝ පුදුමයට පත් වුණා.

"මම හිතන්නේ ඔයාට හොඳට පීනන්න පුළුවන් ඇති" ඩැෆනි ගොන්ඩොලින්ට කිව්වා. මඳක් පැකිළුණ ගොන්ඩොලින් වටපිට බැලුවා. ඇය ඩැෆනි සමග බොහෝ පුරසාරම් දොඩා තිබුණද ඒ අනෙක් අය අවට සිටියදී නොවෙයි. දැන් ඩැරල් ඉතා සමීපයේ සිටි හෙයින් ඇයට පිහිනීම පිළිබඳව අමූලික බොරුවක් දෙසාබෑමට නොහැකි වුණා.

"හරි, අනිත් අයට තරම් හොඳට බැහැ." ඇ කිව්වා.

"ඕනෑම ඔට්ටුවක්, ඔයාට තමයි හොඳටම පුළුවන්." ඩැෆනි කිව්වා. "ඔයා බොරු ලැජ්ජාකාරියක්."



ඩැරල් සිහින් සිනාවක් නැඟුවා. ගොන්ඩොලින් බොරු ලැජ්ජාකාරියක බව කිසිවෙක් කියන්නේ නැහැ. පාසලේ සිටි නරකම කයිවාරුකාරිය ඇය වූ අතර ඇය බොරු කයිවාරුවේ හා සැබෑ අසත්‍යයේ වෙනස හෝ දැන සිටියේ නැහැ.

එලන් තමාට පිහිනිය නොහැකි බව කිව්වා. "මට සෙල්ලම් කරන්න ඒ තරම් කාලයක් ලැබුණේ නැහැ." ඇ කිව්වා. "ඒත් ක්‍රීඩාවලට මම කැමතියි. මට නිතරම මහන්සි වෙලා වැඩ කරන්න සිද්ධ වෙලා තිබුණේ."

"එහෙනම් ඔයා හුඟාක් දක්ෂ ඇති." මේරි ලෝව් කිව්වා. "මැලෝරි ටවර්ස්වලට එන්න පුළුවන් එකම ශිෂ්‍යත්වය දිනා ගත්තේ ඔයා නේ ද ?"

"ඔව්, ඒත් ඇත්තටම දක්ෂයි කියලා මම හිතන්නේ නැහැ." තම නළලේ තිබූ රැල්ල තවත් ගැඹුරු කර තැවුලට පත් පෙනුමක් ගනිමින් එලන් කිව්වා.

"මම කියන්නේ, මට වැඩ කරලා, කරලා හුඟාක් දේවල් මතක තියා ගන්න පුළුවන්, ඒත් මම සමහර අය වගේ දක්ෂ නැහැ. සමහර අයට මහන්සියෙන් වැඩ කරන්න අවශ්‍ය නැහැ. එයාලා ඉහළින් ඉන්නවා. ඒ එයාලා දක්ෂ නිසා. ඒක එයාලගේ හැටි. මට හැමදේකටම මහන්සි වෙන්න සිද්ධ වෙනවා. ඒ වගේම මැලෝරි ටවර්ස්වලට එන්න මට ලොකු වුවමනාවක් තිබුණා. මගේ මහන්සියේ ප්‍රතිඵල තියෙනවා. මම දැන් මෙහේ !"

"හොඳයි, වැඩවලට වගේම ඔයා ක්‍රීඩාවලටත් උනන්දු වෙන්න." ක්‍රීඩාවලට දැඩි කැපවීමක් තිබූ සැලී කිව්වා. මැලෝරි ටවර්ස්හි සෑම දෙයකටම බෙලින්ඩා ඇලුම් කළා. ඩැෆනිගේ අතින් ඇදගෙන යන ගොන්ඩොලින් මෙන්ම බෙලින්ඩා සමග සිටින අයිරින්, බෙලින්ඩා සෑම දෙයක්ම අගය කිරීම ගැන දැඩි සතුටට පත්ව සිටියා.

"ඕ, අර දර්ශනය" බෙලින්ඩා කෑ ගැසුවා. "මුහුද දිහා බලන්න! අර පිහිනුම් තටාකයේ තියෙන පාට දිහා බලන්න ! කෝ මගේ පාට පෙට්ටිය, ඉක්මනට !"

එවිටයි, ප්‍රථම වතාවට දැරියෝ බෙලින්ඩාගේ සැබෑ දක්ෂතාවය දැන ගත්තේ. ඇයට ඉතා විස්මයජනක ලෙස ඇඳීමට හා වර්ණ ගැන්වීමට හැකියාව තිබුණා. පැන්සලකින් හෝ පින්සල් කැබැල්ලකින් ඕනෑම කෙනෙකුට සමාන රූපයක් ඇඳ එයට යම් විහිළු අංගයක් එක් කර දැරියන්ව සිනා ගැස්වීමට ඇයට තිබුණේ දැරියන් සිතන පරිදි, ඉතාම ඉහළ හැකියාවක්.



"ඔයත් එක්ක අපිට හුඟාක් විනෝද වෙන්න පුළුවන් බෙලින්ඩා !" අයිරීන් කිව්වා. "ඔයාට පුළුවන් පාකර්වයි, මම්සලීලා දෙන්නාවයි, ඇත්තටම මේට්‍රන් හරි ඕනෑම කෙනෙක්ව අඳින්න. ඔයා ආව එක ගැන මට සතුටුයි. අපි ඔක්කොම විනෝද වෙමු !"



# 04

වාරයේ පළමු දිනයේ පාකර් ගුරුතුමිය පන්තියේ නායිකාව වන්නේ කවුද යන්න ප්‍රකාශයට පත් කළා.

"මම හිතන්නේ ඔයාලා හැමෝටම අවශ්‍ය ඇති මේ වාරයේ පන්ති නායිකාව කවුද කියලා දැන ගන්න." ඇය කිව්වා. "හොඳයි, මම ඔයාලට ඒක ඉක්මනින්ම කියන්නම්. ගුරු රැස්වීමේදී කෙටි සාකච්ඡාවකින් පස්සේ අපි තෝරගන්න තීරණය කළා, සැලී හෝප්." දැරියෝ අත්පොළසන් නැගූ අතර සැලී ලැජ්ජාවෙන් රතු වුණා.

සැලීට අකමැති කිප දෙනෙකු මෙය වැරදි තේරීමක් ලෙස පිළිගැනීමට ඉඩ තිබුණ ද පන්තියේ සැම කෙනෙක්ම හොඳ තේරීමක් කර තිබූ බව පිළිගත්තා ! ගොන්ඩොලින් තදින් කිපී සිටියා. ඇලිසියා තෝරාගනු ඇතැයි සිතා සිටි බෙටී ද එසේ වුණා. සැලීගේ නිදන කාමරයේ නොසිටි බෙටීගේ මිතුරියන් එක් අයෙක් දෙන්නෙක් ද එසේ සිටියා.

ඩැරල් සැලීගේ බාහුව මිරිකුවා. "හොඳටම හොඳයි !" ඈ කිව්වා. "මට සතුටුයි. ඔයාගේ අම්මා සතුටු වෙයි නේද ? ඔයා අපේ නිදන කාමරයේත් නායිකාව වෙයි, සැලී. ගොන්ඩොලින්ට හොඳ වැඩේ !"

එය ඇත්තෙන්ම සිදුවුණා. එදින රාත්‍රියේ ඇඳේ සිටින ගොන්ඩොලින්ට වඩාත් සිත පෑරෙන දෙයක් වූයේ සැලී පාලනය අතට ගනිද්දියි. සැලී තම බලය ඕනෑවට වැඩියෙන් හෝ ඕනෑවට වඩා ඉක්මනින් පාවිච්චි කිරීමට අදහස් නොකළ ද ගොන්ඩොලින් නැවත මෝඩ ලෙස හැසිරෙන බවත්, එවිට ඇයට ඉක්මනින්ම

බලය පාවිච්චි කිරීමට සිදුවන බවත් ඇය දැන සිටියා. මැද මොළොක් බව තේරුම් නොගත් ගොන්ඩොලින් ඉන් අවුසු ප්‍රයෝජන ගත්තා. එලෙස, විදුලි පහන් නිවූ පසු, නැවත කෙඳිරීම පටන් ගත් විට සැලී කතා කළා.

"සද්දේ නවත්වන්න, ගොන්ඩොලින්. මම ඒක ඊයෙ රෑත් කිව්වා. එනකොට මම නිදන කාමරයේ නායිකාව නෙවෙයි. ඒත් දැන් මමයි නායිකාව. ඒ නිසා දැන් මම කියද්දි කට නවත්වාගන්න."

"මේ අසරණ ඩැෆනිට ගෙදර මතක් වෙලා" ගොන්ඩොලින් පටන් ගත්තා.

"ඔයා එයාගේ කනට කොඳුරලා විකාර කියෙව්වාට ඒක හරියන්නේ නැහැ." සැලී කිව්වා. කෙටි නිහැඬියාවක් පැතිරුණා. ඉන් අනතුරුව බෙලින්ඩාගේ කටහඬ ප්‍රශ්නයක් සමග අඳුර කපාගෙන ආවා.

"සැලී ! අපි නායිකාව කියන දේ අහන්නේ නැතිව කතා කළොත් මොකද වෙන්නේ ?"

"කවුරුවත් එහෙම කරන්නේ නැහැ." "ඒත් මැලෝරි ටවර්ස්වල චාරිත්‍රයක් තියෙනවා කියලා මම අහලා තියෙනවා. ඒවගේ කියන දේ අහන්නේ නැති අයට අනිත් අය ලොකු පනාවලින් පස්ස රත්වෙන්න ගහනවා කියලා." සැලී තරහින් කිව්වා.

"අපොයි !" කී බෙලින්ඩා ගොන්ඩොලින්ට දැන් කුමක් සිතෙනු ඇතිදැයි සිතමින් ඇඳේ ගුළි වුණා. ඇය නැවත කොඳුරා කතා කරයිද, නැද්ද ?" ගොන්ඩොලින් නැවත ඩැෆනි සමග කතා බහ ඇරඹීමට මුව විවර කර තිබුණ ද බෙලින්ඩාගේ ප්‍රශ්නය හා ඊට ලැබුණ පිළිතුරු ඇසී කට පියාගත් ඈ කම්පනයට පත් වුණා. දෙවැනි පන්තියේ කෙනෙකුට එසේ ඇගවීමක් කිරීමට එය මොනතරම් නිර්භීතකමක් ද ? එය තමා බිය වැද්දීමට කළ දෙයක්දැයි ඈ තම සිත සමග තර්ක කරන්නට වුණා. එහෙත් සැලිගේ කෝපය මුසු කටහඬ ගැන සිහිවී අවදානම නොගැනීමට ඇය තීරණය කළා. සැලී සැබැවින්ම එම තර්ජනය ක්‍රියාවට නැගුවහොත් එය මහත් ලැජ්ජාවක් වනු ඇත. එවිට ඩැෆනි ඇයට කිසි දින ගරු නොකරනු ඇත.



05

පළමු සතිය ඉතා සෙමින් ගත වුණා. නිතරම එය ගත වුණේ ඉතා සෙමින් වුවද ඊළඟ සති වඩ වඩාත් ඉක්මනින් ගත වුණා. සියලුම දැරියෝ පරිසරයට අනුගතව සිටි අතර කෙළිදෙළින් කාලය ගත කළා.

කාලගුණය උණුසුම්ව යහපත් ලෙස පැවතුණ අතර පිහිනුම් තටාකයට යාම අවශ්‍ය වූ අයට තවමත් ඒ හැකියාව තිබුණා. මේ වන විට ශීත සෘතුවේ ලැක්රෝස් ක්‍රීඩාව පටන්ගෙන තිබුණද ටෙනිස් ක්‍රීඩා පැවැත්වෙමින් තිබුණා. එනිසා විවේක වේලාවේදී කිරීමට බොහෝ දේ තිබුණා.

ගොන්ඩොලින් හා ඩැෆනි දැඩි ලෙස මිතුරුදමින් බැඳුණා. ගොන්ඩොලින් ගත කර තිබූ වාර හතර පුරාම නියම මිතුරියක සොයාගෙන නොතිබූ අතර මැලෝරි ටවර්ස්හි දී ඩැෆනි මිතුරිය ලෙස ලැබීම ගැන මහත් සේ සොම්නසට පැමිණ තිබුණා. එම දැරියගේ සුන්දර රුවට හා ඇගේ සිත්ගන්නාසුලු හැසිරීම ඈ ඉහළින් අගය කළා. එමෙන්ම ඇගේ පොහොසත් පවුලේ කතා ඇසීමට ද ඈ ප්‍රිය කළා.

"ඔයා ඉස්කෝලයකට එන්න කොහොමටවත් කැමති වෙන්න නැතිව ඇති නේද ඩැෆනි ?" ඈ ඇසුවා. "ඒතරම් සැප සම්පත් අත් හැරලා මේ වගේ ඌරු කොටුවකට එන්න. මම හිතන්නේ මෙහේ එන්න ඉස්සර ඔයා ඔයාගේ ඇඳවත් හදා ගන්න නැතිව ඇති."

"ඇත්තෙන්ම නැහැ." තම සුන්දර කෙස් කළඹ පසුපසට දමමින් ඩැෆනි කිව්වා.

"මම කියන්නේ ඔයත් කරලා නැතුව ඇති."

"මමත් කළේ නැහැ තමයි." ගොන්ඩොලින් කිව්වා. "මගේ ආයා, මිස් වින්ටර් මගේ හැම වැඩක්ම කරලා දෙනවා. නිවාඩු කාලයේදිත් එයාමයි කරන්නේ. එයා මෝඩ නාකිච්චියක් වුණත් ඒවගේ වැඩවලදී හරි ප්‍රයෝජනවත්. මට උගන්වන්න නම් එයා ඒතරම් හොඳ නැහැ. ඒ නිසා තමයි මෙහෙ ආව මුල් දවස්වලදී මම හුඟාක් දේවලට දුර්වල වුණේ."

එමෙන්ම ගොන්ඩොලින් තවමත් දුර්වලයි ! තත්ත්වය හඳුනාගෙන සැබෑ ලෙස මහන්සි වී වැඩකර අනෙක් අයගේ මට්ටමට එනු වෙනුවට ඇ බොරු රඟපෑමක් කළා මිස වැඩක් කළේම නැහැ. ඇගේ දෙමව්පියෝ නිතරම ඇගේ වාර්තාවල තිබූ 'තරමක් හොඳයි, මීට වඩා හොඳට වැඩ කළ හැකියි, පුළුවන් වුවද උනන්දු වන්නේ නැහැ.' වැනි වචන ඉවසිලිවන්තව දරා ගත්තා.

ඇගේ පියා නිතර ඇගේ වාර්තා ගැන තියුණු උපහාසයෙන් යුතුව වචන පාවිච්චි කළ ද නිතර ඇගේ මව ඇයට අනුකම්පාවෙන් කතා කර ඇයව තවත් නරක් කළ හෙයින් පියාගේ වචනවලින් යහපතක් වනු වෙනුවට සිදුවූයේ ගොන්ඩොලින් කෝපවීම පමණයි. එවිට ඇය ඇඬීම පටන් ගන්නා නිසා වින්ටර් මහත්මියටත්, මවටත් සිදු වන්නේ ඇයව සැනසීමටයි. කඳුළුවලින් යමක් කරගන්නේ කෙසේද යන්න ගොන්ඩොලින් හොඳින් දැන සිටියා.

එමෙන්ම තම සුන්දර සිනාවෙන් යමක් කර ගන්නේ කෙසේද යන්න ගැන ඩැෆනි හොඳින් දැන සිටියා. විශේෂයෙන් මම්සලී ඩූපොන්ට්, චිත්‍ර ගුරුතුමිය ලිනී, සංගීත ගුරුවරයා යං මහත්මයා වැනි අයගෙන් එන කරදරවලින් බේරීමට එය මහත් සේ උපකාරී වුණා.

මම්සලීට ද ඒ සිනාවට විරෝධයක් දැක්විය නොහැකි වුණා. ඩැෆනිට එය මිහිරි, ශෝචනීය, නිර්ඝීත, සෙනෙහෙබර එකක් බවට පෙරළිය හැකි වූ අතර සිනාවකින් කළ හැකි දේ විස්මයජනක වුණා.



ඩැෆනි නරකා? කළ ප්‍රංශ අභ්‍යාසයක් මම්සලීට ඉදිරිපත් කළ විටක ඇ එම සිනාව නඟා ගන්නා අතර මම්සලී උණුසුම් බැල්මක් හෙළනවා. ඕහ්, ලස්සන දරුවා !

"මම පුළුවන් තරම් හොඳින් කළා, මම්සලී" සිනාව එලෙසම රඳවාගෙන ඩැෆනි කියනවා. "අනේ මන්දා, ඒත් ඒ තරම් හොඳ නැහැ. බලන්නකෝ, මීට ඉස්සර ඉස්කෝලෙකට නොගිය නිසා හුඟාක් අමාරුයි."

ඉන්පසුව සිනාව තරමක් දුක්බර වන අතර ඉන් දුකට පත්වන මම්සලී ඇගේ බාහුවට තට්ටු කරනවා.

"ඔයා හුඟාක් උත්සාහ කරනවා, දරුවා. මීට වඩා ඔයාට බැහැ. බලන්න, ඔයා අමතර පාඩම්වලට හැන්දෑවේ එන්න කැමති නම් මම උදව් කරන්නම් !"

මම්සලී මේ පරිත්‍යාගශීලී ඉදිරිපත්වීම කරන්නේ මුහුණේ මහත් සතුටු සිනාවක් පුරවාගෙන. එහෙත් ඉන් බේරීමට ඩැෆනි එක්වරම ක්‍රියා කිරීමට තරම් වේගවත්. ඇය කලකිරීමෙන් හිස වනා තවත් ගුරුතුමියක් සමග අමතර පාඩම් ඇති බව පවසා තමා ඒගැන ඉතා කනගාටු වන බව පවසනවා.

අනතුරුව අර සිනහව නැවත මතුවන අතර නිල් ඇස් මම්සලී දෙස ආයාචනාත්මකව බලනවා.

"අනේ මම්සලී, මේ තරම් ප්‍රංශ වැඩ කරන්න ආයෙත් මට දෙන්න එපා." ඇ කියනවා. "මගේ පළමු වාරයේ වැඩ අල්ලා ගන්න අනිත් අයත් එක්ක මට හුඟාක් වැඩ තියෙනවා."

එලෙස, ප්‍රංශ අභ්‍යාස නැවත නැවත කිරීමට කාට සිදුවුවද ඩැෆනිට නම් සිදු වුණේ නැහැ. ඇගේ වශීකරණසුලු බව යොදා ගැනීමට හා එම සිත් කුල්මත් කරන සිනාව පෑමට හැකි නම් ඇයට මම්සලී සමග ඕනෑම දෙයක් කිරීමට හැකි වුණා.

අවාසනාවකට මෙන් පාකර් ගුරුතුමිය, පොට්ස් හා මම්සලී රොජර් සම්බන්ධයෙන් සිදු වුණේ එහි අනිත් පැත්ත. විශේෂයෙන් මම්සලී රොජර් සමග. සාමාන්‍යයෙන් අනිත් මම්සලී කැමති දැරියන්ට ඇලුම් නොකිරීමටත් ඇ පුරුද්දක් කරගෙන තිබුණා.

ඇය ඩැෆනිට ඉතා තදින් සිටි අතර ඈ සමග සිනාසීම ප ඇරීයව අපහසුවක් බවට ඉක්මනින්ම පත්වුණා. ඔවුන් දෙදෙනා එකිනෙකාට තදින් අප්‍රිය වුණා. පන්තියේ වෙනත් කෙනෙකුගේ සහයෝගය නොලැබුණේ නම්, ඩැෆනිට ඉතා නරක කාලය උදාවන්නට තිබුණ අතර ඇගේ සියලුම වැඩ මම්සලී රොජර්ගෙ ප්‍රතික්ෂේප වන්නට ඉඩ තිබුණා.

එම වෙනත් කෙනා වූයේ පුදුමයකට මෙන් මේරි ලෝ නිවාඩු කාලයේදී ඇය සමග කාලය ගත කිරීමට ඇගේ ම ප්‍රංශ දැරියක්ව කැඳවාගෙන තිබුණ නිසා මේරි ලෝව් ප්‍රංශවල ඇදහිය නොහැකි ලෙස දක්ෂ වුණා. පසුගිය අවුරුද්දේ කෑ නිවාඩු කාලයකදී ම ප්‍රංශ දැරිය සමග කල්ගෙවා තිබූ හෙයින් මේරි ලෝව් ඉංග්‍රීසියෙන් කතා කරන අයුරින්ම ප්‍රංශ බසින් ද කතා කිරීමේ හැකියාව ලබා තිබුණා. මේ නිසා මම්සලීලා දෙදෙනාම දැඩි සතුටට පත්ව සිටියා.

ඩැෆනි ඉතා දයාබර බව මේරි ලෝව් සිතා සිටියා. ඇය දෙස දෑස් දල්වාගෙන බලා සිටීමට ඇයට නොහැකි වුණා. ඇත්තෙන් ඩැරල්ට හා සැලීට ඇලුම් කරන ලෙස ඇයට ඩැෆනිට ඇලුම් කිරීමට කවදාවත් නොහැකි වුවද ඩැෆනිගේ සුන්දර ස්වභාවය ඇලුම් නොකර සිටීමට ඇයට නොහැකි වුණා.

එක් දිනක, නැවත වතාවක් නිවැරදිවම කර නොපෙන්වන්නේ නම් නැවතත් ආපසු කිරීමට දෙන බව කියමින් ඩැෆනිට කරන්නට මම්සලී රොජර් දී තිබූ ප්‍රංශ අභ්‍යාසයක් ඇය කඳුළු පිරි දෙනෙතින් කරමින් සිටිනු මේරි ලෝව් දුටුවා. මේරි ලෝව් ඇය වෙතට ගියා.

"ගොන්ඩොලින්ට බැරිද ඔයාට උදව් කරන්න ?" ඈ බියගුළුව ඇසුවා.

"එයා කිසිම දෙයක් කරන්නේ නැහැ. නිකම් ඉන්නේ. මම එයාට ඇවිදින් උදව් කරන්න කියන්න ද ?"

ඇස පිස ගනිමින් කඳුළු පිරි මුත් සුන්දර සිනාවක් මව ගනිමින් ඩැෆනි මේරි ලෝව් දෙස බැලුවා. ගොන්ඩොලින්ට ඇය කෙටියෙන් ආමන්ත්‍රණය කළේ 'ග්වේන්' කියලා. "එපා, ග්වේන්ට



කතා කරලා වැඩක් නැහැ. පුළුවන් නම් එයා උදව් කරනවා. එයාටත් මට වගේම ප්‍රංශ බැහැ."

"හරි, මම හිතන්නේ මම උදව් කරනවාට ඔයා කැමති නැතිව ඇති. එහෙමද ?" මේරි ලෝව් උනන්දුවෙන් ඇසුවා. "මම නම් කැමතියි."

"අනේ, හුඟාක් ස්තූතියි" ප්‍රමෝදයට පත්ව ඩැෆනි කිව්වා. "ඔයාට හොඳට ප්‍රංශ පුළුවන්. මම දන්නවා. අනේ! කෙල්ලේ. බලන්න, මට මොනවාද වැරදිලා තියෙන්නේ ?"

අසල වූ පුටුවකට බර දී මේරි ලෝව් සතුටින් ඩැෆනිට යම් යම් දේවල් පැහැදිලි කරන්නට වුණා. ඒවා තේරුම් නොගනිමින් ඉක්මනින්ම ඇය වැඩය අවසාන කර තමාටම සිනාසී මේරි ලෝව්ට උණුසුම්ව ස්තූති කළා.

"ඒකට කමක් නැහැ." මේරි ලෝව් ලැජ්ජාශීලීව කිව්වා. ඈ ඩැෆනිගේ රන්වන් රැලි කොණ්ඩය දෙස ආශාවෙන් බැලුවා. "ඔයාගේ කොණ්ඩය හරි ලස්සනයි." ඈ කිව්වා.

ඩැෆනි ද ගොන්ඩොලින්ට සමාන වුණා. අනෙක් අය තමාව අගය කිරීම හා සිත සතුටු වන දේවල් කීම ගැන ඔවුන් ආශා කළා. කුඩා මේරි ලෝව් දෙස බැලූ ඩැෆනිට ඇය කෙරෙහි මඳ කැමැත්තක් ඇති වුණා. එමෙන්ම මේරි ලෝව් නිතරම ඇගේ ප්‍රංශ වැඩවලදී උදව් කරන්නේ නම් එය ඉතා ප්‍රයෝජනවත් බව ඇයට කල්පනා වුණා.

"මම හිතන්නේ සමහර විට මගේ ප්‍රංශ වැඩවලට උදව් කරන්න ඔයා කැමති නැතිව ඇති, නේද?" ඈ ඇසුවා. "මම්සලීලා දෙන්නා අමතර පාඩම් කියලා දෙනවාට මම කැමති නැහැ. ඒත් ඔයා මට පැහැදිලි කරලා දෙනවා නම් මම ආසයි. ඔයා හොඳට තේරුම් කරනවා."

ඒ ආකාරයට මින් පෙර කිසිවෙකු මේරි ලෝව්ගෙන් උදව් ඉල්ලා තිබුණේ නැහැ. තදින් රතු වුණ ඇයට උගුරේ යමක් හිර වුණ බවක් දැනුණා.

"ඔබත් ආසයි." අන්තිමේ දී ඈ කිව්වා. "ඔයාට උදව් කරන්න කියලා හිතෙන එකත් සතුටක් ! උදව් ඉල්ලාගෙන හතර වටේ දුවන්නේ මමයි. මම හරිම ආසයි, ඩැෆනි."

එලෙස, දෙවැනි පන්තියේ අයට විස්මයක් ලෙස, සැන්ඩ... පොදු කාමරයේ කෙළවරක ඩැෆනි අසල වාඩිගෙන පෙරදින ඉං... අභ්‍යාසවල එකින් එක වැරදි පෙන්වා දෙන කුඩා මේරි ලෙ... කවුරුත් දැක ගත්තා !



## 06

සති කිපයකට පසු, ඇලිසියා නොසන්සුන් වුණා. "කම්මැළි කම යන්න මොනවා හරි දෙයක් කරන්න පරක්කු වුණා වැඩියි !" ඈ බෙට්ට කිව්වා. "අපි දැන් දෙවැනි පන්තියේ කියලා මම දන්නවා. - ඒත් ටිකක් විනෝද නොවී ඉන්න කාරණයක් තියෙනවා කියලා හිතන්න බැහැ. සැලීව එපා වෙනවා. විහිළුවක්වත් සෙල්ලමක්වත් නැහැ."

"අපි මොනවාද කරන්නේ ?" නපුරු ඇස නටවමින් බෙට් ඇසුවා. "මා ළඟ නොපෙනෙන හුණු කූරු තියෙනවා. ඔයා ළඟ මොනවා හරි තියෙනවා ද ?"

"නොපෙනෙන හුණු කූරු ! ඔයා මට කවදාවත් කියලා නැහැ !" බබළන මුහුණින් යුතුව ඇලිසියා කිව්වා. "ඒක මොකක් ද ? මට පෙන්වන්න !"

"ඒක තියෙන්නේ මගේ කබඩ් එකේ පෙට්ටියක" බෙට් කිව්වා. "පොදු කාමරයේ දැන් කවුරුත් නැතිව ඇති. එන්න මාත් එක්ක. මම ඒක පෙන්වන්නම්. ඒක අමුතුම දෙයක්."

දැරියෝ දෙදෙනා පොදු කාමරයට ගියා. කබඩයක් විවෘත කළ බෙට් හතරැස් පෙට්ටියක් ගත්තා. එතුළ, කොළයක ඉතා ප්‍රවේසමෙන් ඔතා තිබුණේ අමුතු හුණු කූරක්.

"මේක නොපෙනෙන බවක් පෙනෙන්නේ නැහැනේ." ඇලිසියා කිව්වා. "මේකෙන් මොකක් ද වෙන්නේ ?"

"හොඳයි, මේක පුටුවක ඇතුල්පුවාට ඒ බව පේනෙන්නේ නැහැ." බෙට් කිව්වා. "කවුරු හරි ඒක උඩ ඉඳගෙන ඒක ටිකක් රත් කළොත් තද රෝස පාට හුණු කුඩු පාරක් ඇඳුමේ හරි, සායේ හරි වදිනවා."

"හා, හරි" ඇලිසියා කිව්වා" අපිට මේක පන්ති කාමරයේ ගුරු පුටුවේ අතුල්ලන්න පුළුවන්. මම්සලී රොජර් එන වෙලාවට කළා නම් හරි."

"ඒක හරි ! මිස්ටර් යං සංගීත පාඩමට එන්න ඉස්සර අපි මේක එයාගේ පුටුවේත් අතුල්ලමු !" බෙටී කිව්වා. "එයාගේ පියානෝ ස්ටූල් එකේ ! එයා ඒකේ වාඩි වෙලා අපේ සිංදුවට පියානෝ එක ගහයි. ඊට පස්සේ කළු ලෑල්ලේ ලියන්න එයා නැඟිටලා අනිත් පැත්ත හැරෙද්දී, අපොයි මොන හිනාවක් ද !"

ඇලිසියා හඬ නඟා සිනාසුණා. "පාකර්ට හරි, මම්සලීට හරි කරනවාට වඩා මිස්ටර් යංට කරන එක හොඳයි. එයා කිසි දෙයක් සැක කරන්නේ නැහැ. පළමු පන්තියේ අයත් අපිත් එක්ක ගායනයට එන නිසා එයාලටත් පුළුවන් අපි එක්ක විනෝද වෙන්න !"

එදින විවේකයට පෙර තිබූ පාඩම ගායනයයි. දෙවැනි පාඩම අවසාන වීමට ආසන්නවත්ම බෙටීගේ අත ඉහළට එසවුණා. "මිස් පාකර්, සංගීත කාමරයේ වැඩ අද මට පැවරිලා තියෙන්නේ. මිස්ටර් යං එන්න ඉස්සර මම එතැන ලෑස්ති කරන්න ඕනැ. මම යන්න ද ?"

පාකර් ගුරුතුමිය ඔරලෝසුව දෙස බැලුවා. "හොඳයි, ඔයාට විනාඩි හතරක් තියෙනවා."

ඇලිසියා වෙත ඉක්මන් බැල්මක් හෙළූ බෙටී සැකමුසුව දොර වෙතට ගොස් ඒ වහාම කොරිඩෝව ඔස්සේ වේගයෙන් දුවගොස් සංගීත කාමරයට වැදුණා.

බෙටී පියානෝවේ ආසනයට ඉගිල්ලුණා. එය උස් වූ රවුම් අසුනක් වූ අතර එහි හම් කවරය මත රවුමට හුණු කුර ඇතිල්ලීම පහසු වුණා. හුණු කුර ගත් බෙටී රවුමට ඒ මත හුණු කුර උලා දැමුවා.

තමා කළ දෙයෙහි අඩුපාඩුවක් ඇතිදැයි දැක ගැනීමට නොහැකි වුවද අසුනේ සෑම තැනම තම හුණු කුර ඇතිල්ලූ බවට සැකයක් බෙටීට තිබුණේ නැහැ. එය සැබැවින්ම අදෘශ්‍යමාන හුණු කුරක් !



ඉන්පසුව ඈ යං මහතාට ප්‍රමාණවත් නොවන තරම් පහතට යන ලෙස අසුන කරකවා පහත් කළා. අසුන තමාට ප්‍රමාණවත් නොවන පරිදි පහත් හෝ උස්ව තිබුණේ නම් පමණක් ඔහු ඒ මේ අත අසුනේ කැරකෙමින් ඔහුට මනාප පරිදි උසකට එය සකස් කර ගන්නට පුරුදුව සිටියා. ඔහු අද ද එය කළහොත් අරුම පුදුම හුණු කුර අමුතුම ක්‍රියාව පෙන්නුම් කරනු ඇත !

උස් කොලරයක් සහිත හොඳින් ඔප දැමූ කළු ඇඳුමින් සැරසුණ යං මහතා වහා කාමරයට ඇතුළු වුණා. තම උඩුරැවුල අත ගෑ ඔහු දැරියන්ට හිස නමා ආචාර කළා.

"සුබ උදෑසනක්, ළමයි."

"සුබ උදෑසනක්, මිස්ටර් යං" කී ඔවුන් ඉක්මනින් ගීතය සහිත පිටුව පෙරළා ගත්තා. පාඩම ඇරඹුණා. කළුලෑල්ල වෙතට ගිය යං මහතා සංකේත හා සංගීත සටහන් ගැන විනාඩි පහක පමණ කාලයක් පැහැදිලි කිරීමේ යෙදුණා. අනතුරුව ඔහු පියානෝව වෙතට ගියා.

ඇලිසියාට වැලමිටින් ඇන්න බෙටී හුස්ම ඉහළට ඇද ගත්තා. එහෙත් යං මහතා වාඩි වූයේ නැහැ. දැරියන්ට මුහුණ පා ඔහු හිටගෙනම අතෙහි යෂ්ටිය ඔසවමින් තාලයක් වාදනය කළා.

"අභ්‍යාසයේ යෙදෙන්න" ඔහු කිව්වා. "කට ඇරලා උගුරේ පසුපසින් හඬ නඟනවා අහන්නයි මට ඕනෑ."

යං මහතා නිතර උගුරේ පසුපස ගැන අවධාරණය කළා. ගායනයේදී හෝ අභ්‍යාසවලදී හෝ එය නිතරම කියැවුණා. උගුරේ පසුපසින් යන්න නිතර නොවරදින ඔහුගේ මුඛ්‍ය පාඨයක්.

වාඩි නොවී සිටගෙනම ඔහු අභ්‍යාසය මෙහෙයවන්නට වුණා. ඇලිසියා සිටියේ සිත් රිදවනසුලු කලකිරීමක. ඔහු කිසිසේත් වාඩි නොවේවි ද ? එසේ වුවහොත් ඒ මත වාඩි වන ඊළඟ කෙනා වනුයේ නැවුම් ගුරුතුමියයි. එමෙන්ම ඈය ඉතා දීප්තිමත් වර්ණ සහිත ඇඳුම් අඳින නිසා හුණු පැල්ලම පැහැදිලිව නොපෙනෙනු ඇත. අපරාදේ !

එහෙත් ඇත්තෙන්ම, අවසානයේදී යං මහතා වාඩි වුණ
ඇරියන්ට ඉගැන්වීමට ඔහුට අලුත් ගීතයක් තිබූ අතර නිතර කර
පරිදි ගායනයට පෙර දෙතුන් වතාවක් එය වාදනය කිරීමට ඔහු
අවශ්‍ය වුණා. ඉන් ඇරියන්ට තාලය හා රිද්මය හොඳින් අල්ල
ගත හැකි වුණා.

ඉතින් ඔහු වාඩි වුණා. අහා ! එම ආසනය නැවත වතාවක්
අවශ්‍ය ප්‍රමාණයට වඩා පහත් ! යං මහත්මයා ආසනය සුදුසු උස
එනතුරු එහි වාඩි වී වේගයෙන් රවුම් රවුම් කැරකුණා. ඇරියෙ
සිහින් හඬින් සිනාසුණා. කුඩා ආසනයේ වාඩි වී කැරකෙන
විට තමා කොතරම් හාස්‍යජනකදැයි යං මහතාට අවබෝධය
තිබුණේ නැහැ.

"දැන් මම අලුත් තාලය ඔයාලට වාදනය කරල
පෙන්වන්නම්." යං මහතා කිව්වා. "වාඩි වෙලා අහගෙන ඉන්න
මම ගායනා කරලා පෙන්වන නිසා අත්වැල් ගායනය අවශ්‍ය
කොතනටද කියලා ඔයාලට පෙනෙයි.

දැත් ඉහළ පහළ යවමින් ඔහු පටන් ගත්තා. ඇලිසියා හ
බෙටී එකිනෙකාට ඇස්වලින් ඉඟිමරා ගත්තා. රටහුණු මේ වන
විට ක්‍රියාත්මක වනු ඇත.

ගීතය කෙවරක් වාදනය කළ යං මහතා නැඟී සිටියා
"කැමති ද ඒකට ?" ඔහු ඇසූ අතර දැරියෝ එක හඬින් පිළිතුරු
දුන්නා. "ඔ,ඔව් මිස්ටර් යං !"

යං මහතා කළුලෑල්ල දෙසට හැරී සුදු හුණු කුරක් අතට
ගත්තා. දීප්තිමත් රෝස පැහැයක් ඔහුගේ පස්ස පැත්තේ තැවරී
ඇති බව එක් වරම දැරියෝ දුටුවා ! ඔවුන් සතුටින් දෙනෙත්
මහත් කර බලා සිටියා.

"අර බලන්න ! මොනවාද එයා අතුල්ලාගෙන තියෙන්නේ!
ඕ, අර බලන්න !"

එසැනින් පංතියම සිහින් සිනා හඬ නැගූ අතර යං මහතා
කැරකී රවා බැලුවා.

"නිශ්ශබ්ද වෙන්න ! මොකක්ද මේ හැසිරීම ?"



මොහොතක නිහැඬියාවක් පැතිරුණ ද යං මහතා කළුලෑල්ල
වෙත හැරෙන්ම නැවත තවත් සිනා හඬ නැගුණා. ඊළඟට අයිරින්
ඇගේ සුපුරුදු සිනා හඬින් පිපිරුණා.

යං මහතා හුණු කැල්ල බිම දමා ගැසුවා. ඔහු එය පාගා
දැමීමට සැරසුණ බවක් පෙනුණ අතර හදිසියේම දොර ඇර
ග්‍රේලින් මහත්මිය ඇතුළට නොඑන්නට ඔහු එසේ කරන්නට ඉඩ
තිබුණා. ඇය සමග තවත් අයෙක් සිටියා.

"පන්තියට බාධා කිරීම ගැන සමාවෙන්න, යං මහත්මයා"
ඈ කිව්වා. "මේ මිස්ටර් ලෙමින් එක්ක පියානෝ එක ගැන ටිකක්
කතා කරන්න පුළුවන් ද ?"

තම හිත් රිදීම ගිල ගැනීමට සිදුවූ යං මහතාට පියානෝවේ
ඇති දෝෂ ගැන පැහැදිලි කිරීමට සිදු වුණා. මෙසේ කිරීමේදී ඔහු
ග්‍රේලින් මහත්මියට පසු පස හැරවූ අතර ඈ මහත් විමතියෙන්
යුතුව දීප්තිමත් හුණු පැල්ලම දෙස බැලුවා. මේ වන විට දැරියන්
මීයන් මෙන් නිහඬව සිටි අතර ඇලිසියාට හා බෙටීට චකිතයක්
හා කුතුහලයක් ඇති වුණා.

ග්‍රේලින් මහත්මිය දෙවැනි පන්තියේ නායිකාව, සැලී, වෙතට
හැරුණා. "එළියට ගිහින් ඇඳ රෙදි පිස්නාව අරන් එන්න." ඇය
කිව්වා. "අපේ යං මහත්මයා මොනවා හරි අතුල්ලාගෙන"

සැලී කාමරයෙන් පිටතට දුව ගොස් රෙදි පිස්නාව රැගෙන
ආවා. ග්‍රේලින් මහත්මිය කී දෙය ඇසුණ යං මහතා විමතියට පත්
වුණා. උරපත්ත ඉහළින් හිස හරවා ඔහු තම පස්ස බැලුවා.

"තීන්ත ද?" ඔහු තිගැස්සී ඇසුවා. "නැහැ නේද? මේ, හුණු
කුඩු මොන විදියකින් ගෑ වුණා ද?"

## 07

ඉක්මනින්ම රෝස පැහැ හුණු පැල්ලම් පිස දැමුණේ පියානෝවේ මූලික ස්වර හඬවා වැරැද්ද සොයා ගැනිමට අසුනේ ඊළඟට වාඩිවීමට සැරසුණ ලෙමින් මහතා අතිනුයි. ඇලිසියා හා බෙටී හුස්ම අල්ලාගෙන බලා සිටියා. යම් දඟ වැඩක් සිදුවෙමින් පවතින බව දැනගත් බොහෝමයක් දැරියෝ ඉතා උනන්දුවෙන් බලා සිටියා.

ලෙමින් මහතා අසුනින් නැඟිටින විට ඔවුන්ගේ එම අපේක්ෂාව ඉටුවුණා. ඔහු ඇඳ සිටියේ දිගු කළු උඩු කබායක් වූ අතර එහිද දිප්තිමත් රෝස පැහැ මෝස්තරය තිබුණා. යං මහතා විස්මයෙන් දෙනෙත් මහත් කර ගත්තා.

"ඕ, ඔහේගෙත් වැදිලා!" ඔහු කෑගැහුවා. "බලන්න, මිස් ශ්‍රේලින් මිස්ටර් ලෙමිනුත් මොනවා හරි අතුල්ලාගෙන. මම ඉක්මනට ඒක පිහලා දමන්නම්."

ශ්‍රේලින් මහත්මියගේ දැස ඉදිරිපිටම වුවද දැරියෝ සිහින් සිනා හඬ නගන්නට වුණා. ශ්‍රේලින් මහත්මිය ව්‍යාකූල වූ පෙනුමින් යුතු වුණා.

"මේ මහත්මයාගේ කෝට් එකේ මොකවත් වැදිලා තිබුණේ නැහැනේ අපි මෙතැනට එද්දී." ඈ ලෙමින් මහතාට කිව්වා.

"මේ තරම් ලොකුවට රෝස පාට පැල්ලමක් තිබුණා නම් මම අනිවාර්යයෙන්ම දකින්න තිබුණා. ඒ කොහොම වුණත් මේ තරම් රෝස පාට හුණු තියෙන බිත්තියක් වත් මෙහේ නැහැ. මොකක්ද සිද්ධ වෙන්න ඇත්තේ?"



ආසනය වෙත ගිය ඈ එදෙස ඉතා විමසිලිමත්ව බැලුවා. ඇලිසියාට හා බෙටීට හුස්ම ගැනීම පවා අමතක වුණා. එහෙත් අදෘශ්‍යමාන හුණු එම නමට ගැළපෙන අයුරින්ම තිබූ අතර ශ්‍රේලින් මහත්මිය එහි කිසිදු සලකුණක් දුටුවේ නැහැ. එහි වාඩි වී සුපුරුදු දෙයම සිදුවේදැයි බැලීමට ඇයට අදහසක් පහළ වූයේ නැහැ. තවදුරටත් ව්‍යාකූලවම ඇය ලෙමින් මහතාව පිටතට කැඳවා ගෙන ගිය අතර නැවත පාඩම කෙරීගෙන ගියා.

ඒ අසරණ යං මහතා නැවත අසුනේ වාඩිවුණා. ඔහු නැඟී සිටි විට, මෙන්න! ඔහු පෙර පරිදිම අමුතු දර්ශනයක් වූ අතර දැරියෝ සිනාව වළකා ගැනීමට ඔවුන්ගේ ලේන්සු මුවෙහි ඔබා ගත්තා. යං මහතා මෙවර කිසිවක් දුටුවේ නැහැ. ඔහු උදාර ලෙස දොර වෙත පියමං කර සෑම දිනම කරන පරිදි දැරියන්ට හිස නමා ඉක්මන් ආචාරයක් කළා.

"සුභ උදෑසනක්, ළමයි! කී ඔහු දිප්තිමත් රෝස පැහැය පෙන්වාගෙන පිටතට ගියා. ඔහු පිටතට යන්ම විවේකය සඳහා සීනුව නාද වූ අතර දැරියෝ තදකරගත් සිනහව නිදහසේ මුදා හැරීමේ ආශාවෙන් මැද මිදුලට දිව ආවා.

"අපොයි, හරිම අපූරුයි! එයා කළුලෑල්ල දිහාට හැරෙද්දි මට හිනා ගිහින් පණ යන්න ආවා!"

"බෙටී, කියන්නකෝ! ඒක ඔයාගේ විජ්ජාවක් ද? කොහොමද ඒක කළේ? මමත් ස්ටූල් එක දිහා හොඳට බැලුවා. ඒත් කිසිම දෙයක් පෙනෙන්න නැහැ!"

"දැනුයි මට මතක් වුණේ" ඇලිසියාට සිනාවක් පාමින් බෙටී කිව්වා.

"තෙත රෙදි කෑල්ලකින් ස්ටූල් එක පිහින්න ඕනැ." කී ඇය අතුරුදහන් වූ අතර දැරියෝ රහස ඔවුන්ට ද කියන මෙන් ආයාචනා කරමින් ඇලිසියාව වට කර ගත්තා. මේ අතරතුරේ දී, තම පස්ස පැත්තේ වූ අපූරු මෝස්තරය ගැන නොදත් යං මහතා දිගු කොරිඩෝවක් ඔස්සේ ඇවිද යමින් සිටියා.

කාමරයකින් පිටතට පැමිණි මමසලී ඩූපොන්ට් අහම්බෙන් ඔහු පසුපස වැටුණා. අසාමාන්‍ය දර්ශනය දුටු ඈ ඔහු පසුපස දුව යන්නට වුණා.

"යං මහත්මයා! යං, මිස්ටර් යං!" යං මහතා මම්සලීට දෙදෙනාට දැක්වූයේ මහත් බියක්. ඔහු වහාම පියවර ඉස්සර කළා. මම්සලී ඊට වඩා ඉක්මනින් දිව්වා.

"මහත්මයා, මහත්මයා, ඉන්න, ඉන්න! ඔය විදියට එලියට යන්න එපා!"

යං මහතා කැරකී ආපසු හැරුණා. "ඒ මොකද? ඇයි යන්න බැරි?"

"මෙ! මෙ!" කී මම්සලී ඉක්මනින් ඔහුගේ හුණු පැල්ලම තට්ටු කළා. එක් වරම හුණු කුඩු වලාවක් නැගුණා. එතරම් සමීප වී මම්සලී තමාට තට්ටු කිරීම ගැන යං මහතා භීතියට පත් වූ අතර තම පසුපසින් නැගුණ හුණු කුඩු වලාව ගැන ඔහු මවිතයට පත් වුණා. ලෙමින් මහතාගේ කබායට සිදුව තිබූ හරිය මතක් වී ඇඹරී තම පසු පෙදෙස බලා ගැනීමට උත්සාහ කළා.

"මම පිහලා දාන්නම්" තම හදවතේ කරුණාව මතු වූ මම්සලී ඔහුගේ බාහුවෙන් අල්ලාගෙන කිව්වා. ඈ සිනාසෙමින් ඔහු පසෙකට කැඳවාගෙන ගොස් පිස්නාවක් ගෙන තදින් අතුල්ලා ඇඳුමේ වූ හුණු පැල්ලම ඉවත් කළා.

ඔහු කෝපයෙන් පසු වූවා මිස කෘතගුණ පූර්වක වූයේ නැහැ.

"අද උදේ මේක දෙසැරයක් සිද්ධ වුණා." තරහින් මම්සලීට කී ඔහු එය කළ වැරදිකාරිය ඇය වූ කලෙක මෙන් මීට මෙළ වූ අත ඇගේ මුහුණට එසෙව්වා. ත්‍රස්ත වූ ඈ පසුපසට වුණා. වේගයෙන් හිස් වැසුම ලා ගත් යං මහතා තමාටම මුමුනා ගනිමින් යන්නට වුණා.

"එයා කිසිම විනීතකමක් නැහැ. නරක මිනිහා." මම්සලී තමාටම කියා ගත්තා. "මම මිනිහාට හොඳ දෙයක් කළේ. ඒ මිනිහා මගේ මූණට අත මිට මෙළෙව්වා. මම කවදාවත් ඒ මිනිහා එක්ක කතා කරන්නේ නැහැ."

ශාලාවේ සිදු වූ මෙම සිද්ධිය දුටු එකම දැරිය ඩැරල් වූ අතර ඔපදූපය ද සමඟ ඈ අනෙක් අය වෙතට දිව්වා. "මම ශාලාවේ කෙළවර පහු කරමින් යද්දියි දැක්කේ. මම්සලී රෙදි පිස්නාවකින් මිස්ටර් යංගේ පස්ස පැත්තට ගහනවා."



ඈ හති දැමුවා. "එයාට හොඳවම නරහා ගිහින්! ඕ! අපි ඒක ආයෙත් සැරයක් කරමු, ඇලිසියා. ඒක හරිම විජ්ජාවක්!"

එකම දඟ වැඩය දෙවරක් කිරීම නිතරම කෙරුණ අත් වැරැද්දක්. ඇලිසියා එය දැන සිටියා. එහෙත් එය නැවත මම්සලීට කිරීමට තිබූ මහත් පෙලඹීම ඇයට මැඩ ගත නොහැකි වුණා.

"කරමු ද?" ඈ බෙට්ටිගෙන් ඇසූ අතර බෙට්ටි සතුටින් හිස සැලුවා. අසාමාන්‍ය නොපෙනෙන හුණු කූර දැක ගැනීමට දැරියෝ රොක් වුණා.

ගායනා පන්තියේ සිදුවීම සිහිපත් කරමින් හඬ නඟා සිනාසුණ ඔවුන් පළමු පන්තියේ දැරියන්ට ද රහස හෙළිදරව් කළා.

මෙලෙස එම උපාය සෑම කෙනෙකුවම සෑහෙන පරිදි සතුටට පත් කළ අතර නැවත එය මම්සලී ඩූපොන්ට කිරීමට දරන උත්සාහය ගැන වූ සිතුවිල්ලෙන් ඔවුන් මහත් ඕනෑකමින් මඟ බලා සිටියා.

"අද හවස ප්‍රංශ පාඩමට ඉස්සර කාටද පුළුවන් මේක ගුරු පුටුවේ අතුල්ලන්න.?" බෙට්ටි අභියෝග කළා.

"ඇලිසියාටයි, මටයි බැහැ. අපිට පන්ති කාමරයේ ඉන්න අවස්ථාවක් නැහැ. කවුද අද පන්තියේ වැඩ බලන්නේ?"

"මම" ඩැරල් කිව්වා. "මම ඒක කරන්නම්. හුණු කැල්ල මට දෙන්න.! මොකක්ද කරන්න ඕනැ. නිකම්ම හුණු කැල්ල අතුල්ලනවා ද?"

සවස පාසල ආරම්භ වීමට විනාඩි දහයකට පෙර ඩැරල් දෙවැනි පන්ති කාමරයට රිංගා ගත්තා. පොත් රාක්ක පිළිවෙළට තැබීම, කළුලෑල්ල පිරිසිදු කිරීම හා හුණු කැබලිත්, කොට්ටයත් හරි හැටි තැබීම වැනි පන්තියේ එම සතියේ රාජකාරි භාරව තිබුණේ ඇයටයි.

මේ දේවල් කිරීමට ඇයට ගතවූයේ විනාඩියක් පමණයි. ඉන්පසු ගුරු මේසය පිටුපස වූ පුටුව වෙත ගිය ඈ හුණු කැල්ල සාක්කුවෙන් පිටතට ගත්තා. ඇය ආසනය මත එය ඇතිල්ලීමට සූදානම්වත්ම දඟකාර සිතුවිල්ලක් පැන නැඟුණා.

යම් කුඩා දෙයක් ලිව්වහොත් එය මම්සලීගේ සායේ දර්ශනය වේ. එම නිසා දැරියන්ව කුල්මත් කිරීමට ඇයට නොහැකි වේවිද? එය කෙටි වචනයක් විය යුතුයි.

"මම ලියනවා, ඔයි!" ඩැරල් සතුටින් තමාටම කියා ගත්තා.

"ඒක ලියන්න වෙන්නේ අනිත් පැත්තට. එතකොට මම්සලීගේ සායේ ඒක හරි පැත්තට වැදෙයි."

මෙලෙස ඇය ඉතා වෙහෙසක් ගෙන උනන්දුවෙන් පුටුව මත "ඔයි!" යන අකුරු දෙක ලියන්නට වුණා. ඔයි! යන්න පසුපසින් දර්ශනය කරමින් එහේ මෙහේ යාම මොනතරම් හිනා යන දෙයක් ද! කෙල්ලෝ කොහොම කෑ ගහයි ද?

පාඩම සඳහා සීනුව නාද වුණා. හුණු කැබැල්ල සාක්කුවේ ඔබා ගත් ඩැරල් තම ආසනයට ගියා. පන්තියේ සෙසු පිරිස පැමිණෙද්දී ඈ සිහින් සිනා හඬක් නැගුවා.

"ඔයා ඒක කළා ද? වෙලාව තිබුණා ද?" දැරියෝ කෙඳිරිලි හඬින් ඇසුවා. ඩැරල් හිස සැලුවා. අනතුරුව ඇතුළතට පැමිණියේ තරමක් සන්සුන් බවක් පළ කරන මම්සලී වූ අතර දොර වැසුණා.

මම්සලී එක්වරම වාඩි වුණා. ඇයට තිබුණේ සිහින් කකුල් දෙකක් නිසා සිට ගෙන සිටීමට ඇය මනාප වුයේ නැහැ. දැරියෝ උනන්දුවෙන් බලා සිටියා. ඇය කොයි මොහොතේ නැගී සිටියි ද? ඇය පන්තියට පසුපස හරවන තුරු ඩැරල් ඉවසිලි නැතිව හිටියා. පුටුව මත තමා ලියූ දෙය දුටු විට ඔවුන් මොනවා කියනු ඇති ද?

යමක් ලිවීමට ජීන්ව කළු ලෑල්ල වෙතට කැඳවනු ලැබුණා.

"වැරදියට ලියන්න" ඩැරල් කොඳුරා කිව්වා. "එතකොට ඒක නිවැරදි කරන්න මම්සලී නැගිටියි."

මම්සලීගේ මහත් විමතියට මෙන්, මම්සලීගේ තදබල ලෙස උපදෙස් ලැබෙද්දීත් වෙනදා දක්ෂ ලෙස ප්‍රංශ වචන ලියන දැරිය බරපතළ ලෙස වචන වරද්දා, ලිවීමට නොහැකි බවක් පෙන්නුම් කළා. අන්තිමේදී, තරයේ සිත රිදුණ ඈ ජීන්ව ආපසු අසුනට යවා තමාම වැරදි නිවැරදි කිරීමට නැගී සිටියා.



එක්වරම ඇගේ පසුපස දර්ශනය දැකගත් දැරියෝ හුස්ම ඉහළට ඇද ගත්තා. ඇගේ හිරට ඇඳුණ සාය හරහා දීප්තිමත් රෝසපාටින් වචනයක් ලියවී තිබුණා. "ඔයි!" එතරම් පැහැදිලිව එය දර්ශනය වනු දැක ඩැරල් පවා විමතියට පත් වුණා. මෙන්ම ඇයට යම් අපහසුවක් දැනුණා. කෙනෙකුගේ ඇඳුමේ රෝස පැහැයක් වැදීම වෙනම කාරණයක් එය පැහැදිලි කිරීමට සමාවට කාරණයක් සොයා ගත හැකියි, ඒත් "ඔයි!" යන වචනය ලියවුණ ආකාරය කෙසේ පැහැදිලි කරන්න ද? එය කළ නොහැකි දෙයක්!

මම්සලීගේ පසුපස දර්ශනය දැක දැරියෝ සිහින් සිනාහඬ නැගුවා. ඔවුන් සම්පූර්ණයෙන්ම විස්මයට පත්ව සිටියා. සිනාසෙන්නද නැතහොත් බියට පත්වන්නදැයි ඔවුන් නොදැන සිටියා.

"ඩැරල්! මෝඩියේ! එයා අනිත් ටීචර්ස්ලා ඉස්සරහින් කොරිඩෝවේ අර විදියට ලියා ගෙන ගියොත් මොනවා වෙයි කියලාද හිතන්නේ?" ඇලිසියා නපුරු හඬින් කෙඳිරුවා. "ඇත්තටම, ඔයාට ඊට වැඩිය හොඳට මොළය තියෙන්න ඕනෑ."

අනෙක් ගුරුතුමියන් මම්සලීගේ "ඔයි!" දැකීම පිළිබඳ සිතුවිල්ලෙන් පන්තියම බිය වුණා. පාකර් ගුරුතුමිය කිසිසේත් අනුමත කරන්නේ නැහැ. ඈ එය තදබල නිගරුවක් ලෙස සලකනවා.

එහෙත් එය මකා දමන්නේ කෙසේ ද? භයානක රෝස පැල්ලම, "ඔයි!" මම්සලී ලෑල්ලේ ලියද්දීත් නැවත හැරී පන්තියට පැහැදිලි කරද්දීත් අතුරුදහන් වෙමින් හා දර්ශනය වෙමින් බබළන්නට වුණා.

"මම මම්සලීට කියන්නම් එයාගේ ඇඳුමේ හුණු කුඩු හරි වෙන මොනවා හරි වැදිලා කියලා පිහලා දාන්නම්."

ඩැරල් කෙඳිරිල්ලකින් පොරොන්දු වුණා. "පාඩම ඉවර වුණාවේ."

එහෙත් ඇයට ඒ සඳහා අවස්ථාවක් නොදී පළමු පන්තියේ පාඩමට තමා ප්‍රමාද වී ඇති බව සිහි වූ මම්සලී ඉක්මනින්

පන්තියෙන් පිටවුණා. යාබද පන්ති කාමරයේ සිටි පළමු පන්තියේ දැරියෝ විනාඩියක් හැර විනාඩියකින් මම්සලීගේ පසුපසින් බැබළී පෙනුණ "ඔයි!" ජීවිතයේ දුටු ලොකුම පුදුමය ලෙස පෙනී නැතිව සළන්තව වුණා.

ඔවුන්ට සිනාව වළකා ගැනීමට නොහැකි වූ අතර මම්සලී තව තවත් කෝප වුණා.

"මට ඒතරම් සිනාසෙන්න තියෙන කාරණය මොකක්ද?" ඈ තදින් ඇසුවා

"මගේ කොණ්ඩය අවුල් වෙලා ද? මගේ මූහුණ කළු වෙලා ද? මම ජාති දෙකක සපත්තු අල ද?"

"නැහැ, මම්සලී" සිනාව නවතා ගැනීමට නොහැකිව අසරණ වූ පළමු පන්තියේ දැරියෝ කිව්වා.

"මම විකාරකාරියකුත් නොවෙයි, මට මෙතැන විකාරයක් පෙනෙන්නේ නැහැ" මම්සලී සැරෙන් කිව්වා.

ඒ සමග ඇය නැවත කළු ලෑල්ල වෙතට වේගයෙන් හැරුණ අතර 'ඔයි!' දිස්වුණා. පළමු පන්ති දැරියෝ තද කරගත් සිනාවෙන් යුතුව එකිනෙකාව මිරිකා ගත්තා.

එමෙන්ම මම්සලී පන්තියෙන් පිටට යාමට පෙර ඇයව අල්ලා ගැනීමට තරම් ඔවුන්ට සිහි බුද්ධියක් තිබුණා. "එයා පිටට යන්න ඉස්සර අපිට ඒක පිහලා දාන්න සිද්ධ වෙනවා." හිල්ඩා කිව්වා. "එහෙම නැතිනම් දෙවැනි පන්තියේ අය ලොකු අමාරුවක වැටෙනවා. මම හිතන්නේ එයාලා කොහොමහරි ඒක පිහදාන්න හිතාගෙන හිටියත් අවස්ථාවක් ලැබෙන්න නැතිව ඇති."

එලෙස, මම්සලී පළමු පන්ති කාමරයෙන් පිටවීමට පෙර ඒ තැවරී තිබුණේ සාමාන්‍ය හුණු බව අඟවමින් එය පිස දැමීමට හිල්ඩා විනීතව ඉදිරිපත් වුණා. "අපොයි!" ඇය දෙස පහත් වී බලමින් මම්සලී කිව්වා.

"මේ රට හුණු! ඇඳුම්වල වදින්න හොඳ නැහැ. ස්තූතියි, හිල්ඩා. ඔයා බොහොම හොඳ ළමයෙක්!"



හිල්ඩා උනන්දුවෙන් ඒ මේ අතට අතුල්ලා සායෙහි වූ "ඔයි!" පැල්ලම සම්පූර්ණයෙන්ම යවන තුරු ඈ බැටළු පැටවකු සේ හිටගෙන සිටියා. ඉන් පසු ඈ පන්තියෙන් පිට වුණා. වැඩය අවසාන කළ දෙවැනි පන්තියේ දැරියෝ මම්සලී, පොට්ස් ගුරුතුමිය සමග එකට සිටින කුඩා කාමරයට යාමට පෙර ඇයව අල්ලා ගෙන හුණු පැල්ලම ඔවුන්ම පිස දැමීමේ අදහසින් යුතුව මඟ රැක සිටියා.

මේ වන විට මම්සලීගේ සායෙහි කිසිදු පැල්ලමක් නොමැති බව දැනගත් ඔවුන්ට මහත් සහනයක් දැනුණා. ආපසු පන්ති කාමරයට ගිය ඔවුන් තම ආසනවලට බර වුණා.

"දෙවියන්ගේ පිහිටයි!" ඇලිසියාට කියවුණා.

"අර 'ඔයි!' පොට්ටි හරි, පාකර් හරි දැකලා ඒ ගැන කිව්වා නම් එහෙම අපිට සිද්ධ වෙන්නේ නොම්මර එකේ කරදරයකට පැටලෙන්න! අපි ටීචර්ලාට ගරු කරන්නේ නැහැ කියලා එයාලා හිතුවොත් එහෙම එයාලාට මොනතරම් හිත රිදෙනවා ද කියලා දන්නවාද, ඩැරල්? ඔයා නම් මෝඩියක්! මම හිතන්නේ සැලී තමයි ඒක කියන්න ඇත්තේ. එයා නම් පන්තියට අපූරු නායිකාවක්!"

"කට වහනවා!" තමා ගැනත් අනුන් හැම දෙනා ගැනත් සිත රිදුණ ඩැරල් කිව්වා. "සැලීට මේකේ කිසිම සම්බන්ධයක් නැහැ. මම ඒ ගැන ඒ තරම් කල්පනා කළේ නැහැ. එච්චරයි!"

## 08

ඉන්පසු දින ගණනක් යන තුරු අද්‍යෘශ්‍යමාන රට සිදු සිද්ධිය කතා බහට ලක්වුණා. ඉහළ පන්තිවල සමහර දැරියන් ද මේ පිළිබඳව ආරංචි වූ අතර තමන්ට ද මම්සලීගේ "ඔයි" ඇසී ගැනීමට ලැබුණේ නම් හොඳ යැයි රහසින් සිතුවා. එය දැනගත් අය ඩැරල් දුටු විට රහස දන්නා බව පළ කරන සිනාවක් පා 'ඔයි' කියා ඇගේ කනට කෙඳිරුවා.

සියලු දෙනාම එය ඩැරල්ගේ වැඩක් ලෙස සිතන්නට වූ බැවින් ඒ ගැන ඇලිසියාගේ හා බෙටීගේ සිත් රිදුණා. මුළු පන්තියම අමාරුවේ වැටෙන ලෙස මම්සලීගේ සායේ එම වචනය දර්ශනය වන ලෙස අවධානම ගෙන එය ලියූ පමණින් සියලු ගරු බුහුමන් ඩැරල්ට ලැබිය යුත්තේ කෙසේ ද?

ඔවුන් දෙදෙනාම ඩැරල් අධෛර්යමත් වන පරිදි හැසිරුණ ද ඩැරල් ඔවුන්ව නොතකමින් එකට එක කළා. තමා පන්ති නායිකාව ලෙස පත් නොකිරීම ගැන තවමත් ඇලිසියා තරහින් සිටින බවත් ඒ නිසාම ඇය සැලී සමග අමනාපයෙන් පසුවන බවත් ඩැරල් දැන සිටියා. ඩැරල් නිතර නීති ගරුක වූ අතර බැරි තැනක දී හැර නීතියටම කටයුතු කිරීමට ඈ සිතා තිබුණා.

ඇලිසියාගේ කට සැර පරුෂව නැවත නොහික්මී කතා කිරීමට පටන් ගත්තා. තමාගේ ඉක්මන් කේන්තිය ඇවිස්සීමට ඇලිසියා කටයුතු කරන බව දැන, ඩැරල් තද කෝපය මැඩ ගෙන රතු වුවද වචනයක් හෝ කිව්වේ නැහැ. ඇය තම කෝපය අවුස්සා ගත යුතු නැහැ. යුතු නැහැමයි. එසේ වුවා නම් ඇය කෑ ගසා ඇලිසියාට යමකින් දමා ගසනවා. එවිට නැවතත් වහාම ඇය



වැරදිකාරියක වෙනවා. තමා කෝපයෙන් පුපුරන්නට යන බවක් පෙන්නුව ද ඈ එසේ කළේ නැහැ.

එය ඇයට මහත් වදයක් වුණා. සැලී ඇයව සන්සුන් කිරීමට වෙහෙසුණ ද ඉන් තත්ත්වය වඩාත් නරක අතට හැරුණා.

"ඔයා මගේ යාළුවා නිසයි මට ඇලිසියා ගැන ඒතරම් කේන්ති යන්නේ කියන එක ඔයාට පෙනෙන්නේ නැද්ද?" සමහර විටක ඩැරල් ඇසුවා. "එයා මට මොනවා කිව්වත් කමක් නැහැ. මම ගණන් ගන්නේ නැහැ. ඒත් ඔයාට කියන දේවල් අහගෙන මට නිකම් බලා ඉන්න බැහැ. සැලී මොකවත් නොවෙයි, එයාගේ ඊර්ෂ්‍යාව. එයා ඒවා කියන්නේ මට ඉක්මනින් තරහා යන බව එයා දන්න නිසා අපි දෙන්නාව කොටවන්න."

"හොඳයි, දෙවියන්ගේ නාමෙට එයාගේ උගුල්වලට අහුවෙන්න එපා." බුද්ධිමත් සැලී කිව්වා.

"ඒක මෝඩකමක්. එයයි බෙටීයි ඔයාට හොඳට හිනා වෙයි!

මෙලෙස, බෙටී හා ඇලිසියා ඇයව බිළී බා ගැනීමට කෝප කරවන සුලු කතා බහවල යෙදෙන විටදී අසරණ ඩැරල්ට දත්කූරු සපමින් ඉවසා සිටීමට සිදුවුණා.

"මහ ලොකු සැලී!" ඇලිසියා විටක කියනවා.

"හැමතිස්සෙම හරිම හොඳයි. ඒත් වැඩකට නැහැ. හොඳම නායිකාව. එහෙම නේද ඔයාට හිතෙන්නේ බෙටී."

"ඕ, ඔයා නම් හරියට හරි." ඩැරල්ව කෝප ගන්වන සුලු සිනා හඬක් නඟමින් බෙටී කියනවා.

"එයා අපිට කොයිතරම් ආදර්ශමත් ද කියලා හිතන්න. හිතවත් අවංක සැලී. ඇත්තටම සැලී හැදුණ ළමයෙක් වගේ පන්තියේ ඉඳගෙන ඉන්නවා දකිනකොට මට මගේ වැරදි ගැන පුදුම ලැජ්ජාවක් හිතෙන්නේ. විහිළු කරන්නේ නැහැ. හිනාවෙන්නේ නැහැ. අපි හැමෝටම මොනතරම් ආදර්ශයක් ද!"

තවමත් ඩැරල්ට තරහා ගොස් ඇත්දැයි හොර බැල්මක් හෙළන ඇලිසියා කියනවා. ඩැරල් නැඟිට පසෙකට ගියේ නම් දෙදෙනා එය ඔවුන්ගේ ජයග්‍රහණයක් ලෙස සලකනවා.

මෙලෙස, ඩැරල්ගේ සිතට ඒ දින කීපය පුරා සැනසිල්ල තිබුණේ නැහැ. එමෙන්ම එලෙස නොරුස්සනා ලීලාවකින් අයෙක් පසු වුණා. ඒ එලන්.

ඇය කැවුලට පත් පෙනුමින් වුවද පසුගිය සති කීපය සමබර සිතින් යුතුව පසුවුණා. අනතුරුව හදිසියේම ගිරිහැරුණ ලෙස හැසිරුණ ඇය දැරියන්ට කඩා පනින්නට වූ අතර ඇය නළලේ වූ රැල්ල නිසා ඇය නිතර රවා සිටින කෙනෙකු ලෙස පෙනුණා.

සිදුව ඇත්තේ කුමක් දැයි සොයා ගැනීමට ජීන් පමණ වෙරදැරුවා. සැලී ද වෙහෙසුණ මුත් එලන් සිතුවේ පන්ති නායිකාව ලෙස සැලී තම බලය යොදා තමාගේ හැසිරීම පාලනය කිරීමට සැරසෙන බවයි. එහෙයින් ඈ සැලීට කඩාපැන බැ වැදුණ අතර සිත රිදුණ පන්ති නායිකාව විමතියට පත් වූ තවත් කිසිවක් කීමට ගියේ නැහැ.

"විකාර කෙල්ලක්!" ඩැරල්ට කිව්වා. "මට එයාව තේරුම් ගන්න බැහැ. එයා මැලෝරි ටවර්ස්වලට එන්න ශිෂ්‍යත්වයක් දි ගත්තා නම් හුඟක් දක්ෂ කෙනෙක් වෙන්න ඕනෑ. ඒ වගේම එයා අපි වගේ නොවෙයි, අපටත් වඩා මහන්සියෙන් වැඩ කරනවා ඒත් කවදාවත් එයා පළමුවෙනියා තියා පළවෙනි දහහතරදෙනා අතරටවත් ඇවිදින් නැහැ.! මම හිතන්නේ ඒ ගැන තරහින් තමයි එයා කේන්ති ගන්නේ..මම එයාට කැමැති නැහැ."

"මමත් එහෙමයි." ඩැරල් කිව්වා. "එයා ගැන කරදර වෙන්න වටින්නේ නැහැ, සැලී. එයාව අතහැරලා දාන්න."

"ඔ, මම හිතන්නේ කරදර වෙන එකේ ප්‍රයෝජනයක් තියෙනවා." සැලී කිව්වා.

"ඔහොම කෙනෙක් එහෙමයි. මම ජීන්ට කියන්නම් එයා එක්ක කතා කරලා බලන්න කියලා. පන්තියේ එයා ළඟම ඉන්නේ ජීන්."

ජීන් කිසිවක් නොසිතා නොවළහා කතා කරන, වැංකියක් මෙන් බාධක බිඳගෙන අවශ්‍ය තැනට යන හා තමා අවශ්‍ය දේ දැන ගැනීමට උත්සාහය අත් නොහරින දැරියක්



එහෙත් මේ කාරණයේ දී ඇයට ද එලන්ව හරි හැටි මෙල්ල කර ගැනීමට නොහැකි වුණා. ඇය පන්තියේදී ඇගේ අසුනට යාබද අසුනේ සිටි අතර නිදන කාමරයේ දී ඈ නිදා ගත්තේ ඇගේ ඇඳට යාබද ඇඳෙයි. එහෙයින් ඇය බොහෝ අවස්ථාවලදී එලන් කල්පනාවකින් තොරව සුසුම්ලනු හා කෙඳිරිලි නඟනු අසා තිබුණා. මහන්සියෙන් වැඩ කරන විට හා නින්දට යනවිට මෙය සාමාන්‍යයෙන් සිදු වූ දෙයක්!

රාත්‍රියේ දී බොහෝ විට එලන් නිදි වර්ජිතව සිටි බව හා ඇය යමක් ගැන මහත් සේ කැවුලෙන් පසුවන බව ඈ දැන සිටියා. එලන්ට සම්පව මෙය දැන ගන්නේ කෙසේ දැයි ඈ නිතර කල්පනා කළා. කාරණය කුමක් ද යන්න හා කළ යුත්තේ කුමක් දැයි යන්න සෘජුව ඇසීම හැරුණ විට වෙනත් මගක් ඇති බව පෙනුණේ නැහැ.

එහෙත් ඉන් යමක් සිදු නොවනු ඇත. සැලීට කඩා පැන්නාක් මෙන්ම එලන් කඩා පනිනු ඇත. මෙලෙස එක් වරක් කාරණය ගැන සිතා බැලූ ජීන් සුපුරුදු පරිදි අප්‍රවේසමෙන් වැඩ නොකර කිසිවක් ක්‍රියාවට නැඟුවේ නැහැ.

එලන්ට මිතුරියක් සිටියේ නැහැ. අඩුම තරමේ ශාන්ත එමිලි වැනි අයෙකු හෝ මිතුරියක කර ගැනීමට දිරි උපදවා ගත්තේ නැහැ. බලහත්කාර මැදිහත්වීමකින් තොරව මිතුරුදමක් ගොඩ නැඟෙන අයුරින් ජීන් රැඳී සිටියා. කාරණය කුමක්දැයි කිසිදින එලන්ගෙන් බලෙන් දැන ගැනීමට ඇයට නොහැකි වනු ඇත. එහෙත් ඇය විසින්ම එය කියන තරමට තමාව විශ්වාස කිරීමට එලන් පෙලඹෙනු ඇත. අනෙක් අයගේ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ගොස් බොහෝ ප්‍රශ්නවලට මෙම දුරදිග නොබලන ස්කොට් දැරිය මුහුණ පාන නිසා ඇගේ පැත්තෙන් ගත් කල මෙය පැසසීමට වටිනා අදහසක්.

එහෙත් තමා අපොහොසත් වූ බව පවසා එලන් සම්බන්ධ කාරණයට අත ගසන ලෙස සැලී ඇයට කියන විට ඇයට ඇය ගැන ආඩම්බරයක් දැනුණා. මෙලෙස, එලන් එම අවස්ථාවේ එය තේරුම් නොගත්ත ද ජීන් කරුණාවන්ත වීමට හා යම් යම් ආකාරවලින් සුළු උදව් කිරීමට පටන් ගත්තා.

එලන්ගේ නැති වූ ක්‍රීඩා සපත්තු යුවළ සොයා ගැනීමට ඇයට නොහැකි වූ විට ජීන් ද එය සොයා දිගු කලක් ගත කළා. එලන්ගේ දෙමව්පියන්ගේ ඡායාරූපයේ වීදුරුව බිඳුණු විට ඈ ඒ ගැන ඉතා අනුකම්පාසහගත වී ඊළඟට සාප්පු යන දිනයක දී එයට වීදුරුවක් කප්පවා ගෙන ඒමට පොරොන්දු වුණා. එලන් ස්නානය කළ විට ඇගේ කොණ්ඩයේ තෙත මාත්තුකර දීමට ඇය ඉදිරිපත් වුණා. ඒවා එලන් පමණක් නොව වෙනත් කිසිවකු හෝ විශේෂයක් ලෙස නොදකින ඉතා සාමාන්‍ය දේවල්.

එහෙත් ක්‍රම ක්‍රමයෙන් එලන් මෙම සූක්ෂම ස්කොට් දැරිය ගැන විශ්වාසය තැබීමට පෙලඹුණා. තදින් හිසරදය තිබුණ විටක එය නේවාසිකාගාර පාලිකාවට කීමට අකමැති වුවද ඈ එය ජීන් සමග කිව්වා. සෑම කෙනෙකුටම කඩා පැන බැණ වැදුණ ද ජීන්ට කඩා පැනීම ඈ නැවැත්වූවා.

එම දිනවල කාලගුණය අයහපත් වූ නිසා ලැක්රෝස් පන්දු ක්‍රීඩාව නොකෙරුණා මෙන්ම පාද චාරිකා ද සිදුවුණේ නැහැ. ඒ අවට ප්‍රදේශය අධික ලෙස මඩ වී තිබුණ නිසයි. දැරියෝ නිවාස තුළම කොටුව සිටි නිසා නොසන්සුන්ව සිටි හෙයින් කාලගුණය කෙසේ වුවද ඊළඟ දිනයේ පාගමනක් යාමට ගුරුතුමියෝ තීරණය කළා.

සෑම කෙනෙක්ම කෙඳිරි ගෑවා. වර්ෂාව තදින් ඇද හැළුණා. කළු වූ අහස් ගැබ පහත් වුණා. ලැක්රෝස් පන්දු පිටි ජලයෙන් යට වී තිබුණා. ගම්බද පාරවල් කුමන තත්ත්වයක් ගනු ඇති ද? මුහුද අළු-කොළ පැහැයෙන් රුදුරු බවක් ගෙන තිබූ අතර ගල් තලාව මතින් හැමූ සුළඟ බිහිසුණු වූ නිසා දැරියන් ගසාගෙන යාමට ඉඩ තිබූ හෙයින් කිසිවෙකුට පිටතට යාමට අවසර තිබුණේ නැහැ.

තදින්ම කන් කෙඳිරි ගෑවේ ඩැෆනි හා ගොන්ඩොලින්. තමාට තද ප්‍රතිශ්‍යාවක් ඇතැයි සිතා එළිමහන් ගමන්වලින් වළකින ලෙස පාකර් ගුරුතුමිය කියනු ඇතැයි සිතූ ගොන්ඩොලින් පන්තියේ දී තදින් කිවිසුම් හැරියා. එහෙත් ගොන්ඩොලින්ගේ නාසය ඉහළට ඇදීම ගැන පොට්ස් ගුරුතුමිය කල් ඇතිව පාකර් ගුරුතුමියට අනතුරු අඟවා තිබුණ නිසා කිසිදු අනුකම්පාවක් ලැබුණේ නැහැ.



“තවත් නාසය සූරන්න ඕනෑ නම්, ඔයාට පුළුවන් එළියට ගිහින් ඒක කරන්න.” ඈ කිව්වා. “මට දරන්න බැරි දෙයක් තියෙනවා නම් ඒ ඉහළට අදින එක. හරි පිළිකුල් සහගතයි ගොන්ඩොලින්.”

ගොන්ඩොලින් රවා ගත්තා. තමාගේ නිවසේ ආයා, විත්ටර් මහත්මිය, වැනි පාසල් ගුරුතුමියන් නැත්තේ ඇයි? ඈ නිතරම උණ කටුව ද ගෙන ඇය වෙතට දුව එනවා. එමෙන්ම ඇය උගුර පෑදුව හොත් මෙවැනි නරක කාලගුණයක දී කිසිම කිසිදාක එළිමහනේ ඇවිදීමට යාමට අවසර දෙන්නේ නැහැ.

නැවතත් නාසයෙන් ඉහළට ඇදීමට ඇය නිර්භීත නොවූ අතර ඇගේ සිත රිදුණා. ඩැෆනි ඇය දෙස අනුකම්පාවෙන් බැලුවා. ඒ ඇය ගොන්ඩොලින්ට ප්‍රතිශ්‍යාවක් තිබීම හෝ නොතිබීම ගැන තැකූ නිසා නොවෙයි, ගොන්ඩොලින් අනුකම්පාවට මහත් රුචියක් දැක්වූ නිසයි.

ඩැෆනි ද පා ගමන්වලින් වැළකී සිටීමට උපායක් යොදමින් සිටියා. සැතපුම් ගණනක් මඩ ගොහොරුවල බැස ඇවිදීමට ඇයට අදහසක් තිබුණේ නැහැ. එම සැන්දෑවේ ප්‍රංශ අභ්‍යාස පොත ද ගෙන ඈ මම්සලී ඩුපොන්ට් වෙතට ගියා. තම සුන්දරම සිනාව පැලැඳ ගත් ඈ මම්සලී හා පොට්ස් ගුරුතුමිය එකට සිටින කුඩා කාමරයේ දොරට තට්ටු කළා. පොට්ට් එහි නොසිටිනු ඇතැයි ඈ දැඩිසේ බලාපොරොත්තු වුණා. ඩැෆනි දැකීමෙන් පොට්ට් නිතරම සිත නරක් කරගත් බවක් පෙනුණා.

වාසනාවකට පොට්ට් සිටියේ නැහැ.

“ඕ, ඔයා, මගේ වස්තුව, ඩැෆනි!” ඩැෆනිගේ මෙන්ම සුන්දර සිනාවකින් යුතුව මම්සලී තම ප්‍රියතම සිසුවිය සාදරයෙන් පිළිගත්තා.

“ඔයාට මා එක්ක කියන්න දෙයක් තියෙනවාද? මොනවා හරි දෙයක් තේරෙන්නේ නැතිව නේද?” “ඕ, මම්සලී මට මේ කාලභේද හරිම අවුලක්!” ඩැෆනි කිව්වා. “මට ඇත්තටම හිතෙනවා ඔයාට වෙලාවක් තියෙනවා නම් මට වැඩිපුර ඉගෙනීමක් තිබුණොත් හොඳයි කියලා. මගේ ප්‍රංශ හොඳින් කර ගන්න ලොකු වුවමනාවක් තියෙන්නේ.”

"ඒත් ඔයා දැන් හුඟක් හොඳයි, ළමයෝ!" ඩැෆනිගේ බො... ප්‍රංශ අභ්‍යාස කර දෙන්නේ නම් මේරි ලෝව් බව නොදැන මම්සලී සතුටින් කෑ ගැසුවා. "මට ඔයා ගැන සතුටුයි."

ඩැෆනි නැවතත් සුන්දර සිනාව පැලඳ ගත් අතර මම්සලීගේ හදවත නවත් උණු වුණා. ඕ, මේ සුන්දර ඩැෆනි! ඈ තම ... ඇයව ළං කර ගත්තා. "ඔව්, ඔව්, ඇත්තෙන්ම මම ඔයාට අමතර ඉගැන්වීමක් කරන්නම්." ඈ කිව්වා. "අපි ඉක්මනින්ම ගැටලු විසඳා ගනිමු. ඔයා දැන්ම නවතිනවාද වස්තුවේ?"

"නැහැ, දැන් නොවෙයි, මම්සලී" ඩැෆනි කිව්වා. "... හෙට අර අපූරු පා ගමන අතහැරලා හරි මම එන්නම්, ඔයාට ... වෙලාවට මට උදව් කරන්න පුළුවන්නම්. ඒ වෙලාව විතරයි ම... ඉතුරුවෙලා තියෙන්නේ."



"හොඳ ළමයා, ළමයි හැමෝම ආස කරන චාරිකාව ඇ... හැරලා එනවා." සියලු පා ගමන් අනුවණ ක්‍රියා ලෙස සැලකූ මම්සලී කෑ ගැසුවා. "ඔව්, මම ඒ වෙලාවට ඔයාව ගන්නම්. මු... මිස් පාකර්ට කියන්නම්. ඔයා හොඳ ළමයෙක්, ඩැෆනි. මට ඔයා ගැන සතුටුයි."

"ස්තුතියි, මම්සලී" සතුටින් කී ඩැෆනි මම්සලීට ආකර්ෂණීය සිනාවක් පා ජයග්‍රාහී හැඟුමින් පිටතට ගියා.



## 09

පන්තිය සමග දීර්ඝ පා ගමන යාම සඳහා ඩැෆනි නොපැමිණෙන බව දැන ගත් පාකර් මහත්මිය පුදුමයටත් සිත් අමාරුවටත් පත් වුණා. ඈ අමනාපයෙන් යුතුව මම්සලී දෙස බැලුවා. "ඒත්, ඇයි මේ හදිස්සියේම ඩැෆනිට ප්‍රංශ ගැන ආශාවක් ඇතිවුණේ." ඈ කිව්වා.

"එයා දිග ගමනක් යන්න හොඳටම වටිනා කෙනෙක්. ඔව්, මේ වගේ මඩ ගොඩක යන ගමනක්ම තමයි එයාට අවශ්‍ය. එයාගේ බොරු සෝබන ටිකක් අඩු කරන්න! එයාට අමතර පාඩම් වෙන වෙලාවක කරන්න, මම්සලී.

එහෙත් මම්සලී මුරණ්ඩු වුණා. ඈ විශාල නාසය සහිත පාකර් ගුරුතුමියට ඇලුම් කළේ නැහැ. ඈ තම සිහින් දෙතොල් තදින් පියවාගෙන හිස වැනුවා.

"මට ඩැෆනිට වෙන වෙලාවක උගන්වන්න බැහැ. ඒ තරම් හොඳ ගමනක් අතහැරලා ඒ ළමයා ප්‍රංශ ඉගෙන ගන්න එන එක හොඳ දෙයක්."

පාකර් ගුරුතුමිය මම්සලීගේ සිත රිදවන, ඇදහිය නොහැකි හඬක් එක්වරම නිකුත් කළා.

"එයාට ඕනෑ ගමන මඟ හරින්න. ඔයා ඒක හොඳටම දන්නවා මම්සලී. එයාට එයාගේම හිතුමතේට වැඩ කරන්න දෙන එක මෝඩ කමක්! ඩැෆනි තමන්ට ඕනෑ දේ කොහොම හරි කර ගන්නවා, මම කැමති නැහැ එයාගේ කපටිකම්වලට. කිසිම අවංක කමක් නැහැ."

තම ප්‍රියතම සිසුවිය වෙනුවෙන් පෙනී සිටි මම්සලි අභියෝක්තියෙන් කතා කිරීමට පටන් ගත්තා. "මිස් පාකර්! ඒ ළමයා පා ගමන යන්න මොනතරම් ආශාවෙන් ද හිටියේ කියලා ඔයා දන්නවා නම්! පාරවල් දිගේ මඩ නාගෙන දුවන්න, ඕ, මූණු සුළඟ ඉහළට ඇදලා නාස් පුඩු හිර කර ගන්න. ඒ හැම දෙයක්ම කැප කරපු ඩැෆනිට බණින්න නොවෙයි ප්‍රශංසා කරන්නයි වටින්නේ. ඔයාලා එළියට ගිහින් හොඳට විනෝද වෙද්දී එයා මාත් එක්ක හුඟක් මහන්සියෙන් වැඩ කරයි."

"හොඳයි, එයා ඔයාව අල්ලා ගන්න තරම් ලේසියෙන් මම්සලි රොජර්ව නම් අල්ලා ගන්න එකක් නැහැ." තම කෝපය ඇවිස්සෙන අතරේ පාකර් ගුරුතුමිය කිව්වා.

"එයාට ඩැෆනිගේ කපටිකම් තේරෙනවා!"

මම්සලිගේ කෝපය නැඟෙන්නට වුණා. "මම මම්සලි රොජර් එක්කත් වචනයක් කතා කරන්නම්." ඈ පටන් ගත්තා.

"වචනයක් නොවෙයි වචන තුන හතර පහක්ම මම කතා කරන්නම්. මේ තරම් හොඳට ප්‍රංශවලට උනන්දුවෙලා ඉහළට ඇවිත් තියෙන ඩැෆනිට විරුද්ධව එයාට එක වචනයක් කතා කරන්න බැහැ."

"අපි මේ කතාව නවත්වමු." ඩැෆනි ගැන තදින්ම කලකිරුණු පාකර් ගුරුතුමිය කිව්වා.

"අවශ්‍ය නම් මම්සලි රොජර් එක්ක ඒ ගැන කතා කරලා බලන්න. මට කමක් නැහැ. මම කතා කළේ ඩැෆනි අපෙන් අයුතු ප්‍රයෝජන ගන්න එක ගැනයි. වැලපෙන, කෙඳිරිගාන, ගාට ගාටා එන ඒ කෙල්ල අපේ ගමනට එක් නොවෙන එකම හොඳයි කියලා මම සතුටු වෙනවා."

තමා පා ගමනින් වැළකී සිටීමට කළ දේ ගැන අනිත් අය සමග පවසා නොසිටීමට ඩැෆනිට නොහැකි වුණා. තමාට ද එසේ කිරීමට හැකියාවක් තිබුණේ නම් කොතරම් හොඳදැයි ගොන්ඩොලින් කල්පනා කරන්නට වුණා. අනෙක් හැමෝම වංචනික පහත් උපාය අවංකවම පිළිකුල් කළා.



"පා ගමනක් යන එකෙන් මඟ හරින්න එතරම් දේවල් කරන්නම ඕනෑද කියලා හිතා ගන්නත් බැහැ." ඩැරල් කිව්වා.

"සපත්තු දාගෙන මඩ ගොඩවල් දිගේ යන එක හරිම විනෝදයක්. හොඳයි, මුළු දවසම ප්‍රංශ ක්‍රියාපද පාඩම් කර කර ඉන්න ආස නම් ඔයාට දෙවියන්ගේම පිහිටයි. ඒක ඔයාගේ වාසනාවක්, ඩැෆනි."

එහෙත් චාරිකා යාමක් සිදු වුණේ නැහැ. සුළඟ චණ්ඩ මාරුතයක් බවට හැරෙන්නට වූ හෙයින් පාකර් ගුරුතුමිය එය කල් දැමීම යහපත් බව තීරණය කළා. පණිවිඩය දීමට පාකර් ගුරුතුමිය ඇඳුම් කාමරයට එද්දී දැරියෝ ඔවුන්ගේ ක්‍රීඩා සපත්තු හා උඩු කබා පැලඳ ගනිමින් සිටියා. ඒ වන විට ඩැෆනි තම ප්‍රංශ අභ්‍යාස පොත ගෙන මම්සලි වෙත ගොස් තිබුණා.

"ළමයි! මට කනගාටුයි. සුළඟ දරුණු කුණාටුවක් බවට පත්වෙලා." හදිසියේම ඇඳුම් කාමරයේ දර්ශනය වූ පාකර් ගුරුතුමිය කිව්වා.

"ගමන කල් දමනවා. ඒ වෙනුවට අපි ක්‍රීඩාගාරයට ගිහින් කැමති ඕනෑම සෙල්ලමක් කරමු. හොඳද? අපි මේට්‍රන්ට කියලා එළිමහන් තේ පැන් සංග්‍රහයක් ලෑස්ති කරමු. ඒක අපූරු වෙනසක් වෙයි. ඔයාලා කිපදෙනෙක් බඩු ටික ගේන්න එන්න ඕනෑ."

දැරියෝ සතුටින් ඉපිලුණා. අපූරු සෙල්ලම් දවසක්. ඔට්ටු සෙල්ලම්, හැංගිමුත්තන්, කෑගහල හිනාවෙන්න හෝ ඕනෑම ක්‍රීඩාවක්, ඊට පසුව බිම ඉඳගෙන තේ පැන් සංග්‍රහයක්, අපූරු වෙනසක්. පිරිස රැස්ව සෙල්ලම් කරන තැනට නේවාසිකාගාර පාලිකාව පැමිණියා. ඈ චොක්ලට් කේක් හතරක් හා මී පැණි බඳුන් දෙකක් ද සංග්‍රහයට රැගෙන ආවා. දැරියෝ ඉමහත් ප්‍රීතියට පැමිණුනා.

"එතකොට ඩැෆනි, මිස් පාකර්?" ඩැෆනි මම්සලි සමග සිටින බව සිහිවූ මේරි ලෝව් ඇසුවා.

"මම ගිහින් එයාව එක්ක එන්න ද?"

"මෝඩි!" ඇලිසියා තපුරු හඬින් කෙඳිරුවා. "ඩැෆනි ගැන මිස් පාකර්ට මතක් කරන්නවත් හිතන්න එපා. මෙච්චර මහ හරිහවාට එයාට හොඳ වැඩේ. මට එයා ගැන හිතෙන දේ මේරි ලෝව්ට මම තව ටිකකින් කියලා දෙන්නම්."

මේරි ලෝව්ගේ උද්‍යෝගිමත් මුහුණ දෙස බැලූ පාකර් ගුරුතුමිය මේරි ලෝව්ට ඩැරල් හා සැලී මිතුරියන් ලෙස සිටියදීත් ඩැෆනි ගැන ඒතරම් උනන්දුවන්නේ මන්දැයි පුදුමයට පත් වුණා.

"ඔ, මේරී ලෝව්, එපා. ඔයා ඩැෆනිට බාධා කරන්න එපා." අසා සිටින සියලු දැරියන්ට ඇසෙන පරිදි ඉතා පැහැදිලි උස් හඬින් පාකර් ගුරුතුමිය කිව්වා.

"එයාට අමතර පාඩම් කරන්න ලොකු උවමනාවක් තියෙනවා කියලා මම්සලී මා එක්ක කිව්වා. ඒකයි එයා අමාරුවෙන් හරි මේ ගමන අතහැරලා පාඩම් කරන්න ගියේ. එයාට සෙල්ලම්, පා ගමන් තේ හෝ කිසිම දේකට වැඩිය පාඩම් වටිනවා. ළමයෙක් ඉගෙන ගන්න ඒ තරම් කැප කිරීම් කරද්දී ඒකට බාධා කිරීම පව්!"

පාකර් ගුරුතුමියගේ වදන්වල ගැබ් වූ සියුම් උපහාසය තේරුම් ගත නොහැකි වූයේ මේරි ලෝව්ට පමණයි. එය අවබෝධ කර ගත් අනෙක් හැමෝම මහත් හඬ නගා සිනාසුණා. පාකර් ගුරුතුමිය මඳ සිනාවක් පෑවා පමණයි.

"කපටි ඩැෆනිට හොඳ වැඩේ." ඇලිසියා කිව්වා.

ඒ සවස් යාමය ඔවුන්ට දුව පැන නැටීමට හෝ කැකෝ ගසා පෙරළීමට හෝ රිසි අයුරින් දැඟලීමට අවස්ථාවක් වූ හෙයින් ඔවුන් දූවිලි තවරාගෙන වෙහෙසට පත්ව සිටියා. ඉන්පසුව ඔවුන් වාඩිවූයේ පෙති කැපූ පාන් සමග බටර් ද මී පැණි හා චොක්ලට් කේක් සහිත තේ පැන් සංග්‍රහයටයි.

අවසාන කේක් කැබැල්ල කා හමාර කරන විටම වාගේ ඩැෆනි පැමිණියා. ඇයට අවශ්‍ය වන පරිදිම මම්සලී ඩූපොන්ට ප්‍රංශ ක්‍රියා පද පිළිබඳ පාඩම් හා අභ්‍යාස දවස පුරාම කරවන්නට වූ හෙයින් ඇය ගත කර තිබුණේ ඉමහත් අප්‍රසන්න දවසක්. මම්සලී එකම වචනය සිය වතාවකට වඩා ඇ ලවා ලියෙව්වා පමණක්



නොවෙයි, ඒවා නිවැරදිව හඬ නගා කීමට මහත් සේ ඩැෆනිට බල කරමින් ඇයට මහත් වූ දුෂ්කර කාලයක් ලබා දුන්නා.

එවැනි අමතර පන්තියක් කිසිදින නොඉල්ලුවේ නම් කොතරම් හොඳ දැයි ඇ කල්පනා කළා. තමා ගැන පුරසාරම් දොඩමින් මම්සලී සමග කල් ගත කළ හැකි වෙතැයි ඇය සිතා තිබුණා. එහෙත්, මම්සලී ඩැෆනිට මහත් සේ ඇලූම් කළ ද දැරියට ඉගැන්වීමේ කටයුත්තේ දී තම රාජකාරිය නිවැරදිව ඉටු කිරීමට සිතට ගෙන තිබුණා. එහෙයින් අසරණ ඩැෆනි ලොකු අමාරුවක වැටුණා. ඒ නිසා, තමා නිසා මම්සලී ඉතා වෙහෙසට පත්වීම ගැන සමාව අයදින බව කී ඇ අනෙක් දැරියන් ආපසු එන හඬ ඇසුණ විට නැවත ඔවුන් සමග එකතු වන්නට අවසර ඉල්ලුවා.

"එයාලා ආපසු එන ශබ්දය අපට ඇසෙයි." මම්සලී කිව්වා. ඔවුන් පිටතට නොගොස් තිබූ බවක් ඇය දැන සිටියේ නැහැ.

"එයාලා ආව ගමන්ම ඔයාටත් ගිහින් එයාලා එක්ක තේ බොන්න පුළුවන්, දරුවෝ. අවංක හිතින් කන කෑම තමයි ඇඟට අල්ලන්නේ."

දැරියන් ආපසු එන හඬක් නොනැගෙන විටදී මම්සලී ඩැෆනිව පිටතට යැව්වේ සිදුව ඇත්තේ කුමක්දැයි බැලීමට වූ අතර දෙවැනි පන්තියේ දැරියන් ක්‍රීඩාගාරයට වැදී සෙල්ලම් කරමින් විශාල කේක් ගෙඩි හතරක් අවසන් කර හිස් වූ පිඟන් පසෙක තබා තේ බොන අයුරු දුටු ඩැෆනි හැඬුම් බර වුණා.

"ඔයාලා ඊරියෝ" ඇ කෑගැසුවා.

"ඔයාලා ඇවිදින්න යන්නේ නැතිව මට හොරෙන් තේ බිව්වා."

"ඔයාගේ අමතර පාඩම්වලට බාධා කරන එක හොඳ නැහැ නේද?" නියවමින් ඇලිසියා කිව්වා.

"ඔයා පාඩම් ගැන හුඟක් උනන්දු හින්දා මිස් පාකර් කිව්වේ ඔයාට බාධා කරන එක පව් කියලා."

ඩැෆනි ගොන්ඩොලින්ට රැව්වා. "ඔයාට තිබුණා මාව හොයාගෙන එන්න." ඇ කිව්වා.

"ඔයාට හිමින්ම ඇවිදින් මට කියන්න තිබුණා."

"මේරි ලෝව්ට විතරයි ඔයා ගැන මතක් වුණේ." සැලි කිව්වා.

"එයා ඇක්තටම මිස් පාකර් ළඟට ගිහින් ඇහුවා ඔයාව එක්ක එන්නද කියලා. ක්‍රීඩාවලට හරි, පා ගමන්වලට හරි වැඩියෙන් පාඩම් ඉගෙන ගන්න එක හොඳයි කියලා මේරි ලෝව් දන්නේ නැහැ."

මේරි ලෝව් දෙස බැලූ ඩැෆනිට ඇය කෙරෙහි උණුසුම් ඇල්මක් ඇති වුණා. ඇගේ මිතුරිය, ගොන්ඩොලින් පවා තමන්ව අමිහිරි ප්‍රංශ පාඩම්වලින් මුදාගෙන සෙල්ලමට කැඳවා ගැනීමට උත්සාහ කර තිබුණේ නැහැ. එහෙත් මේරි ලෝව් උත්සාහ කර තිබුණා. මේරි ලෝව් ඇයට පක්ෂපාතිව කටයුතු කර තිබුණා.

"ස්තුතියි මේරි ලෝව්." ඈ කිව්වා.

කුඩා දැරිය තමාට ප්‍රංශ අභ්‍යාසවලදී උදව් කිරීමට පමණක් නිසා නොව ඇය සැබැවින්ම තමාට උදව් කර ඇලුම් කරන නිසා ඩැෆනි ඇයට අවංකවම මිහිරි සිනාවකින් සංග්‍රහ කළා. සැබැවින්ම මින් පෙර ඩැෆනි කිසිවෙකුට සැබෑ කැමැත්තක් දක්වා තිබුණේ නැහැ. එහෙත් මේරි ලෝව් ඇයට පක්ෂපාතී වී තිබුණා.

"මම ඔයාව කවදාවත් අමතක කරන්නේ නැහැ. ඔයා හොඳ කෙනෙක්." එතැන් සිට ආත්මාර්ථකාමී, පුරාජේරු දොඩන හා විශ්වාසයක් තැබිය නොහැකි ඩැෆනි කුඩා මේරි ලෝව්ට හොඳින් සැලකුවා.



## 10

**සෑ**ම පන්තියක්ම වාර අවසානයේ යම් විශේෂාංගයක් ඉදිරිපත් කළ යුතුව තිබුණා. මම්සලී රොජර් කෝරන හා මම්සලී ඩූපොන්ට් කෝරන ප්‍රංශ නාට්‍ය දෙකක් ද කිරීමට අනිවාර්ය වුණා.

මෙම නාට්‍යවල විවිධ චරිත සඳහා දැරියන් තෝරා ගැනීම සම්බන්ධයෙනුයි මම්සලීලා දෙදෙන සමහර විට අතින් පයින් දබර කර ගන්නා තරමට හැප්පුණේ.

එක් නාට්‍යයක කුමාරිකාවක් සිටියා. අනෙක් නාට්‍යයේ සුරංගනාවක් සිටියා. මම්සලී ඩූපොන්ට්ට තම ප්‍රියතම සිසුවිය, ඩැෆනිට මෙම චරිත දෙකම දෙන්නට උවමනා වුණා. සුන්දර රන්වන් කෙස් කළඹක් ඇති දැරිය කුමාරිකාව ලෙස ඇගේ සිතේ මැවුණා. ආහ්, ඇය කොතරම් පුදුමාකාර ලෙස පෙනෙනු ඇති ද? එමෙන්ම සුරංගනාව ලෙසත්. ඇත්තෙන්ම ඩැෆනි සුරංගනා චරිතයටම සුදුසු කෙනෙක් වුණා.

එහෙත් අවාසනාවකට මෙන් මම්සලී රොජර්ට තිබුණේ වෙනස් අදහසක්.

"මොනවා! ඒ මෝඩ තකතීරු කෙල්ල මේවාගේ වැදගත් චරිත දෙකකට ඔයා තෝරා ගන්නවා?" මම්සලී රොජර් අවඥාවෙන් ඇසුවා.

"එයාට කවදාවත් දෙබස්වල භාගයක්වත් පාඩම් කර ගන්න බැහැ. එයාගේ උච්චාරණය අත්-තිමයි-වැඩකට නැහැ. ඔයා දන්නවා ඒක. මම ගන්නේ නැහැ ඒ කෙල්ල හොඳ චරිතයකට."

"ඒත් එයා ඒ චරිතයට හරියටම ගැළපෙනවා." තම සිත අවධාරණය කිරීමට අතපය විසි කරමින් මම්සලී ඩූපොන්ට් කෑ ගැහුවා.

"එයා ඇත්තම කුමාරිකාවක් වගේ. එයා සිනාසෙන්නෙත් හරියටම සුරදූතිකාවක් වගේ."

"පෝහ්!" මම්සලී රොජර් නපුරු හඬක් නැඟුවා.

"එයා ඔයාගේ හුරතලියක්, ඔයාගේ පූස් පැටියෙක්. හරි, සැලී ඔය එක චරිතයක් හොඳට කරයි. එයාගේ උච්චාරණය හොඳ නිසා එයා හොඳට ඉගෙන ගනියි. එහෙම නැතිනම් ඩැරල්, ඒත් නැති නම් මේරි ලෝවි වුණත් හොඳින් ප්‍රංශ කතා කරන්න ඕනෑ විදියට කරන නිසා ඩැෆනිට වඩා හොඳයි.

"ඔහේට පිස්සු!" මම්සලී ඩූපොන්ට් කෑ ගැහැව්වා.

"ඒ ළමයි හැමෝටම මේ වගේ චරිත කරන්න පුළුවන් වගේනේ කතාව."



"එහෙම නම් නාට්‍යවලට මගේ සම්බන්ධයක් නැහැ." මම්සලී රොජර් දැඩි ලෙස කිව්වා.



"ඔයා කරන විදියට හැම තිස්සෙම තමන්ට විශේෂ අය දාගෙන නාට්‍ය කරන්න බැහැ."

"මට විශේෂ අය නැහැ." පොළොවේ අඩි හප්පමින් මම්සලී කිව්වා. "මම හැම ළමයාටම එක වගේ කැමතියි."

මම්සලී රොජර් විශ්වාසයෙන් තොරව නාසයෙන් පිම්බා. "එහෙම හිතන්නේ ඔයා විතරයි." ඈ කිව්වා. "ආයුබෝවන් මම්සලී. මට ඩැෆනි වගේ කෙල්ලක් ගැන විකාර කතා කර කර තර්ක කරන්න පුළුවන් කමක් නැහැ."

වහා කැරකුණ ඈ රිටක් සේ තම කෙසඟ සිරුර සෘජු කර ගෙන ඉවතට ඇවිද ගියා. පුෂ්ටිමත් කුඩා මම්සලී ඩූපොන්ට් කෝපයෙන් ඇය දෙස බලා සිටියා. හුරතලියෝ ඇත්තෙන්ම! එවැනි දෙයක් කීමට මම්සලීට ඇති එඩිතරකම. නැවත නම් ඈ මම්සලී රොජර් සමග කතා කරන්නේ නැහැ. කවම කවදාකවත් නැහැ. ඈ මැලෝරි ටවර්ස් හැර යනවා. ඈ තම ආදරණීය ප්‍රංශය බලා යනවා. අද මේ ගැන පුවත්පත්වලට ලියනවා. මම්සලී ඩූපොන්ට් සුනඛයෙකු බඳු හඬක් නඟන්නට වූ අතර දොර වෙතින් ඇතුළට එන පොට්ස් ගුරුතුමිය තිගැස්සුණා.

"අසනීපයක් ද, මම්සලී?" මම්සලීගේ රතු වූ මුහුණ හා රවා ගත් දෙනෙත් දැක ගත් ඈ ඇසුවා.

"මට කොහෙත්ම සනීපයක් නැහැ. මට හොඳටම අපහාස කළා." මම්සලී ඩූපොන්ට් කිව්වා. "මගේ නාට්‍යයට ළමයින්ව තෝරා ගන්න මට ඉඩක් නැහැ. කුමාරිකාවගේ චරිතයට ලස්සන හුරුබුහුටි ඩැෆනි තෝරා ගන්නවාට මම්සලී රොජර් විරුද්ධයි. එයා මට කිසිම ඉඩක් දෙන්නේ නැහැ. මට ඩැෆනිට සුරංගනාවගේ චරිතය දෙන්න ඉඩදෙන්නේ නැහැ."

"හොඳයි, මම කියන්න ඕනෑ මමත් එයාට එකඟයි." කියලා වාඩි වී තම පොත් සකස් කරමින් පොට්ස් ගුරුතුමිය කිව්වා.

"මට නම් පෙනෙන්නේ ඩැෆනි දෙපිටකාට්ටු පහත් ළමයෙක් කියලයි."

"ඔයත් මට විරුද්ධව කුමන්ත්‍රණය කරනවා." නාටකයක ස්වරූපයක් ආරූඪ කර ගනිමින් කෝපයෙන් දෙනෙත් කඳුළු පුරවාගෙන මම්සලී කිව්වා. "ඔයත් එහෙමයි. ඕ,නපුරු මිනිස්සු! මි මේ."

ඒ මොහොතේම කිසිවකු දොරට තට්ටු කරනු ඇසී පොට්ස් ගුරුතුමිය සතුටට පත් වුණා. එම ස්වරූපයෙන් සිටින මම්සලී සමග තවත් ගනුදෙනුවකට ඈ කැමති වුවේ නැහැ. සිනාමුසුව ඇතුළට පැමිණියේ නේවාසිකාගාර පාලිකාවයි.

"මට ඔයා එක්ක වචනයක් කතා කරන්න පුළුවන්ද, මම්සලී?" ඈ ඇසුවා. "බැහැ, දැන් බැහැ." මම්සලී නපුරු ලෙස කිව්වා.

"මගෙ හිත හොඳට රිදුණා. මගේ හිතට ඒක දැනෙනවා, හොඳටම, හොඳටම: ඒත් මම එකක් කියන්නම්, මගේ නාට්‍යවලට තෝරා ගන්නේ මම කැමති ළමයි. අහ්-හ්-හා!"

නැවත සුනඛයෙකුගේ බඳු හඬක් නගමින් මම්සලී පිටතට යන්නට වුවේ ගල් ගැසුණ පාලිකාව තනිකරමිනි.

"මම්සලී මොනවාද කියවන්නේ?" ඈ පොට්ස් ගුරුතුමියගෙන් ඇසුවා.

"ඕ, එයා අනිත් මම්සලී එක්ක ප්‍රශ්නයක් ඇති කරගෙන." පොත්වල හරි නිවැරදි ලකුණු කරමින් පොට්ස් ගුරුතුමිය කිව්වා.

"ඔයා දන්නවානේ ඒ දෙන්නා ඉඳලා හිටලා හැප්පෙනවා. ඒත් මේ වතාවේ නම් වෙනදාට වඩා බරපතළයි වගේ. එයාලම ඒ අයගේ පැටලිලි ලිහා ගනියි."

මම්සලී ඩූපොන්ට් හා මම්සලී රොජර් මාරුවෙන් මාරුවට ප්‍රංශ නාට්‍ය සඳහා දැරියන් පුහුණු කළා. මම්සලී ඩූපොන්ට් ඩැෆනි පිනවීම සඳහා ඇය පුහුණුවීම් භාරගත් සැමවිටම ඩැෆනි ප්‍රධාන චරිත දෙක සඳහා යොදවා ගත්තා. එහෙත් එලෙසම වූ උනන්දුවෙන් ඩැෆනිව පහළ මට්ටමේ චරිතවලට යොදා ගනිමින් සැලී හා ඩැරල්ට ප්‍රධාන චරිත දෙමින් ඊළඟ අවස්ථාවල මම්සලී රොජර් පුහුණුවීම් කළා. මෙය මහත් අවුලක් වුණා.



මම්සලීලාගෙන් කිසිවෙක් යටත් වුණේ "නැහැ. දබරය බැරෑරුම් හා භයානක බවක් ගෙන තිබුණා. ඔවුන් මුණ ගැසුන විට මුහුණු ඉවතට හරවා ගත්තා. ඔවුන් කිසිවිට එකිනෙකා සමග කතා කළේ නැහැ. දැරියන් මෙය මහත් විහිළුවක් ලෙස සැලකුව ද ඔවුන් ගත්තේ මම්සලී ඩූපොන්ට්ගේ පාර්ශ්වයයි. ප්‍රධාන චරිත සඳහා ඩැෆනිව තෝරා ගැනීම ඔවුන් එක හෙළාම අනුමත නොකළ ද එයට කරන්නට දෙයක් තිබුණේ නැහැ.

මේ දබරයෙන් උද්දාමයට පත් බෙලින්ඩා පමණට වඩා උස්ව කෙසගව මම්සලී රොජර්ව හුවා දක්වමින් අගනා කාටූන් මාලාවක් නිර්මාණය කළා.

අසරණ මම්සලී ඩූපොන්ට්ට පසුපසින් ගොස් පහර දෙන්නට සැරසෙන මම්සලී රොජර් කිනිස්සක් අතැතිව සිටින අයුරු ඈ සිතුවම් කළා. තුවක්කුවක් අතැතිව ඇය පඳුරක් පසුපස සැඟව සිටින අයුරු ඈ සිතුවම් කළා. තම සැතිරියට පිරිනමන තේ කෝප්පයට ඇය වස මුසුකරන අයුරු ඈ සිතුවම් කළා.

පින්තූර දුටු දැරියෝ කැකිරි පළමින් සිනාසුණා. ඒවා දැක ඇලිසියාට හදිසි ආවේගයක් ඇති වුණා. නපුරු අදහසක් ඇගේ සිතට ඇතුල් වුණා.

"බෙලින්ඩා! මම්සලී ඩූපොන්ට් මේ චිත්‍ර දකින්න හුඟක් කැමති වෙයි. එයාට මොනතරම් හිනා යයිද කියලා ඔයා දන්නවානේ. එයා මේවා දකින්නම ඕනෑ. එයා හෙට හවස ප්‍රංශ පාඩමට එන්න කලින් මේවා මේසය උඩින් තියන්න. මේවා දැක්කට පස්සේ එයාගේ මූහුණට වෙන දේ බලන්නකෝ!"

"මේවා දැක්කට පස්සේ හෙට අපිට ප්‍රංශ පාඩමක් නැහැ කියලා මම ඕනෑම ඔට්ටුවක් දානවා." බෙට්ටි කැකිරි පළමින් සිනාසී සී අතර අනෙක් දැරියෝ එය අනුමත කළා.

බෙලින්ඩා කාටූන් සිතුවම් කොළ ටික පොතක් සේ සැකසුවා. ඇය ඒවා නම් නොකළ ද ඒ දෙස බලන ඕනෑම කෙනෙකුට ඒවායින් නියෝජනය වුණේ මම්සලීලා දෙදෙනා බව හොඳින්ම පෙනුණා.

## 11

කාටූන් සිතුවම් පොත හොඳම වේලාවට ගුරු මේසය මත තබා තිබුණා. හැකි ගත් සතුටින් යුතු දැරියෝ මම්සලී එනතුරු තම ස්ථානවල නැගී සිටියා. ඇය පින්තූර ගැන කොතරම් සතුටුවනු ඇති ද! තම සතුරු මම්සලී රොජර්ට එරෙහි විහිළුව ඇය කොතරම් සතුටුවනු ඇති ද?

ඉක්මන් පා හඬ කොරිඩෝවෙන් නැගී ආවා. දැරියෝ සද්ද වුණා. දොරින් පැමිණි යමෙක් මේසය වෙත ගියා. එහෙත් ඒ ඔවුන් අපේක්ෂා කළ මම්සලී නොවෙයි. ඒ ඇත්තෙන්ම අතිස් කෙනයි. අසුන්ගත් මම්සලී රොජර් පන්තිය ඇමතුවා.

"මොකද තවම හිටගෙන, බය වෙලා වගේ."

සමහර දැරියන්ට වාඩි වීම පවා අමතක වුණේ එම කාටූන් පොත මම්සලීගේ මුහුණ ඉදිරියෙන්ම තිබීම නිසා කුමක් සිදුවේදැයි වූ මහත් භීතිය නිසයි. මම්සලී මේසයට තට්ටු කළා.

"කන් ඇහෙන්නේ නැද්ද? වාඩි වෙනවා."

ඔවුන් වාඩි වුණා. බෙලින්ඩා ආයාචනාත්මකව රවුමක් කැරකී බැලුවා. ඇලිසියාගේ තෘප්තිමත් සිනාමුසු මුහුණ දුටු ඇගේ කෝපය ඇවිස්සුණා. එහෙනම් මම්සලී ඩූපොන්ට් වෙනුවට මම්සලී රොජර් එන බව ඇය දැන තිබුණා. එමෙන්ම ඉතා භයානක උපායක් සඳහා ඇව බලල් අතක් ලෙස පාවිච්චි කර තිබුණා. සෑම කෙනෙක්ම මම්සලිගේ කේන්තිය මොන වගේ දැයි දැන සිටියා. ඇය කෙළින්ම විදුහල්පතිනිය වෙතට යනු ඇත.



කුමක් කරන්නට දැයි බෙලින්ඩාට සිතා ගත නොහැකි වුණා. ඇය කොතරම් බියපත් විදැයි දුටු ඩැරල් නිර්භීත පියවරක් ගත්තා. නැඟිට ගත් ඇ ගුරු මේසය වෙතට ගොස් සිතුවම් පොතට අත තැබුවා.

"කනගාටුයි, මේ පොත බැරිවීමකින් මෙතැන දාලා ගිහින්, මම්සලී." ඇ විනීතව කිව්වා. ඇ එය අතට ගත්තා පමණයි. එහෙත් අවසාන නැහැ. දැරියෝ හුස්ම ඉහළට ඇදගෙන දැස මහත් කර ගත්තා.

"ටිකක් ඉන්න." මම්සලී රොජර් කිව්වා.

"බැරිවෙලා ගිය පොත් අවසරයක් නැතිව ගන්න බැහැ. මොකක්ද මේ පොත?"

"ඔ, මෙ කටු සටහන් පොතක්." අසරණ වූ ඩැරල් කිව්වා. මම්සලී නිහඬ පන්තිය දෙස කැරකී බැලුවා. ඇයි සියලුදෙනා ඇඩි උනන්දුවකින් බලාගෙන සවන් දීගෙන ඉන්නේ? මෙහි යමක් තිබිය යුතුයි.

පොත අතට ගත් ඇ එහි පිටු පෙරළුවා. මම්සලී ඩූපොන්ට්ගේ පසුපසින් කිනිස්සක් අමෝරාගෙන සිටින පින්තූරයට ඇගේ නෙත් යොමුවුණා. ඇදහිය නොහැකි ලෙස ඇ ඒ වෙත ඇස් දල්වා ගත්තා. උස්ව, හීන්දැරිව, කෙසඟ ඇය එම සිතුවමේ සිටියා. සැබැවින්ම නපුරු පෙනුමකින් යුතුව, එමෙන්ම කිනිස්සක් අමෝරා ගෙන.

ඇ තවත් පිටුවක් පෙරළුවා. ඒ සෑම පිටුවකම ඇය සිටියේ අකරුණාවන්ත කාටූනයක් ලෙස. ඒ සෑම තැනකම මම්සලී ඩූපොන්ට් අහිංසක වීරවරියක්ව තිබූ අතර ඇය, මම්සලී රොජර් දුෂ්ට චරිතයට යොදා ගනු ලැබ තිබුණා.

"මේක අදහාගන්නත් බැහැ." තමා අසලම සිටගෙන සිටින ඩැරල්ව ද බලා සිටින අනෙකුත් දැරියන් ද අමතකව මම්සලී රොජර් සිහින් කෙඳිරියෙන් යුතුව කිව්වා. බෙලින්ඩා පැහැදිලිවම සුදුමැලි වුණා. මොනතරම් අවාසනාවක් ද? දැන් කුමක් සිදුවනු ඇති ද? මෙම මෝඩ උපායට හසුවන තරමට ඇය ඇලිසියාට රැවටුණේ කෙසේ ද? ඇලිසියා හා බෙටී තමා ඔවුන්ගේ උපායට හසුවනු දැක කොතරම් සතුටු වෙනවා ද!

මම්සලීට නැවතත් ඇරියන් සිහි වුණා. ඇය කඩා පැන්න අතර ඩැරල් උඩ විසිවුණා. "ගිහින් වාඩිවෙනවා."

ස්තුති පූර්වකව ඩැරල් පැන දිව්වා. කෝපයෙන් නපුරු වූ දෙනෙතින් යුතුව මම්සලී පන්තිය සිසාරා බැලුවා.

"කවුද මේක කළේ? මගේ ඇස් දෙකට දකින්න මේ පොත තියලා කවුද මේ අපහාසය කළේ?"

සැලී එක්වරම කතා කළා. "අපි හැමෝම ඒකට සම්බන්ධයි, මම්සලී. ඒත් අපි ඒක තිබ්බේ ඔයාට පෙනෙන්න නොවෙයි. අපි හිතුවේ මම්සලී ඩූපොන්ට් දකියි කියලා. අද පාඩමට ඔයාලා මාරුවෙලා එයි කියලා අපි දැනගෙන හිටියේ නැහැ."

අවාසනාවකට මෙය සැලීට කිව හැකි නරකම දෙය බවට පත්වුණා. මම්සලී විදුලිසැර වැදුණ කලක මෙන් එක්වර නැඟී සිටියා. ඇගේ දැස් ගිනියම් වුණා.

"මොනවා! තමුසෙලා මේක මම්සලී ඩූපොන්ට්ට දෙන්න හිටියේ. තමුසෙලා හිතාගෙන හිටියේ එයත් එක්ක මට හිනාවෙන්න. මම නැති තැනදි එයා ඒක ද කරන්නේ? ඕන්, එයා හැසිරෙන හැටි දැන ගත්ත එක මට මොනතරම් සතුටක් ද, මේ ලැජ්ජා නැති ප්‍රංශ ගෑනි! එයා දැන ගනියි. මම දැන්ම යනවා මිස් ග්‍රේලින් ළඟට, මේ දැන්ම."

පන්තිය ත්‍රස්ත වූ නිහැඬියාවකින් වාඩි වී සිටියා. මම්සලී ඩූපොන්ට්ට කාටූන් පොත පෙන්වීම මම්සලී රොජර්ට අපහාසයක් වනු ඇතැයි ඔවුන්ට සිතී තිබුණේ නැහැ. බෙලින්ඩාට ක්ලාන්ත ගතියක් දැනුණා.

"මම්සලී, මිස් ග්‍රේලින් ළඟට යන්න එපා. මම...."

එහෙත් බෙලින්ඩාට තනිවම බැණුම් ඇසීමට පන්තිය ඉඩ දීමට සූදානම් වුණේ නැහැ. මේ වන විට ඇලිසියා පවා බියපත්වී සිටියා. අසරණ බෙලින්ඩාගේ හඬ යටපත් කරමින් බොහෝ දැරියෝ එක්වරම කතා කළා.

"මම්සලී අපට කනගාටුයි. අපි ගැන කියන්න එපා."



එහෙත් මම්සලී දැඩි කෝපයෙන් නැගී සිට ඒ වනවිට දොරින් පිටව ගියා. දැරියෝ සැබෑ භීතියෙන් එකිනෙකා දෙස ගතත් වූ දෙනෙතින් බලා සිටියා.

"ඇලිසියා, මම්සලී ඩූපොන්ට් වෙනුවට අද හවස එන්නේ මම්සලී රොජර් කියලා ඔයා දැනගෙන සිටියා." බෙලින්ඩා කිව්වා.

"මම දැක්කා ඔයා බෙට්ටිට ඇහැක් ගහනවා. ඔයා දැනගෙන හිටියාමයි. ඔය වගේ කැත විහිළුවක් කරන්න ඔයා මාව යොදා ගත්තා. ඔයා දන්නවා, මම කවදාවත් ඒවා මම්සලී රොජර්ට, පෙන්වන්නේ නැහැ කියලා.

තම වැරදි මොනවා වුවද ඇලිසියා සත්‍යගරුක වුණා. ඈ එය නැහැ කිව්වේ නැහැ. "මම හිතුවේ නැහැ එයා ඒතරම් කල-බලයක් කරයි කියලා." තරමක් දුර්වලව ඈ කිව්වා.

"ඇලිසියා, ඔයා නපුරියක්!" තමා තුළ කෝප ගින්නක් මුර මුරා නැගෙනු දැනී ඩැරල් කිව්වා.

"ඔයා මොනතරම් බරපතළ අවුලකට ද බෙලින්ඩාව ඇද දාන්නේ කියලා ඔයාට හිතන්න තිබුණා. ඔයා, ඔයා......"

"මේක බේරුමක් කරන්න මට ඉඩදෙන්න." ඇය පිටුපසින් සැලීගේ ශාන්ත කටහඬ නැඟුණා. ඔක්කොම වගකීම ගන්න එපා, ඩැරල්, මම ඇලිසියා ගැන බලා ගන්නම්."

"ආ, එහෙමද?" ඇලිසියා ද්වේෂයෙන් ඇසුවා.

"ඔයා මට බනින්නද එන්නේ, පන්ති නායිකා නෝනා, ඒවා බැහැ සැලී හෝප්."

"මෝඩ වෙන්න එපා." සැලී පිළිකුලින් කිව්වා.

"ළඟදී ඉඳලා ඔයාට මොනවද වෙලා තියෙන්නේ කියලා මම දන්නවා, ඇලිසියා. ඔයා හැම තිස්සෙම මාව අමාරුවේ දාන්න හදන්නේ. මමත් ප්‍රින්සිපල් ළඟට යනවා. දැන්ම ඔයත් එන්න ඕනැ, බෙලින්ඩා. වැඩේ දුර දිග යන්න ඉස්සර මේක ඉවරයක් කරන්න බලමු."

"ඔයා ඔක්කොම බැණුම් මගේ පිට දායි, ඇක්කටම!" ඇලිසියා අවඥාවෙන් කිව්වා. "මම දන්නවා ඔයාගේ හැටි! බෙලින්ඩා බේරලා මාව අමාරුවේ දායි."

"මම ඔයා ගැන මොනවත් කියන්න යන්නේ නැහැ." සැලී කිව්වා. "මම කේලාම්කාරියක් නොවෙයි. ඔයත් අපි එක්ක ඇවිද්දා ඔයාගේ කොටස කියනවා නම් ඔයා හොඳ කෙනෙක් කියලා අපිට හිතන්න පුළුවන්.!"

"ඔයාලා මා ගැන මොනවා හිතුවත් කමක් නැහැ." කෝපයට පත්වෙමින් ඇලිසියා කිව්වා. "මම ඔයාගෙ පස්සෙන් ඇවිද්දා 'අනේ මමයි ඒක කළේ' කියන්න එන්නේ නැහැ. මම නොකරන දේවල් ඔයාට කරවන්න බැහැ."

"මම ඒ ගැන හිතන්නේවත් නැහැ." සැලී කිව්වා. "එන්න බෙලින්ඩා අපි ප්‍රමාද නොවී යමු." ඉමහත් භීතියට පත් අසරණ බෙලින්ඩා කොරිඩෝව ඔස්සේ ගොස් තරප්පු පෙළ බැස පිටත මැද මිදුලට පැමිණුනා. ඔවුන් විදුහල්පතිනියගේ කාමරය බලා ගියා.

"ඔහ්, සැලී - මට බයයි." තම උද්දාමය හා සැහැල්ලු ස්වභාවය අතුරුදන්ව තිබූ බෙලින්ඩා කිව්වා. "මම්සලී හරිම නපුරුයි. ඒ සමහරක් පින්තූර හුඟක් දුරට නපුරු පාටයි, සමහර ඒවා....."

දැරියෝ විදුහල්පතිනියගේ කාමරයේ දොරට තට්ටු කරන විට ඔවුන්ට ඇතුළතින් එන කටහඬ ඇසුණා. ග්‍රේලින් මහත්මිය එහි සිටි අතර මම්සලී රොජර් හා චිත්‍ර ගුරුතුමිය ලීනී මහත්මිය ද සිටියා. මේ දක්ෂ හා උපහාසාත්මක කාටූන් ඇන්දේ කවුදැයි හඳුනා ගැනීමට ඇයව ද කැඳවනු ලැබ තිබුණා.

"බෙලින්ඩා මොරිස්ම තමයි!" එක බැල්මකින් පසුව ඇ කිව්වා. "මේ වගේ දළ සටහන් අඳින්න දක්ෂ වෙන කිසිම ළමයෙක් මේ ඉස්කෝලේ නැහැ. එයා කවදාහරි හොඳ චිත්‍ර ශිල්පිනියක් වෙයි. සත්තකින්ම මේවා දක්ෂකම්."

"දක්ෂකම්!" මම්සලී හඬනැඟුවා. "මේවා නපුරු, අපහාස කරන, නරකම නරක වැඩ. මම කියන්නේ මේ ළමයාට දඬුවම්



කරන්න ඕනැ, මිස් ග්‍රේලින්. මම කියන්නේ මුළු පන්තියටම හොඳටම දඬුවම කරන්න ඕනැ."

ඒ මොහොතේදීමයි, සැලී දොරට තට්ටු කළේ. "ඇතුළට එන්න." ග්‍රේලින් මහත්මිය කී අතර දැරියෝ දෙදෙන ඇතුළු වුණා.

"හොඳයි" ග්‍රේලින් මහත්මිය කතා කළා. සැලී දිග සුසුමක් ඇද ගත්තා. එය දුෂ්කර කාර්යයක් ලෙස පෙනුණා. විශේෂයෙන් මම්සලී ඇය දෙස නපුරු ලෙස රවාගෙන සිටි නිසා.

"මිස් ග්‍රේලින්" ඈ පටන් ගත්තා. "අපිට හුඟාක් කනගාටුයි මේ ගැන."

"මොකක්ද මේ ගැන ඔයාට තියෙන සම්බන්ධය?" ග්‍රේලින් මහත්මිය ඇසුවා. "මම හිතුවෙ පින්තූර ඇන්දෙ බෙලින්ඩා කියලයි."

"ඔව්, මම තමයි." බෙලින්ඩා කිව්වා. "ඒත් මුළු පන්තියටම ඕනැ වුණා මේවා මේසය උඩ තියන්න, ඒ මම්සලී ඩූපොන්ට්ට බලාගන්න." සැලී කිව්වා. "ඒත් මම්සලී රොජර් ඒ වෙනුවට ආව නිසා මේවා එයා දැක්කා. මට ඒ ගැන කනගාටුයි."

"ඒත් ඇයි ඔයාලා මම්සලී රොජර් එයාගේ යාළුවා පස්සෙන් යන මිනීමරුවෙක් වගේ ඇන්දේ" පොතෙහි පිටු පෙරළමින් විදුහල්පතිනිය ඇසුවා.

"මේවා දැකලා මම්සලී ඩූපොන්ට් සතුටු වෙන්නේ ඇයි කියලා මට හිතා ගන්න බැහැ." නිහැඬියාවක් පැතිරුණා. ඉන්පසුව මම්සලී රොජර් දරදඬුව කතා කළා. "අපි යාළුවෝ නොවෙයි. මම්සලී ඩූපොන්ට් මගේ යාළුවෙක් නොවෙයි."

ග්‍රේලින් මහත්මිය ඇගේ කෑගැසීම නැවතීමට පෙර මම්සලී නාට්‍ය පිළිබඳ ඇයට ඇතිව තිබූ වේදනාව ගැන සියලු දේ දිගටම කියා සිටින්නට වුණා. ග්‍රේලින් මහත්මිය බැරෑරුම්ව අසා සිටින්නට වුණා. අනතුරුව ඈ දැරියන් දෙසට හැරුණා.

"එතකොට මට තේරෙන්නේ එක දවසක ප්‍රධාන චරිත සැලියි ඩැරලුයි කරනවා. අනිත් දවසේ ඩැෆනි කරනවා කියන එකයි ද?" ඈ ඇසුවා.

[illegible] හදිසියේම මම්සලී රොජර් ලැජ්ජාවෙන් ඔර වූ බවක් පෙනුණා. තම පෞද්ගලික අදහස්වලින් හාටය අවුල්ව ඇති බවත්, ඉන් ඉදිරියට පොඩ්ඩක් ඇයට නිවැරදි වී ඇති බවත් ඇයට අවබෝධ වුණා.

තම කතුන් පොත විදුහල්පතිනිය වෙතට ගෙන ඒමට පෙර දෙවරක් සිතුවේ නම් හොඳයැයි ඇයට කල්පනා වුණා. දැරියන් ඔවුන්ගේ සටන මෙවැනි විකට රූපවලින් ප්‍රකාශ කිරීම සුදුසු නොවෙයි. එහෙත් තමා දුක්වයා ලෙසත්, මම්සලී ධූපොත්ට විටවරිය ලෙසත් ඔවුන් දකින්නේ ඇයි? ඔ, එය හොඳ දෙයක් නොවෙයි.

"මම්සලී ධූපොත්ට වෙනුවට පන්තියට එන්නේ මම්සලී රොජර් කියලා එතකොට ඔයාලා දැනගෙන සිටියේ නැද්ද?" විදුහල්පතිනිය හදිසියේම ඇසුවා. සැලී මොහොතකට පැකිළුණා. ඇසිලියා එමෙන්ම බෙට් ද එය දැන තිබුණා. එහෙත් සැලී මෙන්ම අනිත් අය දැන තිබුණේ නැහැ.

"ඇත්තෙන්ම මම දැනගෙන හිටියේ නැහැ. මිස් ග්‍රේලින්" ඇ කිව්වා. "කවුරු හරි දැනගෙන හිටිය ද?" විදුහල්පතිනිය තදින් විමසුවා. කොසේ පිළිතුරු දිය යුතුදැයි සැලී දැන සිටියේ නැහැ. ඇයට කේලාම් කීමට අවශ්‍ය නොවූ නමුත් ඇයට කිසිවක් නොකියා සිටිය නොහැකි වුණා. බෙලින්ඩා ඉක්මන් වුණා.

"ඔව්, කෙනෙක් දැනගෙන සිටියා. ඒ කෙනා මාව බලද් අතකට පාවිච්චි කළා. එහෙම නොවෙන්න මම කිසිමදාක මම්සලී රොජර්ට මේ පින්තූර පෙන්වන්නේ නැහැ. ඒ කවුද කියලා මම කියන්නේ නැහැ. ඒත් මම කිසිම විදියකින් මම්සලී රොජර්ට රිදවන්න හැදුවා කියලා හිතන්න එපා. ඒක විහිළුවක් විතරයි."

"ඔව්, මට තේරෙනවා." ග්‍රේලින් මහත්මිය කිව්වා.

"අවාසනාවන්ත විහිළුවක්. ඇත්තෙන්ම ඒක විහිළුවක් විතරයි. වැරදි කෙනෙකුට කරපු විහිළුවක් නිසා ඇස් රතු වෙන විදිහේ එකක්. මට තේරෙන විදියට ආරම්භය රණ්ඩුවක්. එහෙම නොවෙන්න බොහෝ විට මේ වගේ දෙයක් සිදු නොවන්න



තිබුණා. මය ළමයි දෙන්නා දැන් යන්න. මම මම්සලී රොජර් එක්ක මය හැම දෙනාටම දෙන්න ඕනෑ දඬුවම ගැන සාකච්ඡා කරන්නම්."

බෙලින්ඩා හා සැලී නිහඬව කාමරයෙන් පිටවුණා. ලිනී ගුරුතුමිය ද ඔවුන් සමග ආවා. ග්‍රේලින් මහත්මිය නවතින ලෙස සංඥා කළ නිසා මම්සලී රොජර් ඉතිරි වුණා.

"බෙලින්ඩා, ඔයා මෝඩියක්." ලිනී ගුරුතුමිය කිව්වා.

"මම ආයෙත් කාගේවත් පින්තූර අඳින්නේ නැහැ." කලකිරීමෙන් යුතුව බෙලින්ඩා කිව්වා. "ඇයි නැත්තේ? ඔයා අඳින්න ඕනෑ." ලිනී ගුරුතුමිය කිව්වා. "ඒත් ඉදිරියේදී ඔයා අඳින්න ඕනෑ හොඳ පින්තූර. ඕනෑවට වඩා පණ්ඩිත වෙන්න එපා, බෙලින්ඩා. ඒකෙන් වෙන්නේ මොනවා හරි කරදරයක වැටෙන එක."

## 12

ඉහළ මාලයේ යමක් සිදුවෙමින් තිබුණා. මම්සලී ඩූපොන්ට් දෙවැනි පන්ති කාමරයේ දොර පසු කර යමින් සිටි අතර එය විවෘතව තිබෙනු දැක්කා. ඇතුළට එබී බැලීමේ දී, ඇගේ මව්තයට මෙන්, මම්සලී රොජර් පන්තිය හැරගොස් තිබූ අතර ඇරියන් හුදෙකලාව සිටිනු ඇය දුටුවා. ඊටත් වඩා පුදුමය ඇරියෝ මීයන් මෙන් නිහඬව වාඩි වී සිටීමයි. එමෙන්ම දික් කර ගත් මුහුණු.

"මොකක්ද ප්‍රශ්නය, ළමයි?" දිලිසෙන ඇසින් නිහඬ පන්තිය සිසාරා බලමින් මම්සලී හඬ නගා ඇසුවා.

"මොකක්ද සිද්ධ වුණේ?"

සිදුව තිබූ දේවලින් තැවුලට පත්ව සිටි මේරි ලෙවි අනපේක්ෂිත ලෙස ඉකි ගැසුවා. මම්සලී ඇය වෙතට හැරුණා. ඇයට ඉතා චතුර ලෙස ප්‍රංශ කතා කළ හැකි නිසා මේරි ලෙවි ඇගේ හුරතලියක්ව සිටියා.

"මොකක්ද ප්‍රශ්නය? මට කියන්න! මම ඔයාලාගේ යාළුවෙක් නොවෙයි ද? සිද්ධ වුණේ මොකක්ද කියලා මට කියන්න!"

"ඔ, මම්සලී හරිම නරක දෙයක් සිද්ධ වුණේ?" මේරි ලෙවි හැඬුම් බර වුණා.

"බෙලින්ඩා ඔයාගෙයි, මම්සලී රොජර්ගෙයි පින්තූර වගයක් ඇඳලා තිබුණා. ඔයාව ලස්සනට ඇඳලා මම්සලී රොජර්ව තපුරු විදියට ඇඳලා. අපි දැනගෙන හිටියේ නැහැ ඔයා වෙනුවට අද එන්නේ එයා කියලා. ඉතින් අපි කාටූන් පොත මේසය උඩින් තිබ්බා ඔයාට පෙන්වන්න. එතකොට..... එතකොට....."



"ඔ, මම්සලී රොජර්. ඒවා දැකලා එයා උඩ ගියා. ඊට පස්සේ එයා අර අසරණ බෙලින්ඩාවයි, සැලීවයි මිස් ග්‍රේලින් ළඟට ඇදගෙන ගියා. මම්සලී කෑ ගැසුවා."

"ඕ..... මේ කේන්තිකාර ගෑනි. එයාට විහිළුවක් ඉවසන්න බැහැ. මම එයාට එකක්-දෙකක් නොවෙයි තුන හතරක් කතා කරන්නම්. හහ්...... හහ්...... හා!"

ඒ දොරින් පිටවූ මම්සලී ඩූපොන්ට් දඩයමට ලක්වූ හාවෙකු සේ අඩි උස් සපත්තු හඬ නගමින් දුව ගියා. ඇරියෝ එකිනෙකා දෙස බලා ගත්තා. හරිම දවසක්.

වෙනත් මාර්ග දෙකකින් ගිය නිසා මම්සලී ඩූපොන්ට්ට බෙලින්ඩා හා සැලී හමු වුණේ නැහැ. ඈ ග්‍රේලින් මහත්මියගේ දොරට තට්ටු කරන මොහොතේම මුහුණ අඳුරු කර ගත් සැලී හා බෙලින්ඩා දෙවැනි පන්ති කාමරයට ඇතුළු වුණා. සිදුවූ දේ ඔවුන් වාර්තා කළා.

"ඉතින් කොහොම හරි ඔයාලා මාව පාවා දුන්නා." ඇලිසියා පිළිකුලින් කිව්වා.

"අපි ඔයාගේ නමවත් කිව්වේ නැහැ." බෙලින්ඩා කිව්වා.

"ඔයා බය වෙන්න ඕනැ නැහැ, ඇලිසියා."

"මම බය නැහැ." ඇලිසියා කිව්වා. එහෙත් ඇය බියව සිටියා. තමා ග්‍රේලින් මහත්මියගේ පැසසුමට පසුගිය දිනවලදී ලක් නොවී සිටිය බව ඈ දැන සිටියා. මේ අවස්ථාවේදී දෝෂාරෝපණයට ලක්වීම ඇයට දැරිය නොහැකි වුණා.

"මම්සලී ඩූපොන්ට් ගියා කට්ටියට එකතු වෙන්න." ඩැරල් කිව්වා. "මොනවා සිද්ධවෙනවාද දන්නේ නැහැ."

ග්‍රේලින් මහත්මියත්, මම්සලී රොජර්වත් මවිතයට පත් කරමින්, මම්සලී ඩූපොන්ට් කාමරයට කඩා වැදුණා. ඇය ඇතුළු වනවිට, තරමක් ලැජ්ජාශීලී මම්සලී රොජර්ගෙන් ප්‍රංශ ගුරුවරියන් අතර වූ දබරය ගැන සෑහෙන විස්තරයක් ග්‍රේලින් මහත්මිය අසමින්නුයි සිටියේ.

කාටුන් පොත දැක ගත් මම්සලී ඩූපොන්ට් එක්වරම ඒ අතට ගත්තා. ඇ ඒවා දෙස හොඳින් බැලුවා. "අන්, ල, ලා, බෙලින්ඩා නම් හරිම දක්ෂයි. හන්, හා- මේ බලන්න මේක මම. මිස් ග්‍රේලින්- මම මහත හාවෙක් වගේ ඉන්නවා. කවදාවත් ඇඳලා තියෙනවා ද? එතකොට, මේ මම්සලී රොජර් මහා කිනිස්සක් අරගෙන මොනවද කරන්නේ? හරිම පුදුමයි. විස්මිතයි ඒත් මෙතැන බලන්න! මට වස දෙන්න හදනවා."

මම්සලීගේ මහත් වූ සිනාහඬ නින්නාද දෙන්නට වුණා. ඇ ඇසට ඉනූ කඳුළු පිස දමන්නට වුණා.

"මේක හරිම විහිළුවක් කියලා ඔයාලා හිතන්නේ නැද්ද?" ඇ අනෙක් දෙදෙනාගෙන් ඇසුවා.

"ඒත්, මේ බලන්න. බලන්න. මට මේ තුවක්කුවෙන් වෙ තියන්නයි යන්නේ. මගේ හොඳ යාළුවා මම්සලී මට මෙහෙම දේවල් කරයි ද? ඔ, අපි සමහර වෙලාවට රණ්ඩු වෙනවා. ඒ මමයි. ඒත් ඒක ලොකු දෙයක් නොවෙයි. අපි දෙන්නම හ ගැහැනු. මම කියන්නේ ඇත්ත මම්සලී රොජර්. මේ කෙල්ලන්ගෙ අපි දෙන්නම විඳින්නේ පුදුම වදයක්."

මම්සලී රොජර්ගේ දරදඬු බව මඳක් ලිහිල් වූ බවක් පෙනුණා. කාටූන් දෙක තුනකට බැලුම් හෙළූ ග්‍රේලින් මහත්මියගේ මුහුණේ ද මඳ සිනාවක් පහළ වුණා.

"මේක නම් හරිම විකට එකක්, මම්සලී ඩූපොන්ට්" ඇ කිව්වා.

"මේකත් එහෙමයි, ඇත්තටම. මේක හරිම නිගරුකිරීමක් නිසා මට දැන ගන්නට ඕනෑ ඔයාලා දෙන්නාම මේ පන්තියට දෙන දඬුවම මොකක්ද කියලා. විශේෂයෙන්ම බෙලින්ඩාට දෙන දඬුවම."

නිහඬබවක් පැතිරුණා. "මට හිතෙන්නේ...." මම්සලී රොජර් අවසානයේ හඬ අවදි කළා. "මම හිතන්නේ, මිස් ග්‍රේලින් මේ සම්බන්ධයෙන් මම්සලී ඩූපොන්ට්ටත්, මටත් තරමක වැරැද්දක් පැටවෙනවා. අපේ මෝඩ රණ්ඩු, දන්නවනේ කෙල්ලන්ට ඒක ඇති, ඉතින්..."



"ඔ, ඔව්, ඔයා හරි! මම්සලී ඩූපොන්ට් උනන්දුවෙන් හඬ නගා කිව්වා.

"ඔයා හරියටම හරි! මෙතැන වැරැද්ද අපේ. මිස් ග්‍රේලින් . මේ තරකම නරක කෙල්ලන්ට දඬුවම් ඕනෑ නැහැ කියලා අපි දෙන්නාම කියනවා. අපි එයාලට සමාව දෙන්නම්."

මම්සලී රොජර් තරමක් ආපස්සට විසි වුණ බවක් පෙනුණා. ඇයි මම්සලී ඩූපොන්ට් ඔවුන්ට සමාව දෙන්නේ? ඒ එයාව නපුරු පෙනුමකින් ඇඳලා නැති නිසයි. එහෙත් මම්සලී ඩූපොන්ට් තමන්ගේ හිතුමතේට තවත් ඉදිරියට යනවා.

"මේ පින්තූර විහිළුවක් මිසක් අපහාසයක් නොවෙයි. ඒක තවට කමට විනෝදයට කරපු දෙයක්. අපි ඒක ගණන් ගන්නේ නැහැ. අපේ මෝඩ රණ්ඩු නිසයි මේක සිද්ධ වුණේ. ඒත් දැන්, දැන් අපි යාළුයි නේද, මම්සලී රොජර්?"

එයට නැහැ යයි කීමට මම්සලී රොජර්ට නොහැකි වුණා. තම හිතුවක්කාර අදහස්වලින් පසෙකට විසි වූ ඇ හිස සැලුවා. මම්සලී ඩූපොන්ට් හදිසියේම ඇගේ දෙකම්මුල්වලට ප්‍රීතියෙන් ප්‍රමෝදමත් හාදූ දෙකක් දුන්නා. ග්‍රේලින් මහත්මිය දැඩි සතුටට පත් වුණා.

"අර බෙලින්ඩා," නැවත කාටූන් දෙස බලමින් මම්සලී ඩූපොන්ට් කතා කළා. "ඔ, හරිම දක්ෂ ළමයෙක්. දවසක මිස් ග්‍රේලින්, අපිට මේ චිත්‍ර ගැන සතුටු වෙන්න පුළුවන්. බෙලින්ඩා ප්‍රසිද්ධ වුණාම, මම්සලී රොජර්, මම, අපි හැමෝම මේ කාටූන් දිහා ආඩම්බරෙන් බලලා ' මේ බෙලින්ඩා කෙල්ල කුඩා කාලෙදි අපේ පන්තියේ ඉන්නා වේලාවේදී අපිවත් මේ විදියට ඇන්දා' කියලා කියයි!"

මේ ගැන මම්සලී රොජර් කිසිවක් කීවේ නැහැ. තමා අදහස් නොකළ දේවල් කිරීමට තමාට සිදුව ඇති බවක් ඇයට දැනුණා. එහෙත් මේ වනවිට තමා කියූ දෙයට පරස්පරව යමක් කිරීමට ඇයට නොහැකි වුණා. එය ස්ථිරයි.

"හොඳයි, එහෙමනම් දැන් ඔයාලාගේ පන්තිවලට ගියොත් හොඳයි." ග්‍රේලින් මහත්මිය යෝජනා කළා.

"මේ ගැන ළමයින්ට කියලා එයාලාගේ හිතට සහනයක් දෙන්න. ඒත් ඇත්තටම, බෙලින්ඩා සමාව ගන්න ඕනෑ. මං හිතන්නේ ඔයාලා බලපෑම් නොකළත් එයා ඒක කරයි."

මම්සලීලා දෙදෙන පිටතට ගියේ අත්වැල් බැඳගෙනයි. පසුගිය සති කීපය පුරා ඔවුන් දරුණු සතුරන්ව සිටි බව දැන සිටි දැරියෝ අතරමගදී ඔවුන් දැක මහත් විමතියට පත් වුණා. ඔවුන් දෙදෙනා නිහඬව සිටින දෙවැනි පන්ති කාමරය තුළට යද්දී මම්සලී ඩූපොන්ට ප්‍රීතියෙන් ඉපිල සිටිනු හා අනෙක් මම්සලී සුපුරුදු අප්‍රසන්න පෙනුමින් තොරව සිටිනු දුටු දැරියෝ සතුටට පත් වුණා.

"පැන්සල ඕනෑ විදියට යන්න ඔයා ඉඩ දුන්නා. මටත් පුදුමයි."

ඇය පුදුමයට පත්ව තිබූ බවක් පෙනුණේ නැහැ. ඇගේ දීප්තිමත් ඇස් දිලිසුණා. බෙලින්ඩා නැඟී සිටියා.

"මට සමාව ගන්න අවශ්‍යයි." ඈ තරමක් සැලෙමින් කිව්වා. "ඔයාලා දෙන්නාගෙන්ම"

බෙලින්ඩා මම්සලී ඩූපොන්ට්ගෙන් සමාව ගැනීමේ අවශ්‍යතාවයක් නැති බව මම්සලී රොජර් දුටුවද ඈ හැකිතාක් දුරට ඉවසිලිවන්තව සමා අයැදීම පිළිගත්තා.

"දැන් දඬුවමක් හැටියට," මම්සලී ඩූපොන්ට් දැඩි ස්වරයෙන් කතා කළා. එහෙත් ඇගේ දෑස බැබළෙමින් තිබුණා. "දඬුවම හැටියට ඔයාලා ප්‍රංශ පාඩම්වලට මීට ඉස්සරට වඩා වැඩි අවධානයකින් වැඩ කරන්න ඕනෑ. ඔයාලා හොඳට ඉගෙන ගන්න ඕනෑ. හොඳම ප්‍රංශ පරිවර්තන කරන්න ඕනෑ. ඔයාලා මගේ හොඳම ශිෂ්‍යාවෝ වෙන්න ඕනෑ. එහෙම නේද?"

"ඔ, ඔව් මම්සලී," දැරියෝ උනන්දුවෙන් පොරොන්දු වුණ අතර අවස්ථාවේ හැටියට ගොන්ඩොලින් හා ඩැෆනි පවා එය හිතට ගත්තා.



මම්සලී රොජර් පිටව ගියා. පාඩමේ ඉතිරි විනාඩි පහ මම්සලී ඩූපොන්ට් ප්‍රයෝජන ගත්තා. අවසානයේදී ඩැරල් කතා කළා. "අනේ මම්සලී, අපි දැන් කරන ප්‍රංශ නාට්‍යවල ප්‍රධාන චරිත කරන්නේ කවුද කියලා අපිට දැන් කියනවාද? මේක නොදන්නා එක හරිම අවුලක්. සමහරවිට මම්සලී රොජර් එක්ක ඔයා මේක සමථයකට පත් කරගෙන ඇති."

"අපි තවම නැහැ." මම්සලී ඩූපොන්ට් කිව්වා. "ඒත් මම, මම අද ටිකක් පරිත්‍යාගශීලී වෙලා අසරණ මම්සලී රොජර්ට කැමැති දෙයක් කරන්න ඉඩදෙනවා. එහෙම කරන්නේ අද එයාට ඔයාලා ඇති කරපු කම්පනයට වන්දියක් විදියටයි. ප්‍රධාන චරිතවලට මම ඩැෆනිව ගන්නේ නැහැ. ඩැරල්, සැලී දෙන්නා ඒ චරිත කරයි. මේ වැඩෙන් සන්තෝෂ වෙන එයා හැමතිස්සේම ඔයාලාට හිනාවෙලා කතාකරයි!"

ඩැෆනි මෙ ගැන එතරම් සතුටට පත් වුණේ නැහැ. ඇය මම්සලී දෙස බැලුවේ තරමක සිත් රිදුණු පෙනුමකින්. එමෙන්ම එය හොඳ දෙයක් බව ඇයට කල්පනා වුණේ ප්‍රංශ නාට්‍යයේ දෙබස් කිසිදිනෙක ඇයට මතක තබා ගැනීමට නොහැකි බව සිහිවීමෙන්. කෙසේ වෙතත් ප්‍රධාන චරිත නොලැබීම ඇයට සතුටට කරුණක්. ඇය සිත් රිදුන බවක් පළ කල මුත් තමා ඉතා පරිත්‍යාගශීලි බව ද පළ කළ යුතුයි.

මදක් සසල වූ බවක් පෙන්වමින් ඈ මම්සලීට කතා කළා. "ඔයා කැමති දෙයක් කරන්න, මම්සලී. මම බලාගෙන සිටියේ මගේ චරිතය ඔයා කැමති විදියට කරන්න. ඒත් මම හිතනවා කලබලයක් නොකර කැමැත්තෙන් අනිත් අයට අවස්ථාව දෙන එක හොඳයි කියලා."

"හොඳ ළමයා." මම්සලී සතුටින් කිව්වා.

කාටුන් සිද්ධියෙන් ප්‍රතිඵල තුනක් ලැබුණා. ඇලිසියා බූම්මා ගත්තා. තමා සිද්ධිය සම්බන්ධයෙන් දැක්වූ ප්‍රතිචාරය හොඳ එකක් නොවූ බවත් ඒ නිසාම ඩැරල්, සැලී හා තවත් දැරියන් ඇය ගැන නරක ලෙස සිතා සිටි බවත් ඇට දැනුණා. මම්සලීලා දෙදෙන දැඩි මිතුරු දමකින් බැඳුණා. ඔවුන් තව දුරටත් සතුරන් නොවුණා.

ඩැෆනිට ලැබුණේ නාට්‍යයේ ප්‍රධාන හෝ ලස්සන කෙනෙකුට ලැබිය යුතු චරිතයක් නොව පරණ තොප්පි කබලක් දමාගත් මහලු මිනිසෙකුගේ චරිතයක්. ඈ තදින් පිළිකුල් සහගත වුණා.

"විශේෂයෙන්ම, මම ලස්සන චරිත ගැන ගෙදර අයට ලියලා යවලා තියෙන්නේ" ඈ මැසිවිලි නැඟුවා. "හරිම ලැජ්ජාවක්."

"ඒක නම් එහෙම තමා." ගොන්ඩොලින් කිව්වා.

"ගණන් ගන්න එපා ඩැෆනි, දැන් ඔයාට දෙබස් කට පාඩම් කරන්න වෙන්නේ නැහැනේ." ඒ මොහොතේ ටින් එකක් ද රැගෙන ජීන් ආවා. ඇය ඔවුන්ගේ මුහුණු ඉදිරියේ එය සොලවා හඬ නැංවූවා.

"ක්‍රීඩා අරමුදලට සල්ලි තියෙනවාද, ඔය දෙන්නා? අද ඒක එකතු කරනවා සිලිං පහයි."

"මෙන්න මගෙන්" තම මුදල් පසුම්බිය ගනිමින් ගොන්ඩොලින් කිව්වා.

"ඔයාගේ ඒවා, ඩැෆනි?" ජීන් කිව්වා. "මම හිතාගෙන හිටියේ මා ළඟ සිලිං දහයක් තිබුණා කියලා. ඒත් දැන් තියෙන්නේ පැන්ස හයයි. ඕ, ඔව්, ගිය සතියේ මට ආයාට උපන්දින තෑග්ගක් ගන්න සිද්ධ වුණානේ. ග්වෙන්, ගෙදරින් සල්ලි ලැබුණාට පස්සේ දෙනකම් මට සල්ලි ටිකක් දෙනවා ද?"

"එයා ගිය සතියේත් ඔයාගෙන් සිලිං දෙකක් ණයට ගත්තා." ටින් එක ශබ්ද කරමින් ජීන් කිව්වා. "ඕනෑම ඔට්ටුවක්, ඒක ආපසු දුන්නේ නැහැ. පල්ලියේ ආධාරවලට ඔයා මගෙනුත් පැන්ස හයක් ණයට ඉල්ලා ගත්තා. මම අහන්නේ, ඔය ණය සටහන් කර ගන්න ඔයා පොඩි පොතක් තියා ගන්නේ නැත්තේ ඇයි?"

"ඒ වාගේ පොඩි ගනුදෙනු වැඩක් තියෙනවා ද?" සිත් රිදුණු ඩැෆනි කිව්වා. "මට උපන්දිනේට පවුම්වලින් මොනතරම් හම්බ වෙනවද. උපන්දිනෙත් ළඟයි. කොහොම වුණත් ලබන සතියේ මේවා ගෙවන්න පුළුවන්. මගේ බාප්පා සිලිං තිහක් එවනවා."

"හොඳයි, මම, මම එතකම් සිලිං පහක් දෙන්නම්." ඊ ගොන්ඩොලින් සිලිං දහයක නෝට්ටුවක් ටින් එකකට දැම්මා.



ඩැරල් වෙත හැරුණු ජීන් ඇගේ මුදල එකතු කර ගත්තා. එලන් වෙතට ගිය ඈ ඇය ඉදිරියේ ටින් එක ශබ්ද කළා.

"සිලිං පහයි, එලන්"

"මූණ ඉස්සරහට අල්ලන්න එපා." උඩඟිය එලන් කිව්වා. "මොනවද ඕනෑ?"

"සිලිං පහක්"

"දැන් මා ළඟ නැහැ. මම පස්සේ දෙන්නම්."

"ඔයා ෂේෆරලත් ඕකමයි කිව්වේ." මුදල් එකතු කිරීමේ දී නොපසුබට වන ජීන් කිව්වා. "ඉක්මන් කරන්න, සල්ලි ගන්න, එලන්. මේක මෙතැනින් ඉවර කරන්න ඕනෑ."

"මම වැඩක්." සිත රිදුණු එලන් කිව්වා. "ඔය ටින් එක ගෙනියන්න. මම සිලිං පහ ඉක්මනටම දෙනවා."

ජීන් ද පසෙකට ගියේ සිත් රිදවීමෙන් යුතුව.

ඩැෆනි පහත් හඬකින් ගොන්ඩොලින්ට කෙඳිරුවා.

"ඕනෑ ඔට්ටුවක්, එයාට දෙන්න සිලිං පහක් නැහැ."

"එයා මෙහාට ශිෂ්‍යත්වයක් දිනාගෙන ආවට, මේවගේ ඉස්කෝලෙකට එවන්න එයාගේ ගෙදර අයට වියදම් කරන්න බැහැ කියන එක මට විශ්වාසයි." කියන්නේ කුමක්දැයි එලන්ට නෑසුණු ද යම් අකරුණාවන්ත දෙයක් ගැන කියවුණු බව එලන්ට අනුමාන කළ හැකි වුණා. ඈ තම පොත විසිකර දැමුවා. ඩැෆනිගේ මුහුණේ වූ නියැවීම ඇයට ඉසිලිය නොහැකි වුණා.

"මෙතැන කාටවත් වැඩක් කරන්න දෙන්නේ නැද්ද?" ඈ කිව්වා.

"ඔය රහස් කතා නවත්වන්න ඩැෆනි, ඔය මෝඩ හිනාව නවත්වා ගන්නවා."

## 13

"හැබෑටම!" හඬ නගා දොර වසාගෙන එලන් පිටතට යද්දී ඩැෆනි කිව්වා. "එයාට තියෙන්නේ හරිම නරක පුරුදු. එයාට මොනවා වෙලාද?"

තම වැඩ ගැන එලන් වදයට පත් වී සිටින බවක් කිසිවෙක් දැන සිටියේ නැහැ. වාර අවසාන පරීක්ෂණ ළඟම එන බව ඇය දැන සිටි අතර ඇයට ඉන් හොඳ ප්‍රතිඵල ලබා ගැනීමට අවශ්‍ය වී තිබුණා. එය අනිවාර්ය දෙයක්.! එහෙයින් සෑම මිනිත්තුවකම ඇය වෙහෙසී වැඩ කළා. තම විභාගවලට සම්පූර්ණයෙන්ම සූදානම් බව ඇයට දැනෙන තෙක් වැඩ කිරීමට ඇයට අවශ්‍ය වුණා.

එහෙත් එදින සැඳෑවේ ඇයට එතරම් සනීපයක් තිබුණේ නැහැ. ඇගේ උගුර වේදනා සහගත වුණා. ඈ කැස්සා.

ඒකාන්තයෙන්ම ඇය අසනීපවීමට ආසන්නව සිටියා! ඉන් ඇය තවදුරටත් අසමත් වනු ඇත. එය සිදුවන්නට දිය නොහැක. එහෙයින් එලන් කැස්සට ගෙනා ලොසින්ජර රහසේ ගත් අතර නාන කාමරයේදී උගුර සෝදා කාටත් නෑසෙන සේ සෙම පිට කළා.

එහෙත් එදින සැඳෑවේ ඇගේ දෙනෙත තදින් දිලිසුණා. ඇගේ අසාමාන්‍ය සුදුමැලි දෙකම්මුල් වඩා රත් පැහැ ගැන්වුණා. පාඩම අතර දී ඈ කැස්සා. පාඩම කරමින් සිටි පොට්ස් ගුරුතුමිය ඇය දෙස බැලුවා.

"ඔයාට අසනීප ද, එලන්?" ඈ ඇසුවා.



"ඔ, අසනීපයක් නැහැ, මිස් පොට්ස්." බොරුවක් කී එලන් පොතට හිස නමා ගත්තා. ඈ නැවතත් කැස්සා.

"මේ කැස්සට මම කැමති නැහැ." පොට්ස් ගුරුතුමිය කිව්වා. "මම හිතන්නේ ඔයා යන්න ඕනෑ..."

"ඔ, මිස් පොට්ස්, මගේ උගුර කසනවා විතරයි." කර ගැනීමට දෙයක් නොවූ එලන් කිව්වා. "වතුර ටිකක් බිව්වොත් හරියයි......"

"හොඳයි, ගිහින් එන්න." එතරම් සතුටු බවක් නොදැක්වූ පොට්ස් ගුරුතුමිය කිව්වා. එලන් පිටතට ගියා. ඇඳුම් කාමරයට ගිය ඈ තම ගිනිගත් හිස සීතල බිත්තියට හේත්තු කරගෙන තමාට දැනෙන අපහසුව කීමට විශ්වාස කටයුතු යමෙකු සිටින්නේ නම් යැයි සිතන්නට වුණා. එහෙත් ඇගේ තුරුස්සනා හා කෝපකාරී හැසිරීම නිසා සෑම කෙනෙක්ම ඇගෙන් දුරස්ථව සිටියා. ජීන් පවා. ජීන් ඇයට සමීප වීමට උත්සාහ දරා තිබුණා.

"මට මේ දවස්වල මොනවා වෙලාද කියලා මම දන්නේ නැහැ." දැරිය සිතුවා.

"වෙනදා මම මෙහෙම නැහැ. ඇත්තෙන්ම හිටපු ඉස්කෝලේ මට හුඟක් යාළුවෝ හිටියා. මම ඒකෙත් අස්නොවුණා නම් හොඳයි. මම ශිෂ්‍යත්වය පාස් නොවුණා නම් හොඳයි!"

ඇය ආපසු යා යුතුයි. ඇගේ උගුර තවමත් වේදනා දුන් අතර ඇය ලොසින්ජරයක් මුවේ ඔබා ගත්තා. අනතුරුව සෘජුව ඇවිදීමට උත්සාහ කරමින් ඈ පන්තියට ගියා. එහෙත් ඇගේ දෙපා ගැහුණා.

ඇයට තදින් උණ ගැනී තිබුණ අතර හොඳින් පොරවා ඇඳක ගුළිවී සිටිය යුතුව තිබුණා. එහෙත් ඇය අසනීපයට යටත් වීමට කැමති වුණේ නැහැ. ඇය තම වැඩ කළ යුතුයි. ඇය ආපස්සට යා නොහැක. කුමක් සිදුවුවද විභාගයේ දී ඇය හොඳින් වැඩ කළ යුතුයි.

ඇය ප්‍රංශ කවියක් පාඩම් කිරීමට උත්සාහ කළද එය අපැහැදිලිව ඇගේ හිස වටා භ්‍රමණය වන්නට වුණා. ඈ නැවතත් කහින්නට පටන් ගත්තා.

"ඔ, කට වහනවා." ඇලිසියා කොඳුරා කිව්වා.

"පොට්වීගෙන් අනුකම්පාව ලබා ගන්න තමුසේ බොරුවක් කරන්නේ!"

ඇලිසියාගේ හැටි එහෙමයි! කඩින, ඉහළට අදින කෙඳිරිගාන අයට ඈ කැමති වුණේ නැහැ. අනුකම්පාව ලැබිය යුතු අයට එය දීමට ඇය කිසි විටක සූදානම් වුණේ නැහැ. ඇය නිරෝගී ශක්තිමත් හා කිසිදින අසනිප වූ දැරියක් නොවූ අතර අනුවණ හෝ නිකර බොළඳ ලෙස අසනිපවලට ගොදුරු වන හෝ කරදරයට පත් වූ අයට සැලකුවේ අවඥාවෙන්. ඇය දැඩි කෙනෙකු වූ අතර කෙසේවත් කරුණාවන්ත බවට පත්වීමට සූදානම් නැති බවක් පෙනුණා.

එලන් අකමැත්තෙන් ඇලිසියා දෙස බැලුවා.

"මට ඒක නවත්වා ගන්න බැහැ." ඈ කිව්වා. "මම බොරු කරනවා නොවෙයි." ඇය කිවිසුමක් පිට කළ අතර ඇලිසියා පිළිකුලින් යමක් කියා කෑ ගැසුවා.

"එපා! ඒ තරම් අමාරු නම් ගිහින් නිදා ගන්න."

"නිශ්ශබ්ද වෙන්න!" සිත රිදුණ පොට්ස් ගුරුතුමිය කිව්වා.
ඇලිසියා තවත් කිසිවක් කීවේ නැහැ. සුසුමක් හෙළූ එලන් තම පොතට නැවත අවධානය යොමු කිරීමට උත්සාහ කළා. එහෙත් ඇයට එය නොහැකි වුණා. සීනුව නාද වී ඇයට පිටතට යාමට හැකි වීම ගැන ඈ සතුටු වුණා. ඇගේ සිරුර හොඳටම රත්වී ඇය වෙව්ලුවා. අපොයි, ඇයට ප්‍රතිශ්‍යාවක් සෑදීමට ආසන්න වුණා. සමහර විට හෙට වන විට එය සුවපත් වනු ඇත.

රාත්‍රී කෑම වේලාවේදී තමා කිසිවක් නොකෑ බව පාකර් ගුරුතුමිය දකිනු ඇතැයි බිය වූ ඈ අපහසුවෙන් ආහාර ටිකක් උගුරින් පහළට ඔබා ගැනීමට වෙහෙසුණා. එහෙත් පාකර් ගුරුතුමිය එලන් ගැන නිතර සොයා බැලුවේ නැහැ. ඉක්මන් කේන්තිය ගැන නරක නාමයක් තිබුණ ද ඈ බොහෝ විට කල- බලයක් නැති දැරියක්. සමහර විටකදී ඇගේ වැඩ දුර්වල වීම ගැන පුදුමයට පත් වුවද පාකර් ගුරුතුමිය කිසිසේත් ඇය ගැන උනන්දුවක් දැක්වූවේ නැහැ.



එදින රාත්‍රියේ එලන් අසනිපයෙන් බව දැන ගත්තේ සැලී. එලන්ගේ ඉක්මන් ගෙරවිලි සහිත හුස්ම ගැනීම ඇසුණ ඈ උනන්දුවෙන් ඇය දෙස බැලුවා. එලන් පන්තියේ දී කැස්ස ආකාරය ඈට සිහිපත් වුණා. අසරණ එලන්, ඇයට හුඟක් අමාරු තිබුණත් ඒ ගැන කාටවත් කරදර නොකරන්න සිතනවා ද?.

සැලී අවබෝධයෙන් මෙන්ම කරුණාවෙන් ද යුතු වුණා. එලන් වෙතට ගිය ඈ ඇගේ උණුසුම්ව තිබූ අත ගත්තා. එහෙත් එලන් නොඉවසිල්ලෙන් හිස වැනුවා.

"මට අසනීපයක් නැහැ. මට පාඩුවේ ඉන්න දෙන්න. පොඩි ඔළුව රදයක්, එච්චරයි."

"අනේ අහිංසක එලන්." සැලී කිව්වා.

"ඔයාට ඔළුව රදයකට වඩා අමාරුවක් තියෙනවා. එන්න මේට්‍රන් ළඟට යන්න. ඔයාට බෙහෙත් බොන්න වෙනවා."

එහෙත් එලන් එකඟ වුණේ නැහැ. ජීන් පැමිණ දැඩි ලෙස අනුකම්පාව දැක්වූ පසුවයි ඈ සැබෑ අසනිප බව පළ කර එය පිළිගෙන ඇයට තදින් අසනිප ගතියක් දැනෙන බවත්, ඒ වුවද විභාගයට පෙර කිරීමට ඇති දේ අතපසුකර ලෙඩ ඇඳට යාමට නොහැකි බවත් පාපොච්චාරණය කර සිටියේ.

"මම හොඳට වැඩ කරන්න ඕනෑ." හදිසියේ වෙව්ලූ ඈ කතා කරන අතරේ කඳුළු වැල් දෙකම්මුල් දිගේ ගලන්නට වුණා.

"ඇඳට වෙලා විවේක ගන්න තියෙද්දී නැඟිටලා හිටියා කියලා ඔයාට කිසිම සෙතක් වෙන්නේ නැහැ." ජීන් කිව්වා.

"එන්න. පාඩම්වලදී කරන දේවල් මම හොඳින් ඔයාට කියලා දෙන්නම්. මම ඒක පොරොන්දු වෙනවා. මම ඔයාට සටහන් ලියලා දීලා හැම දේම කරන්නම්."

"ඔ, ඇත්තම ද?" කහිමින් අසරණ එලන් කිව්වා.

"එහෙම නම් හරි, මට පාඩම්වලට උදව් කරනවා නම් මම දැන්ම ගිහින් මේට්‍රන් හම්බ වෙන්නම්. සමහර විට එක දවසක් ඇඳේ සිටියොත් මට සනීප වෙයි."

එහෙත්, සැබැවින්ම, එලන්ට සුවය ගෙන ඒමට එක් දිනක් ප්‍රමාණවත් වුණේ නැහැ. ඇය තදබල ලෙස අසනීපව සිටි නිසා නේවාසිකාගාර පාලිකාව වහාම ඇයව අසනීප කාමරයට ඇමුවා. එහි සිටීම මහත් සහනයක් වූ ඇයට නොහඬා සිටීමට නොහැකි වුණා. ඇය තමා ගැනම ලැජ්ජා වුවද ඇයට කඳුළු නවත්වා ගැනීමට නොහැකි වුණා.

"දැන් දුක් වෙන්න එපා." පාලිකාව කරුණාබරිතව කිව්වා.

"ඔයාගේ පෙනුමේ විදියට නම් මීට හුඟ දවසකට ඉස්සරවු ඔයා ඇඳට වෙන්න තිබුණේ. මෝඩ ළමයා! දැන් දඟයක් නැතිව සතියක් විනෝදෙන් ඇඳේ ඉන්න."

සතියක්! එලන් භීතියෙන් තිගැස්සුණා. ඇයට කිසිසේත් සතියක වැඩ අතපසු කිරීමට නොහැකි වුණා. චංචල සිතින් යුතුව ඈ දෑස් මහත්කර පාලිකාව දෙස බැලුවා.

"ඒ තරම් බය වෙන්න එපා. මේක ඔයාට විනෝදයක්. එහෙම හිතුවොත් හෙම්බිරිස්සාව උග්‍ර වෙන්නෙත් නැහැ. එතකොට කාට හරි බලන්න එන්න පුළුවන්."

දින හතරක් තිස්සේ තදබල ලෙස අසනීප බවක් දැනුණ එලන්ට ඉන් පසුව සුවයක් දැනුණා. ඇගේ උණ බැසගිය අතර ඇය යම් යම් දේ ගැන උනන්දු වුණා. එහෙත් අවාසනාව! ඇයට හොඳින් කල්පනා කිරීමට හැකි වූ වහාම ඇයට සුපුරුදු පැරණි සිත් කරදර කර ගැනීම් සිහිපත් වුණා.

විභාග! තම ප්‍රතිඵල මත පන්තියේ ස්ථානය රැඳෙන බව ඈ දැන සිටියා. තමා පළමු වෙනියා හෝ පළමු ස්ථානයට ආසන්නව සිටීම වැදගත් බව ඈ දැන සිටියා. මෙවැනි කදිම පාසලකට තෝරා ගනු ලැබීම ගැන ඇගේ මව හා පියා ඉතා ආඩම්බරව තිබුණා. ඇගේ එම ශිෂ්‍යත්වය දිනා ගැනීම ඔවුන්ට මහත් ආඩම්බරයක් වුණා. ඔවුන් එතරම් වත් පොහොසත් කම් තිබූ අය නොවුණද ඇගේ මහන්සියේ ප්‍රතිඵලයක් ලෙස මැලෝරි ටවර්ස්හි ඉගෙනීමට ලැබුණ අවස්ථාව ගෙන ඇය එහි රැඳවීමට කළ හැකි සෑම දෙයක්ම කරන බවට ඔවුන් පොරොන්දු වී තිබුණා.



නිල ඇඳුම අධික වියදම් සහිත එකක්ව තිබුණා. එමෙන්ම දුම්රිය ගාස්තුව ද ඉහළයි. වෙනත් අයෙකුගේ මෝටර් රථයක නොමිලයේ එන්න ලැබීම වාසනාවක් වුණා. ඇගේ මව අලුත් ට්‍රන්ක පෙට්ටියක් හා සූට්කේසයක් මිලදී ගෙන තිබුණා. බොහෝ වියදම්. අපොයි, මැලෝරි ටවර්ස් වැනි පාසලකට ශිෂ්‍යත්වයක් දිනා ගැනීම මුදලට තට්ටු වෙන වැඩක් නම් එය වාසනාවක් ද? එහෙම නොවෙන්න පුළුවන්.

පසුව, ඇයට තවත් සිතුවිල්ලක් පහළ වුණා. ඇයට වෛද්‍යවරයකු ලබා ගැනීමට සිදුව තිබුණා. එය බිලට එකතු වන තවත් වියදමක් වනු ඇත.

මෙලෙස දිගින් දිගටම එලන් තැවුලට පත්වුණා. මේ වනවිට සාමාන්‍ය පරිදි සුව විය යුතු වුවද එසේ නොවීම ගැන නේවාසිකාගාර පාලිකාවත් හෙදියත් ඒ මන්දැයි සිතා ගැනීමට නොහැකිව සිටියා. සෑම දිනයකම ඈ ඇඳෙන් බැස යාමට ආයාචනා කළ ද පාලිකාව හිස වැනුවා.

"බැහැ. එහෙම බැහැ, දරුවා. ඔයාට තාම සනීප නැහැ. කවුරුහරි බලන්න එනවාට කැමති ද? කැමති නම් එක්කෙනෙක් ගෙන්වා ගන්න පුළුවන්."

"ඔව්, මම කැමතියි ජීන් එනවා නම්." එලන් එක්වරම කිව්වා. ජීන් ඇයට සටහන් රැගෙන ඒමට පොරොන්දු වී තිබුණා. ඇයට මඟ හැරුණ පාඩම් ගැන ජීන් කියනු ඇත. ජීන් පිළිගත හැකි විශ්වාසවන්ත කෙනෙක්.

මෙලෙස ජීන් ඇයව බලන්න සූකිරි බෝතලයක් ද රැගෙන පැමිණියා. එහෙත් එලන්ට අවශ්‍ය වුණේ සූකිරි නොවෙයි. ඈ එදෙස බැලුවේවත් නැතිතරම්.

"ඔයා මට ලියලා දෙනවා කියපු සටහන් ගෙනාව ද?" ඈ උනන්දුවෙන් ඇසුවා. "ඕ, ජීන්-ගෙනාවේ නැද්ද?"

"මගේ දෙවියනේ, ඔයාට දැන්ම සටහන් මොකට ද?" ජීන් මවිත වී ඇසුවා.

"අනේ, මට ඕනෑ. මට ඕනෑ." එලන් කිව්වා. "ඔයා පොරොන්දු

චූණ ජීන්. හොඳයි, ඊළඟ වතාවේ ගෙනෙන්න. ඔයාලා ඉතා කරලා තියෙන පාඩම් ගැන මට කියන්න."

ඇස තරකැවූ ජීන් මතක් කිරීමට උත්සාහ කළා. ක්‍රීඩා හෝ විනෝදය ගැන කතා නොකර එලන්ට පාඩම් ගැන කතා කිරීමට අවශ්‍ය වීම අසාමාන්‍ය දෙයක් ලෙස ජීන් සිතුවා. ඈ ඒවා ගැන කියන්න පටන් ගත්තා.

"හොඳයි, ගණිතයට අර අලුත් ගණන් නැවත කළා. ටිකක් ගෙනත් මම ඔයාට පෙන්වන්නම්. ප්‍රංශවලට අර හැටහතර පිටුවේ තිබුණ දිග කවිය කළා. ඔයා කැමති නම් මම කියලා පෙන්වන්නම්. එතකොට භූගෝලයට අපි ඉගෙන ගත්තා...." පාලිකාව හදිසියේම ඇතුළට වැදුණා.

"ජීන්! තවම පාඩම් ගැන වචනයක්වත් එලන්ට ඇහෙන්න හොඳ නැහැ. එයා වැඩ ගැන ඔළුව වෙහෙසන්න හොඳ නැහැ. එයාට පාඩම් මග හැරෙන එක වළක්වන්න බැරි නිසා එයා ඉදිරියේදී පන්ති වැඩවලින් ටිකක් පසුබට වෙන එක ගැන මිස් පාකර්වත්, මම්සලීත් ඒ තරම් ගණන් ගන්නේ නැහැ." එලන් ඇය දෙස භීතියෙන් නෙත් දල්වා බැලුවා.

"ඒත්, මේට්‍රන්! ඒ හැම දෙයක්ම මම දැන ගන්න ඕනෑ. දැනගන්න ඕනෑමයි. අනේ, ජීන්ට ඒවා කියන්න දෙන්න. අනිත් එයා මා වෙනුවෙන් ලියපු සටහනුත් ගෙනෙන්නයි යන්නේ."

"හරි, එයා ගෙනෙන්නේම නැහැ. මම ඒක තහනම් කරනවා." පාලිකාව කිව්වා.

එය එසේම විය යුතුයි. එලන් තවදුරටත් ජීන්ගේ අල්ලාප සල්ලාප ගැන උනන්දුවක් දැක්වූවේ නැහැ. බලාපොරොත්තු බිඳී ඇය ආපසු වැතිරුණා. ඇය පන්තියේ පහළටම යනු ඇත. ඇය කොතරම් අවාසනාවන්ත ද?



## 14

එලන්ට දින එකොළහක් තිස්සේ පාසලින් ඉවත්ව සිටීමට සිදුවූ අතර දින හත අටක් යන තුරු මහත් ළතැවිල්ලෙන් පසු වූයේ ජීන්ට පාඩම් සටහන් ගෙන ඒමට හෝ පාඩම පිළිබඳව කතා කිරීමටත් අවසරයක් නොතිබූ නිසයි. මේ වනවිට සුදුමැලිව, මදක් කෙට්ටු වී මුරණ්ඩු පෙනුමක් සහිත දෙනෙතින් යුතුව ඈ ආපසු පැමිණ තිබුණා.

ඇයට කෙසේ හෝ අතපසු වූ දේවල් අල්ලා ගැනීමට සිදුව තිබුණා. උදේ හයට අවදිව ඇඳේ සිටම විදුලි පහනක ආධාරයෙන් පාඩම් බලා ගත හැකි නම් රහසිගතව ඇයට එය කර ගත හැකියි.

තමාට අත පසු වූ දේවල් නැවත කියා දීමට හැකිදැයි ඈ පාකර් ගුරුතුමියගෙන් කාරුණිකව ඉල්ලා සිටියා. පාකර් ගුරුතුමිය එය කාරුණිකව ප්‍රතික්ෂේප කළා.

"නැහැ එලන්, සාමාන්‍ය වැඩ කරන්න තරම්වත් ඔයාට තවම සනීප මදි. අමතර පන්ති ගැන තව කතා මොකට ද! මම ඔයාගෙන් ලොකු දෙයක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. කවුරුත් එහෙම නැහැ. ඒ නිසා කරදර වෙන්න එපා."

එලන් මම්සලී ඩූපොන්ට් ළඟට පමණක් නොව මම්සලී රොජර් වෙතට ද ගියා.

"මට දැනගන්න ඕන මට මග ඇරුණ දේවල්. එතකොට මට ඒවා අල්ලා ගන්න පුළුවන්." ඈ කිව්වා. "මට ටිකක් අමතර පාඩම් කියලා දෙන්න පුළුවන් ද?"

එහෙත් මම්සලීලා දෙදෙනාගෙන් කිසිවෙක් එකඟ වුණේ නැහැ.

"ඔයාට තවම පණ මදි ළමයෝ." මම්සලී ධූපොත්ත කරුණාවන්තව කිව්වා.

"දැන් මේ වාරයේදී ඔයා දක්ෂ විදියට වැඩ කරන්න ඕනෑ කියලා කවුරුවත් බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ තරම් හිතට ගන්න එපා."

එලෙස අසරණ එලන්ගේ බලාපොරොත්තු කඩ වුණා. කිසිවෙක් ඇයට උදව් කළේ නැහැ. ඔවුන් සෑම දෙනාම ඇයට එරෙහිව සිටියා. පාලිකාව, වෛද්‍යවරයා, පාකර් ගුරුතුමිය හා මම්සලීලා දෙදෙනා.

විභාගය ආරම්භ කිරීම දවස් දහයක කාලයක් තිබුණා. සාමාන්‍යයෙන් එලන් විභාගවලට කැමති වුවද ඇ මෙම විභාගයට මහත් භීතියක් දැක්වූවා. විභාගය ගැන දැරියන් සැහැල්ලුවෙන් විහිළු කරන්නේ කෙසේදැයි ඇයට සිතා ගැනීමට අපහසු වුණා.

එවිට ඇයට අදහසක් පහළ වුණා. නරක අදහසක් නිසා එක්වරම ඇ එය සිතින් බැහැර කළා. එහෙත් එය නැවත නැවත සිතට පැමිණ ඇගේ කනට කොඳුරන්නට වූ හෙයින් ඇයට එයට සවන්දීමට සිදු වුණා.

"විභාග ප්‍රශ්න පත්‍ර දෙන්න කලින් ඒවා බලා ගන්න පුළුවන් වුණොත් ප්‍රශ්න කියවා, අහන්නේ මොනවාදැයි දැන ගැනීමට හැකි වුණොත්!"

තව දුරටත් එම අදහස සිතින් පලවා හැරීමට එලන්ට නොහැකි වුණා. එය නිතරම හිතේ පැළපදියම් වුණා. දිනක් ඇය පාකර් ගුරුතුමියගේ කාමරයේ සිටින අතරේදී ප්‍රශ්න පත්‍රය විය යුතු යැයි ඇයට සිතුණ දෙයක් මේසය මත තිබුණා. පාකර් ගුරුතුමිය කාමරයේ සිටියේ නැහැ. වටපිට බලා ප්‍රශ්න පත්‍රයට ඇස යොමු කිරීමට අවශ්‍ය වූවේ සුළු නිමේෂයයි.

එලන් කඩිනමින් ප්‍රශ්න සියල්ල කියවා දැමුවා. ඒවා කොතරම් පහසු ද! එවිටම, ඒවා දෙවන පන්තිය සඳහා නොව



පළමු පන්තිය සඳහා බව දැක ඇ මහත් කම්පනයට පත්වූවා. ඇගේ හදවත කඩා වැටුණා.

ඉන් පසුව එලන් නිතරම පොට්ස් ගුරුතුමියගේ හෝ පාකර් ගුරුතුමියගේ කාමරවලට රහසේ ඇතුල්වීමට පටන් ගත්තා. ඔවුන් කාමරවල නොමැති අවස්ථා ඇ තෝරා ගත්තා. එක් උදය වරුවක, පාසල් කාලයෙන් පසුව, ප්‍රශ්න පත්‍රවලට අදාළ යමක් තිබේදැයි දැන ගැනීමට ඇ දෙවැනි පන්තියේ ගුරු මේසයේ තිබූ දේවල් පවා අවුස්සා බලන්නට වුණා.

ඇය එහි සිටිනු දුටු ඇලිසියා පුදුමයෙන් බලා සිටියා.

"මොනවාද ඔයා කරන්නේ?" ඇ ඇසුවා. "ඔයා දන්නවා අපි ගුරු මේසය ළඟට යන්න හොඳ නැහැ කියලා. අනේ, ඇත්තට එලන්!"

"මගේ තීන්ත පෑන නැතිවෙලා." එලන් නොපැහැදිලි හඬින් කෙඳිරුවා. "මම කල්පනා කළේ සමහර විට මිස් පාකර්වත්......"

"හරි, එයා ගත්තා වුණත්, ඔයා ගුරු මේසය අවුස්සන්න හොඳ නැහැ." ඇලිසියා අවඥාවෙන් කිව්වා.

ඉන්පසු තවත් අවස්ථාවක, පොට්ස් ගුරුතුමියගේ කාමරයේ, හිස් වූ මම්සලීගේ මේසය මත වූ කොළ අවුස්සන එලන්ව ඩැරල්ට දැක ගත හැකි වුණා. ඩැරල් මවිතව ඇය දෙස ඇස් දල්වා ගත්තා.

"ඔ, ආ මම්සලී පොතක් අරගෙන එන්න කියලා මාව එව්වා." කී එලන් කම්පනයට පත්වුණා. එක් පවක් තවත් පවකට මඟ පාදන බව දැන සිටි ඇය එය සත්‍යයක් බව පසක් කර ගත්තා. ඇ උත්සාහ කරමින් සිටියේ වංචාවකට, ඉන් ඇය බොරු කීමට පෙලඹුණා. ඊළඟට කුමක් සිදුවනු ඇති ද?

"හරි, මම කියන්නේ සති දෙකක් පන්තියේ නොහිටපු නිසා එලන්ට වැඩ අමාරුයි." එක් සැඳෑවක එලන් යමෙකුට කඩා පැන බුම්මාගෙන පොදු කාමරයෙන් ඉවත ගිය පසු බෙටී කිව්වා.

"එයා වෙනදා වගේම කඩා පනිනවා. එයා නිතරම ඉක්මන් කරනින්."

"එයාට තියෙන්නේ ඉක්මන් කේන්තිය." ඇලිසියා කිව්වා. "මට නම් එයාව එපා වෙලා. හැම තිස්සෙම රවාගෙන දුකෙන් ඉහළට අදිනවා."

ඒ මොහොතේම කරදරයට පත් බවක් පළ කරමින් ගොන්ඩොලින් එතනට පැමිණියා.

"මගේ පර්ස් එක කවුරු හරි දැක්කා ද? මම ඒක ඩෙස්කයට දැම්මා හොඳටම මතකයි. ඒත් දැන් නැහැ. අනික මට බඩු වගයක් ගන්න ඕනෑ නිසා ඒකට සිලිං දහයක් දාගෙන හිටියේ. දැන් කොහොමද මම මොනවා හරි ගන්නේ?"

"අපි ඒක හොයමු." කීකරු බවක් දක්වමින් නැඟිට ගත් ඩැෆනි කිව්වා. "මම නම් කියන්නේ ඒක ඩෙස්කයේම කොතැන හරි ඇති."

එහෙත් එය තිබුණේ නැහැ. එය මහත් සිත් වේදනාවක් වුණා. නළල රැලි ගන්වමින් තමා එය වෙනත් තැනක දැමුවේදැයි සිහිමට ගොන්ඩොලින් වෙහෙසුණා.

"නැහැ. වෙන තැනක දැම්මෙ නැහැ." ඈ අවසානයේ කිව්වා. "අයියෝ, මට එපා වෙනවා. මට සල්ලි ටිකක් ණයට දෙන්න පුළුවන් ද ඩැෆනි?"

"ඔව්, මගේ පර්ස් එක සාක්කුවේ තියෙනවා." ඩැෆනි කිව්වා. "කොහොම වුණත් මම ඔයාට ණයක් දෙන්නත් තියෙනවානේ. ඊයේ බාප්පාගෙන් සල්ලි ලැබෙන්න ඉස්සරයි මම ඔයාට ඒක දෙන්න හිතාගෙන හිටියේ."

සාක්කුව අතපත ගා බැලූ ඈ කලකිරීමෙන් උඩ බැලුවා.

"පර්ස් එක නැහැ. මගේ සාක්කුවේ හිලක්! අපොයි! ඒක කොහේ වැටෙන්න ඇතිද?"



"හරි, මම කියන්නම්, ඔයාලා දෙන්න නම් නියමෙට ගැළපෙනවා!" ඇලිසියා කිව්වා. "දෙන්නාගේම පර්ස් නැතිවෙලා. පර්ස් දෙකේම සල්ලි පිරිලා තියෙද්දී! ඔයාලත් හරියට අයිරිනුයි, බෙලින්ඩයි වගේ."

මීට පෙර දින බෙලින්ඩාගේ සිලිං දෙක හමාරක කාසියක් නැතිව තිබූ අතර ඇය පන්ති කාමරයේ බිම පුරා බඩගාමින් එය සොයද්දී මම්සලීගේ කෝපය ඉහවහා ගොස් තිබුණා. ඇයට එය හමු නොවූ අතර ඇය ක්‍රීඩා අරමුදලට දුන් මුදල ආපසු දෙන ලෙස ජීන්ට බල කරන්නට වුණා. යම් මුදලක් ටින් එකට වැටුණ පසු කෙසේවත් එය දුන් අයට නොලැබෙන බව ජීන් දැඩි ලෙස කී නිසා ඇයට එය ලැබුණේ නැහැ. කුමන අරමුදලක් සඳහා වුවද ටින් එකට වැටෙන මුදල තව දුරටත් දුන් කෙනාට අයිති නොවන බව ජීන්ගේ මතය වුණා.

"මුදල් පසුම්බි දෙක හමු වුණේ නැහැ. එය සිත රිදවන සුලු තරමක් අබිරහස් දෙයක්. මුදල් පසුම්බි දෙකක්, මුදල් පිරිලා."

ඩැෆනි දෙස බැලූ ගොන්ඩොලින් කට හඬ බාල කළා.

"ඔයාට හිතෙන්නේ නැද්ද කවුරු හරි ඒවා ගත්තා කියලා? ඇත්තෙන්ම, ඒත් එහෙම දෙයක් කරන්න පුළුවන් කෙනෙක් පන්තියෙ ඉන්න බැහැ."

ඇලිසියා මුදල් පසුම්බි ගැන දැඩි කුතුහලයෙන් යුතු වුණා. දෙවන පන්ති කාමරයේ ගුරු මේසය අවුස්සමින් සිටි එලන් ගැන මතකය ඇගේ සිත තුළට එබුණා. ඇය එසේ කළේ ඇයි? ඇය කිව්වේ ඇගේ තීන්ත පෑන නැතිව තිබූ බවයි. එහෙත් ඒ සමගම වූ ඊළඟ පාඩමේදී ඇය එය පාවිච්චි කරමින් සිටිනු ඇලිසියා දුටුවා. හොඳයි, එහෙම නම්.....

එලන් වෙත ඇස යොමු කර සිටීමට ඇලිසියා සිතට ගත්තා. ඇය වංක හෝ රහසිගත යමක් කරන්නේ නම් එය සැලීට වාර්තා කළ යුතුයි. යම් සිද්ධියක් පාකර් ගුරුතුමිය වෙතට ගෙන යා යුතු ද නැති ද එය සැලී විසින්ම විසඳිය යුතු ද යන්න තීරණය කිරීමට සැලීට ඇති අයිතිය ගැන සිතීම පවා ඇලිසියාට අමිහිරි දෙයක් වුව ද එය එසේ කිරීමට සිදුව තිබුණා.

සැලී පන්ති නායිකාව බව සිහි වුණ ඇලිසියාට මේ ගැන සිතමේදී නැවතත් සුපුරුදු ඊර්ෂ්‍යා සහගත හැඟීම දැනුණා.

ඇලිසියා තමා වෙත ඇස ගසාගෙන සිටින බවක් එලන් නොදැන සිටිය ද පාකර් ගුරුතුමියගේ හෝ පොටිස් ගුරුතුමියගේ කාමරවලට තනිව යාමට පමණක් නොව දෙවැනි පන්ති කාමරයට ද කිසිවකු නැති අවස්ථාවක රිංගා ගැනීම තමාට අපහසුව ඇති බව ඇයට පෙනුණා.

ඩැෆනි පුරුදු පරිදි කාගෙන් හෝ ණයට ඉල්ලා ගත් නමුත් ගොන්ඩොලින් එසේ කළේ නැහැ. කිසිවෙකුගෙන් ණයට නොඉල්ලන ලෙස ගොන්ඩොලින්ට උගන්වනු ලැබ තිබූ අතර වියදම් පිරිමසා ගැනීමට මුදල් එවන මෙන් ඇය ගෙදරට ලියා යවා තිබුණා. මේරි ලෝව්ගෙන් ණයට මුදල් ඉල්ලා ගත් ඩැෆනි ඉන් අඩක් ගොන්ඩොලින්ට දුන්නා.

"ඕ, එපා," ගොන්ඩොලින් මඳක් කම්පනයට පත්ව කිව්වා.

"වෙන කාගෙවත් සල්ලි ඔයා මට ණයට දෙන්න එපා ඩැෆනි! මම දන්නවා ඔයා මේරි ලෝව්ගෙන් ඉල්ලා ගත්ත බව. ඇයි ඔයාටත් මම කරනවා වගේ කරන්න බැරි? ගෙදරින් චීක් වැඩිපුර සල්ලි ලැබෙන තුරු ඉන්න බැරිද? ඔයා වගේ පොහොසත් කෙනෙක් වෙන එකේ නරක ඒක තමයි. මට හිතෙන්නේ ඔයාට සල්ලිවල අගයක් තේරෙන්නේ නැහැ."

තමාගේ විශ්වාසනීය මිතුරිය, ගොන්ඩොලින්ගෙන් ඉතා සුළුවෙන් වුව ද, කෙනෙක් තමාට යම් විවේචනයක් එල්ල කළ ප්‍රථම අවස්ථාව මෙය නිසා ඩැෆනි තරමක් පුදුමයට පත් වූ බවක් පෙනුණා. අනතුරුව ඈ තම මිතුරියගේ අත පටලවා ගත්තා.

"මම හිතනවා ඔයා හරි." ඈ කිව්වා. "මට අවශ්‍ය තරම් සල්ලි මට නිතරම තිබුණා. මම ඇත්තටම සල්ලිවල වටිනාකම දන්නේ නැහැ. ඒ මම හැදිලා තියෙන හැටි. තරහා ගන්න එපා ග්වෙන්."

"ඇත්තටම සල්ලි උවමනා වුණාම ඔයාට මොනවා වෙයිද කියලා මට හිතාගන්න බැහැ." ගොන්ඩොලින් කිව්වා. "ඔයාගේ



නැව, කාර්, සේවකයෝ, ලස්සන ගෙදර නොතිබුණා නම් ඔයා අවාසනාවන්ත වෙන්න තිබුණා. අනේ, මටත් ඒ වගේ දේවල් තිබුණා නම්!"

"එන්න, මාත් එක්ක නිවාඩු කාලයේ නවතින්න." ඩැෆනි එසේ කියනු ඇතැයි නිතරම ගොන්ඩොලින් බලාපොරොත්තුවෙන් සිටිය ද ඇයට එවැනි ආරාධනයක් නම් ලැබුණේ නැහැ. නත්තල් නිවාඩුවේදී තම උසස් මිතුරිය දැකීමට නොලැබෙන බවත්, ඇය සමග උසස් නත්තල් සාදවලට යාමටත්, නාට්‍ය බලන්න යාමටත් නොලැබෙන බව ගොන්ඩොලින් දුකින් සිතුවා. ආදරයෙන් වැළඳගන්නා අම්මාත්, ගරු සැලකිලි දක්වන ආයාත් සමග ඇයට තමාගේම නිවසේ නිවාඩුව ගත කිරීමට සිදුවනු ඇත.

# 15

එය විභාග පටන් ගන්නා දිනට පෙර දිනය වුණා. කළ යුතු පරිදි පාඩම්වල අවධානය යොමු නොකිරීම ගැන වැරදිකරු හැඟීමෙන් යුතු වූ සමහර දැරියෝ මහන්සියෙන් පාඩම් කරන්නට වුණා. බෙටී හිල් පොත්වලම ගිලී සිටියා. ගොන්ඩොලින් ද එසේම වුණා. එමෙන්ම අසරණ එලන් පොතක මුහුණ ඔබාගෙන ඉතිරිව ඇති සුළු කාලයේදීත් හැකිතාක් දේවල් ඔළුවට පුරවා ගැනීමට වෙහෙසෙමින් සිටියා.

පාකර් ගුරුතුමිය එලන් ගැන තරමක් කරදරයට පත්ව සිටියා. දැරිය ඇයට පන්තියේ දී දැඩි අවධානයක් යොමු කළ ද ඇගේ වැඩ එතරමම යහපත් වුණේ නැහැ. එය උත්සාහයේ අඩුවක් නොවෙයි. පාකර් ගුරුතුමිය එය දැන සිටියා. අසනීපයෙන් පසු එලන් ශාරීරිකව දුර්වලව ඇතැයි ගුරුතුමිය සිතුවා.

විභාග ප්‍රශ්න පත්‍ර සූදානම් බව එලන් දැන ගත්තා. ඒ ගැන පාකර් ගුරුතුමිය කියනු ඇයට ඇසුණා. මම්සලී ද ඇගේ සුපුරුදු ලීලාවෙන් යුතුව විභාග ප්‍රශ්න පත්‍රය පන්තිය ඉදිරියේ වනමින් කෑ ගැසුවා.

"ආන්, දැන ගන්න කැමති ද මම ඔයාලට දෙන්න යන්නේ මොනවා ද කියලා, කැමති ද, නැද්ද? මේ අමාරු ප්‍රශ්න මොනවද කියලා දැන ගන්න කැමති ඇති! ඔන්න පළමුවෙනි එක......."

එහෙත් පළමුවැන්න කුමක්දැයි ඈ කිසිවිට කීවේ නැති අතර පන්තිය හඬ නගා සිනාසුණා. කෙසේ වෙතත්, ඉතා අමාරු ප්‍රශ්න දී ඒවා සියල්ලටම නිවැරදි පිළිතුරු බලාපොරොත්තු වී, දැරියන්ගෙන් අඩක් හෝ හොඳින් ලකුණු ලබා නැති බව දැන,



ඒ ගැන කන් කෙඳිරිගාන, රවන ඔරවන මම්සලී රොජර් මෙන් විභාග ගැන මම්සලී ඩූපොන්ට් දැඩි වූවේ නැහැ.

එදින සැඳෑවේ බොහෝ වේලාවක් එලන් පාකර් ගුරුතුමියගේ කාමරය අසල කොරිඩෝවේ සුනංගු වුණා. එහෙත් කිසිවෙකුට නොපෙනී ඇතුළට පැන ගැනීමට අවස්ථාවක් තිබුණේ නැහැ. සෑම විටම යමෙකු අසලින් යනු පෙනුණා. මෙතරම් දැරියන් සංඛ්‍යාවක් පාකර් ගුරුතුමියගේ කාමරය පසුකර යාමට වීම ඇයට පුදුමයක් වුණා. අනතුරුව, ඉතා සිත් රිදවන ලෙස, කොරිඩෝව මුළුමනින්ම හිස් වූ මොහොත වූවේ පාකර් ගුරුතුමිය කාමරයට වැඩුණ වේලාවයි. ඈ එහි සිටියේ පොට්ස් ගුරුතුමිය ද සමගයි. ඔවුන් කතා කරමින් සිටි දේවල් සැහෙන දුරට ඇයට ඇසුණා.

ඇය දොර අසලම නැමී ලිහුණ සපත්තු ලේස් ගැට ගහන බවක් ඇඟෙව්වා.

"මේ වාරයේදී දෙවැනි පන්තිය නරකම නැහැ." පාකර් ගුරුතුමිය පොට්ස් ගුරුතුමියට කියනු ඇයට ඇසුණා.

"ඔයා එක්ක හිටපු අවුරුද්දේදී එයාලට හුඟක් ප්‍රයෝජන ලැබිලා වගේ පෙනෙනවා. හුඟක් දෙනෙකුට මොළේ පාවිච්චි කරන්න පුළුවන් එකත් ලොකු දෙයක්."

"හොඳයි, මම හිතනවා එයාලා හුඟ දෙනෙක් විභාගය හොඳට කරයි කියලා." පොට්ස් ගුරුතුමිය කිව්වා.

"මම හුඟක් ආසයි එයාලා පළමුවතාවට දෙවැනි පන්තියට ගිහින් කරන පළවෙනි විභාගය ගැන බලන්න. වාර තුන හතරක් එයාලා එක්ක ඉඳලා එයාලා ගැන උනන්දුව ඉක්මනට අතහරින්න බැහැ. මම හිතන්නේ ඇලිසියා හරි, අයිරින් නැති නම් ඩැරල් පළමුවෙනියා වෙයි. එයාලට හොඳට මොළය තියෙනවා."

"බලන්න මේ ප්‍රශ්න දිහා." පාකර් ගුරුතුමිය කී අතර පොට්ස් ගුරුතුමියට කඩදාසි දෙන සර සර හඬ ඇත්තෙන්ම එලන්ට ඇසුණා. ඒවා බලා ගැනීමට ඇය කොතරම් ආශා කළා ද?

පොට්ස් ගුරුතුමිය එය කියවන අතරේ දැඩි නිහඬ බවක් පැතිරුණා.

"ඔව්, ටිකක් අමාරුයි, එකක් දෙකක්, ඒත් අවධානයෙන් වැඩ කළා නම් හැම කෙනෙකුටම හොඳට උත්තර ලියන්න පුළුවන්. ප්‍රංශ ප්‍රශ්න පත්‍ර කොහොම ද?"

"ඒවා මම්සලී ළඟ එයාගේ කාමරයේ." පොට්ස් ගුරුතුමිය කිව්වා.

"මම මේවාත් එයාට ගිහින් දෙනවා. හෙට උදේම තියෙන්නේ දෙවැනි පන්තිය නිසා එයාට පුළුවන් මේවාත් අරගෙන යන්න."

එලන්ගේ හදවත ගැස්සුණා. එදින රාත්‍රියේ ප්‍රශ්න පත්‍ර තියෙන්නේ කොහෙද යන්න දැන් ඇය දන්නවා. මම්සලීගේ කාමරයේ. එමෙන්ම එය පිහිටියේ නිදන කාමරවලට තුදුරින්. ඇයට පුළුවන්ද, ඇයට බයක් නැද්ද, මහ රෑ නැඟිට ගොස් ඒවාට බැල්මක් හෙළන්න.

මුල්ලකින් හැරී ආ දැරියක් එලන්ගේ ඇගේ හැපීමෙන් එලන් වැටෙන්න ගියා. ඒ ඇලිසියා.

"දෙවියනේ, මේ එලන්! මම උඩට යද්දිත් ඔයා මෙතැන කැරකි කැරකි සිටියා. දැන් මම ආපහු එද්දිත් තවම ඔයා මෙතැන. මොනවද මේ කරන්නේ?"

"ඔයාට ඒකෙන් වැඩක් නැහැ." කී එලන් ඉවතට පා තැබුවා. පොදු කාමරයට ගිය ඈ වාඩි වුණා. ඇයට කල්පනා කරන්න දේ තිබුණා. මහ රෑ නැඟිට ප්‍රශ්න පත්‍ර දඩයමේ යාමට ඇයට හැකි ද? එය ඉතාම ඉතා වැරදි දෙයක්. එහෙත්, අපොයි ! ඇය මුළු වාරය පුරාම සනීපයෙන් සිටියා නම් සමහර විට පළමු වැනියා හෝ ඊට ආසන්න වීමට ඇයට හැකියාව තිබුණා නේද? එය ඉතා පහසු දෙයක් වන්නට තිබුණා නේද? තමා අන්තිමයා හෝ ඒ තරමට ඇද වැටීමට හේතුව ඇගේ වැරැද්ද නොවෙයි.

මෙලෙස වාඩිවී, තමා කරන්න යන දෙය සාධාරණ බව ඇය තම සිත සමග තර්ක කරන්නට වුණා. ඒක වැරදියි. ඒත් වෙන මොනවා කරන්න ද? ඇයට එය කරන්නට සිදුව ඇත්තේ තම දෙමාපියන්ගේ කලකිරීම වළකා ගැනීමටයි. ඇයට ඔවුන්ව අපහසුවට පත් කිරීමට නොහැකි වුණා. අසරණ එලන් තමා



අවංක වී පන්තියේ අන්තිමයා වෙනවාට වඩා, වංචාව පන්තියේ පළමු වැනියා වීමේ සිතුවිල්ල ඇයට සිහින් බැහැර කළ නොහැකි වුණා.

මේ අතර මුදල් සොරකම් කරන්නේ එලන් යන සැකය ඇලිසියාට තහවුරු වන්නට වුණා. එසේ නැතිනම්, අඩුතු කරන්නේ කුමක්ද? මුදල් පසුම්බි දෙකෙන් එකක්වත් හමුවුණේ නැහැ. බෙලින්ඩාගේ සිලිං දෙකහමාරේ කාසිය හමු වුණේ නැහැ. තවත් මුදල් හා මුදල් පසුම්බි පිටින්ම නැතිවුණ ද සලකුණක් හෝ සොයා ගැනීමට නොහැකි වුණා. ඒ අතරම තම ආච්චි නියවාරයේ දී තමාට තෑගී දුන් රතුත් කොණ්ඩා කටුව නැතිවී ඇති බවට එමිලි පැමිණිලි කළා.

එමිලි ඉතා පිළිවෙළකට හා ප්‍රවේසමෙන් වැඩ කළ නිසා සාමාන්‍යයෙන් බෙලින්ඩා හෝ අයිරින් මෙන් තම දේවල් අස්ථාන ගත කර ගත්තේ නැහැ. එමිලි තම කොණ්ඩා කටුව නැතිවීම ගැන පොදු කාමරයේදී කතා කරනු ඇසුණා.

"වහපු දොරවල් ළඟ හොරගල් අහුලන කෙනෙක්, මම හිතන්නේ." ඇලිසියා සිතුවා.

"මේ" තරමක් හඬ නගා ඈ කතා කළා. "සැලී, මේ අතුරුදහන්වෙන දේවල් ගැන මට යමක් කියන්න තියෙනවා. මට කාටවත් චෝදනා කරන්න වුවමනාවක් නැහැ. මම පහුගිය දවස් ටිකේ කෙනෙක් ගැන ඇහැ ගහගෙන හිටියා. හැබැයි අමුතු අමුතු දේවල් තමයි දකින්න ලැබුණේ."

සැම කෙනෙක්ම පුදුමයෙන් හිස ඔසවා බැලුවා. සැලී පොදු කාමරය සිසාරා බැලුවා.

"අපි හැමෝම ඉන්නවා ද?" ඈ ඇසුවා.

"ඔව්, ටිකක් ඉන්න. එලන් නැහැ. අපි එයාවත් එක්ක එමු."

"නැහැ, එපා." ඇලිසියා කිව්වා. "නැති එකමයි හොඳ."

"මොකක්ද ඒකේ තේරුම?" ව්‍යාකූලව සැලී ඇසුවා. ඒ සමගම ඇගේ දෑස් මහත් වුණා.

"ඔ, ඔයා හිතන්නේ නැහැ. ඇලිසියා ඔයා කියන්න හදන්නේ ඔයා ඇහැ ගහගෙන හිටියේ එලන්ට කියලා ද? එයා මොනවාද ඒතරමටම කළ අමුතු දේවල්?"

කාමරයක් හිස්වන තුරු එලන් කොරිඩෝවේ රැඳී බොරු රඟපෑම් කරන අයුරු තමා දුටු ආකාරය ඇලිසියා කිව්වා. එලන් පාකර් ගුරුතුමියගේ මේසයේ තිබූ දේවල් අවුස්සා බලන අයුරු තමා දුටු බව ඇලිසියා කිව්වා. සෑම කෙනෙක්ම පුදුමව අසා සිටියා.

"එයා එහෙම කෙනෙක් කියලා මම හිතුවේ නැහැ." පිළිකුලින් යුතුව ඩැෆනි කිව්වා.

"මොනතරම් නරක ද! මම නම් එයාට කැමති නැහැ. මගෙයි ග්වෙන්ගෙයි පර්ස් එක ගත්තේ එයා කියලා දැන් නම් කිසිම සැකයක් නැහැ. එතකොට එමිලිගේ කොණ්ඩා කටුව, අපොයි තව මොනවද?

"අපි මොනවා හරි දෙයක් හරියට හොයා ගන්න තුරු එහෙම කතා කරන්න එපා." සැලී තියුණු ලෙස කිව්වා. "අපිට තවම හරි හමන් සාක්ෂියක් නැහැ. එලන් සැක විදියට හැසිරෙන එක ඇලිසියා දැකලා විතරයි."

"හොඳයි" මඳක් පසුබාමින් ඩැරල් කතා කළා. "සැලී, මමත් එක දෙයක් එක සැරයක් දැක්කා. එලන්, මිස් පොට්ස්ගේ කාමරයේ ඉන්නවා දැක්කා. එයා මේසය උඩ තිබුණ මොකක් හරි කියෙව්වා."

"කොයි තරම් නරක ද!" ඩැෆනි කී අතර ග්වෙන් ද එය නැවත හඬ නගා කිව්වා. ජීන් කිසිවක් කීවේ නැහැ. ජීන් එලන්ට එතරම් ඇලුම් නොකළ ද අනෙක් අයට වඩා එලන්ට හිතවත්ව සිටියේ ඇයයි. එහෙත් එලන් හෙර වනු ඇතැයි ඇයට සිතා ගැනීමට නොහැකි වුණා.

"හොරකම් කරන කෙනෙක්, හරි අපරාධයක්!" ජීන් ඇස කුඩා කර කල්පනාවට වැටුණා. නිසැකවම එලන් එසේ විය නොහැක.

"මට නම් ඒක විශ්වාස කරන්න බැහැ." ඈ තම පැහැදිලි ස්කොට්ලන්ත ස්වරයෙන් කිව්වා. "එයා අමුතු ළමයෙක්, ඒත් මම හිතන්නේ නැහැ හොරකම් කරන කෙනෙක් කියලා."

"හරි, ඒත් ඔයාට එයා ක්‍රීඩා අරමුදලට සල්ලි දුන්නේ නැහැ කියලයි මම හිතන්නේ." එලන් මුදල් දීම ප්‍රතික්ෂේප කරනු සිහිවූ ඇලිසියා කිව්වා.

"එයා දුන්නා. මම ආයෙත් ඉල්ලුවා." ජීන් කිව්වා.

"ඔව්, ඒ එක පර්ස් එකක් නැති වුණාට පස්සේ." බෙටී හඬ නගා කිව්වා.

ජීන් නිහඬ වුණා. ඔව්, එය සැබෑවක්. ඒ වනතුරු එලන් තම මුදල දී තිබුණේ නැහැ. සෑම දෙයක්ම එලන්ට එරෙහි වී තිබුණා.

"අපි මොකද කරන්නේ?" ඩැරල් අසරණ ලෙස ඇසුවා.

"සැලී, ඔයා නායිකාව. ඔයා මොනවාද කරන්න යන්නේ?"

"මට ඒ ගැන හිතන්න ඕනැ." සැලී කිව්වා. "මට ඒක දැන්ම තීරණය කරන්න බැහැ."

"තීරණය කරන්න දෙයක් නැහැ." අවඥා සහගත හඬින් ඇලිසියා කිව්වා. "එයා හෙරක්. හරි, එයා එක්ක කතා කරලා එයාගෙන්ම අහගන්න. ඔයාට බැරි නම් මම අහගන්නම්."

"ඔයා ඒක කරන්න ඕනැ නැහැ." සැලී එක්වරම කිව්වා. "මම කියන්නේ අපිට තවම සාක්ෂියක් නැහැ. ඔයා වචනයක් වත් කියන්න එපා ඇලිසියා. මම නායිකාව නිසා ඔයාට ඒක තහනම් කරනවා."

ඇලිසියාගේ දෙනෙත් නපුරින් දිලිසුණා. "අපි බලමු" ඈ කිව්වා.

එහෙත් ඒ මොහොතේම කාමරයට ඇතුළු වුණේ කවුද? එලන්, මුහුණු දුටු වහාම, කවුරුත් කෝපයෙන් සිටිනු දුටු ඈ තරමක් බියට පත්වුණා. ඇගේ හදිසි පැමිණීමෙන් මඳක් වික්ෂිප්ත වූ දැරියෝ මහත් වූ දෙනෙතින් යුතුව ඇය දෙස බැලුවා. ඒ

සමග සැලී, ඩැරල් සමග කතාවක් ආරම්භ කළ අතර ජීන් එමිලි වෙතට හැරුණා. එහෙත් ඇලිසියා කතාව මාරු කිරීමට හෝ සැලීට අවනත වීමට සූදානමින් තිබුණේ නැහැ!"

"එලන්" ඈ පැහැදිලිව හඬ නගා කතා කළා. "මේසවල තියෙන දේවල් අවුස්සලා, දොරවල් ළඟ එබිකම් කරලා මොනවාද ඔයා හොයා ගත්තේ?"

එලන් සුදුමැලි වුණා. සාජුව සිටගත් ඈ ඇලිසියා වෙත දැඩි බැල්මක් හෙළුවා.

"මොනවා, මොකක්ද ඔය කියන්නේ?" අවසානයේ ඈ ගොත ගසමින් ඇසුවා. ඇත්තෙන්ම ඔව්, ඇත්තෙන්ම තමා විභාග ප්‍රශ්න පත්‍ර සොයන බවක් කිසිවෙකු දන්නවා විය නොහැක.

"කට වහගන්න, ඇලිසියා." සැලී නියෝගාත්මක හඬින් කිව්වා. "මම කියපු දේ මතකනේ!"

ඇලිසියා එය තැකුවේ නැහැ. "මම කියපු දේත් ඔයා දන්නවානේ" කී ඈ එලන්ට දැඩි ස්වරයෙන් කතා කළා.

"කවුරුත් නැති වෙලාවක කාමරවලට, මේසවලට, කබඩ්වලට ගිහින් එබිකම් කරලා ගන්න පුළුවන් මොනවාද කියලා ඔයා දන්නවානේ. ලාච්චුවල එහෙම මොනවද තිබුණේ?"

"මම මොකක්වත් ගත්තේ නැහැ." උගුලකට අසුවූ කලක මෙන් එලන් කෑ ගසා කිව්වා. "මම මොනවා කරන්න ද?"

"ආහ්, සල්ලි පිරුණ පර්ස් නැතිනම් රත්‍රන් කොණ්ඩා කටුවක් දෙකක්" ඇලිසියා ඇද පැද කතා කළා. "කියන්න, ඇත්ත කතා කරන්න, එලන්, ඔයා වැරදිකාරි වෙලා ඉවරයි. ඇයි තවත් බොරු කියන්නේ?"

තම දෙසවන් ඇදහිය නොහැකිව එලන් ඇස් දල්වාගෙන බලා සිටියා. දැරියෝ නිහඬව ඇය වෙත නෙත් දල්වා ගෙන සිටියා. සමහර කෙනෙකුට ඇය දෙස බැලිය නොහැකි වුණා. මෙවැනි සිද්ධීන් දැරිය නොහැකි වූ මේරි ලෝව් හඬන්නට වුණා. කළ හැකි දෙයක් නොමැතිව සැලී කෝපයෙන් ඇලිසියා දෙස



බැලුවා. දැන් සිද්ධිය නැවැත්වීමෙන් පලක් නැහැ. දුරදිග ගොස් වැඩියි. ඇයට අවනත නොවෙන්නට තරම් ඇලිසියාගේ බය නැතිකම!

ඩැරල් ද කෝපයෙන් යුතු වූ අතර එලන් මුළුමනින්ම වැරදිකාරී යැයි ඈ සිතූ නිසා ඇගේ කෝපයෙන් අඩක් එලන් වෙතට ද එල්ල වුණා.

කෙසේ වෙතත් පන්ති නායිකාව වූ සැලීට අවනත නොවීම ගැන ද ඈ කෝපයෙන් යුතු වූ අතර එලන් වැරදිකාරියක් නම් සිද්ධිය හැකි ඉක්මනින් සමථයකට පත් කළ යුතු බව ද ඈ සිතුවා.

"ඔයාලා හිතනවද මම, මම ඔයාලාගේ දේවල් හොරකම් කරනවා කියලා." අවසානයේ දැඩි උත්සාහයක් ගෙන එලන් ඇහුවා. "ඔයාලාට එහෙම හිතන්න බැහැ."

"ඇයි බැරි" ඇලිසියා සැරෙන් ඇහුවා. "එහෙම නම් ඇයි ඔයා හොරෙක් වගේ හැසිරුණේ? ඇයි මිස් පාකර්ගේ මේසයේ තිබුණ දේවල් ඇවිස්සුවේ? ඒ ඇයි කියලා ඔයාට කියන්න පුළුවන්ද?"

නැහැ. එලන්ට නොහැකියි. විභාගයේදී වංචා කිරීමට තමන් විභාග ප්‍රශ්න පත්‍ර බලා ගැනීමට උත්සාහ කළ බව ඇයට කියන්නට හැකිද?

ඔහ්! එක වැරැද්දක් කරන්න ආරම්භ කළොත් තවත් වැරදිවල ඉවරයක් නැහැ. ඈ දෑතින් මුහුණ වසාගත්තා.

"මට මොකවත් කියන්න බැහැ."ඇය කී අතර ගලා ආ කඳුළුවලින් ඇඟිලි තෙමෙන්නට වුණා. "ඒත් මම ඔයාලාගේ දේවල් ගත්තේ නැහැ."

"ඔයා තමයි ගත්තේ." ඇලිසියා කිව්වා. "ඔයා හෙරක් විතරක් නොවෙයි බය ගුල්ලියක්. වැරැද්ද පිළි අරගෙන බඩු ආපසු දෙන්න ඔයාට බැහැ."

එලන් කාමරයෙන් පිටතට ගියා. ඇය පිටව ගිය පසු දොර වැසුණා. මේරි ලෝව් දුකින් ඉකියක් ගැසුවා. "මට එයා ගැන හුඟක් දුකයි." ඈ කිව්වා. "මට දුක හිතෙනවා."

## 16

දැඩි නිහඬතාවයක් තිබූ අතර මේරි ලෝවිගේ ඉහළට ඇදීමෙන් එය වරින් වර බිඳුණා. බොහොමයක් දැරියෝ කනස්සල්ලටත්, බියටත් පත්ව සිටියා. ඇලිසියා කුඩුකේඩු ලෙස මඳ සිනාවක් පෑවා.

"මම හිත රිදෙව්වා නම් සමාවෙන්න, සැලී" ඈ කිව්වා.

"ඒත් එලන්ට කෙලින් කතා කරන්න අපි පරක්කු වැඩියි. නායිකාව හැටියට ඔයයි ඒක කරන්න තිබුණේ. ඒත් සිද්ධ වුණේ ඔයා ඒක මටම කරන්න ඉඩ ඇරියා."

"මම ඉඩ දුන්නේ නැහැ." සැලී කිව්වා. "මම ඔයාට මොකවත් කියන්න එපා කිව්වා. අපි එලන්ට චෝදනා නොකරන්නයි තිබුණේ. හරි සාක්ෂියක් නැතිව එහෙම කරන එක හරි නැහැ. මේක කරන්න හොඳම විදිය දැන ගන්න මට හිතන්න අවශ්‍ය වෙලා තිබ්බේ. ඇත්තටම, හැම කෙනෙක්ම ඉන්න තැන නොවෙයි."

සැලී නිවැරදි බව සිතුණ ඩැරල්ට අපහසුවක් දැනුණා. තව ටිකක් ඉවසා සිට සැලීට යම් මඟක් සිතා ගැනීමට ඉඩ දුන් පසුව ඇයට එලන් සමග එය විසඳා ගැනීමට ඉඩ හැරියා නම් තමයි හොඳම. දැන් දෙබර කූඩයට ගල් ගසා හමාරයි. සෑම කෙනෙක්ම දැන ගත්තා. එලන් මොනවා කරන්න ද?

"හොඳයි, මට කියන්න තියෙන්නේ මේ කාරණය ඉස්මතු කරලා ගත්ත එකට මම ඇලිසියාට ස්තුති කරනවා කියලා විතරයි." තම දිලිසෙන කෙහෙරැලි නළලින් පසුපසට කරමින් ඩැෆනි කිව්වා. "දැන්වත් අපේ බඩු ආරක්ෂා වෙයි."



"ඔයා අහන්න ඕනෑ සැලී කියන දේවල්, ඇලිසියා කියන දේවල් නොවෙයි." ඩැරල් කෝපයෙන් කතා කළා.

"අපි තවත් ඒ ගැන කතා නොකර ඉඳිමු." සැලී කිව්වා. "සිද්ධ වුණ දේ වුණා. ඊ කෑමට සීනුව වදිනවා. දෙවියන්ගේ නාමයට, අපි යමු."

ඔවුන් ශාන්තව කෑම මේස වෙතට ගියා. එලන් එහි සිටියේ නැහැ. ජීන් ඇය ගැන ඇහුවා.

"මම ගිහින් එලන්ව එක්ක එන්න ද, මිස් පාකර්" ඈ ඇහුවා.

"නැහැ. එයාට ඔළුවේ රුදයක් ඇවිදින් කල් ඇතිව නින්දට ගියා." පාකර් ගුරුතුමිය කිව්වා. දැරියෝ එකිනෙකා වෙතට බැලුම් හෙළා ගත්තා. එසේ නම් එලන්ට නැවතත් එදින සැඳෑවේ ඔවුන්ට මුහුණ දීමට නොහැකි වෙලා.

"හොර හිත" ඇලිසියා බෙට්ට කිව්වේ ඩැරල්ට හා සැලීට ද ඇසෙන පරිදි තරමක් උස් හඬකින්.

නිදන වේලාව පැමිණි පසු පන්තිය ඇඳන් වෙත යද්දී එලන් නිදාගෙන සිටියා. ඇලයකට හැරී සිටි ඇගේ මුහුණ නිසලව කොට්ටය මත තිබුණා.

"නිදි වගේ බොරු කරනවා." ඇලිසියා කිව්වා.

"කට වහගන්න." හදිසියේම ජීන් පහත් හඬකින් කිව්වා.

"ඔයා කරන්න ඕනෑ ටික දැනටමත් කරලා ඉවරයි ඇලිසියා ජෝන්ස්. තවත් කට කැඩිච්ච කතා අහන්න අපිට ඕනෑ නැහැ. කතාව නවත්වා ගන්න."

දැස් මවිතයට පත් ඇලිසියා ජීන් දෙස රවා බැලුවා. ජීන් ද ආපසු රවා බැලුවා. ඇලිසියා තවත් කතා කළේ නැහැ. ඉක්මනින්ම දැරියෝ ඇඳන්වලට නැඟ ගත් පසු විදුලිපහන් නිවුණා. එක්වරම ඔවුන් කතා නැවතුවා. නීති ආරක්ෂා කළ යුතු බව සැලී තරයේ කියූ අතර ඇයට ගරු කළ දැරියෝ එය අනුගමනය කළා.

ඔවුන් එකිනෙකා නින්දට වැටුණා. ඩැෆනි ප්‍රමාදව නින්දට යන අයෙක් වුවද ඇය ද බොහෝ වේලාවකට පසුව නින්දට වැටුණ නමුත් තවත් කෙනෙක් හොඳින් අවදිව සිටියා. ඇත්තෙන්ම ඒ එලන්.

ගුරු මණ්ඩලය ද නින්දට යන තුරු අවදිව රැඳී සිටීම ඇයට කිසිසේත් අපහසු වුණේ නැහැ. ඇගේ දෙනෙත් සාජුව අඳුර යොමුව තිබූ අතර ඇගේ හිස රත් වී ඇති බව දැනුණා. ඇලිසියාගේ අවඥාසහගත මුහුණ මතක් වන විට ඇගේ දැත් මිට මෙළවුණා.

අවසානයේ නැඟිට ගැනීමට තරම් ආරක්ෂාකාරී වාතාවරණයක් ඇති බව සිතූ ඇය ඇඳේ වාඩි වී වට පිට බැලුවා. සඳ නැඟ තිබූ අතර කාමරයේ අඳුර තුළින් සඳ රැස් කාන්දු වුණා. කිසි තැනක කිසිවක් සෙලවුණේ හෝ නැති අතර සැම අසින් ඇසුණේ දැරියන් හුස්ම ගන්නා ඒකාකාරී හඬයි. ඇ ඇඳෙන් සෙමින් බැස ගත්තා. සෙරෙප්පු යුවළට පා ඔබා ගත් ඇ උඩු ගවුම දවටා ගත්තා. ඇගේ හදවත වේදනාත්මකව ගැහෙන්නට වුණා.

ඇ කාමරයෙන් පිටතට රිංගා ගත්තා. අතරමගදී ඇඳක හැපුණ ඇය එහි නිඳන දැරිය අවදි වේයැයි බියෙන් හුස්ම ඉහළට ඇද ගත්තා. එහෙත් කිසිවක් චලනය වූයේ නැහැ. සඳ එළියෙන් ආලෝක වූ කොරිඩෝවට පැමිණ තරප්පුව බැස ගිය ඇය මම්සලි හා පොට්ස් ගුරුතුමිය එක්ව බෙදා ගත් කාමරය සොයා යන්නට වුණා. එය අඳුරේ ගිලී තිබුණා. බොහෝ වේලාවකට පෙර මම්සලි නින්දට ගොස් තිබුණා.

ජනෙල් තිර හොඳින් පහතට ඇද ඇතිදැයි බලා ගැනීමට එලන් ජනේලය වෙත ගියා. ඒවා ඝනකම් තිර වූ හෙයින් සඳ එළිය කාන්දු වූයේ නැහැ. අනතුරුව දොර වැසූ ඇ විදුලි බුබුළ දැල්වූවා. ඇ මේසය වෙතට ගියා. මම්සලී රොජර් මෙන් මම්සලි ඩූපොන්ට් පොත්පත් පිළිවෙළකට තබා නොගන්නා හෙයින් සුපුරුදු ලෙස එය අවුල් වී තිබුණා. එලන් මේසය උඩම වූ කොළ පෙරළන්නට වුණා.

ඇ දෙවරක් ඒවා පෙරළා බැලුවා. විභාග ප්‍රශ්න පත්‍ර එහි තිබුණේ නැහැ. ඇගේ හදවත ගල් ගැසී නැවතුණා. ඒවා



අනිවාර්යයෙන් එහි තිබිය යුතුයි. සමහර විට ඒවා ලාච්චුවේ විය හැක. එහි අගුල දමා නොතිබේවායි ඇය ප්‍රාර්ථනා කළා. මම්සලි සමහර විටක එහි අගුල දමනු ඇ දැක තිබුණා. එහෙත් එදින මම්සලි විභාග ප්‍රශ්න පත්‍ර ඇතුළට දමා යතුරු දමා ඇත.

දුකින් හා භයින් දෙගිඩියාවෙන් යුතු වූ ඇගේ දණිස් වෙව්ලන්නට වූ හෙයින් ඇ වාඩි වුණා. එවිටම ඇගේ දෙනෙත් පෑන් රඳවනයේ තිබූ යතුරක් වෙතට එල්ල වුණා. ඇය වහා එය අතට ගත්තා. එය යතුරු හිලට දමා ඇ උත්සාහයක් කළ අතර එය විවෘත වුණා.



ප්‍රශ්න පත්‍ර ලාච්චුවට දමා යතුරු ලා යතුර පෑන් රඳවනයේ තබා යන්නට මම්සලී මොනවගේ කෙනෙක් ද?

වෙව්ලන දැතින් එලන් එතුළ වූ විශාල කොළම්ට් පෙරළන්නට වුණා. එක් කොනක, පාකර් ගුරුතුමිය විසින් පිළිවෙළට තබා බැඳ තිබූ දෙවැනි පන්තියේ ප්‍රශ්න පත්‍ර මිටිය තිබුණා.

ස්තූති පූර්වක සුසුමක් පිට කළ එලන් ඒවා අතට ගත්තා. ඇය ඒවා ප්‍රවේසමෙන් කියවීමට සූදානම් වත්ම ඇයට හඬක් ඇසුණා. ඇගේ හදවත නැවතුණ තරම්. ක්ෂණයෙන් දොර වෙතට

පැන ගත් ඇ විදුලි බුබුළ නිවා දැමුවා. නැවත පැමිණ ලාච්චුව සෙමින් වැසූ ඇ දොර වෙතට ගොස් සවන් යොමු කළා.

ශබ්දය නැවත පැමිණියා. ඒ කුමක්ද? කවුරුන් හෝ පිටත ඇවිදිනවා ද? එසේ නම් ඇයට ඉතා ප්‍රවේසම් වීමට සිදු වෙනවා. ඇය ප්‍රශ්න පත්‍ර ටික තම ගවුමේ විශාල සාක්කුවට ඔබා ගත්තා. එහි සිටින බව කවුරුන් හෝ දැන ගතහොත් බරපතළ ගැටලුවකට මැදිවිය හැකි නිසා ඉක්මනින්ම ඇ මම්සලීගේ කාමරයෙන් පිට විය යුතුයි.

ඉහළ මහලේ, නිදන කාමරයේ, එලන් පිටතට පැන ගත් වහාම ඩැරල් අවදි වුණා. එලන් හැපී තිබුණේ ඇගේ ඇඳෙහි වුවද එවිටම ඇය පිබිදුණේ නැහැ. එහෙත් එලන් පිටව ගොස් විනාඩි භාගයකට පමණ පසුව තමා අවදි වූයේ කුමක් හේතුවෙන්දැයි කල්පනා කරමින් ඇ ඇඳේ වාඩි ගත්තා.

ඇය නැවතත් නිඳා ගැනීමට සැරසෙද්දී ඇ එලන්ගේ හිස් ඇඳ දැක ගත්තා. දීප්තිමත් සඳ කිරණක් කෙළින්ම ඇගේ ඇඳ මතට වැටී තිබුණා. එහෙත් එලන් එහි වැතිරී සිටිනු දැක්වෙන පොදියක් එහි තිබුණේ නැහැ. සමතලා බවක් ගත් එය හිස්ව තිබුණා.

ඩැරල් මහත් වූ දෙනෙතින් ඒ දෙස බැලුවා. එලන් කොහේ ද? ඇයට නැවත අසනීපවී ද? නැතිනම් තවත් වටිනා යමක් සොරා ගැනීමට ඇය හොර රහසේ ගැවසෙනවා ඇති ද?

ඩැරල්, සැලී දෙස බැලුවා. ඇය මෙය සැලීට කියා මේ පිළිබඳ කටයුතු කිරීමට ඇයට ඉඩ දිය යුතුයි. ඇලිසියා මැදිහත් වූ ප්‍රමාණය සෑහෙනවා. එහෙයින්, එලන් ඉක්මනින් ආපසු නොපැමිණියහොත් ඒ ගැන කටයුතු කිරීමට සැලීට කීම ඇගේ යුතුකමක්.

එලන් ආපසු නොපැමිණි අතර නොඉවසිල්ලෙන් විනාඩි කිහිපයක් කල් බැලූ ඩැරල් ඇය සොයා යාමට තීරණය කළා. ඇ සැලීට කතා කළේ ද නැහැ.දැඩි කුතුහලයෙන් යුතු වූ ඇයට තනිවම එලන් පසුපස යාමට අවශ්‍ය වුණා. මධ්‍යම රාත්‍රියේ එවැනි දෙයක් කිරීම චකිතය මුසු විනෝදාත්මක දෙයක් ලෙස පෙනුණා.



ඇ තම සෙරෙප්පු හා උඩු ගවුම දමා ගත්තා. තම මාදු පාවහන් මත සෙමින් අඩි තබමින් ඇ කාමරයෙන් පිටතට ආවා. කොරිඩෝවේ සිට ගත් ඇ සවන් යොමු කළා. ඇයට කිසිවක් ඇසුණේ නැහැ.

කොරිඩෝව ඔස්සේ පා තබමින් ඇ තරප්පු පෙළ වෙතට පැමිණියා. සමහර විට එලන් පළමු පන්තියේ හෝ දෙවැනි පන්තියේ ඩෙස්ක අවුස්සනවා විය හැක. ඇ සෙමින් තරප්පු පහළට බැස්සා. ඇය පළමු පන්ති කාමරය වෙතට පැමිණි අතර එහි දොර වසා තිබුණා. ඩැරල් එය විවෘත කළා. කාමරය අඳුරේ ගිලී තිබුණ අතර ඇ දොර වසා දැමුවා. ඉන් කුඩා හඬක් නිකුත් වුණා.

දෙවැනි පන්ති කාමරයට ද ගිය ඇ එහි දොර ද විවෘත කළා. තමාට යම් ශබ්දයක් ඇසුණ බව සිතුණ ඇ ඉක්මනින්ම විදුලි බුබුළ දැල්වූවා. එහෙත් එහි කිසිවෙකු සිටියේ නැහැ. විදුලි බුබුළ නිවා දමා ඇය දොර වැසීමට සැරසෙක්ම නැවතත් හඬක් ඇසුණා. ඇ නැවතත් වහාම විදුලි බුබුළ දැල්වූවා. එවිට කබඩය අසල ඇ යම් චලනයක් දුටුවා.

ඩැරල්ගේ හදගැස්ම වැඩි වුණා. එලන් ඒක ඇතුළේ ද? නැතහොත් වෙනත් කෙනෙක් ද? ඒ ගෙවල් බිඳින්නකු නම් මොනවා කරන්න ද? එහෙත් ඒ එලන් විය යුතුයි. ඇය මෙහි කබඩයේ සැඟවී සිටිනවා විය හැකියි.

ඇය වේගයෙන් කබඩය වෙතට ගොස් තදින් එහි දොර ඇද්දා. එය විවෘත වුණා. එවිට එතුළ, ගුළි ගැසී, බියෙන් වෙව්ලමින් සිටියේ එලන්! ඩැරල් එන හඬ ඇසුණ විට ඇය මම්සලීගේ කාමරයෙන් පිටව දෙවැනි පන්ති කාමරයට පැමිණ තිබුණා. ඇ. මීයෙකු ලෙස නිහඬව, කබඩයට රිංගා ගෙන තිබුණා.

ඩැරල් මවිතයෙන් ඇය දෙස බැලුවා. "එළියට එනවා!" ඇ කිව්වා. "තමුසේ නරක කෙල්ලෙක් එලන්! ඔයා තවත් මොනවා හරි හොරකම් කරන්න ද හොයන්නේ?"

"නැහැ" කී එලන් පිටතට ආවා. ඇය විභාග ප්‍රශ්න පත්‍රවලට අත තබමින් වසන් කරන්නට ගන්න තැත ඩැරල් දැක්කා.

"මොනවද ඒ හංගන්නේ?" ඈ තදින් ඇසුවා. "පෙන්වනවා, ඉක්මනට තමුසේ මොනවා හරි හංගනවා."

"නැහැ! නැහැ!" නිශ්ශබ්ද විය යුතු බව අමතක වූ එලන් කෑ ගැසුවා. ඩැරල් එලන්ගේ අත සාක්කුවෙන් ඉවතට ඇදීමට උත්සාහ කළ අතර බියපත් එලන් අනෙක් අතින් ඩැරල්ට පහර දුන්නා. පහර වැදුණේ ඩැරල්ගේ මුහුණ හරහායි.

එවිට ඩැරල්ගේ කෝපය ඉහවහා ගියා! එලන් වෙතට පැන්න ඈ ඇයව තදින් සොලවා ඇගේ කම්මුලට පහර දුන්නා! ඩෙස්කයක කකුල මතට ඇදගෙන වැටුණ එලන් ඩැරල්ව ද ඒ සමග පහතට ඇද ගත්තා. එලන් පොර බදන අතරේ ඩැරල් ඇයට හොඳින් මිට මෙළවූ පහරවල් එල්ල කළා.

"තමුසේ නපුරු කෙල්ල!" ඩැරල් කෑ ගැහුවා. "හොරෙන් ඇවිදින් එක එක දේවල් ගන්නවා. ගත්ත දේවල් මෙහාට දෙනවා."

එලන් හදිසියේම අප්‍රාණික වුණා. ඇයට තවදුරටත් පොර බැදිය නොහැකි වුණා. ඇයව ඔසවා නැඟිටවීමට හැකි වූ ඩැරල්ට ඇගේ අත සාක්කුවෙන් පිටතට ඇද ගත හැකිවුණා. ඈ ඇඩිව කොළ කීපය ඉවතට ඇද ගත්තා. ගැටය ලිහී කොළ ගෙබිම මත විසිරුණා. දෑතින් මුහුණ වසාගත් එලන් තදින් ඉකිබිඳීමට පටන් ගත්තා.

මහත්වූ දෙනෙතින් කොළ දෙස බැලූ ඩැරල් එකක් දෙකක් ඇහිඳ ගත්තා. "ඔයා වංචාත් කරනවා නේද?" ඈ අවඥා සහගත ස්වරයෙන් ඇසුවා.

"හෙට දෙන්න තියෙන ප්‍රශ්න පත්‍ර! එලන් විල්සන්! ඔයා මොන තරම් නරක කෙල්ලෙක් ද? හෙරක් වගේම වංචාකාරියක්. මේ වගේ වැඩ කරන අයට මැලෝරි ටවර්ස්වලට එන්න පුළුවන් ද?"

"අනේ, මේවා ආපහු තියලා එන්න. කාටවත් නම් කියන්න එපා." එලන් වැලපුණා. "අනේ කාටවත් කියන්න එපා."

"මම ප්‍රශ්න පත්‍ර නම් ආපහු තියනවාමයි." ඩැරල් සරදම් හඬින් කිව්වා. "ඒත් කාටවත් කියන්න එපා කියන එක නම් වැඩකට නැති දෙයක්."



ඈ එලන්ව දොර වෙතට ඇද්දා. "කොහෙන්ද මේවා ගත්තේ? මිසලීගේ මේසයෙන් ද? එහෙම නම් මේවා එකැනින් තියමු."

වෙව්ලන දෑතින් යුතුව ඒවා ආපසු තබා ලාච්චුවට යතුර දැමූ එලන්ව ඩැරල් ආපහු කැඳවා ගත්තා. ඔවුන් ආපසු නිදන කාමරයට ගියා. ඒ වනවිට ද සියලු දැරියෝ තද නින්දේ පසු වුණා.

"හෙට," ඩැරල් කිව්වා. "මම සැලීට කියනවා, එලන්. එයා තීරණය කරයි ඔයාට කරන්න ඕනෑ මොනවද කියලා. මම හිතන්නේ ඔයාව ඉස්කෝලෙන් අස් කරයි. දැන් ඇඳට ගිහින් නිදා ගන්න."

දැරියන් දෙදෙන ආපසු එනු කිසිවෙකුට ඇසුණේ නැහැ. ඩැරල් හා එලන් පිටතට ගොස් නැවත ඇඳන්වලට පැමිණි බවත් කිසිවෙකුට සැක කළ හැකි වුණේ නැහැ. කෝපයටත්, උද්දාමයටත් පත් ඩැරල් සැලීව කුද්දනවාද නැද්ද යන්න සිතින් තර්ක කරමින් මඳ වේලාවක් අවදිව සිටිය අතර තමාට සැලී හමුවූ වහාම සිදුවූ දෙය කීමට ඈ තීරණය කළා.

"මේ වෙලාවේ මම කලබලයක් ඇති කරලා අනිත් අයත් කුද්දන්න හොඳ නැහැ. මම තනිවම සැලීව අල්ලාගෙන කියන්න ඕනෑ." හදිසියෙම නින්දට වැටුණ ඈ චකිතය මුසු සිද්ධියේ ප්‍රබෝධයෙන් උද්දාමව නිදන්න වුණ මුත් එලන්ට නම් නින්දක් වුණේ නැහැ. එය ඇයට අලුත් දෙයක් නොවෙයි. බොහෝ රාත්‍රීවලදී මධ්‍යම රාත්‍රිය පසු වී බොහෝ වේලාවක් යනතුරු නින්ද ඇය අසලට ආවේ නැහැ. මේ වනවිට රාත්‍රිය පුරා සිදු වූ දේවලින් වික්ෂිප්තව සිටි ඈ උඩු බැලි අතට ඇඳේ වැතිරී සිටියා. එහෙත් විශාල කරදරයක් ඇය මතට ඇද වැටීමට තිබුණ නිසා ක්‍රමයෙන් ඈ පසුගිය දේවල් ගැන කැවුලට පත්වීම නවත්වන්නට වුණා. හිසරදය තවත් වැඩි වෙන්නට වූ අතර ඇගේ හිස පුපුරණු ඇතැයි ඇයට සිතුණා. ගිනියම්ව රතු වූ මිටිවලින් හිස තුළට පහර වදිනු දැනෙන ඈ දැඩි භීතියට පත් වුණා.

ඇයට කුමක් සිදුවන්නේ ද? ඇය උමතුවන්නට යන්නේ ද? එවිට දැනෙන්නේ මෙවැනි දෙයක් ද? වේදනාව අඩු වී යනු ඇතැයි පතමින් ඈ දෙනෙත් පියාගෙන නිසලව වැතිරී සිටියා.

අවසානයේ එය ඉතා දරුණු වූ අතර ඇය සෙමින් කෙඳිරි ගාන්නට වුණා. කරුණාවන්තව සහනය සලසන ජේවාසිකාගාර පාලිකාව ගැන මතකය ඇගේ සිහියට ආවා. පාලිකාව ඇය අසනීප කාමරයේ සිටින විටදී ඇයට බොහෝ කරුණාවන්ත වුණා. නැවත ද ඇය කරුණාවන්ත වනු ඇත. තමාට යමෙකුගෙන් එස් කුඩා කාරුණික බවක් ලැබුණහොත් තමා සුව වන බව ඇයට දැනුණා.

වේදනාවෙන් හිස කැරකෙන අතරේ ඈ නැඟිට වාඩි වුණා. මේ වන විට නිදන කාමරයට හොඳින් සඳ රැස් වැටී තිබුණා. සඳ එළියෙන් ආලෝක වූ සුදු ඇඳ ඇතිරිලිවල පරවී පිහාටු මෝස්තර පවා ඇයට හොඳින් පෙනුණා. නොයෙක් ඉරියව්වලින් වැතිර සිටි දැරියෝ තද නින්දේ පසුවුණා.

ඉක්මන් සෙලවීමකින් තම හිස දැරිය නොහැකි ලෙස විදුම් දෙන හෙයින් එලන් ඉතා සෙමින් ඇඳෙන් නැඟිට්ටා. ඇයට තම උඩ ගවුම ගැන අමතක වුණා. ඇයට සෙරෙප්පු අමතක වුණා. නින්දෙන් ඇවිදින කලක මෙන් ඈ දොර වෙත සෙමින් පා තබා ගියා. පිජාමාවකින් සැරසුණ කුඩා හොල්මනක් ලෙස ඈ දොරින් මැත්ව ගියා.

තමා පාලිකාවගේ කාමරය සොයා ගියේ කෙසේදැයි ඇයට කිසිදිනක මතක් කර ගත නොහැකි වුණා. එහෙත් තම දොරට දිගින් දිගටම සෙමින් තට්ටු කරනු ඇසුණ පාලිකාව අවදි වුණා.

"ඇතුළට එන්න!" ඈ කෑගැසුවා. "කවුද ඔය?" ඈ විදුලි පහන දැල්වූවා. සියුම් තට්ටු කිරීම දිගටම කෙරුණා. පාලිකාව ව්‍යාකූලත්වයටත්, මඳක් බියටත් පත්වුණා.

"ඇතුළට එන්න." ඈ නැවත කතා කළා. එහෙත් කිසිවෙක් පැමිණියේ නැහැ. රාත්‍රී ඇඳුමින් සැරසී සිටි පාලිකාව ඇඳෙන් බිමට පැන දොර වෙතට ගියා. ඈ වේගයෙන් ඇද දොර විවෘත කළා. එහි සිටියේ වැලපෙන විලෝ ගසක් මෙන් කඩා වැටී තවමත් තමා දොරට තට්ටු කරනවා යයි සිතා දෑත් ඔසවා ගත් එලන්.

"එලන්, ඇයි මේ ළමයෝ? ඔයාට අසනීප ද?" ඇසූ පාලිකාව ඇයව මෑදුව අල්ලා කාමරය තුළට ඇද ගත්තා.



"මගේ ඔළුව" එලන් වෙහෙසට පත් කෙඳිරියකින් කතා කළා. "ඔළුව පුපුරන්න එනවා, මෙට්‍රන්."

එලන්ගේ සාත්තුවට පාලිකාවට වැඩි කාලයක් ගත වුණේ නැහැ. දැරියට සිට ගැනීමට හෝ නොහැකි තරමට වේදනා ඇති බවත්, දෑස් විවර කිරීමට හෝ නොහැකි බවත් දැකගත් පාලිකාව තමා සඳහා වූ කුඩා කාමරයේ උණුසුම් ඇඳට ඇයව ඇමුවා. ඇය කරුණාවන්ත හා සැනසිලිදායක වූ අතර එලන්ගේ හිසරදය වැඩි නොවන්නට මෘදු හඬකින් සෙමින් කතා කළා.

"දැන් නිදා ගන්න." ඈ කිව්වා. "උදේ වෙද්දී ඔයාට සනීප වෙයි." එලන් තද නින්දට වැටුණා. ඇඳ ළඟ නැවතුණ පාලිකාව ඇය දෙස බලා සිටියා. එය ඇයට ප්‍රහේලිකාවක් වුණා. දැරියගේ යම් දෝෂයක් තිබුණා. ඇය යමක් ගැන කැවුලින් සිටි අතර මීට පෙර අසනීප කාමරයේ සිටින විට ද ඇය යමකින් කැවෙමින් ඉඳ තිබුණා. 'සමහර විට ටික කාලයකට ඇය නිවසට යන්නේ නම් හොඳයි.' ඇයට සිතුණා.

උදයේ අනෙක් අය සමගම ඩැරල් පිබිදුණා. ඇඳුම් ඇඳ ගැනීමේ සීනුව නාද වුණා. රාත්‍රියේ සිදුවූ කලබල ගැන සිහියට නගමින් ඈ ඇඳෙහි වාඩි වුණා. ඈ සැලී වෙත බැල්මක් හෙළුවා. කෙසේ හෝ ඈ ඇයව තනිව හමුවිය යුතුයි.

ඒ සමගම සැලී විමතියෙන් හඬ නැඟුවා. "කෝ එලන්? එයාගේ ඇඳ හිස්!" සෑම කෙනෙක්ම එලන්ගේ හිස් ඇඳ දෙස බැලුවා. "සමහර විට එයා උදෙන්ම නැඟිට්ටින්න ඇති." එමිලි සැක පහළ කළා. "උදේ කෑම වෙලාවට අපිට හම්බවෙයි."

ඩැරල් මඳක් කැලඹුණා. එලන් උදේම අවදිවන්න ඇති ද? ඇය කොහේ ඇති ද? ඇත්තෙන්ම, එලන් උදේ කෑමට සිටියේ නැහැ. දැරියන් ඇගේ හිස් අසුන දෙස බැලූ අතර ඩැරල්ට පැහැදිලිවම අපහසුවක් දැනුණා. එදින ඔවුන් සමග ආහාර ගත්තේ මම්සලී වූ අතර ඇයට කතා කළා.

"එලන් කොහේද, මම්සලී?"

"එයා උදේ කෑමට එන්නේ නැහැ." ඊට වැඩි දෙයක් නොදන් මම්සලී කිව්වා. පොට්ස් ගුරුතුමිය කොරිඩෝවේදී හදිසියේ ඇය

පසු කරමින් සිටියදී කියා තිබුණේ එපමණයි. "ඇයි කියන්න මං දන්නේ නැහැ. සමහර විට එයාට අසනීප ඇති."

මේ වනවිට ඇලිසියාට ද අපහසුවක් දැනෙන්නට පටන් ගෙන තිබුණා. ඊට පෙර දින තමා එලන්ට දරුණු ලෙස චෝදනා කර තිබූ ආකාරය ඇයට සිහි වුණා. ඈ තම උදේ ආහාරය ඇඹි තිහඬ බවකින් යුතුව ගත්තා.

ඊළඟ ආරංචිය පැමිණුනේ පළමු පන්තියේ කැතීගෙන්. පාකර් ගුරුතුමිය පොට්ස් ගුරුතුමියට කතා කරනු ඇසුණ ඇය වචන කිපයක් අල්ලාගෙන තිබුණා.

"මේ! එලන් විල්සන්ට මොනවා වෙලා ද?" ඇය ඇසුවා.

"එයාව ගෙදර යවන්න හදනවා කියලා පාකර්, පොට්ට් එක්ක කියනවා මට ඇසුණා. එයා මොනවා කරලා ද?"

ගෙදර යවන්න! දෙවැනි පන්තියේ දැරියෝ එකිනෙකා දෙස බලා ගත්තා. එහි තේරුම ගුරු මණ්ඩලය එලන් ගැන දැනගෙන ද? සමහර විට ඇය සොරකම් කරන බව සොයා ගෙන ද? ඇය පාසලෙන් නෙරපනු ලැබීමට යනවා ද? දෙවියනේ!

"ඊවර් කෙනෙක් එයා ගැන හොයාගෙන, එහෙම නැතිනම් එයාම ගිහින් පාපොච්චාරණයක් කරලා." අවසානයේ ඇලිසියා කිව්වා.

"අපි දන්න දේවල් ගැන වැඩිය කියන්න යන්න නරකයි. ඒක ඉස්කෝලේ නමට ඒ තරම් හොඳ නැහැ. මම හිතන්නේ මේක රහසක්ව තියෙන්න අරියි."

"ඔයා කියන්නේ එලන්ව ඇත්තටම ගෙදර යවයි කියලා ද? ඉස්කෝලෙන් නෙරපයි කියලා, එයා ඒ බඩු හොරකම කරපු නිසා?" හදිසියේ සුදුමැලි වූ ඩැෆනි ඇසුවා. "එහෙම කරන එකක් නැහැ!"

"හොඳටම එහෙම වෙයි." කී බෙටීගේ හඬෙහි අවඥා සහගත ස්වරයෙන් ඩැෆනි මහත් සේ තැති ගත්තා. "ඒක හොඳ වැඩක්. ඒ වගේ කෙල්ලක් මැලෝරි ටවර්ස්වල තියා ගන්න එක හිතන්නවත් බැහැ!"



සිදුව ඇති දේවල් ගැන ඩැරල් විස්මිත්තව සිටියා. ඈ පෙරදින රාත්‍රිය ගැන සිතුවා. වංචාව සම්බන්ධයෙන් ඈ එලන්ව ඇති කරමට දඬුවම් දී තිබුණා. තමා එලන්ට කම්මුල් පහර දුන් අයුරු හා මීට මොළවා පහර දුන් අයුරු සිහිවන විට ඇගේ සිරුර රත් වනු ඇයට දැනුණා. ඇත්තෙන්ම, නැවතත් ඒ ඇගේ ඉක්මන් කෝපය. සැලී කිසිදින එවැනි දෙයක් නොකරනු ඇත. සැලී ගෞරවාන්විත ශාන්ත ආකාරයකින් සිද්ධිය පාලනය කර ගෙන කටයුතු කරන්නවත්, අවසානයේ දැරියන් දෙදෙනාම ලැජ්ජාසහගත ලෙස බිම පෙරළෙමින් අවමන් සහගත රළු හැසිරීමකින් තොරව එලන්ගෙන් ප්‍රශ්න පතු ලබා ගැනීමට හැකි අයුරින් කටයුතු කරන්නටත් තිබුණා.

"මම වැඩක් හරි විදියට කරගන්නේ නැහැ. සමහර වෙලාවට..." තම නාසය අතින් අතුල්ලමින් ඩැරල් සිතුවා. "මම හදිසියේම අන්තයටම පනිනවා. පාලනය අතහැර ගන්නවා. අන්තිමට හුළං බෝලයක් වගේ උඩ යනවා. ඉතින් මම මොනවාද කරන්න ඕනෑ. සැලීට කියනවාද, නැද්ද?" ඈ එසේ නොකිරීමට තීරණය කළා. ඇත්තෙන්ම එලන්ව ගෙදර යවනවා නම් ඇගේ චරිතය තවත් නරක් කිරීමට එලන් ගැන පැමිණිලි කිරීමේ ඇති ප්‍රයෝජනයක් ඇය දැක්කේ නැහැ.

එසේ වුවද, එලන් ගැන බොහෝ කටකතා දෙවැනි පන්තියේ පැතිරුණා. කෙසේ හෝ, එලන් මුදල් පසුම්බි, මුදල්, කොණ්ඩා කටු හා නොයෙක් දේ සොරකම් කරන බව ගුරු මණ්ඩලය සොයාගෙන ඇති බවත්, ඒ නිසා ඇයව පාසලින් නෙරපන බවත් සෑම කෙනෙක්ම පොදුවේ පිළිගන්නා කරුණක් බව පෙනුණා.

කාගේත් කුතුහලයට මෙන්, මේ පිළිබඳව මහත් ළතැවිල්ලට පත් එක් දැරියක් වූවේ ඩැෆනි. "කොහොම වුණත් හරි හමන් සාක්ෂියක් නැතිව එයාව අස් කරන එකක් නැහැ." ඈ නිතර කිව්වා. "සැලී, ඩැරල්, ඊයේ ඔයාලා ඇලිසියාට කිව්වා එලන් හොරකම් කළා කියන්න හරි සාක්ෂියක් නැහැ කියලා. එලන්ට මොනවා වෙයි ද? නව ඉස්කෝලයකට එයාව ගනියි ද?"

"මම දන්නේ නැහැ. මම එහෙම හිතන්නේ නැහැ." ඇලිසියා කිව්වා. "එයා ඉවරයි! එයාට හොඳ වැඩේ."

"ඒ තරම් නපුරු වෙන්න එපා!" ජීන් කිව්වා. "මම එයාගේ පැත්ත ගන්නවා කියලා හිතන්න එපා. මට ඕනෑ නැහැ. ඒත් ඔයා නිතරම නපුරු. අනුකම්පාවක් නැති කෙනෙක්, ඇලිසියා."

"හරි, මම ඊයේ එලන්ට චෝදනා කරපු එක හරි නැද්ද?" ඇලිසියා තදින් ඇසුවා. "ඔයාලා හරිම ළාමකව ඒක එයාට නොකියා ඉන්න හැදුවා. මම කළේ හොඳ දෙයක්!"

ගුරු මණ්ඩලයට එලන් ගැන කිසිවක් නොකීමට දෙවැනි පන්තිය තීරණය කළා. ශ්‍රේලින් මහත්මිය දැරිය පාසලින් අස් කරන්නට යන්නේ නම් ඇයට එය රහසක්ව තබා ගැනීමට අවශ්‍යව ඇති. නොකියා ඉන්න තරමට හොඳයි.

එලෙස, පාකර් ගුරුතුමියගේ මහත් පුදුමයට මෙන්, කිසිවෙක් එලන් ගැන ඇගෙන් ඇසුවේ නැහැ. "පුදුමයි, කාගෙවත් උනන්දුවක් නැහැ." ඈ සිතුවා. එමෙන්ම ඇය ද කිසිවක් කීවේ නැහැ. එදින උදයේ මෝටර් රථයක් ආ බවට කට කතාවක් සැම තැන පැතිරුණ ද එලන් ගෙදර යනවා ද ඒ කවදා ද කිසිවෙක් සෙව්වේ බැලුවේ නැහැ. සමහර විට එය එලන් රැගෙන යාමට පැමිණියා විය හැක.

එය එසේ නොවුණි. එය වෛද්‍යවරයාගේ මෝටර් රථයයි. දැරියව පරීක්ෂා කිරීමට ඔහුව කැඳවනු ලැබ තිබුණ අතර ඔහු නේවාසිකාගාර පාලිකාවට සහ ශ්‍රේලින් මහත්මියට තදින් කතා කර තිබුණා. "මෙතැන මට නොතේරෙන යම් දෙයක් තියෙනවා. මේ ළමයා මොනවාහරි දෙයක් ගැන කරදරයෙන් ඉන්නවා ද? මේ ළමයාගේ ගෙදර ප්‍රශ්න තියෙනවා ද? ඉස්කෝලේ මොනවා හරි ප්‍රශ්නයක් එයාට තියෙනවා ද?"

පාලිකාවට හෝ විදුහල්පතිනියට කිසිදු තොරතුරක් වෛද්‍යවරයාට දී ගත නොහැකි වුණා. ඔවුන් දන්නා පරිදි එලන්ට ගෙදර ප්‍රශ්නයක් නොවූ අතර ඇයට පන්තියේ ද ප්‍රශ්නයක් තිබුණේ නැහැ. පාකර් ගුරුතුමියව කැඳවනු ලැබූ අතර ඇය කීවේ ද ඇය දන්නා තරමින් එලන්ට පන්තියේ ගැටලුවක් නොතිබූ අතර ප්‍රමාණවත් තරමට වැඩ නොකිරීම සම්බන්ධව සුළු දොස් කීමක් තිබූ බව පමණයි.



"මම හිතන්නේ, එලන්" වෛද්‍යවරයා ආපසු ගිය පසු ශ්‍රේලින් මහත්මිය මෘදුව කතා කළා. "අපි හිතනවා සනීප වුණාට පස්සේ ඔයා ගෙදර යන එක හොඳයි කියලා. දැනට ගෙදර යන එක තමයි හොඳම දේ."

එලන් මෙයට දැක්වූ ප්‍රතිචාරය ගැන ඈ මහත් විමතියට පත් වුණා. වහා නැඟිට ඉඳගත් දැරිය තම කෙස් කළඹ පසුපසට තල්ලු කළා. ඇය බලාපොරොත්තු සුන් වූ පෙනුමින් යුතු වුණා. "අනේ, එපා මිස් ශ්‍රේලින්! මාව අස් කරන්න එපා! අනේ එපා!"

"ඔයාව අස්කරන්න!" විදුහල්පතිනිය විමතියෙන් ඇසුවා. "ඔයා මොනවද කියන්නේ?"

එලන් ඉකි ගසන්නට පටන් ගත් අතර ශ්‍රේලින් මහත්මියට පිටව යන ලෙස සංඥා කරමින් පාලිකාව කඩිනමින් පැමිණුනා. "එයාව කිසිම විදියකින් කලබල කරන්න හොඳ නැහැ." ඈ කොඳුරා කිව්වා. "මට කනගාටුයි, මිස් ශ්‍රේලින්. ඒත් මම හිතන්නේ ඔයා දැන් ගියොත් හොඳයි. මම එයාව බලාගන්නම්."

සැබැවින්ම මහත් සේ ව්‍යාකූල වූ ශ්‍රේලින් මහත්මිය ඉක්මනින් කාමරයෙන් පිට වුණා. එලන් තමාව අස් කරන්න යන බවක් සිතන්නේ ඇයි? තමා ගෙදර යා යුතු බවට ශ්‍රේලින් මහත්මිය කළ යෝජනාව පාසලින් අස් කිරීමක්, අවමන් සහගත නෙරපීමක් ලෙස සැබැවින්ම ඈ සිතුවා. සමහර විට ඩැරල් ඇය වෙතට ගොස් වංචාව ගැන ඇයට කියා තිබිය හැකි ද? නැතහොත් සමහර විට තමා සොරකම් කරන බව සියලු දෙනා විශ්වාස කරන බව ඇලිසියා ඇයට කියන්නට ඇති හෙයින් ශ්‍රේලින් මහත්මිය තමාව පාසලින් නෙරපීමට තීරණය කළා විය හැකියි. එලන් කිසිවක් දැන සිටියේ නැහැ. ඇය නැවතත් සම්පූර්ණයෙන් දුක්වන්නට වූ අතර ඇගේ හදිසි උණ වැඩි වීම ගැන පාලිකාව මවිතයට පත් වුණා.

මේ වන විට එලන්ව පාසලින් අස්කර සමු ගැනීමකින් ද තොරව ගෙදර යවා ඇති බව සිතූ දෙවැනි පන්තියේ සමහර දැරියෝ කම්පාවට පත්ව සිටියා. විශේෂයෙන් මේරි ලෝව් තදින් සැලුණා. ඇය එලන්ට එතරම් ඇල්මක් නොදක්වා තිබුණ ද ඇය

එලන් ගැන බොහෝ සේ කනගාටු වුණා. ඈ ඒ ගැන විවේක කාලයේ දී ඩැෆනි සමග කතා කළා.

"ඩැෆනි, හරි අපරාධයක් නේද? ගෙදර ගියාම අහිංසක එලන් අම්මලාට මොනවා කියයි ද? හොරකම් කරපු නිසා එයාව ඉස්කෝලෙන් අස් කළා කියලා එයා කියයි කියලා ඔයා හිතනවා ද?"

"එපා!" ඩැෆනි කිව්වා. "අපි ඒ ගැන කතා කරන්න ඕනෑ නැහැ මේරි ලෝව්. බලන්න, අපිට තව විනාඩි දහයක් තියෙනවා නේද? මට අද උදේ යවන්න හුඟක් වැදගත් පාර්සලයක් තියෙනවා. ඹුවුන් පේපරයක් නම් තියෙනවා, ඒත් නූල් කැල්ලක් හොයා ගන්න නැහැනේ. ඔයාට පුළුවන් ද, හොඳ ළමයා වගේ නූල් ටිකක් හොයලා දෙන්න?

වැදගත් පාර්සලය කුමක් විය හැකි දැයි කල්පනා කරමින් මේරි ලෝව් වේගයෙන් දුව ගියා. ඇයට කිසිසේත් නූල් ටිකක් සොයා ගැනීමට නොහැකි වුණා. "කමක් නෑ, මම බලන්නම් උදේ පන්තියෙන් පස්සේ මට සොයා ගන්න පුළුවන්ද කියලා. ඊට පස්සේ මම ඉක්මනින්ම තැපැල් කන්තෝරුවට දුවන්න ඕනෑ. අද හවසට පාර්සල් තැපැල් කරන්න ඕනෑ. අද සංගීත ටීචර් නැති නිසා පාඩම් දෙකක් අතර පැය භාගයක් මට තියෙනවා."

"ඒක ඒතරම් වැදගත් ද?" මේරි ලෝව් ඇහුවා. "මටත් ඔයා එක්ක දුවගෙන එන්න පුළුවන්, ඔයා කැමති නම්."

"එපා. ඔයාට දුවලා ගිහින් ආපහු වෙලාවට එන්න බැහැ." ඩැෆනි කිව්වා. "ගම මැද පාර හුඟක් දුරයි. වෙරළ අයිනේ පාරෙන් ගියොත් ඉක්මනට එන්න පුළුවන්. ඒත් අද තියෙන කුණාටුවේ හැටියට ගල්වලින් පහළට ගහගෙන යන්න පුළුවන්."

එහෙත් සංගීත ගුරුවරිය පැමිණ පාඩම් සඳහා ඩැෆනිව කැඳවූ හෙයින්, වැදගත් පාර්සලය කුමක් වුවද ඇයට එය රැගෙන යාමට අවස්ථාව ලැබුණේ නැහැ. ඈ එම පාර්සලය ඩෙස්කයේ තැබුවා.

"අයියෝ!" ඈ තේ වේලාවේදී ග්වේන්ට හා මේරි ලෝව්ට කිව්වා. "මට පාර්සලය තැපෑලට දාන්න මොනතරම් උවමනාවක්



තිබුණා ද? දැන් මට සංගීත පාඩමට යන්න වෙනවා, ඊට පස්සේ අර මෝඩ ප්‍රංශ නාට්‍යයේ පෙරහුරුව."

"මොකක්ද ඒ පාර්සලය යවන්න තියෙන හදිස්සිය?" ග්වේන් ඇහුවා. "කාගේ හරි උපන් දිනයක් ද?"

ඩැෆනි පැකිළුණා. "ඔව්" ඈ කිව්වා. "ඒක තමා." අද දැම්මේ නැතිනම් වෙලාවට හම්බ වෙන්නේ නැහැ!"

"හරි, ඔයාට ඒක දාන්න වෙන්නේ හෙට" ග්වේන් කිව්වා. මේරි ලෝව් ඩැෆනිගේ මැලවුණ මුහුණ දෙස බැලුවා. ඇය නිතරම ඩැෆනිට නොයෙක් දේ කර දීමටත් ඒ වෙනුවට ඇගේ සුන්දර සිනාව ලැබීමටත් කෙතරම ආශා කළා ද?

තමා එය කර දෙන්නේ කෙසේදැයි ඇය කල්පනා කරන්නට පටන් ගත්තා. 'සුදානම් පන්තියට පස්සේ හතට මම නිදහස්' ඈ සිතුවා. රෑ කෑමට පෙර මට පැය භාගයක් තියෙනවා. මම ගම මැද පාරෙන් ගියොත් කවදාවත් වෙලාවට ආපසු එන්න ලැබෙන්නේ නැහැ. ඒත් වෙරළ පාරෙන් ගියොත් පුළුවන්. මම ඒකට බය නැද්ද. කළුවරේ වහිද්දි?"

සවස පාසලින් පසුව වාඩි වී සිටින අතරේ ඈ කල්පනා කළා. 'යාළුවෝ වෙනුවෙන් කරන දේවල් ගැන කවුරුවත් ඒ තරම් හිතන්නේ නැහැ.' ඈ සිතුවා 'බය නැතුව ඕනෑම දෙයක් කරනවා. මම තැපැල් කන්තෝරුවට දුවලා ගිහින් ඩැෆනිගේ උපන්දින පාර්සලය තැපෑලට දැම්මොත් එයා මොනතරම් සතුටු වෙයි ද? පාර්සලය හරි දවසටම ලැබෙන්න යවන්න තරම් එයා මොනතරම් කරුණාවන්ත ද? ඒ එයාගේ හැටි. හොඳයි, ඒතරම් කළුවර නැති නම්, රෑ භයානක නැති නම් එයා වෙනුවෙන් මම දුවලා යනවා. මේක නීති විරෝධී දෙයක් නිසා මම කාටවත් කියන්නේ නැහැ. සැලී දැන ගත්තොත් එයා මට තහනම් කරනවා!'

මෙලෙස බියගුලු කුඩා මේරි ලෝව් යම් තීරණයක් ගත්තා. කුණාටු භයානක ලෙසින් හමන තද සුළං සහිත මෙවැනි රාත්‍රියක දී ගල්පර මතින් ඇති පාරේ යාම පළපුරුදු කෙනෙකු හෝ නොගන්නා තීරණයක්.

## 17

එදින සැඳෑවේ සූදානම් පන්තිය හමාර වූ පසු, පන්තිය සකස් කරන ගොන්ඩොලින් හැර වෙනත් කිසිවෙකු නැති හිස් වූ දෙවැනි පන්ති කාමරය බලා මේරි ලෝව් කිරිල්ලියක මෙන් දුව ගියා.

මේරි ලෝව් ඩැෆනිගේ ඩෙස්කය වෙතට ගියා. ගොන්ඩොලින් ඇය දෙස ඊර්ෂ්‍යාවෙන් බැලුවා. "ඔයාට මොනවාද ඩැෆනිගේ ඩෙස්කයේ හොයන්නේ? එයාට අමතක වුණ දෙයක් තියෙනවා නම් මම ගිහින් දෙන්නම්. ඔයා ඕනැවට වඩා එයාගේ ඇලේ එල්ලෙන්න හදන්න එපා, මේරි ලෝව්."

"මට ඕනැ නැහැ." මේරි ලෝව් කිව්වා. ඇය ඩෙස්කයේ පියන ඔසවා බ්‍රවුන් පේපර් පාර්සලය අතපත ගා බැලුවා. එය හොඳින් ඔතා ගැට ගසා තිබුණා.

"මම මේක තැපෑලට දාන්න යන්නේ. මේ ගැන කාටවත් කියන්න එපා ග්වේන්. මේක නීති විරෝධීයි."

ගොන්ඩොලින් පුදුමයට පත්ව මේරි ලෝව් දෙස බැලුවා. "ඔයා නීති විරෝධී දේවල් කරනවා." ඈ කිව්වා .

"මම හිතන්නේ මීට ඉස්සර ඔයා එහෙම කරලා නැහැ. තැපැල් කන්තෝරුවට දුවලා ඉක්මනට ආපසු එන්න පුළුවන් කියලා හිතන්න ඔයාට පිස්සු ඇති."

"මම එන්නම්, මම යන්නේ වෙරළ පාරේ" මේරි ලෝව් නිර්භීත බවක් පෙන්වමින් කිව්වා. එහෙත් ඇගේ හදවතින් ඇය අසමත් වනු ඇතැයි ඇයට හිතුණා. "විනාඩි දහයෙන් එහාට යන්න පුළුවන්. ඒ පාරේම ආපහු දුවගෙන එනවා."



"මේරි ලෝව්! ඔයාට මල්මාදේ ඇති." ගොන්ඩොලින් කිව්වා. "කුණාටුවක් තියෙනවා, ඒ විතරක් නොවෙයි හරිම කළුවරයි. ඔයා ගල්පරවලින් එහාට ගහගෙන ගිහින් වැටෙන එක නම් සිද්ධ වෙනවාමයි."

"එහෙම වෙන්නේ නැහැ." තමාට එරෙහිව හදවත කඩා වැටෙද්දී මේරි ලෝව් නිර්භීතකමක් මවා ගෙන කිව්වා. "කොහොම වුණත් යාළුවෙක් වෙනුවෙන් කරන්න පුළුවන් සුළු වැඩක් මේක. මම හොඳින්ම දන්නවා ඩැෆනිට ලොකු උවමනාවක් තියෙනවා මේක අදම යවන්න."

"ඩැෆනි ඔයාගේ යාළුවා නොවෙයි." ඊර්ෂ්‍යා සහගත වූ ගොන්ඩොලින් දැඩිව කිව්වා.

"ඇයි නැත්තේ?" ගොන්ඩොලින් විඳවනු පිණිස දැඩි ස්වරයකින් යුතුව මේරි ලෝව් කිව්වා.

"බබෝ" ගොන්ඩොලින් අවඥාවෙන් කතා කළා. "ඩැෆනි ඔයාව ආශ්‍රය කරන්නේ එයාගේ ප්‍රංශවලට උදව් ගන්න කියලාවත් තේරුම් ගන්න බැරි මෝඩියක් ඔයා. එයාට ඕනැ ඔයාගේ උදව්ව විතරයි කියලා එයා මට කියලා තියෙන්නේ."

මේරි ලෝව් කෘජුව ගොන්ඩොලින් දෙස බැලුවා. පාර්සලය ඇගේ අතේ තිබුණා. හදිසියේම ඇයට මහත් දුකක් දැනුණා. "බොරු" ඈ කිව්වා. "ඔයා බොරුවක් කියන්නේ."

"ඒක තමයි ඇත්ත." ගොන්ඩොලින් කුඩුකේඩුව කිව්වා. "මම ඔයාට කියන්නේ ඩැෆනිම ඒක හුඟක් සැරයක් කියලා තියෙනවා. ඔයා වගේ මීයෙකුගෙන් ඒ ඩැෆනි වගේ කෙනෙකුට අවශ්‍ය මොනවා ද? ඔයාගෙන් එයාට ප්‍රයෝජන තියෙනවා විතරයි. ඔයා ඒතරම් අහංකාර නම් මම කියන්න ඕනැ නැහැ ඔයාටම දැන ගන්න පුළුවන්."

මේරි ලෝව්ට එය සත්‍ය ලෙස දැනුණා. එහෙත් වෙව්ලන දෙතොලින් යුතුව පාර්සලය අතට ගත් ඈ යාමට හැරුණා.

"මේරි ලෝව්, මම එහෙම කිව්වාට පස්සෙත් ඔයා ඔය පාර්සලය දාන්න කරදර වෙනවා ද?" පුදුමයට පත් ගොන්ඩොලින් ඇසුවා.

"මෝඩියක් වෙන්න එපා."

"මම ඩැෆනි වෙනුවෙන් මේක කරන්නේ මම එයාගේ යාළුවා නිසාදයි." මේරි ලෝව් වෙව්ලන හඬකින් පිළිතුරු දුන්නා. "එයා මගේ යාළුවා නොවෙන්න පුළුවන්. ඒත් මම එයාගේ යාළුවා නිසා මම එයා වෙනුවෙන් ඕනෑම දෙයක් කරන්න කැමතියි."

"මෝඩ බූරු දෙන." තමාටම කියා ගත් ගොන්ඩොලින් රාක්කයට පොත්වලින් දමා ගසා හුණු කොට්ට බිම ගසා විශාල දූවිලි වලාවක් නැංවූවා. ,මේරි ලෝව් පාර්සලය ද ගෙන අඳුරේ ගිය බවක් ඈ ඩැෆනි සමග පැවසුවේ නැහැ. තමා සැපුව යම් යම් දේ කිම ගැන ඈ ලැජ්ජා වුණා. ඩැෆනි ඒ ගැන මනාප නොවෙනු ඇත. එහෙත් වාරය අවසාන වන්න ආසන්නව තිබූ හෙයින් ඩැෆනිට උදව් කිරීමට මේරි ලෝව්ට එතරම් අවකාශ නොලැබෙනු ඇත. ඇයට ප්‍රංශවලදී තවදුරටත් උදව් ලබා ගැනීමට අවශ්‍ය නොවුණ විට ඇයට මේරි ලෝව්ගෙන් මිදෙන්නට පුළුවන.

හත හමාර එළඹුණ පසු රාත්‍රී කෑම සඳහා සීනුව නාද වුණා. නොයෙක් කාමරවලින් පිටතට ඇදුණ දැරියෝ කතා බහ කරමින් කෑම කාමරයට ඇතුළු වුණා. "ඌහ්! වෙනසකට අද රෑට කෝපි! තව බනිස්, රෝල්ස්, උයපු මස්!"

සියලු දෙනා වාඩි වී කෑම බෙදාගත්තා. ඒ අතර පාකර් ගුරුතුමිය විශාල කෝප්පවලට කෝපි වත්කළා. ඈ මේසය වටා බැල්මක් හෙළුවා. "පුටු දෙකක් හිස්! කවුද නැත්තේ? ඔ, එලන් නෑ. අනික් කෙනා කවුද?"

"මේරි ලෝව්" සැලී කිව්වා. "සූදානම් පන්තිය අවසානයේ දී මම එයාව දැක්කා. තව විනාඩියකින් එයි, මිස් පාකර්."

එහෙත් විනාඩි පහක්, දහයක් ගත වුණ ද මේරි ලෝව් ගේ සලකුණක් හෝ පෙනුණේ නැහැ. පාකර් ගුරුතුමිය නළල රැලි නැංවූවා.

"අනිවාර්යයෙන් එයාට සීනුව ඇහෙන්න ඕනෑ. ගිහින් එයා හොයාගෙන එන්න සැලී."



වේගයෙන් දුව ගිය සැලී ආපසු ආවේ මේරි ලෝව් කොහෙවත් සොයා ගැනීමට නැති බව වාර්තා කිරීමටයි. මේ වන විට ගොන්ඩොලින් සිටියේ උභතෝකෝටික ප්‍රශ්නයක. මේරි ලෝව් කරදරයක වැටෙනු ඇත. ඒකාන්තයෙන්ම ඇය ඉක්මනින් පැමිණිය යුතුයි. සමහර විට ඇයට තැපැල් කන්තෝරුවේ රස්තියාදු වන්නට සිදු වූවා විය හැක.

ඒ සමගම ඇයට තවත් යමක් සිහි වුණා. තැපැල් කන්තෝරුව හතට වහනවා. එය වසා ඇති නිසා පාර්සලය තැපැල් කිරීමට මේරි ලෝව් ගන්නා උත්සාහය පලක් නැහැ. ඇයට එය මුලින් සිහි නොවුණේ ඇයි? ඉතින් මේරි ලෝව්ට කුමක් සිදු වුණා ද?

සීතල අතකින් ගොන්ඩොලින්ගේ හදවත සිර කරන බවක් දැනුණ අතර ඇගේ හුස්ම ගැනීම නතර වූ සෙයක් දැනුණා. කෑම බිල ගැනීමට අපහසු වූ ඈ බනිස් උගුරේ හිරවී කහින්නට වුණා.

ඩැෆනි ඇගේ පිටට තට්ටු කළා. ගොන්ඩොලින් ඇයට පහත් ඉක්මන් ස්වරයකින් කතා කළා.

"ඩැෆනි! රෑ කෑම ඉවර වුණ වහාම මට ඔයාට කියන්න දෙයක් තියෙනවා. අපිට තනිවෙන්න පුළුවන් සංගීත කාමරයකට එන්න." ඩැෆනි බියපත් බවක් පළ කළා. ඈ හිස සැලුවා. රාත්‍රී ආහාරය නිම වූ වහාම ඈ හුදෙකලා සංගීත කාමරයක් බලා ගොන්ඩොලින් කැඳවාගෙන ගොස් විදුලි බුබුළ දැල්වූවා. "ඇයි මේ?" ඈ ගොන්ඩොලින්ගෙන් ඇසුවා. "ඔයා හොල්මනක් වගේ සුදුමැලි වෙලා."

"මේරි ලෝව් ගැන. මම දන්නවා එයා ගියේ කොහේද කියලා." ගොන්ඩොලින් කිව්වා.

"හරි, ඇයි දෙවියනේ ඔයා ඒක ඒ වෙලාවේදී මිස් පාකර් එක්ක නොකිව්වේ?" ඩැෆනි තරහින් ඇසුවා. "මොකක්ද කාරණය, ග්වේන්?"

"ඩැෆනි, එයා ඔයාගේ වටිනා පාර්සලය හත පහුවුණාට පස්සේ තැපෑලට අරගෙන ගියා." ගොන්ඩොලින් කිව්වා. "එයා ගියේ වෙරළ පාරේ. ඔයා හිතනවාද එයාට මොනවා හරි වුණා කියලා."

ඩැෆනි සෙමින් එය සිත තුළට ගත්තා. "මගේ පාර්සලය තැපෑලට අරගෙන ගියා? ඒ මොනවාට ද? අනික මේ ය, මේ වෙලාවේ?"

"එයා ඔයාගේ යාළුවා නිසා ය. වුණත් ත්‍රිලං තිබුණත් ඒක කරනවාමයි කියලා මහා ලොකුවට කතා කරලා ගියා." ගොන්ඩොලින් කිව්වා.

"ඇයි ඔයා එයාව නැවැත්තුවේ නැත්තේ, මෝඩියෝ" ඩැෆනි තදින් ඇසුවා.

"මම උත්සාහ කළා." ගොන්ඩොලින් කිව්වා. "අනික මම තවත් කිව්වා ඔයා එයාගේ යාළුවෙක් නොවෙයි කියලත්. ඔයා හැමතිස්සෙම කියන විදියට ඔයාට එයාව ඕනෑ වෙන්නේ ප්‍රංශවලට ඇ උදව් කර ගන්න විතරයි කියලත්. ඉතින් ඒ තරම් කියලත් ඔයා හිතනවද ඔයාගේ ඒ වැඩකට නැති පාර්සලය තැපෑලට දාන්න මේ වගේ කුණාටු තියෙන රැයක කවුරුවත් යයි කියලා."

"එහෙම කියලත් එයා නැවතුණේ නැති ද?" අමුතුම ස්වරයකින් ඩැෆනි ඇසුවා.

"නැහැ. එයා ඒක කරන්නේ එයා ඔයාගේ යාළුවා නිසා කියලයි එයා කිව්වේ."ගොන්ඩොලින් තරමක අවඥාවෙන් කිව්වා. "එයා කිව්වා සමහර විට ඔයා එයා එක්ක යාළු නැතිව ඇති, ඒත් එයා යාළුයි කියලත්. ඉතින් ඔයා වෙනුවෙන් ඕනෑම දෙයක් කරන්න කැමතියි කිව්වා."

හදිසියේම ඩැෆනිගේ දෙනෙත්වල දිලිසෙන කඳුළු කැට දැක ගොන්ඩොලින් මහත් විමතියට පත් වුණා. ඩැෆනි කිසිදු හැඬ අයෙකු නොවෙයි.

"ඇයි මේ?" පුදුමයට පත් ගොන්ඩොලින් ඇසුවා.

"නිකම්, ඒක ඔයාට තේරෙන දෙයක් නොවෙයි." හදිසියේම දරුණු ලෙස කඳුළු යටපත් කර ගනිමින් ඩැෆනි කිව්වා. "දෙවියනේ! මේ වගේ කුණාටු තියෙන රැයක වෙරළ පාරේ යනවා කියලා හිතන්නවත් පුළුවන් ද? මගේ පාර්සලය තැපැල් කරන්න උවමනා



වුණ නිසා. අනික ඒ වෙද්දි තැපැල් කන්තෝරුව වහලා. අහිංසක මේරි ලෝව්. එයාට මොනවා වෙන්න ඇති ද?"

"ගල්පරවලින් පහළට වැටෙන්න ඇති කියලා ඔයාට හිතෙනවා ද?" ගොන්ඩොලින් ඇසුවා.

ඩැෆනි සුදුමැලි වුණා. "නැහැ, නැහැ, එහෙම කියන්න එපා!" ඇ කිව්වා. "අනේ, මට මගෙන්වත් සමාවක් නැහැ. මට මේක දරා ගන්න බැහැ."

"මොනවා හරි එයාට වුණත් ඒක ඔයාගේ වැරැද්දක් නොවෙයිනේ!" මෙම වැලපුම ගැන මහත් විමතියට පත් ගොන්ඩොලින් කිව්වා.

"ඇයි නැත්තේ, ඇයි නැත්තේ? ඔයාට තේරෙන්නේ නැහැ." ඩැෆනි කෑ ගැසුවා. "අපොයි, අහිංසක මේරි ලෝව්! මම එයාට කැමති නැහැ කියලා හිතපු ඔයා එයාට යන්න දුන්නා. මම එයාගෙන් ප්‍රයෝජන ගන්නවා කියලා විතරයි හිතුවේ! මම කැමති එයාටයි. ඔයාට වඩා දහගුණයක් මම එයාට කැමතියි! එයා කරුණාවන්ත, පරිත්‍යාගශීලිව අනිත් අය ගැන හුගක් හිතන කෙනෙක්. මම මුලදී එයාගෙන් ප්‍රයෝජන ගත්තා වුණාට එයා හොඳ කෙනෙක් කියලා මට තේරුණාට පස්සේ මම එයාට හුගක් කැමතියි. එයා ඕනෑම දෙයක් කරන්න කැමති කෙනෙක් වුණාට කිසිම දෙයක් ආපසු ගන්න බලන කෙනෙක් නොවෙයි!

"ඒත්, ඔයා මට කියලා තිබුණේ එයාගෙන් උදව් ගන්නවා විතරයි, වෙන යාළුකමක් නැහැ කියලානේ." තම ආඩම්බරකම, තමා බෙහෙවින් උසස් යැයි යන හැඟීම බිඳුණ ගොන්ඩොලින් සෙමින් කතා කරන්නට වුණා.

"මම එහෙම කළ එක ඇත්ත. ඒක මගේ නරක ගතියක්. මම එහෙම කිව්වේ මේරි ලෝව් ගැන ඔයා නිතරම මට කරදර කරන නිසයි. අයියෝ, මොනවාහරි සිද්ධ වෙලා නම් මට තවත් ඉඳලා ඕනෑ නැහැ. මම යනවා එයා හොයාගෙන, මට පුළුවන් එයාව හොයාගන්න."

"ඔයාට බැහැ" භීතියට පත්ව ගොන්ඩොලින් කෑ ගැසුවා. "ඔය බලන්න සුළඟේ සද්දය, හරිම තද කුණාටුවක් වගේ"

"මගේ වැඩකට නැති පාර්සලය තැපැලට අත්න මෙදි ලෝව්ට මේ වගේ භූලං තියෙන වෙලාවක කළුවරේ යන්න පුළුවන් නම් අනිවාර්යයෙන්ම මටත් එයාව හොයන්න යන්න පුළුවන්!" කී ඩැෆ්නිගේ මුහුණට ගොන්ඩොලින් කිසිදා නොදුටු ස්වරූපයක් ආරූඪ වුණා. දැඩි අධිෂ්ඨාන පූර්වක හා ඇගේ චරිතයට අලුත්ම මුහුණුවරක් ගෙනෙන පෙනුමක්.

"ඒත්, ඩැෆ්නි" දුර්වල හඬින් කී ගොන්ඩොලින් නැවතුණා. ඒවන විට ඩැෆ්නි කුඩා සංගීත කාමරයෙන් පිටව සුළඟක් මෙන් දුවගොස් හමාරයි. නිදන කාමරයට දුව ගිය ඈ වැහි කබාය ගෙන ඇඳුම් කාමරයට ගොස් බූට් සපත්තු දෙක පැලඳ ගත්තා. කිසිවෙක් ඇයව දුටුවේ නැහැ. ඉන් පසුව අඳුරට විදුලි පන්දම දල්වා පාර සොයමින් ඈ ගමන ආරම්භ කළා.

එය ඉතා දරුණු රාත්‍රියක් වූ අතර සුළඟ උඩු බුරමින් දසත කැරකෙන්නට වුණා. හුස්මක් නැතිව ඩැෆ්නි වෙරළ මාර්ගයේ ගල්පර මතින් දුව යන්නට වුණා. මොනවා සිදුවිය හැකි ද! ඇයව සුළගේ ගසා ගෙන යන්නට තරම් වුණා.

ඈ තම විදුලි පන්දම ඒ අතට මේ අතට අල්ලා බැලුවා. වැහි වතුරින් බරව දිය බේරෙන පඳුරු තැන තැන තිබුණ මුත් වෙනත් කිසිවක් දකින්නට තිබුණේ නැහැ.

තවත් ටිකක් දුර ගිය ඈ කරකියා ගත හැකි දෙයක් නොමැතිව මහත් හඬින් මොර දෙන්නට වුණා. "මේරි ලෝව්, මේරි ලෝව්! ඔයා කොහේ ද?"

ඇගේ මුවින් පිට වූ වචන සුළගේ පාව ගල්පර මතින් රැව් දෙන්නට වුණා. සුළගේ උඩුබිරුම් හඬ සමග ඈ නැවතත් කෑ ගැසුවා. "මේරි ලෝව්! මේරි ලෝව්! මේරි ලෝව්!"

ඇත්තෙන්ම දුර්වල හඬකින් එයට පිළිතුරු ආවා. "මෙහේ! මෙහේ! මාව බේර ගන්න."



# 18

ගල් ගැසුණ ඩැෆ්නි නිසලව සිටගෙන සවන් යොමු කළා. ඈ ගැසීම නැවතත් සුළගේ හඬ සමග දුර්වලව ඇසෙන්නට වුණා. "මෙහේ! මෙහේ !

ශබ්දය ඇය ඉදිරියෙන් ඇසෙන බවක් පෙනුණා. දැඩි සුළඟ සමග පොර බැදූ ඩැෆ්නි ගල් තලාව මුහුදට නෙරූ අද්දරටම ආවා. සුළඟ ඉතා දැඩි නිසා තමා ගසා ගෙන යනු ඇතැයි බියව ඈ ප්‍රවේසමෙන් ගල් තලාවේ අද්දරට වුවමනාවට වඩා සමීප නොවී අපහසුවෙන් ඇවිද යන අතරේ සුළගේ වේගය බාල වූ බවක් පෙනුණා.

හදිසියේම ඇයට මේරි ලෝව්ගේ හඬ ළඟින්ම ඇසෙන්නට වුණා. "අනේ, බේරා ගන්න. මාව බේරා ගන්න."

අද්දරටම ගිය හොත් තමා සුළඟට ගසා ගෙන යනු ඇතැයි බිය වූ නමුත් ඩැෆ්නි ගල්පරයේ කොහේ හෝ තැනකින් ශබ්දය එන බව සිතුවා. ශබ්දය එන්නේ ගල්පරයේ පහළ බෑවුමෙන් බව පෙනුණා. ඩැෆ්නි තෙත් වූ ගල මත වාඩි වුණා. එසේ කළ විට සුළඟට තමාව ගසාගෙන යාමට නොහැකි යැයි සිතූ ඈ තණ කොළ පඳුරු අල්ලාගෙන ගල් වැටියේ අද්දරට බඩගාගෙන මෙන් යන්නට වුණා.

ගල් තලාව නෙරා මුහුද දෙසට තදින් බෑවුම් වූ තැනක් දක්වා ඈ පැමිණියා. එය තියුණු ලෙස කඩතොලු වූ ගල්පර ගැවසී තැනක්. බඩ ගා ගිය ඈ පහළ ගල්කුළුවලට තම විදුලි පන්දම දල්වා බැලුවා.

එතැන, අඩි කිහිපයක් පහළ සිටියේ දිවි රැක ගැනීමට මහත් වෙර දරමින් ගල් නෙරුවක එල්ලී සිටි මේරි ලෝව්! විදුලි පන්දමේ ආලෝකයට ඈ තම සුදුමැලි මුහුණ උඩු අතට හරවා ගෙන භීතියෙන් හා පණ බයෙන් බලාගෙන සිටියා.

"බේරා ගන්න." විදුලි පන්දමේ එළිය දැක ඈ දුර්වල හඬින් කෑ ගැසුවා. "අනේ, මාව බේරා ගන්න! මට තවත් එල්ලිලා ඉන්න බැහැ."

ඩැෆනි ත්‍රාසයට පත් වුණා. මේරි ලෝව්ගේ ග්‍රහණය අත හැරුණ හොත් පහළ ඇති ගල්කුළු මතට ඇද වැටෙන බව ඇයට පෙනුණා. මේ සිතුවිල්ලෙන් ඇගේ හදවත හිරි වැටුණා. ඇය කුමක් කළ යුතු ද? "මම ආවා, මේරි ලෝව්!" ඈ හඬ නඟා කිව්වා. "අල්ලාගෙන ඉන්න. මම උදව් අරගෙන එන්නම්."

"අනේ, ඩැෆනි! මේ ඔයා ද? යන්න එපා ඩැෆනි. මම තව විනෙන් ඇදගෙන වැටෙයි. මොනවා හරි කරන්න බැරි ද?"

ඩැෆනි පහත් වී මේරි ලෝව් දෙස බැලුවා. තව මොහොතකදී මේරි ලෝව්ගේ ග්‍රහණය අත හැරෙන බවත්, මොහොතකට හෝ ඇයව හැර නොයා යුතු බවත්, උදව් ඉල්ලා යාම කිසිත් පලක් නැති බවත් ක්ෂණයෙන් ඇයට අවබෝධ වුණා. නැහැ. ඈ වෙනත් යමක් ගැන සිතා වහා එය ක්‍රියාත්මක කළ යුතුයි.

ඇයට තම වැහි කබායේ බඳ පටිය ගැන හා තම ගවුමේ පටිය ගැන සිහිවුණා. ඇය එම දෙකම එකට ගැට ගසා පහළට ඇමුව හොත් එය අල්ලා ගන්නා මේරි ලෝව්ව උඩට ඇදගත හැකියි. ඒත් ඒවායේ දිග ප්‍රමාණවත් වේවි ද?

වැහි කබායේ පටිය ලිහා ගත් ඈ ගවුමේ පටිය ලිහා ගැනීමට වෙව්ලන ඇඟිලිවලින් මහත් උත්සාහයක යෙදුණා. කඩිමුඩියේ මේ කෙරෙන හැම දෙයක් අතරේම මේරි ලෝව්ගේ සිත සැනසෙන ආකාරයට වාග් මාලාවක් කීමට ඈ අමතක කළේ නැහැ.

"මම ඔයාව බේරාගන්නවා. ඔයා බය වෙන්න එපා. මම ඉක්මනටම ඔයාව උඩට ඇදලා ගන්නවා. මම මගේ බෙල්ට්වලින් ලණුවක් හදනවා. මම ඒක පහළට දමන්නම්. අල්ලාගන්න, මේරි ලෝව්, අල්ලා ගන්න. මම ඉක්මනටම ඔයාව බේරාගන්නවා."



සැනසිල්ලට පත් මේරි ලෝව් තදින් ග්‍රහණය කරගෙන හුන්නා. ඇඩී කුණාටුව තමාව බිම වට්ටා පෙරළාගෙන පෙරළා ගෙන ගල් පරයේ අද්දරට ගෙන එද්දී ඇයට දැනුණේ මහත් බියක් වුවද දැන් ඇයට සහනයක් සැලසෙනු ඇත. පහළට වැටෙද්දී තමාට තණකොළ පඳුරක් අසුවුණේ කෙසේදැයි ඇයට ද කියන්නට දැනුමක් තිබුණේ නැහැ. ඩැෆනිගේ හඬ ඇසෙන තුරු ඇය කල්ප කාලාන්තරයක් ගත කළ බවක් දැනුණා. මේ වනවිට ඩැෆනි පැමිණ සිටින නිසා ඇය බේරා ගැනීමක් වනු ඇත. ගොන්ඩොලින් මොනවා කීව ද ඩැෆනි ඇගේ මිතුරියයි.

ඩැෆනි නැවතත් දිගා වුණා. ඇය පසුපස තිබූ පරුවට වැඩුණ පඳුරක් ඇයට හමු වූ අතර ඈ දෙකකුලින් ශක්තිමත් මුලක් අල්ලා ගත්තා. එය පඳුර සවිමත්ව පොළොව අල්ලා ගෙන ඉදිරියට නෙරා තිබුණ මුලක්. සිරීම හා උල්වූ මුල් කැබලිවලින් සකුල් තුවාල වීම නොතකා ඈ දෙකකුලින් පඳුරේ මුල දැඩිව ග්‍රහණය කර ගත්තා. තමා හා මේරි ලෝව් මුල ගැලවී පහළට ඇද වැටීමට ඇති අවදානම ගැන ඇය ප්‍රවේසම් වන්නට සිතා ගත්තා.



හදිසියේ බියපත් කට හඬින් ඇගේ දෙසවන පිරුණා. "ඩැෆනි මේ පස් පිඩැල්ල බුරුල්වෙලා ගැලවෙන්න යනවා. මාව වැටෙයි. ඉක්මන් කරන්න, අනේ ඉක්මනට!"

ඩැෆනි බඳ පටි දෙකින් තැනූ ලණුව ඉක්මනින් පහතට දැමුවා. එය අල්ලාගත් මේරි ලෝව් එය දැඩිව තම ඉණ වටා පටලවා ගත්තා. ඩැෆනිට හදිසි ඇදීම දැනුණා.

"දැන් හරි ද?" ඈ කෑ ගසා ඇසුවා. "ඔයා දැන් වැටෙන්නේ නැහැ නේද?" ඈ චකිතයෙන් යුතුව ඇසුවා.

"නැහැ. දැන් හරි. මම හොඳට කකුල ගහ ගන්න තැනක් හොයා ගත්තා." තම ඉණවටා වූ බඳපටිය ගැන මහත් විශ්වාසයක් තබාගත් මේරි ලෝව් කිව්වා. "මම ඔයාව පහළට අදින්නේ නැහැ, නේද, ඩැෆනි?"

"නැහැ. ඒත් මම හිතන්නේ ඔයාව ඇදලා ගන්න තරම් මට ශක්තියක් නැහැ වගේ!" ඩැෆනි අසරණ ස්වරයකින් කිව්වා. "අනික බෙල්ට් කැඩිලා ඔයාව වැටෙයි. මට පෙනෙන්නේ කවුරු හරි ඇවිදින් අපිව හොයාගන්නා තුරු අපි දෙන්නාට මෙහෙම එල්ලිලා ඉන්නවෙයි වගේ."

"අනේ, ඩැෆනි, ඔයාට හුඟක් අමාරු ඇති." මේරි ලෝව්ගේ හඬ නැවත පැමිණියා. "අනේ මම පාර්සලය අරන් නොඑන්නයි තිබුණේ."

"ඔයා කළේ හොඳ දෙයක්." වචන සොයා ගැනීමට නොහැකිව ඩැෆනි කිව්වා. "ඔයා හැම තිස්සේම මට උදව් කරන කෙනෙක්, මේරි ලෝව්. මම ඔයාගේ යාළුවා. ඔයා ඒක දන්නවා නේද? ග්වේන් එයා කියපු නපුරු කතා මා එක්ක කිව්වා. ඒක නොවෙයි ඇත්ත. මට ඔයා ලෝකයක් වටිනවා. ඇත්තටමයි කියන්නේ. මීට ඉස්සර මම කාටවත් මේ විදියට යාළු වෙලා නැහැ."

"මේ, ඔයා මාව හොයාගෙන ඇවිදින් මට කතා කරන හඬ ඇහෙද්දී මම දැන ගත්තා ග්වේන් මට කිව්වේ බොරු කියලා." කී මේරි ලෝව්ගේ හඬ අඳුර තුළින් නික්මුණා.

"මම හිතන්නේ ඔයා එඩිතර ළමයෙක්, ඩැෆනි."



"නැහැ. මම නපුරු කෙල්ලක්" ඩැෆනි කිව්වා. "ඔයාට තේරෙන්නේ නැහැ මම කොයිතරම් නරකද කියලා."

"මේක පුදුම විහිළු කතාවක්. මේ රෑ කුණාටු මැද ගල්පර උඩ මේ වගේ කතා කියනවා ද?" ප්‍රීතිමත් බවක් පළ කිරීමට උත්සාහ කරමින් මේරි ලෝව් කිව්වා. "අනේ, මේ කරදර කරන්න වුණ එක ගැන මට දුකයි ඩැෆනි. කවුරුහරි අපිව හොයාගෙන එන්න තව කොයි තරම් වෙලා යයි කියල ද ඔයා හිතන්නේ?"

"හරි, මම ඔයා හොයාගෙන ආවා කියලා දන්නේ ග්වේන් විතරයි." ඩැෆනි කිව්වා. "මම ඉක්මනට ආපසු නොඑන්නොත් අනිවාර්යයෙන්ම එයා මිස් පාකර්ට හරි, කාට හරි කිව්වොත් එයාලා අපිව හොයන්න කවුරුහරි එවයි. මම හිතනවා කාට හරි මේ ගැන කියන්න තරම් එයාට මොළයක් තියෙයි කියලා."

ඇත්තෙන්ම ගොන්ඩොලින්ට මොළයක් තිබුණා. ඇත්තෙන්ම ඇය මුල දී මේරි ලෝව් ගැන කැවුලට පත්ව සිටි අතර දැන් ඩැෆනි ගැන. පැය භාගයකට පසුවත් ඩැෆනි ආපසු පැමිණියේ නැති හෙයින් ගොන්ඩොලින් පාකර් ගුරුතුමිය සොයා ගොස් තිබුණා. මේරි ලෝව් ගියේ කොහේද යන්නත්, ඩැෆනි ඇය සොයා ගිය බවත් ඈ කිව්වා.

"මොනවා! මේ රෑ වෙරළ පාරේ ගියා" කෑ ගැසූ පාකර් ගුරුතුමිය ග්‍රේලින් මහත්මිය සොයා වහා දිව ගියා.

විනාඩි දෙක තුනක දී සෝදිසි කණ්ඩායමක් ලන්තෑරුම්, කඹ හා උණු කෝපි පිරි උණුසුම් බෝතල් ද රැගෙන පිටත් වුණා. වැඩි වේලාවක් යන්නට පෙර ඇරියන් දෙදෙනා සොයා ගනු ලැබුණා. ඔවුන් දුටු විගස ග්‍රේලින් මහත්මියගේ මුවින් විලාපයක් පිටවුණා. "දෙන්නාම මැරෙන්න තිබුණා."

සෝදිසි කණ්ඩායම පැමිණෙන විට දී ඩැෆනිගේ අත් හිරිවැටී තිබුණා. කටු සහිත පඳුරේ දෙකකුල් පටලවාගෙන, බිම දිගාවී, බඳපටිවලින් තදින් අල්ලාගෙන සිටින ඇයත්, අනෙක් කෙළවරේ ඉතා පහත මුහුදට ඇද වැටෙන්නට ආසන්න වී දිවි රැක ගැනීමට ආශාවෙන් එල්ලී සිටින මේරි ලෝව් ද ඔවුන්ට දැක ගත හැකි වුණා.

මේරි ලෝව්ගේ හිස පසුකර ගොස් ඇගේ උරපතු යටින් වැටී සිරුර තදවෙන පරිදි කඹයක් පහතට වැටුණා. තවත් කඹයක් ඇගේ ඉණ වටා වැටී හිරවුණා. දෙකකුල් අප්‍රාණිකව සිටි ඩැෆනිව කෙළින් කර සිටවූ අතර පාකර් ගුරුතුමිය ඇයව වත්කන් කර ගත්තා.

"දැන් කෙළින් හිටගන්න. මාව අල්ලාගන්න."

ශක්තිමත් වතු කම්කරුවා විසින් මේරි ලෝව්ව ඉහළට ඔසවනු ලැබුවා. සහනයට පත් ඈ බිම දිගා වී ඉකි ගසන්නට වුණා. ඇගේ සිරුර වටා තිබූ කඹ ලිහා දැමූ කම්කරුවා ඇයව ඔසවා ගත්තා.

"මම මෙයාව උස්සාගෙන යන්නම්." ඔහු කිව්වා. "මෙයාට "බොන්න මොනවාහරි දෙන්න මැඩම්, ළමයා සීතල වෙලා."

දැරියෝ දෙදෙනාම සතුටින් උණු කෝපි බිව්වා. අනතුරුව පාකර් ගුරුතුමියගේ සිරුරට වාරුවී ඩැෆනි වැතෙමින් ආපසු පාසල බලා යන්නට වූ අතර මේරි ලෝව් ඔසවා ගත් කම්කරුවා සහ සෙසු පිරිස පසුපසින් එන්නට වුණා.

"මේ දෙන්නාම ඇඳන්වලට දාන්න." ග්‍රේලින් මහත්මිය නේවාසිකාගාර පාලිකාවට කිව්වා. "එයාලා හරිම භයානක අත්දැකීමකට මුහුණ දීලා ඉන්නේ. මම හිතනවා එයාලට නිව්මෝනියාව හැදෙන එකක් නැහැ කියලා. ඩැෆනි, ඔයා කුඩා මේරි ලෝව්ගේ ජීවිතය බේර ගත්ත බවට සැකයක් නැහැ. මට ඔයා ගැන හරිම ආඩම්බරයි."

ඩැෆනි කිසිම දෙයක් නොකිවද ග්‍රේලින් මහත්මියගේ පුදුමයට මෙන් හිස පහත් කර ගත් ඈ පසෙකට පිය මැන්නා. මේ ගැන පුදුම වීමට කාලයක් නොතිබූ ග්‍රේලින් මහත්මිය මේරි ලෝව්ගේ ඇඳුම් මාරු කර ඇයව ඇඳකට දැමීමට පාලිකාවට උදව් වුණා. උණුසුම් කෑම හා බීමවලින් සප්පායම් වූ දැරියන් දෙදෙනාම ඉක්මනින්ම උණුසුම් ඇඳන්වලට යැවුණා. දෙදෙනාටම තදින්ම නිඳිමත දැනුණ අතර ඉක්මනින්ම තද නින්දට ඇද වැටුණා.

සිත් තැවුලින් සිටි දෙවැනි පන්තියේ දැරියෝ නිඳි වර්ජිතව ඇඳන්වල වැතිරී සිටියා. මේරි ලෝව් ගිය ගමන ගැනත් ඇයව



...යාගත හැකිදැයි බැලීමට ඇය ගිය මග ඔස්සේ ඩැෆනි ගිය ...ග්‍රේවෙන් පිරිසට කියා තිබුණා. සෙල්ඩ්‍රික් කණ්ඩායමක් පිටත්ව ...තිබූ බව ද ඔවුන් දැන සිටියා. ඇඳන්වල වැතිරී සිසුන් ...සවන් දෙමින් සිටි ඔවුන්ගේ සිත් තුළ සියලුම ආකාරයේ ...සිතුවම් මැවෙන්නට වුණා.

විදුලි පහන් නිවී බොහෝ වේලාවක් යන තුරු ඔවුන් ...ඔස් කළා. මෙය සුපුරුදු සාමාන්‍ය රාත්‍රියක් නොවෙයි. එය ...කුලය හා චකිතය පිරි එකක්.

අනතුරුව, බොහෝ වේලාවකට පසුව, පාකර් ගුරුතුමිය ...කොරිඩෝව ඔස්සේ එන ඉක්මන් අඩි හඬ ඔවුන්ට ඇසුණා. අලුත් ...ආරංචියි! ඔවුන් සියල්ලෝම එක්වර ඇඳන් මත වාඩි වුණා.

විදුලි පහන් දැල්වූ ගුරුතුමිය අපේක්ෂා සහගතව බලා සිටින දැරියන් හත් දෙනා සහිත කාමරය සිසාරා බැලුවා. අනතුරුව මේරි ලෝව් හා ඩැෆනි සොයාගත් ආකාරය හා ඩැෆනිගේ නිර්භීත අදහස නිසා මේරි ලෝව්ගේ ජීවිතය බේරුණ ආකාරයත් ගැන ...ව ඈ ඔවුන්ට කිව්වා. කටු පඳුරක මුලක දෙකකුල් පටලවා ...ගෙන, බඳපටිවලින් මේරි ලෝව්ව එල්ලගෙන, ආධාර පැමිණෙන ...තුරු ඇය ලිස්සන තෙත බරිත පොළොවේ දිගාවී සිටි ආකාරය ගැන ඈ ඔවුන්ට විස්තර කළා.

"ඩැෆනි වීර ළමයෙක්!" ඩැරල් කෑ ගැසුවා. "මම එයාට ...කැමැත්තක් තිබුණේ නැහැ. ඒත් මිස් පාකර් එයා හරිම පුදුම ළමයෙක් නොවෙයි ද? එයා ඇත්තෙන්ම වීර ළමයෙක්!"

"මමත් එහෙම හිතනවා." පාකර් ගුරුතුමිය කිව්වා. "මම ...හිතුවේ නැහැ, එයා ළඟ ඒ වගේ එඩිතරකමක් තියෙනවා කියලා. එයා දැන් අසනීප කාමරයේ හිටියා වුණත් මම හිතන්නේ ඉක්මනින්ම එයාට සනීප වෙයි කියලයි. එයා ආපහු පන්තියට ...ද්දී අපි එයාට අත්පුඩි ගහලා සුබ පතමු."

විදුලි පහන් නිවා දැමූ ඈ දැරියන්ට සුබ රාත්‍රියක් පැතුවා. ...වූව තිබූ දේවල් දැන ගැනීමට ලැබීම ගැන ස්තුති පූර්වක වූ දැරියෝ තවත් විනාඩි කීපයක් උද්දාමයෙන් කතා කළා. ඩැෆනි ...ලෙස වෙස් පෙරළීම මහත් පුදුමයක්. "මේරි ලෝව්ගෙන් වැඩ

ගන්න මිසක් එයාට කැමැත්තක් නැතිව තිබුණ එක පහත් වැඩක් කියලයි මට හැම තිස්සෙම හිතුණේ."

"මම කල්පනා කරන්නේ පාර්සලයට මොකද වුණේ කියලයි." බෙලින්ඩා කිව්වා.

"නැපැල් කන්තෝරුව වහල තිබුණ නිසා මේරි ලෝව්ට ඒක දාන්න බැරි වෙන්න ඇති. ඔන ඔට්ටුවක්, කාටවත් පාර්සලය ගැන මතක් වෙලා නැහැ."

"අපි හෙට ගිහින් ඒක වැටිලා තියෙනවද කියලා බලමු." සැලී කිව්වා. "මේ, අද අපේ කාමරයේ වැඩිය කවුරුවත් නැහැ. අපි හත් දෙනෙක් විතරයි. එලන් ගිහින්, ඩැෆනියි, මේරි ලෝව්වයි දෙන්නාම අසනීප කාමරයේ. ඇති යාන්තම්. එයාලා ගල්පර උඩ තනි වෙන්නේ නැතිව ආපු එක ඇති."

සුළඟ දරුණුව නැවතත් කුණාටුවක් බවට පත් වී උතුරු කුලුන වටා කැරකෙන්නට වුණා. පොරෝනා තුළ ගුළිවී දැරියෝ ඇඳන් මත නිදන්නට වුණා. "ඇත්තටම මට හිතෙන්නේ ඩැෆනි වීර ළමයෙක් කියලා." ඩැරල් කිව්වා.

"අනික මට හිතා ගන්න බැරි මේ කුණාටුව තියෙද්දී මේරි ලෝව් වගේ බයගුල්ලියක් ඒ වගේ ගමනක් යන්න තරම් නිර්භීත වුණේ කොහොමද කියලයි. කවුරුවත් නොවෙයි මේරි ලෝව් වගේ කෙනෙක්."

"එක එක්කෙනා වෙනස්."අයිරින් කිව්වා. "කෙනෙක් දවසකදී කරන දේ නොවෙයි අනිත් දවසේ කරන්නේ."

"අන්න කවදාවත් නැතිව ඇත්ත කිව්වා." ඩැරල් හඬ නැඟුවා. "අද ප්‍රංශ ව්‍යාකරණ පොත පැත්තකට දාලා ලැක්රෝස් පිත්ත අරගෙන ක්‍රීඩාවලින් තැනකට එන්න හදන කෙනා ඒකත් පැත්තකට දාලා හෙට මොනවා කරයිද කියලා හිතා ගන්න බැහැ."



## 19

එතරම් කලබැගෑනි රාශියක් මධ්‍යයේ විභාග කිරීම ඉවර වුණා. මේරි ලෝව් හා ඩැෆනි පිළිබඳ කතාන්දරය පාසල පුරා පැතිරුණ අතර සෑම කෙනෙක්ම කතා කළේ ඒ ගැනයි. ඊළඟ දින දැරියන් දෙදෙනා පාසලේ සිටිනු දකින්නට නොලැබුණේ නේවාසිකාගාර පාලිකාව ඔවුන්ව නිස්කලංකව තබාගෙන සිටි නිසයි. දෙදෙනාගෙන් කිසිවෙකු එතරම් තදබල සිද්ධියකට මුහුණ දුන්නද වඩා නරක තත්ත්වයක සිටින බවක් පෙනුණේ නැහැ.

සවස ඩැරල්, සැලී, අයිරින් හා බෙලින්ඩා පාර්සලය සෙවීම පිණිස වෙරළබඩ ගල්පර මාර්ගයේ ගමන් ඇරඹුවා. සුළඟ නැවතී තිබුණ අතර එය කොන්වෙල් පෙදෙසට කලාතුරකින් උදාවන ප්‍රියකරු දිනයක් වුණා. අහස තිල් කැටයක් සේ පැහැදිලි වූ අතර දැරියන් වෙරළබඩ මාවතේ යද්දී අහසේ පැහැයගත් මුහුද ඉතා චමත්කාර දසුනක් මැව්වා.

"අර බලන්න. අතනින් වෙන්න ඇති මේරි ලෝව්ව ගහගෙන යන්න ඇත්තේ." මුහුදට බෑවුම් වූ ගල්පර කීපයක් තිබූ තැනකට අත දිගු කරමින් ඩැරල් කිව්වා. "අන්න බලන්න. අනිවාර්යයෙන්ම ඩැෆනි තකුල් පටලවාගෙන සිටිය කටු පඳුර. දෙවියනේ එයාව ගොඩක් සීරිලා ඇති!"

මේරි ලෝව් හා ඩැෆනි තම බිහිසුණු අත්දැකීම ලද තැනට සිව් දැරියෝ සිටගෙන එතැන බලා සිටියා. උඩුබුරලන සුළඟ ඇති රාත්‍රියක, පහතින් මහා රළගෙඩි ගල්පරවල හැපෙද්දී එය කෙතරම් අයුරකින් තිබෙන්නට ඇතිදැයි සිතුණ සැලීගේ ගත සලිත වුණා.

"හිතන්න බැරි තරම් භයානකයි."ඈ කිව්වා. "එන්න, අපි පාර්සලය මේ ළඟක වැටිලද කියලා හොයමු. මම හිතන්නේ මේ අහලක මෙරි ලෝව් අතින් ඒක වැටෙන්න ඇති."

ඔවුන් සෝදිසිය ආරම්භ කළා. මදක් දුරින් තෙත තණකොළ මත වැටී තිබූ එය දැක ගත්තේ ඩැරල්.

"මට හම්බ වුණා." කෑ ගැසූ ඈ එය ඇහිඳ ගැනීමට දුවගියා. "අපොයි ඒක දියවෙලා කෑලි කෑලිවලට කැඩෙනවා. කොළය පෙඟිලා ඇතුළේ තියෙන දේවල් පිටට පනිනවා."

"කොළය පැත්තකට දාලා ඇතුළේ තියෙන දේවල් අපේ අත්වලට ගන්න එක හොඳයි."සැලී කිව්වා. ඒ නිසා පෙඟී ඉරුණ කඩදාසිය පසෙකට කරමින් ඩැරල් ඇතුළත වූ දේවල් බිමට ගසා දමන්නට වුණා. ඒවා තණ පිඩැලි මතට වැටුණා.

ඒවා අමුතුම පෙනුමක් ගත්තා. බිම වාඩිවූ දැරියෝ ඒවා දෙස බැලුවා. එක් එක් තරමේ හා හැඩයේ මුදල් පසුම්බි හතරක් එතැන තිබුණා. රන් ආභරණ සාප්පුවලින් දෙන ආකාරයේ පෙන්ඩන් හා කොණ්ඩා කටු බහාලන පෙට්ටි හතරක් ද තිබුණා. එක් කොනකින් තද කරන විට විවෘත වන ආකාරයේ කුඩා ප්ලාස්ටික් අසුරන. එකක් අතට ගත් ඩැරල් එය තදකර බැලුවා. එය ගැස්සී විවෘත වුණා. ඒ සමගම එතුළ වූ රතුන් කොණ්ඩා කටුවක් දිලිසුණා. එය දුටු ඇය විස්මිත්තව එය සැලීට භාර කළා.

"මේ එමිලිගේ කොණ්ඩා කටුව නේද? එයා නැතිවුණා කිව්වේ."

"එයාගේ එක නම් එයාගේ නම ගහලා තියෙනවා." සැලී කලබලයෙන් තොරව කිව්වා. එය අතට ගත් ඈ කුඩා රත්රන් කටුවේ හරස් දණ්ඩ දෙස බැලුවා.

"ඔව්, මේක එමිලිගේ." ඈ කිව්වා. "මම දැකලා තියෙනවා මේක එයා ගහගෙන ඉන්නවා. දෙවියනේ ඒක කොහොමද මේ පාර්සලයට ආවේ? අපිට හම්බවුණේ වැරදි පාර්සලයක් ද?"

තණ කොළ මත වැටී තිබුණ සියල්ල සැලී අහුලාගත්තා. ඇගේ මුහුණේ බැරෑරුම් පෙනුමක් තිබුණා. "මේක තමයි හරි පාර්සලය." ඈ කිව්වා.



"මේ බලන්න, මේ පර්ස් අපි දන්න අයගේ. මේක මේරි ඇමීගේ. අනික ග්වෙන්ගේ. මේක අනිවාර්යෙන්ම බෙට්සිගේ."

මහත් විමතියට පත් දැරියෝ සිව් දෙනා එකිනෙකා දෙස බලා ගත්තා. "මෙරි ලෝව් කැපෑලට දාන්න ගෙන ගිය ඩැෆ්නිගේ පාර්සලය මේක නම් මේවා ඔක්කොම කොහොමද ඩැෆ්නි මේකට දැම්මේ?" සෑම දෙනාම සිතන්න වූ දෙය සැලී හඬ නගා කිව්වා.

"එයා මේවා එලන්ගෙන් අරගෙන ද?" ව්‍යාකූල වූ ඩැරල් ඇසුවා. "අපි හැමෝම දන්නවා මේවා ගන්න ඇත්තේ එලන් කියලා. එහෙම නැතිව වෙන කොහෙන්ද එයාට මේවා ලැබෙන්නේ? ඩැෆ්නි මේවා කරන්නේ එලන්ව ආරක්ෂා කරන්න වගේ දෙයකට ද?"

"අපිට මේ ගැන හොයන්න වෙනවා." අයිරීන් කිව්වා.

"සැලී, අපි පාර්සලය මිස් ග්‍රේලින් ළඟට අරගෙන ගියොත් හොඳයි. මේක අපි ළඟ තියාගන්න බැහැ."

"ඔව්, අපිට තියාගන්න බැහැ." සැලී කිව්වා. "අපි ඉක්මනට ආපහු යමු."

ව්‍යාකූල වූ මුත් දැඩි කර ගත් සිතින් යුතුව වැඩි කතාවකින් තොරව ඔවුන් ආපසු ගියා. මේවා හොරකම් කරන ලද භාණ්ඩ. එලන් හොරකම් කරන්නට ඇතැයි ඔවුන් චෝදනා කර තිබූ දේවල්. කෙසේ හෝ ඩැෆ්නි ඒවා අත්පත් කර ගෙන යම් අසාමාන්‍ය හේතුවක් නිසා පිටමං කිරීමට වෙර දරා තිබුණා. එමෙන්ම එය තැපෑලට දැමීමට යාමේදී මෙරි ලෝව් නොමැරී දිවි ගලවා ගෙන තිබුණේ අනූ නවයෙන් වූ අතර ඇව බේරාගනු ලැබ තිබුණේ ඩැෆ්නි විසින්මයි. එය ඉතාමත්ම ගැටලු සහගත දෙයක්.

"මට හිතෙන්නේ මේ හැම දෙයක්ම ගුප්තයි." බෙලින්ඩා කිව්වා. "මේකේ අගක් මුලක් මට තේරෙන්නේ නැහැ. එලන්ව ඉස්කෝලෙන් අස් කරපු එක පව්. එහෙම නැතිනම් ගිහින් අපිට හම්බවුණ දේවල් එයාට පෙන්වන්න තිබුණා."

එලන් තවමත් මැලෝරි ටවර්ස්හි රැඳී සිටින බවක් දැරියෝ දැන සිටියේ නැහැ. එකින් එක පැමිණි කට කතා නිසා එලන් ගෙදර යවා තිබුණ බවට ඔවුන් දැඩිව විශ්වාස කළා!

ඔවුන් ඇතුළුවන්ම සවස් වරුවේ පාසල ආරම්භ වෙමින් තිබුණා. පාකර් ගුරුතුමිය දෙවැනි පන්ති කාමරයට යමින් සිටි අතර ඇයව හමුවීමට ගිය ඔවුන් ග්‍රේලින් මහත්මිය හමුවට යාම සඳහා අවසර ඉල්ලුවා.

"මේරි ලෝව් තැපැල් කරන්න ගෙන ගිය පාර්සලය අපට හම්බ වුණා. ඉතින් අපි සිතුවා ඒක මිස් ග්‍රේලින්ට දුන්නොත් හොඳයි කියලා." සැලී පැහැදිලි කළා.

"බොහොම හොඳයි. වැඩි වෙලාවක් ගන්න එපා." කී පාකර් ගුරුතුමිය යන්නට ගියා. ග්‍රේලින් මහත්මියගේ කාමරය බලා ගිය දැරියෝ එහි දොරට තට්ටු කළා.

"ඇතුළට එන්න." ශාන්ත ස්වරයකින් ඇසුණ පසු ඔවුන් දොර විවෘත කර ඇතුළට ගියා. ඇ සිටියේ තනියම. දැරියන් සිව් දෙනෙකු දැකීමෙන් ඇය විමතියට පත් වුණා. එහෙත් ඔවුන් සියලු දෙනාට මහත් සේ ඇලුම් කළ ඇ මඳ සිනාවකින් ඔවුන්ට සංග්‍රහ කළා.

"මිස් ග්‍රේලින්, ඩැෆනි වෙනුවෙන් තැපැල් කරන්න මේරි ලෝව් ගෙන ගිය පාර්සලය අපිට හම්බවුණා." ඉදිරියට එමින් සැලී කිව්වා. "මේ තියෙන්නේ ඇතුළේ තිබුණ දේවල්. කොළය හොඳටම පෙඟිලා තිබුණ නිසා අපි ඒක අයින් කළා."

ඇ මුදල් පසුම්බි හා කුඩා පෙට්ටි සියල්ල විදුහල්පතිනියගේ මේසය මත තැබුවා. ග්‍රේලින් මහත්මිය මවිත වී ඒවා දෙස බැලුවා.

"මේවා ද ඇතුළේ තිබුණේ." ඇ ඇසුවා.

"එතකොට ඔක්කෝම ඩැෆනිගේ ද? මේක ඩැෆනිගේ පාර්සලය කියලා මටත් හිතෙනවා."

අපහසුවක් දැනෙන නිශ්ශබ්දතාවයක් ඇතිවුණා. "හරි, මිස් ග්‍රේලින්, ඒත් මේවා අයිති අනිත් ළමයින්ට." සැලී අවසානයේ කිව්වා. "එක එක වෙලාවලදී මේවා නැති වුණා. හොරකම් කරන වෙලාවේදී සමහර පර්ස්වල සල්ලි තිබුණා. දැන් ඒවා හිස්."



ග්‍රේලින් මහත්මියගේ පෙනුම හදිසියේම වෙනස්වුණා. [illegible] ඇගේ දෙනෙතට ආරූඪ වූ අතර ඇ කල්පු වාඩි වුණා.

"මේක තව ටිකක් හොඳට පැහැදිලි කරන්න, සැලී" ඇ [illegible]. ඔයාලා කියන්න හදන්නේ මේ වාරයේ යම් යම් වෙලාවල ඒවා ඔයාලාගෙන් ගත්ත හොර බඩු කියලා ද?"

"එහෙමයි, මිස් ග්‍රේලින්" සැලී කී අතර සෙසු අය හිස සැලුවා.

"ඔයාලා හිතන්නේ ඩැෆනි ගත්තා කියල ද?" මඳ විරාමයකින් පසු ග්‍රේලින් මහත්මිය ඇසුවා. දැරියෝ එකිනෙකා දෙස බලාගත්තා.

"හොඳයි." සැලී අවසානයේ කතා කළා. "අපි හිතුවේ එලන් හොරකම් කරනවා කියලයි, මිස් ග්‍රේලින්. අපි දැනගත්තා එයාව පාසලෙන් අස්කළා කියලා. ඉතින්, අපි හිතුවා."

"ටිකක් ඉන්න." ග්‍රේලින් මහත්මිය කොතරම් තියුණු හඬක් නැඟුවේ ද යත් දැරියෝ උඩ විසිවුණා. "එලන්ව අස් කළා මොකක්ද ඒ කියන්නේ? එයා මෙට්‍රන්ගේ රැකවරණය යටතේ ලෙඩ කාමරයේ ඉන්නවා. එයා ලොකු හිසරදයක් නිසා දින දෙකකට උඩදි එක්ක ගියා. සිද්ධවෙලා තියෙන්නේ මොකක්ද කියලා දැන ගන්න අපි එයාව පරීක්ෂාව යටතේ තියාගෙන ඉන්නේ."

දැරියෝ සැබැවින්ම විස්මිත වුණා. සැලී දීප්තිමත්ව රතු වුණා. ඇය කට කතා විශ්වාස නොකර සිටිය යුතුව තිබුණා. ඇය එලන්ව ඇලුම් නොකළ නිසා ඒවා සත්‍ය බව විශ්වාස කිරීමට ඇ පෙළඹුණා. කියන්නට වචනයක් හෝ සොයා ගැනීමට දැරියන්ට නොහැකි වුණා.

ග්‍රේලින් මහත්මිය ඔවුන් වෙත තියුණු බැල්මක් හෙළුවා. "මේක හරිම අමුතු දෙයක්." අවසානයේ ඇ කිව්වා.

"මට මේක තේරුම් ගන්න බැහැ. එලන් අස්කළ යුතුයි කියලා ඔයාලාට සිතුණේ ඇයි? හොරකම් කරන්නේ එයා කියලා ඔයාලට හිතුණේ ඇයි? කොහෙත්ම එයා ඒ ජාතියේ ළ

මයෙක් නොවෙයි. ඔයාලා දන්නවා, මහන්සියෙන් වැඩ කිරීමේ ප්‍රතිඵලයක් හැටියට මෙහාට එන්න එයා ශිෂ්‍යත්වයක් දිනාගත්තා කියලා. චරිත සහතිකය වගේම අනිත් හැම වාර්තාවක්ම එයා හිටපු ඉස්කෝලේ විදුහල්පතිනිය ඉතා උසස් මට්ටමකින් එවලා තියෙනවා."

"අපි, අපි එයා හොරකම් කළා කියලා හිතුවේ" සැලී කතා කළා. "කොහොම වුණත් හරි හමන් සාක්ෂියක් ලැබෙන තුරු එයාට චෝදනා කරන්නේ නැතිව ඉඳිමු කියලා මම කිව්වා. ඒත්, ඒත්...."

"මට තේරෙනවා ඔයාලා ඒ අවාසනාවන්ත ළමයාගේ මූහුණටම චෝදනා කළා. එහෙම නේද? ඒ කවදා ද?"

"පෙරේදා හැන්දෑවේ, මිස් ග්‍රේලින්." හදිසියේම බුරුම කටුවක් මෙන් වී තම දෙනෙත් පසාරු කරගෙන යන්නට එන විදුහල්පතිනියගේ තියුණු දැස මගහැර ගැනීමට වෙහෙසෙන අතර සැලී කිව්වා.

"පෙරේදා හැන්දෑවේ" ග්‍රේලින් මහත්මිය කිව්වා.

"ඔහ්, දැන් කාරණය පැහැදිලියි. ඒක නිසා තමයි එහෙනම් එලන් ඒතරම් දුකට පත්වෙලා ඔළුව රදේ අල්ලලා මෙට්‍රන් හොයාගෙන ගිහින් තියෙන්නේ. එතකොට කොහොම හරි ඔයාලා හිතුවා එයාව ඉස්කෝලෙන් නෙරපුවා කියලා. දෙවියෝ තමයි දන්නේ ඇයි කියලා. මොකක් හරි මෝඩ කට කතාවක් නිසා, මම හිතන්නේ. කවුරුහරි බොරුවක් කිව්වා. ඔයාලත් කැමැත්තෙන්ම ඒක විශ්වාස කළා! අහිංසක ළමයකුට ඔයාලා කරලා තියෙන්නේ බරපතළ හානියක්."

ඩැරල් දෙතුන් සැරයක් ආවේගය ගිල ගත්තා. එදින රැයේ දෙවෙනි පන්ති කාමරයේදී තමා එලන්ට පහරදුන් ආකාරය ඇයට සිහිපත් වුණා. සැබැවින්ම එලන් හොරයක් කරමින් සිටියේ, එහෙයින් ඩැරල් ඇයට හෙරක් ලෙස චෝදනා කර අමතක කළ නොහැකි දේ පැවසුවා. ග්‍රේලින් මහත්මිය දෙස බැලූ ඈ එලන් හා තමන් අතර සිදුවූ දෙය කිව යුතුයැයි තීරණය කළා.



ඒ එලන් අසනීප වුණේ එම රාත්‍රියේම නිසයි. අපොයි, එක ...ක් වැරදි කරන්න තරම් මෝඩ වුණත් ඒක කොයි තරම් දුර ...නවා ද?

"මට තනියම දෙයක් කතා කරන්න පුළුවන්ද, මිස් ග්‍රේලින්." ...ස්න වූ ඩැරල් ඇසුවා. "ඒක අනිත් කවුරුවත් දන්න දෙයක් ...වෙයි. ඒත් මම හිතන්නේ ඒක මම කියන්න ඕනෑ."

"විනාඩියකට එළියට ගිහින් ඉන්න." ග්‍රේලින් මහත්මිය ...ලී, බෙලින්ඩා හා අයිරින්ට හිසින් සන් කරමින් කිව්වා. "මම ...ම ඔයාලා එක්ක කතා කරලා ඉවර නැහැ."

පුදුමයක් දැනෙන අතරේ පිටතට ගිය ඔවුන් දොර වැසුවා. ...රල්ට ග්‍රේලින් මහත්මිය සමග කියන්නට ඇත්තේ කුමක් ද? ...ම තරමේ ඇය ඔවුන්ටවත් එය කිවයුතුව තිබුණා.

එදින රාත්‍රියේ තමා එලන් පසුපස ආ අයුරු හා විභාග ...න පත්‍ර ගුළි කරගෙන එලන් දෙවැනි පන්ති කාමරයේ කබඩය ...ට රිංගා සිටි අයුරු හා සියලු දේ ඩැරල් දිග හැරියා.

"මම එයාට වංචාකාරි කිව්වා. එයා කළේ වංචාවක්." ඩැරල් ...වා. "මම එයාට හෙරක් කියලත් කිව්වා. මම කිව්වා සැලීට ...ම ගැන උදේ කියලා එයා ගැන වාර්තා කරනවා එතකොට ...යා ඉස්කෝලෙන් අස් කරයි කියලා. ඉතින් මම හිතන්නේ ...කෙන් එයා භුඟක් කල්පනා කරපු නිසා ඔළුව රදේ හැදිලා ...ත් හොයාගෙන එන්න ඇති කියලයි. මම දැනගෙන හිටියේ නැහැ, එයා හොරකම් කරන බව දැනගෙන ඉස්කෝලෙන් අස් ...ලා ද කියන එක. මම හිතුවේ කලබලයක් ඇති නොකර එයාව ...ස්කරලා කියලා."

"අනේ, ඇත්තටම." මෙම දිග හැරීම අවසානයට ආ විගස ග්‍රේලින් මහත්මිය කිව්වා. "මේ ඉස්කෝලේ සිද්ධ වෙන දේවල් කවුරුවත් දන්නේ නැහැ. විශ්වාස කරන්නත් බැහැ. ඔයයි, ...ලනුයි ඇත්තටම දෙවෙනි පන්ති කාමරයේ බිම වැටිගෙන ...ණ්ඩු කළා කියන එක ඔයා ඇත්තටම මට කියන්න හිතුවා ද, ඩැරල්? ඒක කොහොමවත් ආඩම්බර වෙන්න පුළුවන් කාරණයක් නොවෙයි."

"මම දන්නවා." ඩැරල් කිව්වා. "මම ඒ ගැන හුඟක් කනගාටු වෙනවා දැන්. ඒත් ඒක නරක දෙයක්, මිස් ග්‍රේලින්, ඉතින් මට කේන්ති ගියා. මට වංචාව පෙන්වන්න බැහැ."

"ඒක හරි අමුතුයි." කල්පනාවට බරව ග්‍රේලින් මහත්මිය කිව්වා. "එලන් ශිෂ්‍යත්වයක් දිනපු ළමයෙක්, ඉතින් ඒ වගේ ළමයෙක් වංචා කරනවා කියලා මම අහලාවත් නැහැ. එලන් වංචාවක් කළා කියලා මට විශ්වාස කරන්න බැහැ. එහෙම කළා නම් අපි හොයලා බලන්න ඕනැ හේතුවක් මෙතැන තියෙනවා. ඔයාලා කවුරුවත් එලන්ට කැමති නැද්ද ඩැරල්?"

ඩැරල් පැකිළුණා. "හොඳයි, එයා නිතරම කලබල වෙනවා. කඩා පනිනවා. අනිත් අයගේ හිත් පාරනවා, මිස් ග්‍රේලින්. මේසය ටිකක් හරි හෙලවුණත් එයා කෑ ගහනවා. එයාගේ කියවීමට අපි බාධා කරනවා වගේ අපිට කෑ ගහන්නේ. එයා හුඟක් ඉක්මනට තරහා යන කෙනෙක්. මම හිතන්නේ අපි හැමෝටම වැඩිය එයාට කැමති ජීන්. එයා පුදුම ඉවසීමකින් එලන්ව ආශ්‍රය කරනවා."

"මේ දේවල් මුලින් දැන ගෙන සිටියා නම් හොඳයි කියලා මම හිතනවා." ග්‍රේලින් මහත්මිය කිව්වා.

"දැන් මට තේරෙනවා එලන් ගෙදර ගියොත් හොඳයි කියලා මම කියපු වෙලාවේ එයා එතරම් කලබල වුණේ ඇයි කියලා. මම හිතුවේ ගෙදර ගියොත් එයාට හුඟක් සතුටින් ඉඳලා සනීප වෙයි කියලයි. ඒත් එයා හිතලා තියෙන්නේ එයා හොරකම් කරනවා හෝ වංචා කරනවා හෝ කියන එක කවුරු හරි මට ඇවිදින් කියලා ඇති නිසා මම එයාව අස් කරන්න යනවා කියලයි. අසරණ එලන්. මම හිතන්නේ එයා ඕනැවට වඩා මොළය වෙහෙස කරපු එකෙන් ලැබුණ ප්‍රතිඵලය තමයි මේක."

ඩැරල් නිහඬව නැඟී සිටියා. ග්‍රේලින් මහත්මිය තමා ගැන එතරම් ප්‍රසාදයට පත්ව නැති බව ඇ දුටුවා. "මම කළ දේ ගැන මට කනගාටුයි." ඇසට ඉනූ කඳුළු සඟවා ගැනීමට තැත් කරමින් ඇ කිව්වා. "මම දන්නවා ඉක්මනින් කේන්තියාමයි, මාව පාලනය කර ගන්න බැරිවීමයි නවත්වා ගන්නවා කියලා මම නිතරම කියනවා. ඔයා තව දුරටත් මාව විශ්වාස කරන එකක් නැහැ."



"මම හැම වෙලාවකම ඔයාව විශ්වාස කරනවා කියලා ...න්නම්." තම ගැඹුරු නිල් දෙනෙතින් බලා සිනාසුණ ග්‍රේලින් මහත්මිය කිව්වා.

"දවසක මේ පොරොන්දු ඉටුකරන්න තරම් ඔයා ශක්තිමත් වුණායි, බොහෝ විට ඔයා හමයේ පන්තියට ආවට පස්සේ දැන් අනිත් අයට නැවත ඇතුළට එන්න කියන්න."

ඔවුන් ඇතුළට පැමිණියා. ග්‍රේලින් මහත්මිය බැරෑරුම් ලෙස ළමුන්ට ඇමතුවා. "ඩැරල් කිව දේවල් ඔයාලා එක්ක නොකියන්න මට හුඟක් හේතු තියෙනවා. අනික එයත් ඒවා ඔයාලා එක්ක කියන්නේ නැහැ. මම කියන්නේ මේකයි, එලන් හොරක් නොවෙයි. ඔයාලා ඒක හොඳින්ම දන්නවා ඇති."

"හොරකම් කළේ එයා නොවෙයි?" සැලී ඇසුවා. "ඒත්, අපි හැමෝම හිතුවේ එයා කියලයි. ඒකයි ඇලිසියා එයාගේ මුහුණටම චෝදනා කළේ. ඉතින්......"

කල්පනාවකින් තොරව ඇලිසියාගේ නම ඩැරල්ගේ මුවින් ලිස්සා ගියා. ග්‍රේලින් මහත්මිය පැන්සලින් මේසයට තට්ටු කළා.

"ඕ, එහෙනම් ඇලිසියායි චෝදනාව කළේ, නේද?" ඇ කිව්වා.

"එතකොට එයාටත් විශාල වැරැද්දක් පැටවෙනවා. ප්‍රසිද්ධියේ චෝදනා කිරීම නිසයි එලන්ට දරුණු හිසරදයක් ආවේ. සැලී, පන්තියේ නායිකාව ඔයා. මම ඔයාට භාර කරනවා ඇලිසියාට පෙන්වන්න එයා අනිත් අයට ටිකක් කරුණාවන්තව සැර පරුෂ නැතිව සැලකුවොත් විතරයි මමත්, ඔයාලාත්, අපි කවුරුත් එයාව ගරු කරන්නේ කියන එක."

"එහෙමයි, මිස් ග්‍රේලින්" තමා තදබල ලෙස වැරදියි යන හැඟීමෙන් යුතුව සැලී කිව්වා. "ඒත් මිස් ග්‍රේලින් හොරකම් කළේ කවුද?"

"කොහොමවත්ම ඩැෆනි වෙන්න බැහැ." අයිරින් කිව්වා. "එයා ඊයේ කළ දෙය වගේ දෙයක් කරන්න පුළුවන් කෙනෙක් හොරකම් කරයි කියලා හිතන්න බැහැ. දැන් ඩැෆනි වීරවරියක්! ඒක හැම කෙනෙක්ම කියනවා."

"ඉතින් ඔයා හිතන්නේ කෙනෙක් හදිස්සියේම නිර්භීත ක්‍රියාවක් කළ පමණින් එයා පහත් වැඩ නොකරනවා කියල ද?" ශ්‍රේලින් මහත්මිය ඇසුවා.

"ඔයා වැරදියි, අයිරින්. අපි හැමෝම තුළ හොඳ නරක දෙකම තියෙනවා. ඒ නිසා අපි උත්සාහ කරන්න ඕනෑ හොඳින් නරක වළක්වන්න. අපිට සර්ව සම්පූර්ණ වෙන්න බැහැ. ඒත් අපි උත්සාහ කරන්න ඕනෑ වැරැද්ද හදා ගන්න, පසුව වැදගත් හොඳ දේවල් කරලා. ඩැෆනි ඒ වගේ ටිකක් වැරැද්ද අඩුකර ගෙන තියෙනවා. මම හිතන්නේ එයාගේ වීරකමට බැහැ එයා පහත් වැඩ කරන එක නවත්වන්න."

"එයාද හෙර එතකොට?" සැලී උනන්දුවෙන් ඇසුවා.

"ඒක තමයි මම හොයන්න හිතාගෙන ඉන්නේ" ශ්‍රේලින් මහත්මිය කිව්වා.

"එයා නම්, ඒ ගැන ඔයාලට එයාම කියයි. ඔයාලාට බලාගන්න පුළුවන්. දැන් ආපසු පන්ති කාමරයට යන්න. මම අසනීප කාමරයට යනවා ඩැෆනිව බලන්න. ඒක නොවෙයි, අද කෙනෙකුට යන්න පුළුවන් එලන්ව බලන්න. කොහොමද ජීන්? ඔයාලා කිව්වා ඔයාලාට වැඩිය එයා එලන්ට හිතවත් කියලා. එයාට කියන්න ගිහින් එලන්ව බලන්න කියලා. එයාට හොඳින් සලකන්න."

"හොරකම් කළේ එයා නොවෙයි කියලා අපි දන්නවා කියලා එයා එක්ක කිව්වාට කමක් නැද්ද?" ඩැරල් චකිතයෙන් යුතුව ඇසුවා."අනේ, මිස් ශ්‍රේලින් මටත් පුළුවන්ද විනාඩි කිහිපයකට එයාව හම්බවෙන්න යන්න?"

"ඔව්." ශ්‍රේලින් මහත්මිය කිව්වා. "හැබැයි තවත් රණ්ඩු බැහැ, ඩැරල්. නැතිනම් මෙට්‍රන් තදින් ඉන්න පුළුවන්."



## 20

ශ්‍රේලින් මහත්මිය අසනීප කාමරය බලා ගියා. ඇය පාලිකාවට කතා කළ අතර ඇ හිස සැලුවා. "ඔව්, ඩැෆනිට දැන් හුඟක් සනීපයි. දැන් එයා නැඟිටලා."

විදුහල්පතිනිය පාලිකාවට ඩැෆනිව යාබද කුඩා කාමරයට කැඳවාගෙන එන ලෙස කීවේ එහි හුදෙකලා වීමේ අදහසින්. පාලිකාවගේ උදව් ඇතිව පැමිණි ඩැෆනි මේ හමුව කුමක් සම්බන්ධවදැයි කල්පනා කරමින් බියෙන් යුතුව ඇඳි පුටුවක වාඩිවුණා. ශ්‍රේලින් මහත්මිය දැඩි බැරෑරුම් පෙනුමකින් යුතු වුණා.

"ඩැෆනි" විදුහල්පතිනිය කතා කළා. "මේවා ඔයා වෙනුවෙන් මේරි ලෝව් තැපෑලට දාන්න ගිය පාර්සලයේ තිබුණ ඒවා. මේවා අසුරලා තියෙන්නේ ඔයයි. ඔයා කොහෙන්ද මේවා ගත්තේ? ඇයි ඔයාට මේවා යවන්න ඕනෑ වුණේ?"

ඇ හදිසියේ මුදල් පසුම්බි හා පෙට්ටි ඩැෆනිගේ මඩොක්කුවට දැම්මා. දැරිය දැඩි භීතියෙන් මහත් කර ගත් දෙනෙතින් ඒවා දෙස බලා සිටියා. සුදුමැලි වූ ඇ කතා කිරීමට මුව විවර කළා. එහෙත් වචන පිටවුණේ නැහැ.

"මම කියන්නද ඔයා ඒවා ගත්තේ කොහෙන්ද කියලා?" ශ්‍රේලින් මහත්මිය ඇසුවා. "ඔයා ඒවා කබඩ්වලින්, ලාච්චුවලින්, ඩෙස්කවලින් ගත්තා. ඔයා සල්ලි වියදම් කළා. ඩැෆනි, ඔයා කළේ ඇත්තෙන්ම මීට ඉස්සර හිටපු ඉස්කෝල දෙකේදි කළ දේමයි."

"ඔයා කොහොමද දැනගත්තේ?" සුන්දර මුහුණ මේ වනවිට සුදුමැලිව විරූපව ගිය ඩැෆනි කෙඳිරිලි හඬින් ඇසුවා.

"හැම ළමයෙක් ගැනම එයා හිටපු පළමු ඉස්කෝලයේ විදුහල්පතිනියගෙන් රහස්‍ය වාර්තාවක් ලබා ගන්න එක මැලෝරි ටවර්ස්වල චාරිත්‍රයක්." ග්‍රේලින් මහත්මිය කිව්වා. "බැරිම තැනකදි හැර, නරක චරිත ඇති ළමයි අපි ගන්නේ නැහැ ඩැෆනී."

"එහෙම නම් ඇයි මාව ගත්තේ?" විදුහල්පතිනියගේ දෑස දෙස බැලීමට තරම් නිර්භීත නොවූ ඩැෆනී ඇසුවා.

"ඒ මොකද, ඩැෆනී ඔයාගේ අන්තිම ඉස්කෝලේ විදුහල්පතිනිය කිව්වා ඔයා ඒ තරමම නරක නැහැ කියලා." ග්‍රේලින් මහත්මිය කිව්වා. "ඇය කිව්වේ සමහර විට හොඳ සිරිත් ඇති, අන්‍යයන්ට උදව් කරන, කරුණාවන්තකම ඇති, සාධාරණත්වය හා සත්‍ය ගරුක බව ඇති, මේවාගේ ඉස්කෝලයක දී ඔයාට අලුත් ආරම්භයක් ලැබුණොත් ඔයාට නරක ගති නැති කරගෙන හොඳ ගති දියුණු කර ගන්න පුළුවන් වෙයි කියලයි. අනික මම කැමති කාට වුණත් අවස්ථාවක් දීලා බලන්න."

"මට තේරුණා." ඩැෆනී කිව්වා. "ඒත් සිතනවාට වඩා මම නරකයි මිස් ග්‍රේලින්. මම හොරකම් කරලා විතරක් නොවෙයි. බොරු කියලත් තියෙනවා. මාව දෙසැරයක් ඉස්කෝලවලින් ගෙදර යැව්වා කියලා අනිත් අය දැන ගනියි කියලා මෙයාලාට මම කිසිම පාසලකට මීට පෙර ගිහින් නැහැ කියලා බොරු කිව්වා. මම අපේ පවුල හුඟක් පොහොසත් කියලා බොරු රඟපෑමක් කළා. මම, මම ලස්සන පින්තූරයක් මගේ කණ්ණාඩි මේසය උඩ තියාගෙන ඉන්නවා . ඒ කොහොමත්ම මගේ අම්මා නොවෙයි. ඒක හුඟක් ලස්සන ගැහැනු කෙනෙකුගේ පින්තූරයක්....."

"මම දන්නවා." ග්‍රේලින් මහත්මිය කිව්වා. "ගුරු මණ්ඩලයට ඔයා ගැන අනතුරු අඟවලා තිබුණට ළමයින්ට කිව්වේ නැහැ. මට දුක හිතෙන හුඟක් දේවල් මට අහන්න ලැබිලා තියෙනවා. ඩැෆනී, ඔයාට දුන්න අවස්ථාව නොදෙන්නයි තිබුණේ කියලා මට හිතුණා. ඔයාට තියෙන ලොකුම බාධාව ඔයාගේ ලස්සන. ඔයාට අනිත් අයගේ වර්ණනා ඕනැ, ඔයාට ඕනැ අනිත් අයගේ සැලකිල්ල නේද? ඔයා එහෙම හිතාගෙන ඉන්න තරම් ඔයා වගේ ලස්සන දුවෙක් ලබන්න තරම් ඔයාගේ දෙමව්පියෝ ලස්සන නැති නිසා, ඔයාට වියදමට ඒ තරම් සල්ලි නැති නිසා ඔයාට ඕනෑ දේවල් ගන්න ඔයා හොරකම් කළා."



"මම හොඳ නැහැ." කී ඩැෆනී හිස නමා ගෙන දෑත දෙස බැලුවා. "මම දන්නවා. මම හොඳම නැහැ."

"ඒත් ඔයා හොඳ නිර්භීත වැඩක් කරලා තියෙනවා." ග්‍රේලින් මහත්මිය කිව්වා.

"මා දිහා බලන්න, ඩැෆනී. අද ළමයි ඔයාව හුඟක් වර්ණනා කරනවා. එයාලා ඔයාට වීරවරියක් කියනවා. එයාලට ඔයාට සුභ පතලා අත්පුඩි ගහන්න ඕනෑ කියනවා. ඔයාගේ හුඟක් හොඳ ගති ගුණ තියෙනවා."

හිස ඔසවා සිටි ඩැෆනී ග්‍රේලින් මහත්මිය දෙස බලා සිටියා. ඇය රතු වී සිටියා. "මේරි ලෝව්ට සිද්ධ වුණ දෙයට මට බනින්න ඕනෑ." ඈ කිව්වා. "ඇත්තටම මම කරපු හොරකම් නිසා එලන්ව ගෙදර යැව්වා කියලා මම දැන ගත්තට පස්සේ මම බය වුණා. ඉදිරිපත් වෙලා ඇත්ත කියන්න බැරි තරම් මම බියසුල්ලියෙක්. ඒත් මම හිතුවා හිස් පර්ස්, පෙට්ටි හොයා ගත්තොත් මගේ ඇඟිලි සලකුණු ඒවායේ තියෙන නිසා මාව අහුවෙයි කියලා. ඉතින් මම හිතුවා බොරු ලිපිනයකට ඒවා තැපැල් කරන්න. මේරි ලෝව් ඇනගත්තා මට ඒ පාර්සලය යවන්න තිබුණ හදිස්සිය. ඒ විදියටයි එයා අනතුරට වැටුණේ."

"මට තේරෙනවා." ග්‍රේලින් මහත්මිය කිව්වා. "මම කල්පනා කළේ ඔයා මේවා තැපැල් කළේ ඇයි කියලයි, ඩැෆනී. මේරි ලෝව්ව සොයාගන්න ගිය එක ඔයා කළ හොඳ දෙයක්. එහෙම නොවුණා නම් ඔයාගේ මෝඩකමයි, වැරදි වැඩයි නිසා විශාල විපතක් සිද්ධ වෙන්න තිබුණා."

"මම හිතන්නේ මාව ගෙදර යවයි කියලා, මිස් ග්‍රේලින්" නිහඬ විරාමයකට පසුව ඩැෆනී කිව්වා. "ඇයි කියන එක අම්මලා දැන ගනියි. එයාලා හිතයි බරපතළ කාරණයක් තියෙනවා කියලා. එයාලා මගේ ගාස්තු ගෙවන එකක් නැහැ. එයාලට ඒ තරම් සල්ලි නැහැ කියලා දන්නවානේ. මට උදව් කරන්නේ මගේ මායියා. එයා මේක දැන ගත්තොත් මගේ ඉගෙනීමට සල්ලි දෙන එකක් නැහැ. මගේ ජීවිතයම කඩා කප්පල් වෙයි. මාව අස් කරනවාද, මිස් ග්‍රේලින්?"

"මම ළමයින්ට ඒක තීරණය කරන්න ඉඩ දෙන්නයි යන්නේ?" ශ්‍රේලින් මහත්මිය බැරෑරුම්ව කිව්වා. "ඒක, එයාලට කරන්න ඉඩදෙන්න තරම් ඔයා නිර්භීත නම්, ඩැෆනි. මට ඕනෑ ඔයා දෙවැනි පන්තියට ගිහින් මුළු කතාවම එයාලට කියන එක. එයාලට හැම දෙයක්ම පාපොච්චාරණය කරලා බලන්න මොනවාද එයාලා කියන්නේ කියලා.

"ඔ, මට බැහැ." කී ඩැෆනි දෑතින් මුහුණ වසා ගත්තා. "කොහොම වුණත් මම කියලා තියෙනවා, මම කයිවාරු ගහලා තියෙනවා. මට බැහැ!"

"හොඳයි, තීරණය තියෙන්නේ ඔයාගේ අතේ." නැඟිටිමින් ශ්‍රේලින් මහත්මිය කිව්වා. "එක්කෝ තවත් කලබලයක් නැතිව මම ඔයාව ගෙදර යවන්න ඕනෑ. නැති නම් ඔයා ගැන තීරණය ඔයා ඉස්කෝලේ යාළුවන්ට භාර දෙන්න ඕනෑ. ඒක අමාරු දෙයක් වුණත් ඔයාට ඇත්තටම වැරදි හදාගන්න ඕනෑ නම් ඔයා ඒක කරන්න ඕනෑ. ඔයා ළඟ හොඳ ගතිගුණ තියෙනවා. ඒක පෙන්වන්න මේක තමයි අවස්ථාව. ඒක ඊයේ රෑ ඔයා කරපු දේට වඩා වැඩි නිර්භීතකමක්."

ඩැෆනිව තනි කළ ඈ එලන්ව බැලීමට ගියා. ඈ ඇගේ ඇඳ අසල වාඩි වුණා. "එලන්," ඈ කතා කළා. "ඩැෆනි ලොකු කරදරයක වැටිලා. අනිත් අය ඉක්මනින්ම දැන ගනීවි. මම ආවේ ඔයාට ඒක මම ම කියන්නයි. නැතිවුණ සල්ලි, රන් බඩු වගේ හැම දෙයක්ම හොරකම් කළේ ඩැෆනි කියලා හොයා ගත්තා."

මෙය එලන්ගේ සිතට කාවැදීමට මොහොතක් ගත වුණා. අනතුරුව ඈ වාඩි වුණා. "ඩැෆනි! ඒත් ළමයි හිතුවේ මමයි හොරකම් කළේ කියලා. එයාලා මට චෝදනා කළා. ඒ ඩැෆනි කියලා එයාලා කවදාවත් විශ්වාස කරන්නේ නැහැ."

"එයාලා විශ්වාස කරයි." ශ්‍රේලින් මහත්මිය කිව්වා. "මට එහෙම හිතෙන්නේ මොකද, ඩැෆනිම ගිහින් ඒක එයාලට කියයි. දැන් ඉතින් එලන්, මට කියන්න එදා රෑ ඇයි ඔයා ප්‍රශ්න පත්‍ර හොරකම් කළේ කියලා? ඔයා මොළේ පාවිච්චි කරලා ශිෂ්‍යත්වයක් දිනපු ළමයෙක්. ඔයාට වංචා කරන්න වුවමනාවක් නැහැ."



එලන් නැවතත් හදිසියේම වැසිරුණා. ලැජ්ජාව ඇගේ මුහුණ පුරා ගියා. ශ්‍රේලින් මහත්මිය එය කෙසේ දැන ගත්තා ද? එහෙනම් ඩැරල් හැමදෙයක්ම කියල ද? ඇත්තෙන්ම කියලා.

"ඔමයි, ඩැරලුයි හැර කවුරුත් දන්නේ නැහැ." ශ්‍රේලින් මහත්මිය කිව්වා.

"ඩැරල් මට හැර වෙන කාටවත් කීවේ නැහැ. ඒ නිසා ඔයාට බයවෙන්න දෙයක් නැහැ. ඒත් මට ඕනෑ ඔයා එහෙම කළේ ඇයි කියලා දැන ගන්න. ඔයා දුක් වෙන්න මොනවා හරි දෙයක් තියෙනවා එලන්. ඒ නිසා ඔයාට තියෙන ඒ කරදරය ඉවර වෙනතුරු ඔයාට මේ හිසරදය ඉවර වෙලා සැනසිල්ලේ ඉන්න ලැබෙන්නේ නැහැ."

"මට වංචා කරන්න උවමනා වුණා." එලන් සෙමින් කිව්වා. "තවත් මගේ මොළය වැඩ කරන්නේ නැහැ. මට ඔළුව රිදෙනවා. මට තේරුණා මම විභාගය පාස් වෙන්නේ නැහැ කියලා. එතකොට එදා රෑ ළමයි මම හොරක් නොවුණත් මට හොරක් කියලා චෝදනා කළා. ඉතින් හැමෝම මම හොරක් කියලා හිතනවා නම් වංචා කළත් කමක් නැහැ කියලා හිතුවා."

"මට තේරෙනවා" ශ්‍රේලින් මහත්මිය කිව්වා. "ඒත් ඇයි ඔයාගේ මොළය වැඩ කරන්නේ නැහැ කියලා හිතන්නේ?"

"මම දන්නේ නැහැ."එලන් කිව්වා. "මම හිතන්නේ මම ශිෂ්‍යත්වය කරද්දී මම හුඟක් මොළය වෙහෙසුවා වැඩියි කියලයි. බලන්න මිස් ශ්‍රේලින්, මම ඇත්තටම හුඟක් දක්ෂ නැහැ. මම හොඳ ප්‍රතිඵල ගත්තේ මහන්සියෙන් වැඩ කළ නිසයි. ශිෂ්‍යත්වයක් පාස්වෙන ළමයෙක් කරනවා වගේ දෙගුණයක් මම මහන්සියෙන් වැඩ කරලා පාඩම් කළා. මම නිවාඩු කාලෙත් පාඩම් කළා. මම මෙහාට එද්දි හොඳටම වෙහෙසිලා හිටියේ. ඒත් මට පළමු වාරයේ හොඳට වැඩ කරන්න ලොකු උවමනාවක් තිබුණා."

"ඒක ඒ තරම් ලොකු දෙයක් ද?" ශ්‍රේලින් මහත්මිය මෘදුව ඇසුවා.

"ඔව්," එලන් කිව්වා. "මට ගෙදර අයව මතක් වුණා. එයාලට කරන්න බැරි තරම් වියදම් කරලයි මට නිල ඇඳුමයි, අනික් දේවලුයි අරන් දුන්නේ. එයාලා මා ගැන හුඟක් ආඩම්බරයි. ඒ නිසා මම හොඳටම වැඩ කරන්න ඕනැ. ඒත් දැන් මම ඒ හැම දෙයක්ම නැති කරගෙන."

"ඒ තරම් දෙයක් වෙලා නැහැ." ග්‍රේලින් මහත්මිය කිව්වා.

තම පවුලේ අය සිතන දේවල් ගැන කරදර වන දැරිය හා තරමක් වෙහෙස වී වැඩ කිරීම නිසා අනවශ්‍ය ලෙස මහන්සි වීමේ ප්‍රතිඵලය ගැන සරලව සිතූ ග්‍රේලින් මහත්මිය එලන්ගේ හිසරදයට හේතුව එය බව දැන ගත්තා. ඉන් මහත් සහනයට පත් ඈ කතා කළා. "මම ඔයාගේ ගෙදර අයට ලියලා යවන්නම් ඔයා හොඳට වැඩ කරලා හොඳින් ප්‍රතිඵල ලබා ගත්තා කියලා. ඒ වගේම එන නිවාඩු කාලයේදී ඔයාට හොඳට විවේක ගන්න අවස්ථාව දෙන්න කියලා. ඔයා ඕනෑවට වඩා මහන්සි වෙලා නිසා ඕනෑතරම් විනෝද වෙන්න දෙන්න කියන්නම්. එතකොට ඊළඟ වාරයේදී ඔයාට මේ සේරම අමතක කරලා ආලා අලුතින් පටන් ගන්න පුළුවන් වෙයි. ඒ වගේම ඊළඟ වාරයේ දී ඔයාට ඉහළට එන්න පුළුවන් වෙනවා. පළමුවැනියා වෙන්නත් පුළුවන් වෙයි."

විදුහල්පතිනියට මඳ සිනාවක් පෑ එලන්ගේ තළලෙහි වූ ගැඹුරු රැල්ල මැජික් එකකින් මෙන් අතුරුදහන් වුණා. "ස්තුතියි." ඈ කෘතගුණ පූර්වකව කිව්වා. "මට තව හුඟක් දේවල් කියන්න තියෙනවා. ඒත් දැන් මට බැහැ."

ග්‍රේලින් මහත්මිය මේරි ලෝව් ද බැලීමට ගොස් අනතුරුව තම නිවස්නට ගියා. මේ තරම් දැරියන්, මේ තරම් ගැටලු හා සෑම කෙනෙක්ම නිවැරදි මඟට ගෙන ඒම තිබුණ වගකීම් සම්භාරය! ග්‍රේලින් මහත්මියගේ වයසට තිබිය යුතු ප්‍රමාණයට වඩා හිසකෙස් සුදුවී තිබීම පුදුමයට කාරණයක් නොවෙයි.



## 21

එදින තේ වේලාව අවසාන වන්න පාකර් ගුරුතුමිය විසින් දෙවැනි පන්තියේ දැරියන්ට පොදු කාමරයට ගොස් එහි රැඳී සිටින ලෙසට නියෝග කෙරුණා.

"ඇයි ඒ?" බෙලින්ඩා පුදුමව ප්‍රශ්න කළා.

"දැන ගන්න පුළුවන් වෙයි." පාකර් ගුරුතුමිය කිව්වා. "දැන් යන්න. කෙනෙක් ඔයාලා එන තුරු බලා ඉන්නවා."

මේ කුමන අබිරහසක් දැයි පුදුමව ඔවුන් කලබලයෙන් පොදු කාමරයට දුව ගියා. රාත්‍රී උඩුගවුමින් සැරසුණ මේරි ලෝව් තරමක් බියපත්ව එහි රැඳී සිටියා. පාලිකාව ඇයව පහතට කැඳවාගෙන විත් තිබුණා. මනාව ඇඳුම්වලින් සැරසී ඩැෆනි ද එහි සිටියා. දැරියෝ දුවගොස් ඇය වට කර ගත්තා. "ඩැෆනි ඔයා වීරවරියක්, ඩැෆනි අපේ සුබ පැතුම්. ඔයා මේරි ලෝව්ගේ ජීවිතය බේරා ගත්තා."

ඩැෆනි පිළිතුරු දුන්නේ නැහැ. වාඩි වී සිටි ඈ සුදුමැලි මුහුණින් ඔවුන් දෙස බලා සිටියා මිස මඳ සිනාවක් හෝ පෑවේ නැහැ.

"මොකද වෙලා තියෙන්නේ?" ගොන්ඩොලින් ඇසුවා.

"වාඩි වෙන්න, ඔයාලා හැමෝම." ඩැෆනි කිව්වා. "මට කියන්න දෙයක් තියෙනවා. ඊට පස්සේ මම යනවා. ඔයාලාට මාව දකින්න ලැබෙන්නේ නැති වෙයි."

"දෙවියනේ! මොකක් ද මේ භාඩගම?" ඩැෆනිගේ ශෝකාකුල කට හඬින් ඇවිස්සුණ ජීන් ඇසුවා.

"අහගන්න." ඩැෆනි කිව්වා. "ඔයාලා අහගන්න ඕනැ. මමයි හොරකම් කළේ. මම ඒ දේවල් හොරෙන් ගත්තා. මේ වගේම වැඩ නිසා මාව ඉස්කෝල දෙකකින් අස් කරලයි ඉන්නේ . මිස් ග්‍රේලින් ඒක දන්නවා වුණාට එයා මට තවත් අවස්ථාවක් දුන්නා. එහෙමයි මම මෙහාට ආවේ. මම ඔයාලාට කිව්වේ බොරු. විශේෂයෙන් ග්වෙන්ට. අපිට කාර් තුන හතරක් නැහැ. මම මීට ඉස්සර ඉස්කෝලෙකට ගිහින් නැහැ කියලා කිව්වේ මාව ඉස්කෝලවලින් අස් කරපු බව ආරංචි වෙයි කියලයි. ජීන් එකතු කරපු සමහර අරමුදල්වලට දෙන්න මා ළඟ ඒ තරම් සල්ලි තිබුණේ නැහැ. මගේ තාත්තා කෝටිපතියෙක් කියලා තියෙද්දී මම කොහොමද සල්ලි නැහැ කියන්නේ? ඒ නිසා මම සල්ලි, පර්ස් වගේ දේවල් හොරකම් කළා. මා ළඟ කිසිම රත්‍රන් බඩුවක් නැති නිසා ඒවාට ආසාවෙන් මම ඒ දේවලුත් හොරකම් කළා."

ඈ විරාමයකට නැවතුණා. ඈය වටා තිබූ මුහුණුවල කම්පනයත්, ත්‍රාසයත් සටහන්ව තිබුණා. ගොන්ඩොලින් ක්ලාන්ත වීමට ආසන්න බවක් පෙනුණා. කෝටිපති පියෙකුගේ දියණියක වූ ඇගේ උසස් මිතුරිය! නිවාඩු කාලයේදී ඇගේ නිවසට පැමිණීමට ආරාධනා නොකිරීම පුදුමයක් නොවෙයි. ඇය කියා තිබූ සියල්ලම බොරු!

"ඔයාලා හැමෝටම පුදුමයක්. මම ඒක හිතුවා. මිස් ග්‍රේලින් කිව්වා මටම ඇවිදින් ඔයාලාට ඇත්ත කියන්න කියලා. ඔයාලට පුළුවන් මා ගැන තීරණයක් ගන්න. මට පුළුවන් ඔයාල ගන්න තීරණය බලා ගන්න. මම ඔයාලට මොකවත් කියන්නේ නැහැ. මම ගත්ත තීරණයට අනුව මට මාවම පිළිකුල්!

දිගු විරාමයක් ගත වුණා. අනතුරුව සැලී කතා කළා. "එච්චර ද ඩැෆනි?"

"ඒ මදි ද?" ඩැෆනි අම්හිරි ලෙස කිව්වා. "සමහර විට ඔයාලට දැනගන්න ඕනැ ඇති අන්තිමේ මම මේරි ලෝව් අතේ ඒ දේවල් තැපැලට දමන්න යැව්වේ ඇයි කියලා. හොඳයි, හොරකම්



සම්බන්ධයෙන් එලන් ගෙදර යැව්වා කියන කට කතාව පැතිරෙද්දී මම බයවුණා. ඒ දේවල් හම්බවෙලා මගේ ඇඟිලි සලකුණු හොයා ගනියි කියලා. මම දන්නවා පොලීසිය නිතරම ඇඟිලි සලකුණුවලින් තොරතුරු හොයාගන්න බව. ඉතින් මම හිතුවා ඒ දේවල් පාර්සල් කරලා, බොරු ලිපිනයකට තැපෑලෙන් යවන්න. එතකොට ඒවා එක්ක මගේ සම්බන්ධයක් නැහැ. ඒ මෝඩ අදහස නිසා තමයි මේරි ලෝව් මැරෙන්නම ගියේ."

"ඔව්, ඒ නිසාම තමයි ඔයා මාව හොයාගෙන ඇවිදින් මාව බේරා ගන්න ඔයාගේ ජීවිතයත් අවදානමකට දමා ගත්තේ"

මේරි ලෝව්ගේ සියුම් කටහඬ නැගුණා. නැඹිට ගත් ඈ ඩැෆනි වෙතට ගියා.

"අනිත් අය මොනවා කිවත් මට කමක් නැහැ. මම ඔයා එක්ක ඉන්නවා ඩැෆනි. ඔයා අස්වෙලා යනවාට මම කැමති නැහැ. මම දන්නවා ඔයා ආයෙත් කවදාවත් හොරකම් කරන්නේ නැහැ කියලා. තරකට වඩා ඔයා ළඟ හොඳ ගතිගුණ තියෙනවා."

"හොඳයි, මට නම් එයත් එක්ක තවත් ගනුදෙනුවක් නැහැ." ගොන්ඩොලින් පිළිකුල් ස්වරයෙන් කිව්වා. "අපේ අම්මා දන්නවා නම්...."

"කට වහගන්න, ගොන්ඩොලින්" ඩැරල් කිව්වා. "මමත් ඩැෆනි පැත්තේ. මේ සතියේ මම අහිනුත් හුඟක් වැරදි වුණා. මට ඒවා කියන්න බැහැ. මම හිතන්නේ මේක, ඩැෆනි මේ වාරයේ මොන වැරැද්දක් කරලා තිබුණත්, එයා ඊයේ රෑ නිර්භීතව උතුම් ක්‍රියාවක් කළා කියලා දැන් එයා අපි එක්ක කියපු දේවල්වලින් එයාගේ අගය අඩුවෙන්නේ නැහැ."

"මම ඔයා එක්ක එකඟ වෙනවා." සැලී කිව්වා.

"මම හිතන විදියට නම් එයාගේ හොඳ ගුණවලින් තරක යටපත් වෙනවා. මේ විදියට ඇවිදින් අපිට මුහුණ දීලා කතා කරන්න ධෛර්යය තියෙනවා නම් තවත් මොනවා ද? ඔයා ධෛර්යවන්ත ළමයෙක් ඩැෆනි. අපි ඔයාගේ පැත්ත අරගෙන ඔයාට උදව් කළොත් ඒකෙන් ඔයා වෙනස් වෙනවා ද? මම

කියන්නේ ඔය හොර වැඩ නවත්වලා කපටිකම් නොකර ඉන්නවා ද?"

"ඔයාගේ අදහස ඒක ද?" හදිසි අපේක්ෂාවකින් මුහුණ බැමළුණ ඩැෆනි කිව්වා. "අනිත් අයගේ අදහස මොකක්ද?"

"මම සැලීයි, ඩැරලුයි ඉන්න පැත්තේ" ජීන් කිව්වා.

"මමත් එහෙමයි." බෙලින්ඩා කී අතර අයිරීන් ද හිස සැලුවා. මොහොතක් කල්පනා කළ එමිලි ඇගේ අදහස ද එකතු කළා.

"ඔව්, මමත් එකඟයි." ඈ කිව්වා. "මම හිතන්නේ ඔයා හැසිරුණේ හුඟාක්ම නරක විදියට ඩැෆනි. ඒ වගේම හුඟක් හොඳ විදියට. කොහොම වුණත් හොඳ වෙන්න ඔයාට අවස්ථාවක් දෙන එක යුතුකමක්."

"ඔයා, ඇලිසියා?" සැලී ඇහුවා. අවසාන විනාඩි කීපයේදී ඇලිසියා දැඩි ලෙස නිහඬව සිටියා. ඈ එලන් ගැන සිහිවී කනස්සල්ලෙන් යුතු වුණා. ඈ හිස ඔසවා දැස විදහා බැලුවා.

"මට පෙනෙන්නේ ඩැෆනිට වගේම හොඳ කෙනෙක් වෙන්න මටත් අවස්ථාවක් දෙන්න වෙයි කියලයි." ලැජ්ජාවට පත් මුහුණින් ඈ කිව්වා. "මමයි ඔයාලා හැමෝටම වඩා නරක් වෙලා තියෙන්නේ."

"ඔයා හුඟක් සැර, අනුකම්පාවක් නැති කෙනෙක්, ඇලිසියා." සැලී කිව්වා. "සාක්ෂියක් නැතිව කෙනෙකුට චෝදනා කරන්න ඉස්සර කරුණාවන්තව, සාධාරණව බලන්න ඕනෑ කියලා මම කියද්දී ඔයා මට සමච්චල් කළා. අවසානයේදී මේක සිද්ධ වෙන බව මම කිව්වා."

"මම දන්නවා." ඇලිසියා කිව්වා. "දැන් මට තේරෙනවා. මට කනගාටුයි. මේ වාරයේ මා වෙනුවට ඔයා නායිකාව වීම ගැන මම ඔයා එක්ක අමනාප වුණා, සැලී. මම හරිම මෝඩියෙක්. මම ඩැෆනි ගැන තීරණයක් ගන්න සුදුසු කෙනෙක් නොවෙයි. මම ඔයා කියන දෙයක් කරන්නම්. ඇත්තටම බලන්නකෝ."



"හොඳයි, ගොන්ඩොලින් විතරයි විරුද්ධව ඉන්නවා වගේ පෙනෙන්නේ." කී සැලී බුම්මාගෙන සිටි දැරිය වෙතට හැරුණා. "නෑ, අහිංසක ගොන්ඩොලින්! එයාගේ හොඳම යාළුවා නැති එක එයාට දරාගන්න බැහැනේ. අපි ගිහින් මිස් ග්‍රේලින්ට කියමු."

"එපා, එහෙම කරන්න එපා." මමත් එකඟයි ග්‍රේලින් මෙන්මියට තමා පහත් අයෙකු ලෙස පෙනෙනු ඇතැයි බිය වූ ගොන්ඩොලින් කිව්වා.

"එහෙනම් මමත් එකඟයි. ඔයා අපි එක්ක ඉන්න කැමති ද?" සැලී ඇහුවා.

"ස්තූතියි, සැලී. මුළු හදවතින්ම කැමතියි." කී ඩැෆනි හිස පසෙකට හරවා ගත්තා. එය ඇගේ ජීවිතයේ අමතක නොවන මොහොතක්. ජීවන ගමනේ සංධිස්ථානයක්. නිවැරදි මග කමාට භාරව තිබූ අතර ඈ එය දැන සිටියා. ඒ එසේ කිරීමට ඇය ශක්තිමත් නම් පමණයි.

දුර්වල අතකින් ඇගේ බාහුව ස්පර්ශ වුණා. ඒ මේරි ලෝව්. "එන්න, දැන් මේට්‍රන් ළඟට ආපහු යමු." ඈ කිව්වා. "මේ රැස්වීම ඉවර වුණ වහාම අපිට ආපහු එන්න කිව්වා. මම ඔයාව එක්ක යන්නම්."

ඩැෆනි ප්‍රථමවරට සිනාවක් පෑ අතර එය සැබෑ අවංක සිනාවක් විනා අන් අය ආකර්ෂණය කර ගැනීමට මවා ගත් එකක් නොවෙයි. "මමයි ඔයාව එක්ක යන්න ඕනෑ!" ඈ කිව්වා." එන්න, නැති නම් මේට්‍රන් අපිට මෙහෙන් දුවන්න කඩා පනියි."

ජීන් එලන්ව බැලීමට ගියා. එලන් අමුතුම විදියට වෙනස් වෙලා. ප්‍රාතිහාර්යකින් මෙන් සෑම දෙයම වෙනස් වෙලා. "මට හුඟක් දුරට සනීපයි දැන්." එලන් කිව්වා. "මම මේ වාරයේදී එතරම් හොඳට පාඩම් කරන්න ඕනෑ නැහැ. මම නම් ආයෙත් කඩා පනින්නේවත්, කන් කෙඳිරි ගාන්නේවත් නැහැ. මට එකපාරට හැදෙන අර දරුණු ඔළුව රදය දැන් ඉවරයි. මිස් ග්‍රේලින් එක්ක කතා කළාට පස්සේ ඒක එක පාරටම නැතිව ගියා. ඒක නම් හරිම අමුතු දෙයක්."

"මේ දවස් ටිකේ ඇඳේ ඉන්න වුණ එක ඔයාගේ වාසනාවක්." ජීන් කිව්වා.

"විභාග ප්‍රශ්න පත්‍ර හරිම අමාරුයි. ඔයා ගණිත ප්‍රශ්න පත්‍රය දකින්නයි තිබුණේ, එලන්. අවංකවම මට කරන්න පුළුවන් වුණේ ගණන්වලින් භාගයයි. අනික, මම්සලී ඩූපොන්ට් හදලා තිබුණ ප්‍රංශ ප්‍රශ්න පත්‍රය, යමෙකුටවත් කරන්න බැහැ."

එක් දෙයකින් තවත් දෙයකට මාරු වෙමින්, විභාගය පැවැත්වුණා. සතිය ගෙවී ගිය අතර ඉතා ඉක්මනින් වාරයේ අවසාන සතිය එළඹුණා. ප්‍රශ්න පත්‍ර බැලීම, ලකුණු දැමීම, ලකුණු වාර්තා කිරීම හා වාර්තා පොත් සෑදීම වැනි නොයෙක් බරපතළ රාජකාරිවලින් ගුරුතුමියන් මහත් වෙහෙස කර කාලයක් ගත කරන බව පෙනුණා. තමා කදිමට සකස් කරගත් ලකුණු ලැයිස්තුවක් අස්ථාන ගත වී තිබූ හෙයින් මම්සලී ඩූපොන්ට් වියරුවෙන් එය සොයමින් හැසිරෙන බවක් දැකිමට ලැබුණා. මිස් පාකර් වෙත දිවගිය ඈ නැවතත් ලකුණු සොයා දෙන මෙන් ඇගෙන් ආයාචනා කරන්නට වුණා.

පාකර් ගුරුතුමිය ද කාර්ය බහුලව සිටි හෙයින් එය ප්‍රතික්ෂේප කරන්නට වුණා. "මගේ වැඩත් හුඟක් තියෙනවා." ඈ කිව්වා. "ඔයත් බෙලින්ඩා වගේම නරකයි මම්සලී, පන්තියේ හැමෝම භූගෝලය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියද්දී එයා ඉතිහාසයට උත්තර ලියලා. ඒ කොහොමද කියලා මගෙන් අහන්න එපා. ඒ ළමයා තමයි මගේ ජීවිතයේදී දැක්ක මෝඩම ළමයා. මම භූගෝල විද්‍යා ප්‍රශ්න පත්‍ර දෙද්දී එයාට ඉතිහාසය ප්‍රශ්න පත්‍රයක් ආවේ කොහොමද? මම අහන්නේ......"

"ඒත් ඒ වැරැද්ද වුණේ ඔයාගෙන් කියලා ඒ ළමයා නොකිවේ ඇයි?" පුදුමයෙන් මම්සලී ඇහුවා.

"එයා කියනවා ඒවා මොන ප්‍රශ්න පත්‍රයේ ඒවාද කියලා එයා දන්නේවත් නැහැ කියලා" පාකර් ගුරුතුමිය කෙඳිරිලි හඬින් කිව්වා. "මේ කෙල්ලෝ! මට පුදුම වදයක් දෙන්නේ. දෙවි පිහිටෙන් වාරය අවසාන වෙන්න තව දවස් දෙකයි තියෙන්නේ."



තවත් දිනක් පමණයි. එහෙත් කෙතරම් වෙහෙස කර දෙදිනක් ද? බඩු ඇසිරීම, බඩු සොයා ගැනීම, ලිපින හුවමාරුව, කබඩ් ශුද්ධ පවිත්‍ර කිරීම...... හරිම කලබලයකින් යුතු විනෝදමත් කාලයක් තමයි වාර අවසානය. ඒ වගේම නිවෙස් බලා යාමට ඇති උනන්දුව.

"පුදුම විදිහේ වාරයක් ගත වුණේ." ඩැරල් සැලීට කිව්වා.

"එහෙම හිතෙන්නේ නැද්ද, සැලී? මම කරපු දේවල් ගැන මට ඒතරම් සතුටක් නැහැ. ඒත් ඔයා නම් හැමදාම වගේ හොඳට වැඩ කළා."

"විකාර" සැලී කිව්වා. "ඔයා දන්නේ නැහැ ඇලිසියා මම කියන දේ අහන්නේ නැති නිසා මම කී වතාවක් සිහින් කරදර වුණාද කියලා. ඔයා මා ගැන හුඟක් දන්නේ නැහැ."

"කොහොම වුණත් මට නම් මේ වාරය ලොකු විනෝදයක්." සියල්ල සිහිපත් කරමින් ඩැරල් කිව්වා. "එලන් කරනින් පිපිරීම, අපි හැමෝම එයා ගැන වැරදි විදියට හිතපු හැටි, දැන් ඒ හැම දෙයක්ම හරි ගිහින් එයා වෙනස් වෙලා. එයයි, ජීනුයි ඉදිකටුවයි, නූලයි වගේ යාළුවෝ."

"එතකොට ඩැෆනි" සැලී කිව්වා. "ඒක අමුතුම සිද්ධියක් නේද, ඩැරල්? එයාට අවස්ථාවක් දීම ගැන මම සතුටු වෙනවා. අර මෝඩ ගොන්ඩොලින් මේරිව අත හැරලා එයා හොඳම යාළුවා හැටියට මේරි ලෝව්ව තෝරා ගන්න එක හිතා යන වැඩක්."

"අපූරු වැඩේ" ඩැරල් කිව්වා. "මේරි ලෝව් පොඩි බයගුල්ලියක් තමයි. ඒත් එයා හිත හොඳ කෙනෙක්. හැම තිස්සේම අපි පස්සේ එල්ලී එල්ලි එන්නේ නැතිව එයාටම කියලා යාළුවෙක් ඉන්න එක හොඳයි. ඒත් මම හැම තිස්සෙම පොඩි මේරි ලෝව්ට කැමතියි."

"ගොන්ඩොලින් මේ දවස්වල ඉන්නේ මූහුණ ඇඹුල් කරගෙන" සැලි තම මිතුරියට වැලමිටෙන් ඇන තනිව ගමන් කරන ගොන්ඩොලින්ව දැක්වූවා. "කාටත් එපා වුණ කෙනෙක්."

"එයාට කිසි කරදරයක් කරන්න එපා." ඩැරල් අනුකම්පාවෙන් තොරව කිව්වා.

"ඉක්මනින්ම අම්මාගෙයි, මිස් වින්ටර්ගෙයි හුරතලී වෙයි. එයාගේ හැම සුළු වැඩක්ම එයාලා කරලා දෙයි. හුරතල් ගොන්ඩොලින් මේරි. ඩැෆනිගේ සිද්ධියෙන් පස්සේ එයාට තවම හිත හදාගන්න බැරි වෙලා නේද?"

"ඔව්, සමහර විට ලබන වාරය වෙද්දී හරි යයි." කල්පනාබරිතව සැලී කිව්වා. "දෙවියනේ, බෙලින්ඩා මොනවාද කරන්නේ."

නූල් යාර ගණනක් දිගින් දිගටම බිම ඇදෙමින් මැහුම් වැඩ කූඩයක් ද සමග බෙලින්ඩා වේගයෙන් ආවා. ඒවා අනිත් අයගේ කකුල්වල පැටලී ඇය අමාරුවේ වැටෙනු ඇත.

"මගේ නූල් අත හරින්න." ඈ කෝපයෙන් මොර දුන්නා. "ඔයා ඒවා පාගාගෙන."

"ඕ බෙලින්ඩා, ඔයා හැම තිස්සෙම කරන්නේ මොට්ට වැඩ!" ඩැරල් තම පාදයේ පැටලී තිබූ නූලක් පැටලුම් හරිමින් කෑ ගැසුවා. "යනවා යන්න! පඹ ගාලක් වගේ නූල් ගොඩක් මගේ කකුල්වල එතිලා. බෙලින්ඩා, නිවාඩුවට පස්සේ එද්දී විකට පින්තූර ටිකක් ගෙනෙන්න අමතක කරන්න එපා."

"මම ගෙනෙන්නම්" සිනාවක් පෑ බෙලින්ඩා කිව්වා. "කොහොමද ඇලිසියා අලුත් වාරයට අලුත් විජ්ජාවක් අරගෙන ආවොත්? හේයි, ඇලිසියා අපි නිවාඩුවට පස්සේ මොනවා හරි ඔයාට අරගෙන එන්නම්. හොඳ විහිළු වැඩ ටිකක් හොයාගෙන එන්න, හරිද?"

"හරි" ඇලිසියා කෑ ගැසුවා. "මම ගේනවා. ඔයාලාට බලාගන්න පුළුවන්."මම්සලීගේ පස්ස පැත්තේ 'ඔයි' ! වලට වඩා හොඳ එකක්, ඩැරල්!"

"ඔයි! මොන ඔයියක්ද?" කඩිමුඩියේ පැමිණි මම්සලී තදින් ඇසුවා. 'ඔයි' කියලා මගේ පස්ස පැත්තේ? මොනවද ඔයාලා දැන් මට කරලා තියෙන්නේ?"



'ඔයි' කුමක්දැයි බැලීමට ඇඹරී ඇය පසුපස බලද්දී ඇරියෝ යටිගිරියෙන් හඬ නගා සිනාසුණා.

"ඒක දැන් ඉවරයි, මම්සලී දැන් ඒක නැහැ."

"ඒත් මොකක්ද 'ඔයි'?" මම්සලී තදින් ඇසුවා. "මම මිස් පාකර් ගෙන් අහන්නද?"

එහෙත් පාකර් ගුරුතුමියට මම්සලීගේ 'ඔයි' ගැන උනන්දුවීමට කාලයක් තිබුණේ නැහැ. නිවාඩුවට ඇරියන්ව ආරක්ෂිතව යැවීම ගැන පමණයි ඈ උනන්දු වුණේ. ඉන් පසුව ඇයට වාඩි වී සැනසිල්ලේ හුස්මක් ගත හැක.

මෝටර් රථ මිදුලට පියඹා ආවා. බෙලින්ඩා සුපුරුදු පරිදි අමතක කර තිබූ නිසා තම සූට් කේසය සෙවීමට වියරුවෙන් මෙන් ආපසු දිව්වා. අවසානයේ ඔවුන් ගමන් ඇරඹුවා.

"ආයුබෝවන්, මැලෝරි ටවර්ස්." ඇරියෝ මොර දුන්නා.

මීළඟට මැලෝරි ටවර්ස් පාසල - 03

"**රෑ ගමන**" තුළින් හමුවෙමු.